# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2070/11 - 2018 මැයි මස 09 වැනි බදාදා - 2018.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන( සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**මහා නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා( අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙන් (1) උප වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන මාර්ග නීතිය සහ ප්‍රවාහන යන විෂයයන් භාර අමාත්‍ය ක.වි.විග්නේශ්වරන් වන මවිසින් සාදන ලද මහා නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා 7 සිට 9 දක්වා වූ පරිච්ඡේදයෙන් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා, සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියට අදාළව උතුරු පළාතේ පළාත් සභාවේ තීරණය මගින් පිළිගෙන, එකී අනුමැතිය රජයේ *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත්කළ විට, ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (අ) වැනි වගන්තියට අනුව උතුරු පළාතේ වූ මහා නගර සභාවන් එකී සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට මෙයින් බලය ලබාදෙනු ලබන අතර, ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (ආ) වැනි වගන්තියට අදාළව එකී අතුරු ව්‍යවස්ථාවන්හි කෙටුම්පත්වල අඩංගු විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථා සෑදීමට මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 272 වැනි වගන්තිය සමග කියැවෙන 267 වැනි වගන්තිය මගින් උතුරු පළාතේ වූ මහා නගර සභාවන්ට බලය ලබා දෙනු ලැබේ.

**විනිසුරු ක. වි. විග්නේශ්වරන්,**
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා විනය,
ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක,
පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන,
මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන මාර්ග නීතිය සහ ප්‍රවාහන අමාත්‍යවරයා,
උතුරු පළාතේ පළාත් සභාව.

2018 මැයි මස 01 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
A - 9 පාර, කයිතඩි
යාපනය.

1A - PG4032 - 52 (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## මහා නගර සභාවන් සඳහාවන සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි අන්තර්ගතයන්

| අනු. අංකය | පරිච්ඡේදය | කොටස | සම්මත අතුරු ව්‍යවස්ථාවේ නාමය |
|---|---|---|---|
| 1 | 7 | i | මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය , පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 2 | | ii | මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළ් මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 3 | | iii | මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 4 | | iv | මහා නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 5 | | v | මහා නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 6 | 8 | i | මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණ කිරීම, ආපදාවට පත් වූවන්ට සහන සැළසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 7 | | ii | මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 8 | | iii | මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 9 | 9 | i | මහා නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 10 | | ii | මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |

## 7 වැනි පරිච්ඡේදය

**i වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය, පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

**අතුරු ව්‍යවස්ථාවේ නාමය.**

01. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර වර්ග, පාන වර්ග, එළවළු සහ පළතුරු වෙළෙඳාම් කිරීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

**අරමුණ.**

02. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම, පිරිසිදු ආහාර ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම, ගමනාගමනයට අවහිරතා ඇති කිරීම වැළැක්වීම යනාදි අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

**අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.**

03. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267(1) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 272 වැනි වගන්තියේ 19 වැනි සහ 20 වැනි උපවගන්ති යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

**ඉටු කළ යුතු කාර්යයන්.**

(4-12)

04. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, සෑම පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(i) පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් බලපත්‍රයකට අයදුම් කරන අයදුම්පත්‍රයක්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා අවසානයේ දී දක්වා ඇති පළමු වැනි උපලේඛනයට සාරානුකූලව තිබිය යුතුය.

(ii) පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ උඩුකය දක්වා පෙනෙන 2½″ x 2″ ක ප්‍රමාණයේ ඡායාරූප දෙකක්, බලපත්‍රයකට අයදුම් කරන සෑම එක් එක් අයදුම්පත්‍රයකම අයදුම්කරු විසින් අමුණා තිබිය යුතුය. අයදුම්පත්‍රය භාර ගැනීමෙන් අනතුරුව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් සුදුසු යැයි අදහස් කරන ආකාරයේ පරීක්ෂණයක් සිදු කිරීමෙන්, අයදුම්කරු සුදුසු නොවන්නේ නම්, අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ හැකිය. තව ද, අයදුම්කරු තමාගේ පදිංචි ස්ථානය, ඔහු වාසය කරන ග්‍රාම සේවක නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.

(iii) පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ බලපත්‍රයකට අයදුම් කරන අයදුම්පත්‍රය, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කළ අවස්ථාවේ දී, අයදුම්පත්‍රය සමග ලබාදුන් ඡායාරූපයෙන් එකක් අයදුම්කරුට නිකුත් කරනු ලබන බලපත්‍රයේ අලවා තිබිය යුතුය. අනික් ඡායාරූපය මහා නගර සභා කාර්යාලයේ තබාගත යුතුය.

05. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට පිසින ලද ආහාර හා පාන වර්ග විකිණීම පිණිස නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(i) විකිණීමට තබා ඇති පිසින ලද ආහාර හා පාන වර්ග මැස්සන්ගෙන්, කෘමීන්ගෙන්, දූවිල්ලෙන් *නැතහොත්* ජලයෙන් දූෂණය නොවන ආකාරයට සංවෘත භාජනයක් හෝ පෙට්ටියක් හෝ පාවිච්චියට ගැනීමට සුදානම් කර තිබිය යුතුය.

(ii) පිසින ලද ආහාරයක් විකුණුම් කරනු ලබන විට, ගනුදෙනුකරුවන්ට පිළිගැන්වීම් සඳහා මල නොබැඳෙන ලෝහවලින් තැනූ අඩුවක් තබාගත යුතුය.

(iii) ඒ අවස්ථාවේ දී ගනුදෙනුකරුවන්ට ආහාර හෝ පානයන් හෝ පරිභෝජනය කිරීමට පිළිගන්වන්නේ නම්, ඒ සඳහා ම වෙන් වෙන් වූ භාජනයන් තබාගත යුතුය.

(iv) පරිභෝජනයෙන් පසුව ගනුදෙනුකරුවන් විසින් ඉතුරු කරනු ලබන ආහාර හා පානයන් බහාලීමට වෙන වෙනම භාජනයන් තබාගත යුතු අතර එකී භාජන හොඳින් වසා තැබිය හැකි පියන්වලින් යුක්ත විය යුතුය.

06. පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් ව්‍යාපාරික කටයුතුවල නියුක්තව සිටින අවස්ථාවේ දී, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නිකුත් කළ බලපත්‍රය හා හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන ආකාරයේ සුදුසු තැනක ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

07. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රය හා හැඳුනුම්පත පෙන්වන මෙන් ඉල්ලා සිටි අවස්ථාවක, එම ලියකියවිලි වහාම ඉදිරිපත් කිරීම පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ කාර්යය විය යුතුය.

08. බලපත්‍රලාභී පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා වූ කාල සීමාව තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නියුක්තවීමට හිමිකම් ලබයි. එසේ වුව ද, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී කාල සීමාවෙන් බැහැරව රාත්‍රී කාලයේ දී වෙළෙඳාමේ නියුක්තවීම සඳහා අවසර දෙනු ලදුව, ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේ නම්, එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළෙඳාම් කිරීමට බලපත්‍රලාභියෙකුට හිමිකම් ඇත්තේය.

09. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(i) ජෛවහායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) මේ කොටසේ 9 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

10. පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා බලපත්‍රලත් වෙළෙඳුන්, මහා නගර සභාව විසින් වරින්වර පනවනු ලබන කොන්දේසිවලට යටත් විය යුතුය.

11. පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳුන් සෑම වසරක් පාසාම බලපත්‍රය සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන විට, වෛද්‍ය පරීක්ෂණ සහතිකය අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

12. පිසින ලද ආහාර ද්‍රව්‍ය හා පාන වර්ග විකිණීම කරනු ලබන තැනැත්තන්ට මෝටර් වාහනවලින් තැනින් තැන ගෙන යමින් විකිණීම සඳහා වන අනුමැතිය ලබාදිය හැකිය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(13-23)

13. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ විසින් පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට නිකුත් කරනු ලැබූ බලපත්‍රය හා හැඳුනුම්පත නොමැතිව කවර හෝ තැනැත්තෙකු මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, වීථියක, පටුමඟක, පොදු වේදිකාවක, පොදු උද්‍යානයක හෝ තල්ලු අත් කරත්තයක හෝ මෝටර් රථ වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති හෝ උපයෝගී කරනු ලබන කිනම් හෝ වාහන නවත්වාලීමේ හෝ පොදු බස්රථ නැවතුම් පළේ හෝ මහජනයා රැස්වන පොදු ස්ථානයක කවර හෝ භාණ්ඩයක්, ආහාරයක්, පානයක්, එළවළු වර්ගයක් හා පළතුරු වර්ගයක් විකිණීම හෝ විකිණීම පිණිස තැනින් තැන ගෙනයාම හෝ නොකළ යුතුය.

14. පදික වෙළෙඳාමේ සහ සංචාරක වෙළෙඳාමේ යෙදෙන බලපත්‍රලාභී ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා වූ අතරතුර කාලය හැර, වෙනත් යම් වේලාවක කවර හෝ භාණ්ඩයක් විකිණීමට හෝ විකිණීමට තබා ගැනීම හෝ නොකළ යුතුය.

15. බලපත්‍රලාභියා තමාගේ භාණ්ඩ ප්‍රචාරය කරලීමේ අරමුණින් යම් හඬ විකාශනයක් හෝ ශබ්ද විකාශනයක් හෝ ඊට අනුරූපිත වෙනත් උපකරණයක් හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය.

16. බලපත්‍රලාභියා සිය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් පරිශ්‍රය හා භාණ්ඩ හැර, වෙනත් යම් පරිශ්‍රයක බලපත්‍රයේ නිශ්චිතව සඳහන් භාණ්ඩ හෝ වෙනත් යම් භාණ්ඩයක් විකිණීම හෝ විකිණීමට තබා ගැනීම හෝ විකිණීම පිණිස තැනින් තැන ගෙනයාම හෝ නොකළ යුතුය.

17. බලපත්‍රලාභියා, කිසියම් මාර්ගයක ධාවනය කෙරෙන වාහනවලට හෝ ගමන් කරන පදිකයන්ට හෝ කිසිදු බාධාවක් ඇති නොකළ යුතුය. කවර හෝ පොලිස් නිලධාරියෙකු හෝ ග්‍රාම සේවක නිලධාරියෙකු හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කිසියම් මාර්ගයකින් හෝ පදික වේදිකාවකින් හෝ පිටවන ලෙස නියෝග කරනු ලබන විට, එලෙසින් එම තැනැත්තා පිටවීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

18. මහා නගර සභාව විසින් පදික වෙළෙඳාමට සහ සංචාරක වෙළෙඳාමට තහනම් කරනු ලැබූ ප්‍රදේශයේ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් රැඳී සිට හෝ තැනින් තැන ගෙනයමින් හෝ විකිණීම නොකළ යුතුය.

19. බලපත්‍රලාභියා, මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කර ඇති බලපත්‍රය කවර හෝ තැනැත්තෙකුට අන්සතු නොකළ යුතුය.

20. පදික මාළු වෙළෙඳුන්ගේ හා සංචාරක මාළු වෙළෙඳුන්ගේ බලපත්‍ර සම්බන්ධයෙන් උතුරු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ, උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කරන ලද, උතුරු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අංක 2011/25 හා 2017.03.24 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකරන ලද, මාළු වෙළෙඳාම සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 6 වැනි පරිච්ඡේදයේ vi වැනි කොටසේ 20 වැනි හා 21 වැනි අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රයක් ලබා නොගෙන, මාළු විකිණීම හෝ මාළු විකිණීම පිණිස තබා ගැනීම හෝ නොකළ යුතුය.

21. පිසින ලද ආහාර ද්‍රව්‍ය හා පාන වර්ග හැර නිෂ්පාදිත භාණ්ඩ විකිණීම කරනු ලබන තැනැත්තන්ට මෝටර් වාහනවලින් තැනින් තැන ගෙනයමින් විකිණීම සඳහා වන අනුමැතිය ලබා නොදිය යුතුය. එනමුත්, ඉහත ද්‍රව්‍යයන් සංචාරක වෙළෙඳුන් විසින් යතුරු පැදිවලින් හා පාපැදිවලින් හෝ හිසේ තබා ඔසවමින් හෝ තැනින් තැනට යමින් විකිණීම සඳහා වන අනුමැතිය ඉල්ලා සිටි විටෙක, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම නිසා බලපත්‍රලාභියාට සිදුවන යම් පාඩුවක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ වගකීමට යටත් නොවනු ඇත.

23. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රයක් ලබා ඇත්තේ වුවද, කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි රෝගියෙකුව තම නිවසෙහි තබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, පදික වෙළෙඳාමේ සහ සංචාරක වෙළෙඳාමේ නියුක්තවීම නොකළ යුතුය.

මහා නගර සභාවේ කාර්යභාරය.

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කොටසක පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම තහනම් කිරීමට හේතු වූ අවදානම අවසන් වී ඇති බව නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නගරාධිපතිවරයා වෙත කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම්, එකී කොටසේ පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා නැවත අවසර දෙනු ලබන බව, බලපත්‍රලාභීන්ට දැන්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ කාර්යය විය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

25. පදික වෙළෙඳාමක් හෝ සංචාරක වෙළෙඳාමක් හෝ සඳහා 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 247(අ) වැනි උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

26. මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, කිසියම් උත්සවයක දී හෝ යම් ජාතික උත්සවයක දී හෝ මහජන ඒකරාශීවීමක දී හෝ මහා නගර සභා බල ප්‍රදේශය තුළ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියමිත ප්‍රදේශයේ ස්ථිර වෙළෙඳ ස්ථානවලට බාධා ඇති නොවන අයුරින්, වෙළෙඳාම් සඳහා වන ස්ථාන වෙන්කර, ඒ සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කරනු ලැබ, විශේෂිත ගාස්තුවක් අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

බලය පැවරීම.

27. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය.
(28-29)

28. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

29. මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද තාවකාලික බලපත්‍රය, කිනම් දිනයක් සඳහා නිකුත් කරනු ලැබුවේ ද, ඒ දිනෙන් පසුව එම බලපත්‍රය අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරිය.
(30-32)

30. කවර හෝ පදික වෙළෙන්දෙකු සහ සංචාරක වෙළෙන්දෙකු විසින් විකුණනු ලබන යම් භාණ්ඩයක/පිසින ලද ආහාර හෝ ආහාර ද්‍රව්‍යයක/පාන වර්ගයක හෝ සාම්පලයක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ මහා නගර සභාවේ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එහි මිළ ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වුවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, බලපත්‍රලාභියා වෙත ලිඛිතව කරනු ලබන දැන්වීමක් භාරදීමෙන් අනතුරුව බලපත්‍රලාභියාට පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රය නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල වියයුතු අතර අවලංගු කළ බලපත්‍රය ආපසු නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙත භාරදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

32. කිසියම් බෝවෙන රෝගයක් හෝ උදරාශ්‍රිත රෝග තත්ත්වයක් හෝ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පැතිරෙන බවට හෝ එවැනි රෝග තත්ත්වයක් පැතිරීමේ අවදානමක් පවතින බවට හෝ නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නගරාධිපතිවරයා හෝ

නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙත කරුණු වාර්තා කර ඇති යම් අවස්ථාවක, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් පහත සඳහන් පියවරයන් ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(i) මේ සම්බන්ධයෙන් ලිඛිතව කරුණු සඳහන් කරමින් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ නිකුත් කළ බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම;

(ii) මහා නගර සභා බල ප්‍රදේශයේ කිසියම් කොටසක, පදික වෙළෙඳාම හා සංචාරක වෙළෙඳාම තහනම් කිරීම;

(iii) ඉහත 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ තාවකාලිකව අත්හිටුවනු ලැබූ බලපත්‍රය, එසේ අත්හිටුවනු ලැබූ කාලය ඇතුළත භාරයට ගනු ලැබීම; සහ

(iv) බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට නියමිත දිනට පෙර, එකී රෝග පැතිරීමේ අවදානම අවසන් වී ඇති බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් වාර්තා කරනු ලැබ ඇත්නම්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අත්හිටුවනු ලැබූ බලපත්‍රය ප්‍රතිසාධනය කිරීම.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත්කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන. (35– 36)

36. පදික වෙළෙඳාමක් සහ සංචාරක වෙළෙඳාමක් සඳහා බලපත්‍රයක් ලබා නොගෙන, යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ හෝ විකිණීම කරනු ලබන හෝ විකිණීම පිණිස තබාගෙන ඇති හෝ තැනැත්තා, එකී භාණ්ඩය හෝ භාණ්ඩ හෝ විකිණීමට, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ විසින් කරනු ලබන තහනම් කිරීමකට යටත් විය යුතුය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල- අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"සංචාරක වෙළෙඳාම" යන්නෙන්, හිසේ තබා ඔසවා ගෙන යාමෙන් හෝ යම් අනුමත කළ වාහනයක ගෙන යාමෙන් හෝ මහජනතාවගේ පරිභෝජනය සඳහා තැනින් තැනට යමින් හෝ කිසියම් තැනක නතර වී හෝ කරනු ලබන වෙළෙඳාම අදහස් වේ.

"පදික වෙළෙඳාම" යන්නෙන්, පාරක හෝ මාර්ගයක හෝ අසබඩ නිශ්චිතව වෙන් කරන ලද ස්ථානවල රැඳී සිට කරනු ලබන වෙළෙඳාම අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

38. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**ඇමුණුම - 01**

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය, පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. වෙළෙඳ ස්ථානයේ නම: . ...............................................................................

2. (i) වෙළෙඳාම කිරීමට නියමිත කොට්ඨාසයේ අංකය: ............................................

   (ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය: ............................................................. හා

   ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම: .......................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: ..........................................................................................

   (ii) ස්ථිර ලිපිනය: ..........................................................................................

   (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය: ...................................................................
   (ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කළ පදිංචි සහතිකය ඇමිණිය යුතුය.)

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ......................................................
   (ජාතික හැඳුනුම්පතේ ඡායාස්ථිත පිටපතක් සමගින් 2½"x2" ප්‍රමාණයේ ඡායාරූප දෙකක් ඇමිණිය යුතුය.)

   (v) දුරකථන අංකය: ........................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: .................................................

4. (i) වෙළෙඳාම ආරම්භ කළ දිනය: ...................................................

   (ii) වෙළෙඳාමේ ස්වභාවය: .............................................................

(iii)පදික වෙළෙඳාමේ / සංචාරක වෙළෙඳාමේ නියුක්ත සේවකයන් පිළිබඳ විස්තර:

(අ) නම / නම් : .........................................................................

(ආ) දුරකථන අංකය / අංක: .........................................................

(iv)කළින් රැකියාව: ..........................................................

5. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............ නැත: ............

ඔව් නම්: බලපත්‍රය අංකය: ..................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. පදික වෙළෙඳාම / සංචාරක වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

..............................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: ..................................

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

..............................................................................,
නාගරික කොමසාරිස්වරයා /බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස (මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය : ..................................... වරිපනම් අංකය : .........................

වීථියේ / පාරේ නම : ...........................................................................................

අයිතිකරුගේ නම : ...........................................................................................

දේපළෙහි ස්වභාවය : ...........................................................................................

වාර්ෂික වටිනාකම : රු. .........................

හිඟ වරිපනම් මුදල : රු. .......................... ඇත: ............. නැත.: .................

................................,
පරිපාලන නිලධාරී.

දිනය: ............................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ...................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ..................................................................

ඒකකය A B C සටහන්:....................................................................

.................................,
ආදායම් පරීක්ෂක.

දිනය: ..........................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

.............................................................................................................................................
.............................................................................................................................................
............................................................................................................

....................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය: ............................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

දිනය: ..............................

..............................................,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

.....................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක

දිනය: ..............................

**නාගරික කොමසාරිස්වරයාගේ / ගණකාධිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.................................................,
නාගරික කොමසාරිස් /ගණකාධිකාරී.

දිනය: ..........................

**අනුමත කරමි. / නොකරමි.**

.

...........................................................................................,
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

දිනය: .............................

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: .................................... ලදුපත් දිනය: ....................................

බලපත්‍ර අංකය: .................................. බලපත්‍ර දිනය: ...................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: ............................

........................................,
ආදායම් පරිපාලන නිලධාරී.

නගරාධිපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

..........................................................,
නාගරික කොමසාරිස් /ගණකාධිකාරී.

දිනය: ............................

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

.........................................................................................,
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

දිනය: .............................

**ii වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. — අතුරු ව්‍යවස්ථාවේ නාමය.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. — අරමුණ.

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 272 වැනි වගන්තියේ 19 වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

4. ඇමුණුම 01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම් කරනු ලබන වෙළෙඳ සැල, මෙහි පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ තැනැත්තෙකුට කුකුළු මස් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. — ඉටු කළයුතු කාර්යයන්. (4-13)

   (i) විකිණීම පිණිස කුකුළු මස් ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය, පිඟන් ගඩොල් අල්ලා හෝ සිමෙන්තියෙන් කපරාරු කර හෝ මල නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතුය.

   (ii) කුකුළු මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම, සිමෙන්තියෙන් කපරාරු කර හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ තිබිය යුතුය.

(iii) කුකුළු මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ එක් එක් කාමරයකටම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතුය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය, කාමරයේ බිමෙහි වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතුය. කෙසේ වුවද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී, මේ නියමය අදාළ නොවිය යුතුය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයකම බිත්ති මීටර් තුන(3.0)කට නොඅඩු උසකින් යුක්ත විය යුතුය.

(v) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයකම ඇතුල් වහළක් (සීලිමක්) සවිකර තිබිය යුතු අතර, එකී ඇතුල් වහළ පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් තුන(3.0)කට නොඅඩු උසකින් තිබිය යුතුය.

(vi) වහළය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, අගු පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක්වත් තිබිය යුතුය.

(vii) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිහන් ගඩොල් ඇල්ලූ හෝ කාණු තිබිය යුතුය.

(viii) 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (vii) වැනි උපවගන්තියේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය, කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වළකට ගලායෑමට ඉඩ සලස්වා තිබිය යුතුය.

(ix) අපජලය ගලායාමට සලස්වන ලද උරාගන්නා වළ, වාතය ඇතුල් නොවන සේ ආවරණය කර තිබිය යුතුය.

(x) කුකුළු මස් අළෙවි ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායනික අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරු ඇති වළක වැළලීමට හෝ මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව මහා නගර සභාවේ කුණු කසළ රැස්කරන වාහනයට භාරදීමට හෝ කටයුතු කළ යුතුය.

(xi) වෙළෙඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

(xii) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, අඩුම වශයෙන් එක් පඩික්කමක්වත් පරිශ්‍රයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි බලපත්‍රලත් පරිශ්‍රයේ තැබීමට සැලැස්විය යුතුය.

(xiii) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, ඔහුගේ වෙළෙඳ ස්ථානයේ පිටත ප්‍රකටව පෙනෙන තැනක තරාදියක ස්වරූපයෙන් "තමන්ගේ නම" හා "බලපත්‍රලත් කුකුළු මස් අළෙවි සැල" යන වාක්‍ය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් සවිකර තිබිය යුතුය.

(xiv) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, ඕනෑම වේලාවක ලබාගත හැකි පරිද්දෙන් කුකුළු මස් වෙළෙඳුන් ඇතුළුව සියලුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් එකී ස්ථානයෙහි තබාගත යුතුය.

(xv) යටත් පිරිසෙයින් අවුරුද්දකට සිව් වරක්වත්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ලිඛිතව නියම කරනු ලැබිය හැකි පරිදි එකී වෙනයම් වේලාවන්හි දී ද, එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, වෙළෙඳ සැලෙන් කොටසක් වන එක් එක් කාමරයකම බිත්ති, පිහන් ගඩොල් අල්ලා හෝ සිමෙන්ති කපරාරු කර ඇති එකී කොටස් හැර, හුණු පිරියම් කිරීමට ද, ලීයෙන් කළ සියලු කොටස් පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආලේප කර ඇත්නම්, සබන් ගා උණු දියෙන් සේදීමට ද සැලැස්විය යුතුය.

5. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම්, බිත්ති, පිහන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස්, මස් කැපීමට යොදා ගන්නා කොටය, උපකරණ, කුකුළු මස් විකිණීම පිණිස කුකුළු මස් ප්‍රදර්ශනයට තබන ස්ථාන යනාදිය විෂබීජනාශක දියර යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක බලපත්‍රලාභියා කුකුළු මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම ආශ්‍රිතව පාවිච්චි කරනු ලබන සියළුම භාජන හා උපකරණ සහ කුකුළු මස් වෙළෙඳ සැලේ අවට ඇති කාණු හොඳින් සෝදා පිරිසිදු කර, මනා අළුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි ආකාරයෙන් තබාගත යුතුය.

8. කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම් සහ වෙනත් අවශ්‍ය ආරක්ෂිත පැළඳුම් සපයා තිබිය යුතුය. ඒ සමඟ එකී සේවකයන් කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත සියළුම අවස්ථාවන්හි දී, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සියළුම සේවකයින් සඳහාම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර හෝ සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතුය.

11. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

12. බලපත්‍රලත් සියළුම කුකුළු මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් වෙළෙඳ සැල පිහිටි ස්ථානයේ බීමට සුදුසු ප්‍රමාණවත් ජලය ලබාදිය යුතුය.

13. සියළුම කුකුළු මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන්, බලපත්‍රලත් ස්ථානය සඳහා වන වෙළෙඳ සැල හෝ අළෙවි ස්ථාන හෝ ශ්‍රී ලංකා රජය විසින් හෝ නගරාධිපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් වසා තැබිය යුතු යැයි නිශ්චය කරනු ලබන දවස් හැර, සෙසු සෑම දවසකම මහා නගර සභාව විසින් තීරණය නොකළ විටක, පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා පමණක් විවෘත කර තැබිය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.
(14 – 23)

14. කවර හෝ තැනැත්තෙකු, වෙළෙඳ පොළ නොවන වෙනත් කිසියම් ස්ථානයක නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කුකුළු මස් විකිණීම පිණිස යම් ස්ථානයක් පාවිච්චි කිරීම නොකළ යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකි ශේෂ වන මස් අධිශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළෙඳ සැල විවෘත කරනු අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස, ශේෂ වන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ අධිශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ හෝ තබා ගැනීම නොකළ යුතුය.

16. කිසිම තැනැත්තෙකු බලපත්‍රලත් ස්ථානයේ කුමන කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතුය.

17. කිසිම තැනැත්තෙකු අදාළ කාර්යය සඳහා නියම කර ඇති පඩික්කම ඇතුළේ හැර, කුකුළු මස් වෙළෙඳ සැල තුළ කෙළ නොගැසිය යුතුය.

18. බලපත්‍රලත් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියා විසින් කුකුළු මස් විකිණීමෙහි දී, තමන් විසින් පිරිසිදු කරනු ලබන කුකුළු මස්වල අපද්‍රව්‍ය, මාර්ගයේ දෙපස හෝ පොදු ස්ථානවල හෝ ඉවත දැමීම නොකළ යුතුය.

19. කිසිම තැනැත්තෙකු මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් තැනින් තැනට ගෙන යමින් විකිණීම නොකළ යුතුය.

20. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානය, දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදා ගැනීම හෝ ආහාර ගැනීම හෝ කරන ස්ථානයක් ලෙසින් පාවිච්චි කිරීම නොකළ යුතු අතර, වෙනත් කවර හෝ තැනැත්තෙකුට එලෙස කිරීමට ඉඩදීම නොකළ යුතුය.

21. කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීමට හෝ නියුක්ත කරවීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

22. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකුව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

23. බලපත්‍රලත් ස්ථානයෙහි කුකුළු මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට හෝ පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර, කිසිම භාජනයක් හෝ ඇඳුමක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතුය.

මහා නගර සභාවේ කාර්යභාරය.
(24 – 25)

24. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ බලපත්‍රලත් ස්ථානයක ශීතකරණයේ තබා ඇති කිසියම් කුකුළු මසක් පරීක්ෂා කිරීමේ අරමුණින් එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කුකුළු මස් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට, බලපත්‍රලාභියා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

26. කිසියම් කුකුළු මස් අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 247(අ) වැනි උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවලින් මහා නගර සභාවේ නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. — බලය පැවරීම.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය. — බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවලින් පනවන ලද නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. — පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (29 – 32)

30. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය වියයුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

31. මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළයුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

32. මේ කොටසේ 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළහැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. — පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. — දඩ හා දණ්ඩන.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - — අර්ථ නිරූපණය හා නිර්වචන.

“නගරාධිපතිවරයා” යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

“නාගරික කොමසාරිස්වරයා” යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට,

නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම කාලයක් අදහස් වේ.

"කුකුළු මස් සැල හෝ කුකුළු මස් අළෙවි ස්ථානය" යන්නෙන්, කුකුළු මස් ඇතුළත්ව සජීවී කුකුළන් විකිණීමට තබා ඇති ස්ථානය අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

37. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**ඇමුණුම - 01**

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහාවන අයදුම්පත්‍රය - 20...... ... වර්ෂය.**

1. කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ නම: ..............................................................................

2. කුකුළු මස් වෙළෙඳ ස්ථානය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාසය: .......................... වරිපනම් අංකය: ........................

   (ii) වීථියේ / පාරේ නම: ..........................................................................................

   (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය: ........................ ................................ හා

   ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: ...................................................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: ..........................................................................................

   (ii) ස්ථිර ලිපිනය: ..........................................................................................

   (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය: .......................................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ......................................................................

   (v) දුරකථන අංකය: ..........................................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: ..............................................................................

4. (i) කුකුළු මස් වෙළෙඳාම ආරම්භ කළ දිනය: ....................................

5. (ii) කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ

   (අ) නම : ....................................................................................................

   (ආ) දුරකථන අංකය: ..................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

   (i) අයිතිකරුගේ නම: ..............................................................................

   (ii) ලිපිනය: ..............................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............. නැත: ............

   ඔව් නම්: බලපත්‍ර අංකය: ............................ දිනය: ............................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

....................................,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: .............................

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

....................................................................,

නාගරික කොමසාරිස්වරයා /බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස (මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය : ............................ වරිපනම් අංකය : .......................

වීථියේ / පාරේ නම : .........................................................................................

අයිතිකරුගේ නම : .........................................................................................

දේපලෙහි ස්වභාවය : .........................................................................................

වාර්ෂික වටිනාකම : රු. ...............................

හිඟ වරිපනම් මුදල : රු. ........................... ඇත : ............ නැත. : ..........

..............................,

පරිපාලන නිලධාරි.

දිනය : ...........................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය : ..........................................................................................

ගෙවිය යුතු ගාස්තුව : රු. ............................................................

ඒකකය A B C සටහන් :..................................................................

.................................,
ආදායම් පරීක්ෂක.

දිනය: ........................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................
..................... ..................... ....................... ..................................................................

.......................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය: ........................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................

................................................,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය: ..........................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ...................... ව්‍යාපාරයේ ස්වභාවය: .................. පාරිසරික බලපත්‍ර: ...............

MOH වාර්තාව:............. අනුකූලතා සහතිකය: ......... ......... මත්පැන් බදු බලපත්‍ර:............

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතුන් මත නිර්දේශ නොකරමි.

.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................

.......................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය: .........................

**නාගරික කොමසාරිස්වරයාගේ / ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.................................................................,
නාගරික කොමසාරිස් / ගණකාධිකාරී.

දිනය: .............................

අනුමත කරමි. / නොකරමි.

......................................................................,
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

දිනය: ........................

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ......................................   ලදුපත් දිනය: ..................................

බලපත්‍ර අංකය: ...........................................   බලපත්‍ර දිනය: .................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

......................................,
ආදායම් පරිපාලන නිලධාරි.

දිනය: ............................

නගරාධිපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

............................................................,
නාගරික කොමසාරිස් / ගණකාධිකාරී.

දිනය: ..............................

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

.........................................................................................,
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

දිනය: ..............................

**iii වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අලෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *(අතුරු ව්‍යවස්ථාවේ නාමය.)*

2. 1947අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂාවන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *(අරමුණ.)*

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267(1) වැනි වගන්තිය සමග කියවිය යුතු හා එකී පනතේ 272 වැනි සහ 23 වැනි වගන්තින් යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *(අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.)*

ඉටු කළයුතු කාර්යයන්.
(4-24)

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ කිරි පට්ටියකට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(i) එක් සත්ත්වයෙකු රඳවා තැබීමට අවම වශයෙන් වර්ග මීටර් 3.0ක් බැගින් වන සේ කිරි පට්ටියේ සිටින සත්ත්වයන් රඳවා තැබීමට ප්‍රමාණවත් ගොඩනැගිලි ඉදිකර තිබිය යුතුය.

(ii) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි බිත්තිවල උස මීටර් 1.0කට වඩා උසින් යුක්ත නොවිය යුතු අතර, ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ ඇලුමිනියමෙන් හෝ ලීයෙන් හෝ තනා දෙපැත්තම කපරාරු කර, තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iii) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවවලින් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් හෝ තනා තිබිය යුතු අතර, එකී කණුවල ඉහළ කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3ක් උසින් යුක්ත විය යුතුවාක් හැර, කණුවල තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iv) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, වහළය කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3ක් උසින් යුක්ත විය යුතුය.

(v) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිම සිමෙන්ති දමා තිබිය යුතුය.

(vi) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි මනා අළුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතුය.

(vii) කිරි පට්ටියේ සත්ත්වයන්ට පානය කිරීමට, සතුන් නැවීමට සහ ගොඩනැගිලි සේදීමට දූෂණය නොවූ ප්‍රමාණවත් ජල පහසුකම් සපයා තිබිය යුතුය.

(viii) සත්ත්වයන් නැවීමෙන් පසු බැහැර කරන ජලය හා සත්ත්වයන් රඳා තබන ගොඩනැගිලි සේදීමෙන් පසු බැහැර කරන ජලය, මූත්‍රා සහ වසුරු කොටස් උරා ගන්නා වළකට පහසුවෙන් ගලායන පරිදි සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට්වලින් තැනූ කාණු සකසා තිබිය යුතුය.

(ix) සත්ත්වයන්ගේ වසුරු, ඉතිරිවන තණකොළ සහ වෙනත් කෑම වර්ග ඉවත් කිරීම සඳහා වෙනම ම ස්ථානයක් ඉදිකර තිබිය යුතු අතර, එකී ස්ථානය සතුන් රඳවා තබන ගොඩනැගිලිවලින් සහ කිරි කාමරයෙන් යටත් පිරිසෙයින් මීටර් 10.0ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය. එසේම එකී ස්ථානය පොදු ජල මාර්ගයක හෝ ජලය ලබා ගන්නා කිසියම් ළිඳක සිට අවම වශයෙන් මීටර් 10.0ක් දුරින් පිහිටුවා තිබිය යුතුය.

(x) කිරි දොවන ස්ථානය සහ තාවකාලිකව කිරි ගබඩා කරන ස්ථානය සතුන් රඳවා තබන ස්ථානයෙන් අවම වශයෙන් මීටර් 6.0කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(xi) කිරි දොවන ගොඩනැගිල්ල ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ බැඳ දෙපැත්තම සිමෙන්තියෙන් මැද තිබිය යුතුය. එහි බිත්තිවල උස අවම වශයෙන් මීටර් 1.2ක් විය යුතු අතර, බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවවලින් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් හෝ තනා, තීන්ත ආලේප කර තිබිය යුතුය.

(xii) කිරි දොවන ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර, බිම සහ බිත්ති සම්බන්ධ වන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතුය. එසේම එකී ගොඩනැගිල්ලේ පියසි කෙළවර පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.8කට ඉහළින් විය යුතුය.

(xiii) කිරි දොවන ගොඩනැගිල්ලේ මේසයක් තිබිය යුතු අතර, එහි මතුපිට පිඟන් ගඩොල් හෝ පිරිද්දුම් නොමැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ වෙනත් යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ අතුරා තිබිය යුතුය.

(xiv) කිරි දොවන ස්ථානය තුළ සනීපාරක්ෂක කසළ භාජනයක් තිබිය යුතුය.

(xv) කිරි දොවන ගොඩනැගිල්ල, කිසියම් වැසිකිළියකින්, කසළ වළකින්, පොහොර ගොඩකින් හෝ පොහොර වළකින්, විවෘත කසළ කාණුවකින් යනාදියේ සිට යටත් පිරිසෙයින් මීටර් 10.0ක දුර ප්‍රමාණයක දුරකින් පිහිටා තිබිය යුතුය.

(xvi) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට යටත් පිරිසෙයින් මීටර් 20.0කට නොඅඩු දුරකින් රෝගීවන සතුන් රඳවා තැබීම සඳහා වෙනම ගොඩනැගිල්ලක් තබා තිබිය යුතු අතර, සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ නියමයන්ට අනුකූලව මේ ගොඩනැගිල්ල ද ගොඩනගා තිබිය යුතුය.

(xvii) රෝගී සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට ගලායන අපජලය අනෙක් සතුන් රඳවා තබන ගොඩනැගිල්ල දෙසට ගලා නොයන සේ කාණු නිර්මාණය වී තිබිය යුතුය.

(xviii) කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම්, එකී යන්ත්‍ර සහ දොවා ගන්නා කිරි රැස් කරන භාජන දිනපතා ජීවානුහරණය කිරීමට අවශ්‍ය උපකරණ සපයා තිබිය යුතුය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසකම අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

6. නිරෝගී සතුන් සහ රෝගී සතුන් රඳවා තබා ගන්නා ගොඩනැගිල්ලේ ගෙබිම සහ බිත්ති යටත් පිරිසෙයින් දිනපතාම එක් වරක් බැගින් සේදීමට සැලැස්විය යුතුය.

7. කිරි පට්ටිය සහ එහි වටපිටාව, කාණු, ලී බඩු හා උපකරණ පිරිසිදුව හා මනා අළුත්වැඩියා තත්ත්වයකින් තබාගත යුතුය.

8. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. කිරි පට්ටියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීම හා එකී සේවකයන් සියළුම අවස්ථාවන්හි දී, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. කිරි පට්ටියේ කිරි දෙවීමේ කාර්යයන්හි නියුක්තවීමට පෙර, ඔවුන් තමන්ගේ ඇඟපත සේදීම කළ යුතුය.

11. සතුන් රඳවා තබන ගොඩනැගිලි සහ කිරි දොවන කාමරයේ බිම සහ මේසය මතුපිට යටත් පිරිසෙයින් දිනපතාම එක් වරක් බැගින් සෝදා හැරීමට සැලැස්විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා සියළුම භාජන සහ කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම්, එකී උපකරණ ද යටත් පිරිසෙයින් දිනකට එක් වරක් බැගින් ජීවානුහරණය කළයුතු අතර, වෙනත් භාණ්ඩ සහ උපකරණ දිනපතාම පිරිසිදු කරවීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. කිරි පට්ටියේ ඇති කරන සෑම සතෙකුම යටත් පිරිසෙයින් වර්ෂයකට තුන් වතාවක් පශු වෛද්‍යවරයාගේ හෝ ඔහු විසින් නම් කරනු ලබන කවර හෝ නියෝජිතයෙකුගේ හෝ අධීක්ෂණයට ලක්කර, අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සහ එකී උපදෙස් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. කිරි පට්ටියේ කවර හෝ සතෙකුට කිසියම් රෝගයක් වැළඳී ඇති බව දැන ගන්නට ලැබුණු වහාම එකී සතාව, සතුන් රඳවන ගොඩනැගිල්ලෙන් ඉවත් කර, රෝගී සතුන් රඳවන ගොඩනැගිල්ලේ රැඳවීමට ක්‍රියා කිරීම සහ ඒ පිළිබඳව පශු වෛද්‍ය නිලධාරියා දැනුවත් කිරීමට ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ ප්‍රයෝජනය සඳහා ඇති තණකොළ හා පිදුරු හැර, සියළුම සත්ත්ව ආහාර මීයන්ට ඇතුළුවිය නොහැකිවන සේ සුදුසු භාජනවල තබා තිබිය යුතුය.

16. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

(ඇ) ඉහත (ආ) වැනි වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, (අ) වගන්තියේ (i) උප වගන්තියේ සඳහන් වන ජෛවභායන අපද්‍රව්‍ය අතරට ගැනෙන සත්ත්ව වසුරු සහ ඉතිරි වන තණකොළ කොටස්, පොහොර වශයෙන් යොදා ගැනීමට එකී නියමය බාධාවක් නොවිය යුතුය. කෙසේ වුවද, එකී අපද්‍රව්‍ය කිරි පට්ටියෙන් බැහැරට ප්‍රවාහනය කරනු ලබන්නේ නම්, ආවරණයක් සහිතව ප්‍රවාහනය කරන්නේ නම් මිස, කිරි පට්ටිය පිහිටා තිබෙන පරිශ්‍රයෙන් බැහැරව ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

17. දොවා ගන්නා කිරි තැන්පත් කර තැබීමට ඒ සඳහාම වෙන් වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර, එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිතවූ ද, මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන්ට සහ මීයන්ට ඇතුළුවිය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතුය.

18. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර, කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිළි තිබිය යුතුය. එසේම එකී වැසිකිළි, කිරි පට්ටියේ සතුන් රඳවා තිබෙන ගොඩනැගිලි, කිරි දොවන ස්ථානවල සහ කිරි තැන්පත් කරන කාමරවල සිට අවම වශයෙන් මීටර් 15.0ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය.

19. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතුය.

20. සෑම කිරි පට්ටිබලපත්‍රලාභියෙකුම, "තමන්ගේ නම" හා "බලපත්‍රලත් කිරි පට්ටිය" යන වාක්‍ය ත්‍රිවිධ භාෂාවෙන් ලියූ පුවරුවක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

21. සෑම කිරි පට්ටි බලපත්‍රලාභියෙකුම, නිකුත්කරනු ලැබූ බලපත්‍රයේ පිටපතක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතුය. ඒ සමග නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් කවර හෝ නිලධාරියෙකු හෝ විසින් ඕනෑම සාධාරණ වේලාවන්හි දී පරීක්ෂා කර බැලිය හැකි ආකාරයෙන් කිරි පට්ටියේ සියලුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් ඔහු විසින් තබාගත යුතුය.

22. ඉහත කී අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, කිරි නිෂ්පාදන සමුපකාර සමිති විසින් කිරි මිළ දී ගනිමින් විකුණන විටෙක, කිරි සපයන්නන් සඳහා නියමිත ආදර්ශ ආකෘතියේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතකට අයදුම් කිරීම හා අනු අංක යෙදූ කාඩ්පත

වාර්ෂිකවම නගරාධිපතිවරයාගෙන් ලබා ගැනීම කිරි පට්ටි පවත්වාගෙන යනු ලබන සමුපකාර සමිතිවල කාර්යය විය යුතුය. ඉහත කාඩ්පතේ කිරි සමුපකාර සමිතිවලට කිරි සපයන්නාගේ නම, ලිපිනය, භාරදෙන ස්ථාන යනාදිය සඳහන් කිරීම සමග කිරි සපයන්නාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතුය.

23. කිරි පට්ටියක සේවයේ නියුක්ත සියලුම සංචාරක කිරි වෙළෙඳුන් සඳහා නියමිත ආදර්ශ ආකෘතියේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතකට අයදුම් කිරීම හා අනු අංක යෙදූ කාඩ්පත වාර්ෂිකවම ලබා ගැනීම කිරි පට්ටිකරුගේ වගකීම හා කාර්යය විය යුතුය. ඉහත කාඩ්පතේ කිරි වෙළෙන්දාගේ නම, ලිපිනය හා විකිණීම් කරනු ලබන ස්ථාන යනාදිය සඳහන් කර, කිරි වෙළෙන්දාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතුය.

24. මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, බලපත්‍රලත් කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය එහි සාමාජිකයන්ගෙන් කිරි මිළ දී ගනිමින් විකුණන විටෙක, සමුපකාර සමිතියට කිරි සැපයුම්කරු, කිරි පට්ටිකරු ලෙසින් අදහස් කළ යුතුය. එසේම කිරි ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීම සඳහා කිරි තොගයම මිළ දී ගන්නා පෞද්ගලික ආයතන හා එම ආයතනවලට තොග කිරි විකුණම්කරු, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිරි පට්ටිකරු ලෙසින් අදහස් කළ යුතුය.

25. නගරාධිපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටියක් හෝ කිරි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(25–38)

26. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකුව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

27. කිරි දොවා ගැනීමට, කිරි තැන්පත් කිරීමට සහ කිරි ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා භාජන ඔප දැමූ මැටි, ගැල්වනයිස් කළ යකඩ හෝ ටින්, එනැමල් ආලේපිත යකඩ, මතුපිට සුමට කළ ඇලුමිනියම්, වීදුරු හෝ පෝසිලේන් යන කවර හෝ වර්ගයක භාජන යොදාගත යුතු අතර, එකී භාජන සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ ගබඩා නොකළ යුතුය.

28. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා භාජන, ඒවාට නියමිත කාර්යයට හැර, වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතුය.

29. කිරි දොවා ගැනීම ආරම්භ කිරීමට පෙර -

(i) කවර හෝ කිරි දෙනකගේ බුරුල්ල පිරිසිදු ජලයෙන් සේදීම කර;

(ii) කිරි දොවන්නා සබන් හෝ සබන් දියර හෝ යොදා තම දෑත සෝදා ගෙන;

(iii) යන්ත්‍රානුසාරයෙන් කිරි දෙවීම කරනු ලබන අවස්ථාවක, එකී උපකරණ ජීවාණුහරණය කර;

ඇත්තේ නම් මිස, කිරි දෙවීමට ඉඩදීම නොකළ යුතුය.

30. කිරි බුරුල්ලේ හෝ අන් තැනක හෝ ඇතිවන ක්ෂය රෝගයෙන්, තීව්‍ර ස්තන ප්‍රදාහයෙන්, කුර හා මුඛ රෝගයෙන්, අන්ත්‍රැක්ස් රෝගයෙන් හෝ කිරි බුරුල්ලේ ඇන්ටිනොමයිකෝසිස් රෝගයෙන් පෙළෙන හෝ බෲසෙල්ලෝසීස් රෝගයෙන් පෙළෙන බවට පශු වෛද්‍ය නිලධාරියා තීරණය කරන ලද යම් සතෙකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩදීම හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරිවලට එකතු කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

31. කිරි ගබඩා කර තැබීමේ සහ සකස් කිරීමේ කාර්යය හැර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා කිරි කාමරය යොදා ගැනීම හෝ යොදා ගැනීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

32. කවර හෝ තැනැත්තෙකු විසින් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ එකතු කිරීමෙන් කිරි බාල කිරීම නොකළ යුතුය.

33. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර, කිරි පට්ටියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතුය. එසේ වුවද, කිරි පට්ටියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් හෝ මෙයට ඇතුළත් නොවිය යුතුය.

34. කිරි පට්ටියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම්, එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18.0කට අඩු දුරකින් කසළ වළක් හෝ පොහොර වළක් හෝ අළු වළක් හෝ ස්ථානගත කර නොතිබිය යුතුය.

35. කිසියම් කිරි පට්ටියකින් ලබාගන්නා කිරි, දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ භාජන යොදා ගන්නේ නම් මිස, ඒ කිරි බලපත්‍රලත් ස්ථානයෙන් බැහැරව ගෙනයාම නොකළ යුතුය.

36. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් කිරි සමග ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයන් හෝ ද්‍රව්‍යයක් එකතු කිරීමෙන් කිරි බාල කිරීම හෝ බාල කළ කිරි විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ සංචාරයේ යෙදී විකිණීම හෝ භාරදීම හෝ නොකළ යුතුය.

37. (i) 1980 අංක 26 දරන ආහාර පනත යටතේ 1991.08.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී *ජනරජයේ ගැසට් පත්‍ර(අති විශෙෂ)* යෙන් පළ කරන ලද පහත 01 වැනි උපලේඛනයෙන් දක්වා ඇති කිරිවලට අවශ්‍ය කරන අවම වශයෙන් යම් ද්‍රව්‍යයක් එකතු නොකළ බාල කළ කිරි, කිරි ද්‍රව්‍යයන් කිසිවක් කවර හෝ බලපත්‍රලාභියෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

(ii) මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු, නරක් වූ නැතහොත් යම් ද්‍රව්‍යයක් එකතු කළ සම්පූර්ණ යොද සහිත කිරි කිසිවක් කිසිම තැනැත්තෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

38. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් පවත්නා වර්ෂය සඳහා නිකුත් කරන ලද කාඩ්පත ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු කිරි විකිණීම, තැනින් තැනට ගෙනයාම, විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

මහා නගර සභාවේ කාර්යභාරය.
(39 – 41)

39. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ කිරි පට්ටියක කිරි හෝ විකිණීම සඳහා තබා ඇති යම් සාම්පලයක්, එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

40. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කිරි පට්ටියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වුවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතුය.

41. මේ කොටසේ 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇති අවස්ථාවක, නියමිත හැඳුනුම්පත නිකුත් කිරීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ හෝ කාර්යය වන්නේය.

අයකිරීම් හා ගාස්තු.

42. කිරි පට්ටියක් පවත්වාගෙන යාම සඳහා 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 247(අ) වැනි උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

43. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. — බලය පැවරීම.

44. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය. — බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

45. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ මහා නගර සභාවේ බලයලත් කවර හෝ නිලධාරියෙකු හෝ විසින් කිරි පට්ටි බලපත්‍රලාභියෙකුගෙන් විකුණන, විකිණීම සඳහා තැනින් තැනට ගෙනයන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ යම් තැනැත්තෙකුගෙන් කවර හෝ වේලාවක පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා කිරි සාම්පලයක් ලබාගත හැකි අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා ඇති කරන යම් ලියාපදිංචි කිරි පට්ටිකරුවෙකු හෝ වෙනත් තැනැත්තෙකු වරදක් කරන්නේය. — පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (45 – 49)

46. සංචාරක කිරි වෙළෙඳුන්ට වාර්ෂිකවම නිකුත් කරනු ලබන හැඳුනුම්පත පරීක්ෂා කිරීම සඳහා බලයලත් මහා නගර සභා නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ විසින් ඉල්ලා සිටින විට, ඔහු විසින් පරීක්ෂා කිරීමට ඉදිරිපත් කිරීම පැහැර හරින අවස්ථාවක, ඔහු වරදකරු වන්නේය. ඒ නිලධාරියා විසින් ඔහුව අත්අඩංගුවට ගෙන අප්‍රමාදව ළඟම ඇති පොලිසියට ගෙන යා යුතුය. ඔහුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ වරෙන්තුවක් නොමැතිව පොලිස් නිලධාරියෙකු විසින් අත් අඩංගුවට ගනු ලැබුවාක් සේ, ඒ පොලිස් ස්ථානයේ, ස්ථානභාර නිලධාරියා විසින් ක්‍රියා කළ යුතුය. ඉහත කී හැඳුනුම්පත අවලංගු කිරීම මහජන සෞඛ්‍ය පිණිස අවශ්‍ය යැයි නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පෙනී ගියහොත්, ඒවා කවර අවස්ථාවක වුව ද, එසේ අවලංගු කරනු ලැබිය හැකිය.

47. කිරි සාම්පල ගන්නා විට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ බලයලත් මහා නගර සභා නිලධාරියා හෝ විසින් සාම්පල 3ක් ලබාගත යුතු අතර, ඒවා ලබාගනු ලැබූ ලියාපදිංචි කිරි පට්ටිකරු හෝ බලපත්‍රලාභියා හෝ ඉදිරිපිට දී ඒවාට මුද්‍රා තබා, ඉන් එකක් එකී ලියාපදිංචි කිරි පට්ටිකරුට තැනහොත් බලපත්‍රලාභියාට භාර දී, දෙවැන්න ප්‍රදේශයේ හෝ රජයේ රස පරීක්ෂකවරයාට ද, තුන්වැන්න මහා නගර සභා කාර්යාලයට ද යැවිය යුතුය. ඒ සාම්පලය ලබාගනු ලැබූ කිරි බාල කර තිබුණු බවට මහා නගර සභාව හෝ රජයේ රස පරීක්ෂකවරයා විසින් අත්සන් තබන ලද සහතිකය සාක්ෂියක් වන්නේය.

48. මේ කොටසේ 40 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

49. මේ කොටසේ 48 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනයට හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර හෝ ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

50. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. — පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

52. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 — දඩ හා දණ්ඩන.

වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

53. පද සම්බන්ධයෙන් අනාාර්ථයක් අවශ්‍යා වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කිරි පට්ටිය" යන්නෙන්, කිරි ලබා ගැනීමේ හා කිරි විකිණීමේ කාර්යය ප්‍රමුඛ වශයෙන් ක්‍රියාත්මක කිරීමට එක් වර්ගයක හෝ වර්ග එකකට වැඩි වර්ග ගණනක හෝ සත්ත්වයන් රඳවා තබා ගන්නා ගොඩනැගිලි ද, ඒ පරිශ්‍රය ද, අදහස් වන අතර එකී සත්ත්වයන් ද ඊට ඇතුළත් විය යුතුය.

"කිරි අළෙවි ස්ථානය" යන්නෙන්, කිරි මිල දී ගැනීමේ හා මිල දී ගෙන විකුණුම් කිරීමේ කටයුතු සිදු කෙරෙන ස්ථානය අදහස් වේ.

"පශු වෛද්‍ය නිලධාරියා" යන්නෙන්, මහා නගර සභා බල ප්‍රදේශය ආවරණ වනසේ පත් කරනු ලබන මහා නගර සභාවේ රජයේ පශු වෛද්‍ය නිලධාරියා අදහස් වේ.

"සත්ත්වයා" යන්නෙන්, එළ ගවයන්, මී ගවයන්, බැටළුවන් සහ එළුවන් යන වර්ගවලට අයත් සත්ත්වයන් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

54. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

උපලේඛන 01 - කිරිවල සංයුතිය

| I වැනි තීරය කිරි වර්ගය | | II වැනි තීරය කිරිවල නාමය | III වැනි තීරය ක්ෂීර මේදය අවම ප්‍රතිශතය | IV වැනි තීරය ක්ෂීර මේදය හැර ක්ෂීර ඝණද්‍රව්‍ය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1. | මී කිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 7.0 | 9.0 |
| 2. | එළකිරි | එම | 3.5 | 8.5 |
| 3. | ප්‍රමිත කළ | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 3.25 | 8.25 |
| 4. | සකස් කළ | එම | 2.0 | 8.5 |
| 5. | රස කළ | එම | 2.0 | 7.2 |
| 6. | යොදය රහිත හෝ මේදය රහිත | එම | - | 8.5 |

ඇමුණුම - 01

**මහා නගර සභා බලප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහාවන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. කිරි පට්ටියේ / කිරි අළෙවි ස්ථානයේ නම: ..................................................................

2. කිරි පට්ටිය / කිරි අළෙවි ස්ථානය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාසය: ........................... වරිපනම් අංකය:……………..

   (ii) වීථියේ / පාරේ නම: ......................................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: ........................................................... හා

   ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: ...................................................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: ..................................................................................................

   (ii) ස්ථිර ලිපිනය: ..................................................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය:.............................................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ..........................................................................

   (v) දුරකථන අංකය: ...............................................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: .....................................................................................

4. (i) කිරි පට්ටිය / කිරි අළෙවි ස්ථානය ආරම්භ කළ දිනය: ........................................

   (ii) කිරි පට්ටියේ / කිරි අළෙවි ස්ථානයේ කළමනාකරුගේ / නියෝජිතයාගේ -

   *(අ)* නම : .........................................................................................................

(ආ) දුරකථන අංකය: ..........................................................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

(i) අයිතිකරුගේ නම: ..........................................................................................

(ii) ලිපිනය: ..........................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............... නැත: .........................

ඔව් නම්: බලපත්‍රය අංකය: .................................... දිනය: ........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: .........................

.................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

..................................................................,
නාගරික කොමසාරිස්වරයා /බලයලත් නිලධාරියා.

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස (මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය: ........................................ වරිපනම් අංකය: ........................

වීථියේ / පාරේ නම: ..........................................................................................

අයිතිකරුගේ නම: ..........................................................................................

දේපළෙහි ස්වභාවය: ..........................................................................................

වාර්ෂික වටිනාකම: රු. ..........................................................................................

හිඟ වරිපනම් මුදල: රු. ................................ ඇත: .............. නැත.: .......................

දිනය: .....................

.................................,
පරිපාලන නිලධාරි.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ....................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ....................................................................

ඒකකය A B C සටහන්:....................................................................

දිනය: .......................

....................................,
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

........................................,
දිනය: ............................ මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

.......................................................,
දිනය: ............................. ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ............... ව්‍යාපාරයේ ස්වභාවය: ............. පාරිසරික බලපත්‍ර: ................

MOH වාර්තාව:............. අනුකූලතා සහතිකය: ............... මත්පැන් බදු බලපත්‍ර:............

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.
.......................................................................................................................................
.......................................................................................................................................
...........................................................................................................

.........................................,
දිනය: ............................ ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**නාගරික කොමසාරිස්වරයාගේ / ගණකාධිකාරිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.......................................................,
දිනය: ........................... නාගරික කොමසාරිස් / ගණකාධිකාරී.

**අනුමත කරමි. / නොකරමි.**

.........................................................................................,
නගරාධිපතිවරයා /නාගරික කොමසාරිස්වරයා / බලයලත් නිලධාරියා
දිනය: ............................

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ............................... ලදුපත් දිනය: ............................

බලපත්‍ර අංකය: .............................. බලපත්‍ර දිනය: ............................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

........................................,
දිනය: ...................... ආදායම් පරිපාලන නිලධාරී.

නගරාධිපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

....................................................,
දිනය: ...................... නාගරික කොමසාරිස් / ගණකාධිකාරී.

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

.........................................................................................,
දිනය: ...................... නගරාධිපතිවරයා/ නාගරික කොමසාරිස්වරයා /බලයලත් නිලධාරියා.

**iv වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යා ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනතේ 267(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා 272 වැනි වගන්තියේ 15 වැනි උපවගන්තිය හා 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන්.

(4 –19)

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(i) අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන් වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයෙකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග අඩි 80කට නොඅඩු ඉඩකඩක් තිබිය යුතුය. එකී කාර්යය පිණිස පාවිච්චි කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර, එය පිහන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතුය.

(ii) අවමංගල්‍යාය සේවා සැපයුම් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයට, බාහිර පුද්ගලයන් අවසරයකින් තොරව ඇතුළුවීම තහනම් කර තිබිය යුතුය.

(iii) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිතා කරනු ලබන කාමරයේ වර්ගඵලයෙන්, හතෙන් එක(1/7)කට නොඅඩු ප්‍රමාණයකට වූ කවුළු සකසා තිබිය යුතු වන අතර, එකී කාර්යයන්හි නියුක්තවීම

කිසිදු බාහිර පුද්ගලයෙකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතුය. එකී කවුළු අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති නිවාස දෙසට එක එල්ලේ විවෘත නොවී තිබිය යුතුය.

(iv) මෘත දේහයක් සකස් කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස්, තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු වන අතර, එකී කාර්යය කරන අවස්ථාවේ දී, මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම්, එකී අපජලය වැනි දෑ රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයෙන් භාජන තබා තිබිය යුතුය.

(v) බලපත්‍රලත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇති විට, කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන තැනැත්තන්ගේ වාහන නවත්වා තැබීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතුය.

(vi) ගෞරවය දැක්වීම පිණිස මෘත දේහයන් තැන්පත් කර තිබෙන ස්ථානය, ඒ අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙනම වෙන්කර තිබිය යුතුය.

(vii) මේ කොටසේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් තිබිය යුතුය.

5. අවමංගල්‍යය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකුම විසින් මේ කොටසේ පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පතක් නගරාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. මෘත දේහයන් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හය(06)ක් ගත වූ පසු, පොළොවේ මතුපිට සිට අඩි හතර(04)ක ගැඹුරු වළක, වළදමා මැනවින් වසා දැමිය යුතුය.

7. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් නියෝගයක් කර ඇති විටෙක, ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

8. මේ කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටෙක, සභාව විසින් කළින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය මහා නගර සභාවේ පොදු සුසාන භූමිය ඇතුළේ, එම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරක් සහිත වළක, වළදමා වසා දැමිය යුතුය.

9. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තරයෙන් විෂබීජනාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම කළ යුතුය. එසේම අවශ්‍ය වන විටෙක දී, කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනයට ලබාගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් උපකරණ තිබිය යුතුය.

10. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල සේවයේ යෙදෙන සියළුම සේවකයින්ට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුව වැසුම් හා අත් වැසුම් ලබාදීම හා මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේ දී, එකී සේවකයින් ඒ ඇඳුම්වලින් හා පැළඳුම්වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වගබලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථ ඇතුළත, අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක (vacuum cleaner) මගින් පිරිසිදු කර, විෂබීජ නාශක යොදා තිබිය යුතුය.

14. මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව, නිකුත් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම්, බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතුය.

15. මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, එකී ස්ථානයේ තැන්පත් කර තබන කිසියම් මෘත දේහයකට සහ එකී මෘත දේහයේ භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් එකී මෘත දේහය ප්‍රදර්ශනය කිරීම කළ යුතුය.

16. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

17. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය;
(ii) වීදුරු;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;
(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ සිට (vii) වැනි උපවගන්තිය දක්වා වන අපද්‍රව්‍ය යන්නට, කිසියම් මෘත ශරීර කොටස් ඇතුළත් නොවිය යුතු වන අතර, මෘත දේහයෙන් ඉවත් කරනු ලබන කිසියම් මෘත ශරීර කොටසක් හෝ කොටස් අවස්ථාවෝචිත පරිදි 6 වැනි හෝ 7 වැනි හෝ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයට බැහැර කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ඇ) ඉහත (අ) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහනගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නෙන්, බලපත්‍රලත් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන හෝ කිසියම් මෘත ශරීරයක් මහජන ගෞරවරය පිණිස තබා ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

19. බලපත්‍රලත් ස්ථානයේ දී හෝ වෙනත් කිසියම් බාහිර ස්ථානයක දී හෝ සිදු කරනු ලබන සෑම මෘත දේහ සැකසීමක් ම සහ අවමංගල්‍යාය සේවා සැපයීමක් ම පිළිබඳව මේ කොටසේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් පවත්වාගෙන යාම සහ එකී ලේඛනය නගරාධිපතිවරයා හෝ නාගරික

කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්. (20 –26)

20. නගරාධිපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

21. අධික වශයෙන් හානි සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර, වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහ සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිතා නොකළ යුතු ය.

22. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තෙකු හැර, වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතු ය.

23. ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස, කොළරාව, ඩෙංගු, මහාමාරිය, වසූරිය, කහඋණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහයක් බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

24. කිසියම් මෘත දේහයක් සැකසීමට සහ අවමංගල්‍ය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර, එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

25. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වන විටෙක හෝ එකී මරණය සැක සහිත වන විටෙක, මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම් මිස, එකී මෘත ශරීරය සැකසීම හෝ සැකසීම සඳහා භාර ගැනීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

26. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර හෝ කාර්යයක් අවමංගල්‍ය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදු කිරීමට හෝ එසේ කිරීමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය.

27. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වුවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් හෝ එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතු ය.

අයකිරීම් හා ගාස්තු.

28. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 247(අ) වැනි උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

බලය පැවරීම.

29. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය.

(31 – 32)

31. මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට (14) නොවැඩි විය යුතු ය.

32. මේ කොටසේ 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතරක් (14) ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ;

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ;

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ;

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ;

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ;

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ;

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ;

"අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය" යන්නෙන්, කිසියම් මෘත ශරීරයක් කල්තබා ගත හැකි වන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් අදහස් වේ;

"මෘත දේහ සැකසීම" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල්තබා ගත හැකි වන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම අදහස් වේ;

"මෘත ශරීර කොටස්" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැර වන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක්, මියගිය පුද්ගලයාගේ ශරීරයේ තිබූ කිසියම් අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලුම්පටි, පුළුන් හෝ වන යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

37. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**පළමුවන උපලේඛනය**

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම — 20...... වර්ෂය**

1. අයදුම්කරුගේ නම: ......................................................................................
2. ලිපිනය: ...................................................................................................
3. ජාතික හැඳුනුම්පතේ අංකය: ....................................................
4. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය: ..........................................................................
5. එක වරක දී සැකසීම පිණිස තබාගත හැකි මෘත දේහ සංඛ්‍යාව: .................
6. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව:................................
7. මෘත දේහ සැකසීමට පෙර, ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව:.............
8. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය:................
9. ගෞරව දැක්වීම පිණිස මෘත දේහය තැන්පත් කර තැබීම භාරගනු ලබන්නේ නම් -
   (i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව:..................
   (ii) ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද?....................
10. ස්වභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද? ඔව්./නැත.
11. ඉවතලන ස්වභාවික මල් හෝ ශාක කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය: ...........................................................................................
12. ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව:..........................

13. කළමණාකරුවෙකු පත්කර ඇත්නම්, ඔහුගේ -

(i) නම:...............................................................................

(ii) ජාතික හැඳුනුම්පතේ අංකය:..........................................

අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමට හා කලින් කල මහා නගර සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමටත් එකඟ වන බව මෙහි අත්සන් කිරීමෙන්ම පිළිගනිමි.

දිනය: .....................

.................................,
අයදුම්කරුගේ අත්සන.

**දෙවන උපලේඛනය**

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක හෝ වෙනත් බාහිර ස්ථානයක සැකසුම් කරනු ලබන මෘතදේහ පිළිබඳ තොරතුරු ලේඛනය**

| | | | | | මරණ සහතිකය ලියාපදිංචි කළ | | මෘත දේහය භාරගත් | | මරණකරුගේ ඥාති අයගේ විස්තර | | | | හදිසි මරණ පරීක්ෂකගේ නියෝගයේ | | මෘත දේහය බැහැර කළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | මියගිය අයගේ නම | ජා. හැ.පතේ අංකය | ස්ත්‍රී/ පුරුෂභාවය | මියගිය දිනය | අංකය | දිනය | දිනය | වේලාව | නම | මරණකරු වෙත ඇති සබඳතාව | ලිපිනය | ජා. හැ.පතේ අංකය | යොමු අංකය | දිනය | දිනය | වේලාව | ඥාතියාගේ අත්සන |
| 1. | | | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | | | |

**v වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *අතුරු ව්‍යවස්ථාවේ නාමය.*

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම, පීඩාවන් දමනය කිරීම හා කර්මාන්ත අපද්‍රව්‍යයන් නියාමනය කිරීම හා පාලනය කිරීම යනාදි අරමුණු සඳහා මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *අරමුණ.*

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා එකී පනතේ 272(5) වැනි වගන්තියේ (අ) හා (ආ) වැනි උපවගන්ති යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.*

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ කර්මාන්ත ශාලාවක් හා කර්මාන්තයක් පවත්වාගෙන යාමට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් ලැබිය යුතුය. *ඉටු කළ යුතු කාර්යයන්. (4 –12)*

(i) නියමිත ස්ථානය මනා අළුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ii) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැගිල්ලකට ම මනා වාතාශ්‍රය හා ආලෝකය ලැබෙන ආකාරයෙන් පැවතිය යුතුය. සෑම කාමරයකට ම විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට, ඒ කවුළුවල වර්ග ප්‍රමාණය ඒ කාමරයේ මතුපිට බිම් ප්‍රදේශයෙන් වර්ග ඵලයෙන් පහළොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතුය. කෙසේ වුවද, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යයන් සංවෘත ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම කළයුතු කර්මාන්ත ශාලා හෝ කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල වායු සමනය කර ඇති අවස්ථාවක, මෙම විධිවිධානය අදාළ නොවන බව අදහස් කළ යුතුය.

(iii) සෑම කාමරයක ම බිත්තිවල අවම උස මීටර් 2.14ට අඩු නොවිය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇති අවස්ථාවක, ඒවා බදාම යොදා කපරාරු කර ඇතුල් පැත්තේ තීන්ත ආලේප කර තිබිය යුතුය. නැතහොත් ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමඟ ලෑලි යෙදූ බිත්ති නිමකර ඇති අවස්ථාවක, ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iv) ස්ථානයේ වූ සෑම කාමරයක ම ඇතුල් වහළ (සීලිම) සවිකර තිබිය යුතු අතර, එකී ඇතුල් වහළ පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් දෙක(2.0)කට නොඅඩු උසකින් තිබිය යුතුය.

(v) වහළයට යොදන ලද යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත හෝ ආලේප කර තිබිය යුතුය.

(vi) ගෙබිම සිමෙන්ති දමා සිමෙන්තියෙන් මැද තිබීම හෝ පිහන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(vii) කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දස දෙනෙකුට ම, එකක් බැඟින් වන සේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන ප්‍රමාණවත් වැසිකිළි හා කැසිකිළි තිබිය යුතුය.

(viii) නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව අප ජලය පවිත්‍රකරණය කටයුතු සිදුකිරීම කළ යුතුය.

(ix) නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමෙන් පසුව බැහැර කරන අප ජලය පවිත්‍රකරණයට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අප ජලය නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා හෝ විසින් නිර්දේශ කරනු ලබන ආකාරයෙන් උරා ගන්නා වළකට ගලායාමට සැලැස්විය යුතුය. එසේම එකී උරා ගන්නා වළ වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර ආසන්නයේ ඇති පොදු ජල මාර්ගයක සිට හෝ ඉදිකර ඇති ළිඳක සිට හෝ මීටර් පනහ(50) කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(x) කර්මාන්ත ශාලාව සඳහා භාවිතා කරන ගොඩනැගිල්ලට, ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇති කර තිබිය යුතුය.

(xi) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය සඳහා පාවිච්චි කරන කාමරවලින් සහ සේවකයන්ගේ නාන කාමරවලින් බැහැර කෙරෙන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් ඇති කර තිබිය යුතුය.

(xii) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය, වෙනත් රසායනික ද්‍රව්‍ය, කිසියම් නිෂ්පාදනයක් ඇසිරීම සඳහා යොදා ගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා අවම වශයෙන් එක් කාමරයක්වත් වෙනම සපයා තිබිය යුතු අතර, එකී කාමරය මීයන්ගෙන්, කෘමීන්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතුය.

(xiii) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරන නිෂ්පාදනයන් මනුෂ්‍ය පරිභෝජනයට හෝ සත්ත්වයින්ගේ පරිභෝජනයට හෝ සඳහා වන ආහාර හෝ පාන වර්ගයක් වන විට, ඒ සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර, අවම වශයෙන් සෑම මාස හය(06)කට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ස්ථානයේ පාවිච්චිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය එකී නිෂ්පාදන සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතුය.

(xiv) කර්මාන්ත ශාලාවේ පාවිච්චියට ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් සහ මදුරුවන් සහ වෙනත් කීටයන් බෝවීමෙන් වළක්වාලීම පිණිස ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී ජලය භූගත ජල ටැංකියක ගබඩා කර තබන අවස්ථාවක, එකී ස්ථානයේ සිට කර්මාන්ත ශාලාවේ ඉදි කරනු ලබන කසළ වළක් හෝ පොහොර වළක් හෝ අළු වළක් හෝ මීටර් දහඅටකට (18) ඔබ්බෙන් වූ දුරක ස්ථානගත කර තිබිය යුතුය.

(xv) කලින් පාවිච්චි කළ ඇසුරුම් සේදීම සඳහා යොදා ගන්නා ස්ථානය, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය කරන කාමරවලින් වෙන්ව ස්ථානගත කර තිබිය යුතු අතර ඉහත (xiii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතුය.

(xvi) කර්මාන්ත ශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය මේ කොටසේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට වර්ග කර, බැහැර කළ හැකි ආකාරයෙන් වෙන් කළ භාජන හෝ ටැංකි හෝ තිබිය යුතුය.

5. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම කොටසක් ම කටු පඳුරු හෝ වල් පඳුරුවලින් තොරව පවත්වා ගැනීම සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් හෝ බෝවන ආකාරයෙන් ජලය රැඳී තිබීම වැළැක්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

6. මේ කොටසේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

7. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අළුත්වැඩියා තත්ත්වයකින් තබාගත යුතුය.

8. නිෂ්පාදන වර්ග ඇසුරුම් කිරීමට පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කර, නැවත පාවිච්චි කරමින් නිපැයුම් ඇසිරීම සඳහා එකී ඇසුරුම් යොදා ගන්නා කිසියම් කර්මාන්ත ශාලාවක හා කර්මාන්තයක එකී පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කිරීමේ දී -

(අ) එකී ඇසුරුම්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද, සහ

(ආ) එකී ඇසුරුම් අවසාන වටයේ පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද,

යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිතා කළයුතු අතර, එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මඟින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

9. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ නියුක්ත සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයින් නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවහායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය:

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

11. කර්මාන්ත ශාලාවේ පිහිටීම, මධ්‍යම පරිසර අධිකාරියේ, නාගරික සංවර්ධන අධිකාරියේ සහ කර්මාන්ත ශාලා ආඥාපනතේ රෙගුලාසිවලට යටත්ව තිබිය යුතුය.

12. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(13 – 19)

13. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්තයක් හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

14. දුර්ගන්ධය හෝ විෂ සහිත කිසියම් වායු වර්ගයක් බැහැරට විසිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වෝපායයන් සලසා ඇත්තේ නම් මිස, යම් විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් හෝ මතුවන කිසියම් ද්‍රව්‍යයක් කර්මාන්ත ශාලා හා කර්මාන්ත පරිශ්‍රයක් තුළ ගබඩා කිරීම හෝ පාවිච්චියට ගැනීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

15. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කළින් කළ කරනු ලබන සංශෝධනයන්ට අනුව ශබ්ද දූෂණයක් විය හැකි සීමාවට වඩා අඩු සීමාවක ශබ්ද පාලනයක් පවත්වාගෙන ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක ශබ්ද නිපදවීමක් ඇති වන කිසියම් යන්ත්‍රසූත්‍ර හෝ වාෂ්ප බොයිලේරු හෝ ක්‍රියාත්මක කිරීමේ දී, ශබ්ද උපදවන වෙනත් යම් ආකාරයක යන්ත්‍රයක් පාවිච්චි නොකළ යුතුය.

16. යම් උඳුනකින් උත්පාදනය වන දුම් පිට කිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කළින් කළ කරනු ලබන සංශෝධනයන්ට අනුව, දුම් කවුළුවක් තනා ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක දුම් උත්පාදනය කෙරෙන යම් උඳුනක් පාවිච්චියට ගැනීම නොකළ යුතුය.

17. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ කර්මාන්තයක හෝ නියුක්ත කම්කරුවන් හෝ සේවා නියුක්තිකයන් හෝ කැඳවීමේ කාර්යයන් ආරම්භ කිරීමේ හෝ කාර්යයන් අවසන් කිරීමේ සංඥා කිරීමක් හෝ වෙනත් කිසියම් කරුණක් සඳහා යම් වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් හෝ භාවිතා කිරීම හෝ පාවිච්චි කිරීම හෝ නොකළ යුතුය. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දින වන විටත්, ඒ ආකාරයේ වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් පාවිච්චි කරනු ලබන කිසියම් කර්මාන්ත ශාලාවක් වන විට, එකී කර්මාන්ත ශාලාවේ පාවිච්චි කරනු ලබන එකී කැඳවීම් සංඥා මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව නිවැරදි කිරීමට එකී දින සිට මාස තුනක කාලයක් හිමිවන අතර, එදිනෙන් පසුව එකී කැඳවීම් සංඥා පාවිච්චි කිරීම නොකළ යුතුය.

18. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ කර්මාන්තයක හෝ පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය කවර හෝ අවස්ථාවක පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතුය.

19. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රලත් මුත්, කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, සේවයෙහි නියුක්ත නොවිය යුතුය.

මහා නගර සභාවේ කාර්යභාරය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කර්මාන්ත ශාලාවක් හා කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර, එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

21. කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්තයක් හෝ පවත්වාගෙන යාම සඳහා 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 247(අ) වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

බලය පැවරීම.

22. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

23. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටි හා අධිකාරිය.

(24-27)

24. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

26. මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

27. මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

28. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන.

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික හෝ නිෂ්පාදන හෝ කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කර්මාන්ත ශාලාව" යන්නට, 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන අතර, කිසියම් අමුද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් අදහස් වේ.

32. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**ඇමුණුම - 01**

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහාවන අයදුම්පත්‍රය - 20...... වර්ෂය**

1. කර්මාන්ත ශාලාවේ/කර්මාන්තයේ නම: ...................................................................

2. කර්මාන්ත ශාලාව/කර්මාන්තය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාසය: .................. වරිපනම් අංකය: ..........................

   (ii) වීථියේ / පාරේ නම: ..........................................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: ............................................................. හා

   ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: ................................................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: ........................................................................

   (ii) ස්ථිර ලිපිනය: ............................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය: ........................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ......................................................

   (v) දුරකථන අංකය: .........................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: .................................................................

4. (i) කර්මාන්ත ශාලාව/කර්මාන්තය ආරම්භ කළ දිනය: ...................

   (ii) කර්මාන්ත ශාලාවේ / කර්මාන්තයේ, කළමනාකරුගේ / නියෝජිතයාගේ -

   (අ) නම : .............................................................................

   (ආ) දුරකථන අංකය: ..............................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

   (i) අයිතිකරුගේ නම: .......................................................................

   (ii) ලිපිනය: .......................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............. නැත: ............

   ඔව් නම්: බලපත්‍රය අංකය: ..................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: ........................ ................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

............................................................,
නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස (මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය: .......................... වරිපනම් අංකය: ...................................

වීථියේ / පාරේ නම: ........................................................................................................

අයිතිකරුගේ නම: ..........................................................................................................

දේපලෙහි ස්වභාවය: .......................................................................................................

වාර්ෂික වටිනාකම: රු. ......................................................

හිඟ වරිපනම් මුදල: රු. ....................... ඇත: .................... නැත.: .................

දිනය: ............................ .

................................,
පරිපාලන නිලධාරී.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ....................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ...................................................................

ඒකකය A B C සටහන්:......................................................................

දිනය: ........................... .

.......................................
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

දිනය: .......................... .

......................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

දිනය: ....................... .

...................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ................ ව්‍යාපාරයේ ස්වභාවය: .............. පාරිසරික බලපත්‍ර: ....................

MOH වාර්තාව:.......... අනුකූලතා සහතිකය: ................ මත්පැන් බදු බලපත්‍ර:................

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නොකරමි.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

දිනය: ....................... .

.......................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**නාගරික කොමසාරිස්වරයාගේ / ගණකාධිකාරිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: ......................... .

.............................................................,
නාගරික කොමසාරිස් / ගණකාධිකාරී.

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: .......................... .

....................................................................................................,
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ................................... ලදුපත් දිනය: ............................................

බලපත්‍ර අංකය: .................................. බලපත්‍ර දිනය: ...........................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: ........................ .

..........................................,
ආදායම් පරිපාලන නිලධාරී.

නගරාධිපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය: ......................... .

...........................................................,
නාගරික කොමසාරිස් / ගණකාධිකාරී.

**බලපත්‍රය අත්සන් කරන ලදී**

දිනය: ......................... .

....................................................................................................,
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/ බලයලත් නිලධාරියා.

## 8 වැනි පරිච්ඡේදය

**i වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ වර්තමාන කාලයේ ආපදා කළමනාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. අතුරු ව්‍යවස්ථාවේ නාමය.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවීමට ඉඩ ඇති ආපදා අවස්ථා අවම කිරීම, එවැනි යම් ආපදාවක දී අපහසුතාවට පත්වන්නන්ට හෝ පත්වීමට ඉඩ ඇති තැනැත්තන්ට සහන සැලසීම සහ මහා නගර සභා බල ප්‍රදේශයේ ආපදා අවස්ථාවක දී ඊට මුහුණ දීමට හැකිවන අයුරින් පූර්ව සූදානම් කිරීම සඳහා ද, ආපදා අවදානම අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු පූර්ව ආපදා ක්‍රියාදාමයන් සඳහා ද, ඊට සම්බන්ධ හෝ අනුෂාංගික සියළු කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අරමුණ.

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 272 වැනි වගන්තියට අනුකූලව, 188(1) වැනි වගන්තියේ (ඕ) වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

4. මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණය කිරීම සහ එවැනි යම් ආපදා තත්ත්වයක් ඇති වූ විට, එම ආපදාවන්ට ලක් වූ හෝ ලක්විය හැකි තැනැත්තන්ට සහන සැලසීම හා ආපදා අවදානම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු පූර්වෝපායන් නිර්ණය කිරීම යනාදි කටයුතු සඳහා මහා නගර සභාවේ ආපදා කළමනාකරණ කමිටුව පිහිටුවිය යුතු ය. ඉටු කළ යුතු කාර්යයන්. (4 –25)

5. **කමිටුවේ සංයුතිය -**

(අ) 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව 22කට නොවැඩි විය යුතු අතර කාන්තාවන් ද නියෝජනය වන පරිදි එම සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(i) කමිටුවේ සභාපතිවරයා වශයෙන් මහා නගර සභාවේ නගරාධිපතිවරයා;

(ii) කමිටුවේ ලේකම්වරයා වශයෙන් මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා;

(iii) මහා නගර සභාවේ උපනගරාධිපතිවරයා සමඟින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස මහා නගර සභාවේ සභා රැස්වීමෙහි දී ඉදිරි වර්ෂය සඳහා ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන මහා නගර සභාවේ සභිකයන් තුන් දෙනෙකු;

(iv) මහා නගර සභාවේ තාක්ෂණ නිලධාරී;

(v) මහා නගර සභාවේ ගිනි නිවීමේ අංශයේ ස්ථානභාර නිලධාරියා / ප්‍රධාන ගිනි භට;

(vi) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ පත් කරනු ලැබ ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(vii) මහා නගර සභා බල ප්‍රදේශයට ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ/ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයා/ප්‍රාදේශීය ලේකම්වරුන් හෝ විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(viii) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නියෝජිතයෙකු;

(ix) මහා නගර සභා බල ප්‍රදේශයට ඇතුළත් වන පොලිස් ස්ථානාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(x) අවම වශයෙන් මහා නගර සභා ප්‍රදේශයේ ක්‍රියාන්විත නාගරික සංවර්ධන උපදේශක කමිටුවේ නියෝජිතයන් තුන් දෙනෙකු;

(xi) මහා නගර සභා බල ප්‍රදේශයේ රජයේ පාසල් ඇතුළත් වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(xii) මහා නගර සභා බල ප්‍රදේශයට අයත් වාණිජ මණ්ඩලයේ හෝ වෙළෙඳ සංගමයේ හෝ නියෝජිතයෙකු;

(xiii) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි අධිකාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xiv) ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ස්ථානභාර නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xv) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උතුරු පළාතේ ඩිපෝ කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xvi) උතුරු පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජිතයෙකු;

(xvii) උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(ආ) මහා නගර සභාවේ සභිකයින් ධුරය හිස් කිරීම මත කමිටුවේ සාමාජික ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන යම් අවස්ථාවක, එසේ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පවත්වනු ලබන සභාවේ ඊළඟ රැස්වීමේ දී, එකී පුරප්පාඩුව සඳහා සභාවේ වෙනත් යම් සභිකයෙකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර, එසේ තෝරා පත්කර ගනු ලබන සභිකයාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින වන තෙක්, ඒ සාමාජික ධුරයේ කටයුතු කරනු ලැබිය යුතුය.

(ඇ) ඉහත 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv),(v) සහ (ix) වැනි උපවගන්තිවල සඳහන් කවර හෝ නිලධාරියෙකු විසින් යම් කමිටු රැස්වීමකට පෞද්ගලිකව සහභාගීවීමට නොහැකි වන අවස්ථාවක, ඔහු විසින් නම් කරනු ලබන හා ඔහුගේ රාජකාරි ආවරණය කරනු ලබන වෙනත් නිලධාරියෙකු ආයතන ප්‍රධානියාගේ අනුදැනුම ඇතිව කමිටු රැස්වීමට සහභාගි කරවිය හැකිය.

6. (i) අවම වශයෙන් සෑම මාස දෙකකට එක් වරක් හෝ කමිටුවේ සාමාන්‍ය රැස්වීමක් පැවැත්විය යුතු ය. කමිටුවේ සභාපතිවරයා විසින් උචිත යැයි අදහස් කරනු ලබන යම් අවස්ථාවක කමිටුවේ විශේෂ රැස්වීම් කැඳවීමට කමිටුවේ සභාපතිවරයාට බලය තිබිය යුතු ය.

(ii) කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය, මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ ඔහු නොමැති යම් අවස්ථාවක මහා නගර සභාවේ උපනගරාධිපතිවරයා හෝ විසින් දරනු ලැබිය යුතු ය. මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ උපනගරාධිපතිවරයා යන දෙදෙනාටම යම් කමිටු රැස්වීමකට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) (iii) වැනි උපවගන්තියේ සඳහන් මහා නගර සභාවේ සභිකයින් අතුරින් කෙනෙකු එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(iii) කමිටුවේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය, මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(iv) කමිටුව විසින් ගනු ලබන සෑම තීරණයක්ම, එදින රැස්වීමට පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(v) කමිටුව විසින් ගනු ලබන තීරණ සඳහා ඡන්ද ගණන සමාන වුවහොත්, තීරක ඡන්දයක් කමිටුවේ සභාපතිවරයාට හිමි විය යුතු ය.

(vi) කමිටුවේ දී ගනු ලබන තීරණ කමිටුවේ ලේකම්වරයා විසින් වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර, කමිටුවේ ඊළඟ රැස්වීමේ දී අවශ්‍ය විය හැකි සංශෝධන ද සමඟ ඒවා ස්ථිර කරනු ලැබූ විට, කමිටුවේ මූලාසනය දරනු ලබන තැනැත්තා විසින් එයට අත්සන් තැබිය යුතු ය.

7. කමිටුවේ කිසිදු ක්‍රියාවක් හෝ කාර්යයක් හෝ ඒ කමිටුවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පවතීමේ හෝ එහි යම් සාමාජිකයෙකු තෝරා පත්කර ගැනීමේ දී, යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුව නිසා පමණක් අවලංගු හෝ බල රහිත වන ලෙස නොසැලකිය යුතු ය.

8. කමිටුවේ සෑම රැස්වීමකම වාර්තා, එළඹෙන මහා නගර සභාවේ සභා රැස්වීමේ දී දැන ගැනීම පිණිස සභාගත කළ යුතු ය.

9. කමිටුව විසින් මහා නගර සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන යම් නිර්දේශ වන්නේ නම්, ඒවා සම්බන්ධයෙන් මහා නගර සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, මහා නගර සභාව විසින් සලකා බලනු ලැබිය හැකිය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ සඳහන් කාර්යයන් කමිටුවේ කාර්යය විය යුතු ය.

11. (i) නගරාධිපතිවරයා විසින් මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළෙඳ ස්ථානයක හෝ දෛනික කාර්යයන් අවසානයේ එකී කාර්යාලය හෝ වෙළෙඳ ස්ථානය හෝ වසා දැමීමට පෙර, ඒ පරිශ්‍රය ඇතුළත දල්වා තබන ලද -

*(අ)* භූමිතෙල් භාවිතා කරන ලාම්පුවක්;

*(ආ)* පොල්තෙල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් දල්වා තබනු ලබන යම්කිසි පහනක්;

*(ඇ)* හඳුන්කූරක් හෝ එවැනි වෙනත් යම් දෙයක්;

*(ඈ)* එවැනි විවෘත දැල්ලක් සහිත වෙනත් යම් දෙයක්;

නිවා දැමීම කළයුතු බවට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(ii) මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළෙඳ හිමිකරු හෝ සඳහන් කරන ලද එකී යම් ස්ථානයක තත් කාලයේ භාරකරු හෝ විසින් ඉහත 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් නියමය පිළිපැදීමට යටත් තැනැත්තා වන අතර ඔහු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු ලවා හෝ එසේ කිරීමට සැලැස්වීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

12. (i) මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පෙර ආපදාවලට ලක් වූ හා ලක්විය හැකි ප්‍රදේශයන් දැක්වෙන සිතියම් සකස් කර, දත්ත ගබඩාවක් පවත්වාගෙන යායුතු අතර මහජනයාගේ දැන ගැනීම පිණිස ප්‍රදර්ශනය කළ යුතු ය.

(ii) මහා නගර සභා බල ප්‍රදේශයේ ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි ස්ථාන සිතියම්ගත කිරීම හා ඒ පිළිබඳව මහජනයා පුළුල් ලෙස දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.

(iii) ආපදා අවදානම් ස්ථාන පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස භාෂා ත්‍රිත්වයෙන් පුවරු සවිකර යාවත්කාලීන කළ යුතු ය.

(iv) ආපදාවට ලක්විය හැකි බවට හඳුනාගත් ප්‍රදේශවල සිදුවිය හැකි ආපදා අවම කිරීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදාළ අනෙකුත් ආයතන දැනුවත් කර, ඔවුන්ගේ ද සහය ඇතිව ආපදා අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු ය.

13. (i) සියළුම සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් අදාළ අනුමැතිය ලබාදීමේ දී, අදාළ ප්‍රදේශයේ පවතින ආපදා තත්ත්වයන් පිළිබඳ ඇගයීම හා ආපදා අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මගින් ලබාගත යුතු අතර, අධි අවදානම් තත්ත්වයන්ට ලක්විය හැකි වන්නේ නම්, ආපදා අවම කිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත කොට වරලත් වාස්තු විද්‍යාඥයෙකුගේ / භූ විද්‍යාඥයෙකුගේ සහතිකයක් සහිතව සැලැස්මක් ඉදිරිපත් කළ යුතු ය.

(ii) මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත ග්‍රාම නිලධාරී වසම් මට්ටමින්, දැනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පිහිටුවා ඇති ආපදා කළමනාකරණ කමිටු සමඟ සම්බන්ධව කටයුතු කළ යුතු ය.

14. ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධ කර ගෙන, ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීම සඳහා දැනට රජයේ ක්‍රියාත්මක වන ක්‍රමවේදය තුළට සම්බන්ධ වී කටයුතු කළ යුතු ය.

15. ආපදා තත්ත්වයන් සිදුවීමට ඉඩ තිබෙන බවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව කමිටුව විසින් හඳුනාගනු ලැබූ,

(i) ආපදා අවදානම් කලාපය, ඒ එක් එක් කලාපයට ආපදා ඇති වීමට බලපාන හේතු සහ ප්‍රදේශ ආපදාවක දී, එයින් පීඩාවට පත්වන්නන් ඉවත් කර ගැනීමට වඩාත් සුදුසු මාර්ග හා අවතැන් වූවන් තාවකාලිකව රඳවා තැබිය හැකි ස්ථාන කවරේ ද, යන්න පහසුවෙන් සොයාගත හැකි ආකාරයට සිතියම්ගත කිරීම සහ එම සිතියම් යාවත්කාලීනව පවත්වා ගැනීම කළ යුතු ය.

(ii) ආපදා අවදානම් කලාප ඇතුළත පදිංචි ජනතාවගේ ජන ජීවිතයට කිසියම් බලපෑමක් ඇති කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් වෙන් වෙන්ව නිශ්චිතව හඳුනාගෙන තිබිය යුතු ය.

(iii) ආපදා අවදානම් කලාප ඇතුළත මහා පරිමාණයේ ආපදාවක් හේතුවෙන් අවතැන්වීමට ඉඩ තිබෙන පවුල් තාවකාලිකව පදිංචි කරවීම සුදුසු බවට කමිටුව විසින් හඳුනාගනු ලැබ තිබෙන ස්ථානවලට අවශ්‍ය උපකරණ සපයා ගැනීම සඳහා අදාළ ආයතන හඳුනාගෙන තිබිය යුතු ය.

(iv) ආපදා අවදානම් තත්ත්වයන් අවම කිරීම සහ ආපදාවලට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා කාර්යයන් කමිටුවේ සාමාජිකයන්, ප්‍රජාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ වෙනත් පාර්ශ්වකරුවන් සමඟ එක්ව හඳුනාගෙන ක්‍රියා කළ යුතු ය.

(v) ආපදා අවදානම් තත්ත්වයන් අවම කිරීම හා ආපදාවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමේ ප්‍රමුඛතා සැලැසුම් කිරීම සහ එකී සැලැසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

(vi) ආපදා තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එහි පදිංචි ජනතාවට සහන සැලසීම සඳහා කමිටුව විසින් හඳුනා ගෙන ඇති කණ්ඩායමේ සාමාජිකයින්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහය ඇතිව සහන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

16. (i) ව්‍යසන සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන තාක්ෂණික ආයතනවල උපදෙස් මත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිකුත් කරනු ලබන පූර්ව අනතුරු ඇඟවීම් වාර්තා තබා ගැනීම සඳහා මහා නගර සභාවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ නිශ්චිතව යෙදවීම මහා නගර සභාවේ කාර්යභාරය වන්නේය.

(ii) මහා නගර සභා බල ප්‍රදේශයට බලපෑ හැකි උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදන, ආපදා කළමනාකරණ කමිටුවට හෝ කමිටුවේ සභාපතිවරයාට හෝ කමිටු සාමාජිකයන්ට හෝ දැනුම්දීම, කාර්යය පවරන ලද නිලධාරියාගේ හෝ සේවකයාගේ හෝ වගකීම වන්නේය.

(iii) මහා නගර සභා ප්‍රදේශයේ කිසියම් ආපදා අවදානම් කලාපයක ආපදා අවදානමක් ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවක හෝ එවැනි අවදානමක් ඇති වී තිබෙන අවස්ථාවක, අවදානමට ලක්වීමට ඉඩ ඇති හෝ අවදානමට ලක් වූ තැනැත්තන් වෙත සහන සැලසීම සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේ ද, යන්න තීරණය

කිරීම එම කමිටුව විසින් කරනු ලැබිය හැකිය. ආපදාවන්ට ලක්වූවන්ගේ ජීවිත ආරක්ෂාව, ආහාර, පානීය ජලය, ඇඳුම්, සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ යන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තීරණයක් හෝ තීරණ ගැනීම සඳහා කමිටුව රැස්කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව කමිටු සභාපතිවරයාගේ මතය වන විට, ඒ අවස්ථාවේ දී කළයුතු සහන සැලසීම පිළිබඳ තීරණ ගැනීමට කමිටු සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද, තමා විසින් ගනු ලැබූ තීරණය හෝ තීරණ කවරේ ද, යන්න දින තුනක් ඇතුළත කැඳවනු ලබන කමිටු රැස්වීමේ දී ඉදිරිපත් කිරීම කමිටු සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(iv) මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට කමිටුව හෝ කමිටුවේ සභාපතිවරයා හෝ විසින් ගනු ලැබූ තීරණයක් හෝ තීරණ යටතේ ආපදාවට ලක් වූ තැනැත්තන්ට සහන සැලසීම කළ හැකි අතර, ඒ සඳහාවන වියදම් මහා නගර සභා අරමුදලෙන් වියදම් කරනු ලැබිය හැකිය.

(v) මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට කමිටුව හෝ කමිටුවේ සභාපතිවරයා හෝ විසින් ගනු ලැබූ තීරණ, එකී තීරණවලට අනුව මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ඒ වෙනුවෙන් සභා අරමුදලෙන් දරනු ලැබූ වියදම් කොපමණ ද, යන්න පිළිබඳව කමිටුව විසින් පිළියෙල කළ සවිස්තර වාර්තාවක් එකී කාර්යයෙන් පසුව එළඹෙන මහා නගර සභාවේ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම කමිටුවේ කාර්යය විය යුතුය.

17. මහා නගර සභා බල ප්‍රදේශයේ ස්වභාවික ආපදාවලට ගොදුරු විය හැකි ඉඩම් මෙන්ම, $30^0$ට වැඩි වූ බෑවුම් සහිත ඉඩම් හඳුනා ගැනීම සඳහා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ලබාදිය යුතුය.

18. මහා නගර සභා ප්‍රදේශයේ ජල ගැලීම්වලට පාත්‍රවන ප්‍රදේශ හඳුනාගෙන සිතියම්වල සළකුණු කිරීම හා එම එක් එක් ප්‍රදේශවල උපරිම ජල මට්ටම, වර්ෂාපතනය හා අනෙකුත් සාධක පාදක කර ගත් විද්‍යාත්මක ක්‍රමවේදයකින් හෝ පසුගිය අත්දැකීම් හෝ මත තීරණය කර, නිවාසවල අත්තිවාරම් මට්ටම සඳහා අනුමැතිය ලබාදිය යුතුය.

19. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පතිත වන වර්ෂා ජලය බාධාවකින් තොරව ගලා යැමට හැකිවන ආකාරයෙන් මතුපිට ජලාපවහන පද්ධතිය ඉදිකිරීම, නඩත්තුව සහ වැසි ජලය ගලා යැමට පවතින අවහිරතා මඟ හැරවීමට ක්‍රියාකිරීම මහා නගර සභාවේ කාර්යය විය යුතුය.

(i) මහා නගර සභා බල ප්‍රදේශයේ රජයේ හා පුද්ගලික ඉඩම්වල, ඉඩම් අනු බෙදුම් ඉල්ලුම් අනුමත කිරීමේ දී, වැසි ජලය ආපදා තත්ත්වයක් ඇති නොවන සේ ක්‍රමානුකූලව බැහැරලීමට අවශ්‍ය කාණු පද්ධතිය සැලැසුමට ඇතුළත් කර ඇති බව සහතික කළ යුතුය.

(ii) මහා නගර සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබාදීමේ දී, අදාළ ඉඩමේ කට්ටි සැලැස්ම සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති බවට සනාථ කර ගත යුතුය.

20. මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත වූ නිවාසවල, වෙළෙඳ ස්ථානවල සහ වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ප්‍රයෝජනයට ගනු ලබන වායු සිලින්ඩරවලට සම්බන්ධ කරනු ලබන උපාංග වලින් හෝ ඒ උපාංග එකිනෙකට සම්බන්ධ කරන ස්ථානවලින් වායු කාන්දුවීමකින් තොරව පවත්වාගෙන යාම සහ ඒ පිළිබඳ පූර්වාරක්ෂිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් මහා නගර සභා ප්‍රදේශයේ පදිංචි සහ ප්‍රදේශය තුළ ව්‍යවසායකත්වයේ නියුක්ත තැනැත්තන් දැනුවත් කිරීමට කටයුතු කිරීම මහා නගර සභාවේ කාර්යය විය යුතුය.

21. මෝසම් වැසි සමය ද ඇතුළුව සෑම අවස්ථාවකම අකුණු සැර වලින් ආරක්ෂා වීමේ හා ගිගුරුම් සහිත කාලගුණ තත්ත්වයක් පවතින අවස්ථාවල විදුලි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව මහා නගර සභා ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම මහා නගර සභාවේ කාර්යය විය යුතුය.

22. ආපදා අවදානම් අවස්ථාවක දිවි ගලවා ගැනීමේ සහ ප්‍රථමාධාර ලබාදීම සඳහා ස්වේච්ඡා කමිටු පිහිටුවිය යුතු අතර අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව ඔවුනට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

23. මේ අතුරු ව්‍යවස්ථා යටතේ -

(අ) ආපදා අවදානම් අවස්ථා අවම කිරීම සඳහා; සහ

(ආ) ආපදා අවදානම් අවස්ථාවල දී සහන සැලසීම සඳහා;

ආපදා කළමනාකරණ අරමුදලේ, මුදල් ප්‍රමාණයන් ද ඇතුළත් වන සේ, ප්‍රමාණවත් වැය ප්‍රතිපාදන මහා නගර සභාවේ අයවැය ලේඛනයට ඇතුළත් කරනු ලබන බවට වගබලා ගැනීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

මේ අතුරු ව්‍යවස්ථා යටතේ මහා නගර සභාවේ සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණය කුමක් ද, යන්න අප්‍රමාදව විගණකාධිපතිවරයා වෙත වාර්තාගත කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතුය.

24. (i) මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී, මහා නගර සභාවට දැරීමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා කිසියම් සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු හෝ විසින් මූල්‍යාධාර ලබාදීමට හැකි වන්නේය. එනමුත් එකී මූල්‍යාධාර දේශීය මූල්‍ය ප්‍රභවයක් ලෙසින් ලබා ගන්නේ නම්, උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර පළාත් අමාත්‍යවරයාගෙන් ද, විදේශීය මූල්‍ය ප්‍රභවයක් ලෙසින් ලබා ගන්නේ නම්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ද අනුමැතිය ලබාගත යුතු අතර, එකී කාර්යයන්ට අවශ්‍ය උපකරණ, ආම්පන්න හෝ ද්‍රව්‍යමය ආධාර සැපයීමට හැකි වන්නේය.

(ii) 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට සපයනු ලබන මූල්‍ය ආධාර, සභා අරමුදලට ගෙවිය යුතු අතර, එසේ සපයනු ලබන මුදල් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා පමණක් යොදවනු ලැබිය යුතුය.

(iii) 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට ගෙවනු ලබන මුදල් පිළිබඳව වෙනම ගිණුමකින් තොරතුරු පවත්වාගෙන යාම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු අතර, එකී අරමුදල සභාවේ ආපදා කළමනාකරණ ගිණුම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය. මෙම අරමුදලේ මුදල් යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තියක් හා උපදෙස් මාලාවක් සකස් කර, ඒ සඳහා මහා නගර සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

(iv) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ මහා නගර සභා අරමුදලට ලැබෙන හා ඒ අරමුදලෙන් වියදම් කරනු ලබන මුදල් පිළිබඳ වාර්තාවක්, කමිටුවේ සෑම රැස්වීමකදීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී කමිටු රැස්වීමෙන් පසුව පවත්වනු ලබන මහා නගර සභාවේ සභා රැස්වීමේ දී සභාගත කිරීමට සලස්වනු ලැබිය යුතුය.

25. (i) මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව, මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හෝ කොට්ඨාශවල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්, මහා නගර සභා බල ප්‍රදේශයට අයත් වන වෙනත් පළාත් පාලන ආයතන, සභා ප්‍රදේශය ඇතුළත හා ඒ ආසන්නයේ පිහිටා ඇති වෙනත් රාජ්‍ය ආයතන සහ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන යනාදිය සතුව පවත්නා ආපදා කළමනාකරණයට අදාළ වන්නා වූ දත්ත හා තොරතුරු නාගරික කොමසාරිස්වරයා විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී, නාගරික කොමසාරිස්වරයා වෙත ලබාදීම ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තෙකු වන විට, ඔහුගේ කාර්යය විය යුතුය.

(ii) ඒ ආකාරයෙන් ම මහා නගර සභාව සතුව පවතින ආපදා කළමනාකරණයට අදාළ දත්ත හා තොරතුරු එකී යම් ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ ආයතනයට එකී දත්ත හා තොරතුරු ලබාදීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතුය.

(iii) මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි හා (ii) වැනි උපවගන්තිවල කුමක් සඳහන්ව තිබුණ ද, කවර හෝ තැනැත්තෙකු විසින් එසේ ඉල්ලා සිටිනු යම් දත්ත හෝ තොරතුරු හෝ පිටතට ලබාදීමෙන් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් හෝ වන්නේ යැයි එකී දත්ත හා තොරතුරු සතුව පවත්නා ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියාකරනු ලබන වෙනත් යම්

තැනැත්තෙකුගේ මතය වන අවස්ථාවක, එසේ රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් හෝ විය හැකි දත්ත හා තොරතුරු පිටතට ලබාදීමෙන් වැළකී සිටීමට, ඒ තැනැත්තාට එකී වගන්තිවල නියමයන් බාධාවක් නොවිය යුතුය.

26. මෙහි බලය පැවරීම, මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

27. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ඕනෑම අවස්ථාවක් අදහස් වේ. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය.

28. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව හෝ මහා නගර සභාවේ නගරාධිපතිවරයාට හෝ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන.

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"උප නගරාධිපතිවරයා" යන්නෙන්, අදාළ මහා නගර සභාවේ උප නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියාකිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

"මහා සභාව" යන්නෙන්, මහා නගර සභාවේ මාසිකව පවත්වනු ලබන සභා රැස්වීම අදහස් වේ.

"ආපදා සහ අවදානම්" යන්නෙන්, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන පනතෙහි "ව්‍යසනය" යන්නට දී ඇති අර්ථය අදහස් වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදායක වන්නා වූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නා වූ හෝ නැතහොත්, යම් දේපලක් විනාශ කරන්නා වූ හෝ හානියට පමුණු වන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වභාවිකව හෝ මිනිසා හෝ විසින් සිදු කරනු ලබන්නා වූ සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්න වීම හෝ අදහස් වේ. ඊට පහත සඳහන් දෑ ඇතුළත් වේ;

(අ) නායයෑමක්,
(ආ) සුළි සුළඟක්,
(ඇ) ගංවතුරක්,
(ඈ) නියඟයක්,
(ඉ) කාර්මික උපද්‍රවයක්,
(ඊ) සුනාමියක් (භූකම්පනාසන්න චලනයක්),
(උ) භූමිකම්පාවක්,
(ඌ) ගුවන් උපද්‍රවයක්,
(එ) සමුද්‍රීය උපද්‍රවයක්,
(ඒ) ගින්නක්,
(ඔ) වසංගතයක්,
( ඕ) පිපිරීමක්,
(ක) ගුවන් ප්‍රහාරයක්,
(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්,
(ච) රසායනික අනතුරක්,
(ජ) විකිරණශීලීත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්,
(ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පිටාර ගැලීමක්,
(ඩ) න්‍යෂ්ටික ආපදාවක්,
(ණ) නාගරික සහ වනාන්තර ගිනි ගැනීමක්,
(ත) වෙරළ ඛාදනවීමක්, සහ
(ද) ටොනාඩෝ, චන්ඩ මාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගිරුම් සහිත කුණාටුවක්.

''සහන සැලසීම'' යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා ආපදා යන්නට දී ඇති අර්ථ නිරූපණයට අනුව කවර හෝ අවස්ථාවක දී හෝ කිසියම් ආපදාවක් නිශ්චිතව ඇති වීමට ඉඩ ඇති යම් අවස්ථාවක දී, එකී ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වීමට ඉඩ තිබෙන හෝ පීඩාවට පත් වූ තැනැත්තන් තාවකාලිකව ආරක්ෂිත ස්ථානයක හෝ ස්ථානවල ස්ථානගත කිරීම, ජීවිත ගලවා ගැනීම, ප්‍රථමාධාර ලබාදීම, ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත් වී ඇති හා අවතැන්වූවන් තාවකාලික නවාතැන්වලින් ඉවත්ව යන කාලය දක්වා, ඒ තැනැත්තන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලැස්වීම අදහස් වන අතර, එසේ අවතැන් වී ඇති තැනැත්තන්ට පිසූ හෝ වියළි ආහාර සැපයීම ද ඊට ඇතුළු විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

32. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**පළමුවන උපලේඛනය**

1. මහා නගර සභා බල ප්‍රදේශයට බලපාන ආපදා හා එම ආපදා බලපාන ප්‍රදේශ කවරේ ද, යන්න හඳුනා ගැනීම.

2. ආපදා තත්ත්වයන්ට හේතු වන හෝ හේතු විය හැකි කාරණ කවරේ ද, යන්න නිගමනය කිරීම.

3. ආපදා තත්ත්වයන් ඇති වීමට හේතු වන කාරණා වළක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට සහ ආපදාවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කරන ක්‍රමෝපායන් හඳුනා ගැනීම.

4. කිසියම් ආපදා තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවකට පත්වීමට ඉඩ තිබෙන ප්‍රදේශ සහ පවුල් කවරේ ද, යන්න නිශ්චිතව හඳුනා ගැනීම සහ එසේ හඳුනා ගැනීමේ දී සිසුන්, ළමයින්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් පිළිබඳ විස්තර වෙන් වෙන්ව සටහන් කර තබා ගැනීම.

5. කවර හෝ ආපදා තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවට පත්වන පවුල්වලට සහන සැලසීමේ ක්‍රමෝපායන් නිගමනය කිරීම.

6. කිසියම් ආපදා තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාව තාවකාලිකව පදිංචි කරවිය හැකි ස්ථාන, ආපදා සිදුවීමට පෙර හඳුනා ගැනීම.

7. කිසියම් ආපදා තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාවට, නැවත පදිංචි වන අවස්ථාව දක්වා ආහාරපාන ලබාදීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීම.

8. කිසියම් ආපදා අවස්ථාවක දී, සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ඇති කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීම.

9. කිසියම් ආපදා තත්ත්වයක් ඇතිවීමට වඩාත් ඉඩ තිබෙන කාල වකවානු කවරේ ද, යන්න නිශ්චය කර හඳුනා ගැනීම.

10. වාහන ගමනාගමනයට අවහිර වන ආකාරයෙන් සිදුවන හෝ සිදුවිය හැකි ඕනෑම ආපදා අවස්ථාවක දී, ඒ මාර්ග වෙනුවට යොදා ගත හැකි විකල්ප මාර්ග කවරේ ද, යන්න හඳුනා ගැනීම.

11. ගංවතුර ගැලීමක දී, මාර්ග ජලයෙන් යටවීම සිදු වන්නේ කුමන ප්‍රමාණයක වර්ෂාපතනයක් ඇති වූ විටක ද, යන්න සහ එම වර්ෂාපතනය පතිත වී කොපමණ වේලාවකින් මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ ද, යන්න හඳුනා ගැනීම.

12. ඕනෑම ගංවතුර ගැලීමක දී, ප්‍රදේශ ජලයෙන් යටවීම සිදුවීමට තරමේ වර්ෂාපතනයක් ඇති වී කොපමණ වේලාවකින් එම ප්‍රදේශ ජලයෙන් යටවීම සිදුවන්නේ ද, යන්න සහ සුළි සුළඟක් හෝ ඊට සමාන කුණාටු තත්ත්වයක දී ඇතිවන අනපේක්ෂිත වර්ෂා තත්ත්වයක දී, ප්‍රදේශයේ ජලයෙන් යටවන ස්ථාන හඳුනා ගැනීම.

13. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව මහා නගර සභා බල ප්‍රදේශයේ තෝරාගත් ස්ථාන කිහිපයක අඩු වියදම් වර්ෂා මාපක සවි කිරීමට කටයුතු කිරීම සහ එම වර්ෂා මාපක දත්ත එකතු කිරීමට කටයුතු කිරීම.

14. මහා නගර සභා ප්‍රදේශයේ ජනතාවට දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රමවලින් පානීය ජලය ලබා ගැනීමට නොහැකිවන කාල වකවානු සහ හේතු හඳුනා ගැනීම.

15. දේපළවලට හෝ ජනතාවට හානිවිය හැකි ආකාරයෙන් මහා නගර සභා ප්‍රදේශ ඇතුළත ගිනි ගැනීම් ඇතිවිය හැකි අවදානම් ස්ථාන හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම.

16. මහා නගර සභා ප්‍රදේශයේ ඇති බෑවුම් සහිත ස්ථානවල නායයාමේ අවදානමක පැවතිය හැකි ස්ථාන අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව හඳුනා ගැනීම.

17. මහා නගර සභා ප්‍රදේශය ඇතුළත වසංගත රෝග ඇතිවීම සහ පැතිරීම පාලනය කිරීමේ ක්‍රමවේදයන් අදාළ සෞඛ්‍ය ආයතනයේ සහය ඇතිව හඳුනා ගැනීම.

18. වහා ගිනි ඇවිලෙන සුළු හෝ පිපිරුම් ඇති කරන සුළු හෝ අන්තරායකාර රසායන ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින්, මහා නගර සභා ප්‍රදේශයේ නිශ්චිත ස්ථානයක ස්ථානගත කර හෝ තැනින් තැන ගෙන යමින් ක්‍රියාත්මක වන කර්මාන්ත හා කර්මාන්තකරුවන් හඳුනා ගැනීම හා ලියාපදිංචි කිරීම.

19. කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් ආපදා කළමනාකරණයට අදාළව රැස්කර ගනු ලබන දත්ත හා තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බවට සහතික වීම.

20. මහා නගර සභා ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව සමඟ සමීප සම්බන්ධතාවක් ගොඩනගා ගනිමින් ආපදා කළමනාකරණයට අදාළව එකී කමිටුව සතු දත්ත හා තොරතුරු ලබාගැනීම සහ සභාව සතු දත්ත හා තොරතුරු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව වෙත ලබාදීම සහතික වීම.

21. කිසියම් ආපදා හෝ අවදානම් අවස්ථාවක දී, සහන කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීමට හැකියාව තිබෙන හා පහසුවෙන් සහය ලබාගත හැකි තැනැත්තන්, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කවරේ ද, යන්න හා ඔවුන් සතුව පවතින උපකරණ හඳුනා ගැනීම.

22. ආපදා හෝ අවදානම් අවස්ථාවක දී, ජීවිත ගලවා ගැනීමේ කාර්යන්හි ස්වේච්ඡාවෙන් නියුක්ත වීමට කැමැති තැනැත්තන් හඳුනාගෙන, ඔවුන් ලියාපදිංචි කිරීම හා ඔවුනට ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීම සඳහා මහා නගර සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

23. කිසියම් ආපදා තත්ත්වයක් ඇතිවීම පිළිබඳ පූර්ව දැනුම්දීම සඳහා හෝ ආපදා සහන සැලසීම සඳහා මහා නගර සභාව විසින් මිල දී ගනු ලැබිය යුතු උපකරණ හෝ වෙනත් යම් දේ හෝ පිළිබඳව සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

24. කමිටුව විසින් රැස් කරගනු ලැබූ දත්ත, තොරතුරු සහ හඳුනාගනු ලැබූ ක්‍රමවේදයන් පිළිබඳව කමිටුවේ නිර්දේශයන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

**ii වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහා නගර සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරුව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහා නගර සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වූ පදික මාරු ස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම තුළින් ගමන්කරුවන් ආරක්ෂා කිරීමේ හා වාහන අනතුරුවලින් වැළැක්වීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා එකී පනතේ 272 වැනි වගන්තියේ 6 වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.

(4 – 5)

4. කිසියම් පදිකයෙකු යම් පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීමට ඒ මතට පිවිසී ඇති අවස්ථාවක, එකී පදික මාරු ස්ථානය පසුකර යාමට පැමිණෙන සෑම වාහනයකම රියදුරා විසින් එකී පදිකයා පාර මාරු වී අනෙක් පසට පිවිසෙන තෙක් තමා පදවාගෙන යන වාහනය, නතර කර තබා ගැනීම කළ යුතුය.

5. පොලිස් නිලධාරියෙකු හෝ රිය නියාමකවරයෙකු හෝ ආලෝක සංඥා මඟින් හෝ වරින් වර පාලනය කරනු ලබන යම් පදික මාරු ස්ථානයක් හරහා ගමන් කිරීමට පැමිණෙන කවර හෝ වාහනයක් පාලනය කළ හැකිය. එකී පොලිස් නිලධාරියා හෝ රිය නියාමකවරයා හෝ විසින් ආලෝක සංඥාවක් හෝ වෙනත් සංඥාවක් හෝ මඟින් දෙනු ලබන නියෝගයට අනුව එකී වාහනය පදවන රියදුරා ක්‍රියා කළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(6 – 10)

6. කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් පදික මාරු සළකුණක් විකෘති කිරීම හෝ මකා දැමීම හෝ නොකළ යුතුය.

7. කිසියම් වාහනයක් පදික මාරු ස්ථානයේ වාහන නතර කර තැබීමට සළකුණු කර ඇති සීමාව පසු කිරීමට ආසන්න අවස්ථාවක, කවර හෝ පදිකයෙකු පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීම පිණිස පදික මාරු ස්ථානය මතට පිවිසීම නොකළ යුතුය.

8. කවර හෝ පදිකයෙකු කිසියම් පදික මාරු ස්ථානයක් මතින් පයින් ගමන් කිරීමේ දී සාධාරණ වේගයකින් වීදියෙන් එක පැත්තක සිට අනික් පැත්තට ගමන් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය කාලයට වැඩි කාලයක් කවර හෝ පදික මාරුවක් මත රැඳී සිටීම හෝ ඒ හරහා ගමන් ගන්නා වාහනයක ගමනාගමනයට බාධාවන පරිදි රැඳී සිටීම හෝ නොකළ යුතු අතර, එකී පදික මාරු ස්ථානය මතින් ගමන් ගන්නා වෙනත් යම් පදිකයෙකුගේ ගමනට අනිසි ආකාරයෙන් බාධා කිරීම ද නොකළ යුතුය.

9. කවර හෝ වාහනයක රියදුරකු විසින් තමා විසින් පදවාගෙන එනු ලබන වාහනය, තමන්ගේ පාලනයෙන් පරිබාහිර වූ හේතු නිසා ඉදිරියට යාමෙන් තමා වළක්වනු ලැබ ඇත්නම්, එකී වාහනය යම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කුමන හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතුය.

10. කවර හෝ වාහනයක රියදුරකු විසින් අනතුරක් වැළැක්වීම පිණිස එකී වාහනය පදික මාරු ස්ථානයක් මත නතර කිරීමට අවශ්‍ය වන්නේ නම් මිස, එකී වාහනය කිසියම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කුමන හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතුය.

11. මේ කොටසේ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයට පත් කරන ලද පදික මාරු ස්ථානවල කළයුතු සළකුණු කිරීම් මෝටර් රථ වාහන පනතේ 164 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ මධ්‍යම රජයේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වැනි දිනැති 444/18 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කළ 1 වැනි කොටසේ (1) වැනි වගන්තියේ නියෝගවල 16 වැනි නියෝගය සමඟ කියවිය යුතු 4.18 වැනි රූපයේ ආදර්ශයට අනුව විය යුතුවාක් හැර, එකී නියෝගවලට කලින් කළට කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතුය. එසේම එකී සළකුණු මැකී යාමට ඉඩ නොදී නැවත පින්තාරු කිරීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතුය. මහා නගර සභාවේ කාර්යභාරය. (11–14)

12. මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහා මාර්ගවල සහ මංමාවත්වල ගමන් කරන පදිකයන්ට පාර මාරුවීම සඳහා පදික මාරු ස්ථාන මහා නගර සභාවේ ප්‍රවාහන උපදෙස් කමිටුව මඟින් හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම හා සළකුණු කිරීම මහා නගර සභාව විසින් කළ යුතුවාක් මෙන්ම, මෝටර් රථ වාහන ආඥා පනතේ වූ රෙගුලාසිවලට අනුව සංඥා පුවරු සවි කළ යුතුය.

13. මහා නගර සභාව විසින් කලින් කළට කරනු ලබන තීරණයක් අනුව කිසියම් පදික මාරු ස්ථානයක් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ මහා නගර සභාවට බලය තිබිය යුතුය.

14. මහා නගර සභා බල ප්‍රදේශයේ වූ කිසියම් පාසලක් ඉදිරිපිට ඇති මාර්ගයේ සළකුණු කර ඇති පදික මාරු ස්ථානවල කාර්යයේ නියුතු රිය නියාමකවරුන් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට මහා නගර සභාවට හැකිය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවලට නියමිත කාර්යභාරය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් මහා නගර සභාවට පවරන ලද බලතල නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකුට ලිඛිතව පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

16. කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතරක් (14) ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික

කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"රිය නියාමක" යන්නෙන්, පදික මාරු ස්ථානවල පදිකයන් සහ වාහන හැසිරවීමේ කාර්යය සඳහා කිසියම් පාසලක ප්‍රධානියා හෝ ඔහුගෙන් බලයලත් යම් තැනැත්තෙකු හෝ විසින් නම් කරනු ලැබූ හා එම කාර්යයේ නියුක්ත පාසල් සිසුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ අදහස් වේ.

"වාහනය" යන්නෙන්, මෝටර් රථ වාහන පනතේ සඳහන් කවර හෝ මෝටර් වාහනයක් අදහස් වන අතර, කිසියම් කරත්තයක්, අත් කරත්තයක්, තල්ලු කරගෙන යන කරත්තයක්, පාපැදියක්, රික්ෂෝවක් සහ මෝටරයක් මඟින් ක්‍රියා කරවන බයිසිකලයක් ද ඊට ඇතුළත් විය යුතුය.

"මාරු ස්ථාන" යන්නෙන්, වර්ණ කළ රේඛා හෝ වෙනත් ආකාරයකට පයින් ගමන් කරන්නන් සඳහා වෙන් කොට දක්වා ඒ බව "මෙතැනින් මාරු වනු" යන වචන සහිත මාර්ග සංඥාවකින් සඳහන් කරනු ලැබ ඇති මාර්ගය හරහා මාරුවීම සඳහා වූ ස්ථානයක් අදහස් වේ.

"රියැදුරු" යන්නෙන්, පාපැදියක් හෝ ත්‍රීරෝද රථයක් සම්බන්ධයෙන් වන විට, එය යන්ත්‍රානුසාරයෙන් හෝ අත් ආකාරයකින් පදවනු ලැබුව ද, එය පදවා ගෙන යන තැනැත්තා ද, අත් කරත්තයක් හෝ තල්ලු කරගෙන යන කරත්තයක් හෝ සම්බන්ධයෙන් වූ විට, කරත්තය ඇදගෙන යන නැතහොත් තල්ලු කරගෙන යන තැනැත්තා ද, ජින් රික්ෂෝවක් සම්බන්ධයෙන් වූ විට, එම ජින් රික්ෂෝව ඇදගෙන යන තැනැත්තා ද, මෝටර් රථ වාහන පනත යටතේ සඳහන් කවර හෝ වාහනයක් මෙහෙයවන්නා ද අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

20. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**iii වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් වන කාර්යයන් අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය සම්බන්ධිත කළමනාකරණ කාර්යයන් සහතික කරලීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 129, 130 හා 131 වැනි වගන්තිවලට අනුව 272(5) වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.
(4 – 17)

4. මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබාගත යුතුය.

5. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුතුය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුතුය.

6. පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තමන්ගේ පරිශ්‍රයේ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව එක්රැස් කළ යුතුය.

7. සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිවලට අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය, 8 සිට 28 දක්වා සඳහන් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වෙන් කළ යුතුය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුතුය.

8. හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීමට හෝ මුදා හැරීමට භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව එක්රැස් කරලීම පිණිස මනා තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය. ඒවා ඉරී, සිදුරු වී, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණයවීම නිසා බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම්, ඒවා මෙම කාර්යයන් සඳහා පාවිච්චි නොකර, අතහැර දැමිය යුතුය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ විසින් ඉල්ලීමක් කරන්නේ නම්, මහා නගර සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ සහනාධාරයක් වශයෙන්, එවැනි බහාලුම් මහා නගර සභාවෙන්ම සැපයිය හැකිය.

9. යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් හෝ මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදා හැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී, එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම්, එම තැනැත්තාට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

10. මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ යම් අපද්‍රව්‍ය 18(iii) වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සමගින් මෙම අතුරු ව්‍යවස්ථාවලින් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුතුය.

11. යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට හෝ පහත (අ) වැනි හා (ආ) වැනි උපවගන්තිවලින් දැක්වෙන කරුණු හැර, වෙනත් ක්‍රමයකින් අපද්‍රව්‍ය තම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය. –

(අ) මහා නගර සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි;

(ආ) මහා නගර සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

12. යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද සැලැසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදි කරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හා වැළලීම කළ හැකිය.

13. යම් පරිශ්‍රයක හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට්" බඳුනක් තබා ගැනීම නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙතින් ඉල්ලීමක් කළහොත්, ඒ හිමිකරුට හෝ පදිංචිකරුට හෝ එම කොම්පෝස්ට් බඳුන නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබේ නම්, එය එම පරිශ්‍රය තුළ තබා ගැනීමට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ.

14. හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන "ගෙවතු අපද්‍රව්‍ය" හැකිතාක් දුරට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ හැකිය. එම හිමිකරු හෝ පදිංචිකරු හෝ ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවා නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට හෝ බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට හෝ භාරදිය යුතුය.

15. වීථියක හෝ මංමාවතක හෝ යාබද නිවෙස් හිමිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ මායිම් වැටේ වැවෙන යම් ගසක් හෝ එහි අත්තක් හෝ කපන හිමිකරු හෝ පදිංචිකරු වහාම එය ඉවත් කළ යුතුය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුතුය. එසේත් නැතිනම් මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් ගෙවා, මහා නගර සභාවේ භාරකරුට ඒවා භාරදිය යුතුය.

16. සෑම තැනැත්තෙකුම, තම පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුතුය. එසේ මළපහ කරනු ලැබුවහොත් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම අදාළ තැනැත්තාගේ වගකීම වන්නේය.

17. නිවසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට හෝ අයදුම් කරන යම් තැනැත්තෙකු, තම පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර තම අයදුම්පත්‍රයේ ඇතුළත් කළයුතු ය.

18. නිවාස පරිශ්‍රයන්

(i) සෑම හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි (වර්ගීකරණය කර) තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම හෝ එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට දමා, ඒවා ඉවත් කරනු ලබන තෙක්, ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුතුය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක දමා තැබිය යුතුය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන, ඒවා ප්‍රදේශයට සරිලන පරිදි කළින් කළට මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් මහා නගර සභාව වෙත ගෙවීම් කිරීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම මේ කොටසේ 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, එම තැනැත්තා ඉහත (ඇ) වැනි ඡේදයෙන් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. නැතිනම් මහා නගර සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදි කරනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුතුය.

19. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම තම අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි වෙන් කර, වර්ගීකරණය කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 19 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු හෝ, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් හෝ සකසා ගත යුතුය. ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය.

(iii) මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර, අදාළ බඳුන් හෝ බහාලුම් හෝ තබා ගන්නා ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිම් මහලක හෝ උඩු මහලක හිමිකරු හෝ පදිංචිකරු හෝ තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුන්වල දැමිය යුතුය.

(v) සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ජේදවලින් විශේෂයෙන් සඳහන් කර ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. හිමිකරු හෝ පදිංචිකරු හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, එම තැනැත්තා (ඇ) සහ (ඇ) යන ජේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය සමගින් එකී අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු වෙත භාරදිය යුතුය. නැතිනම්, සෑම අපද්‍රව්‍යයක් සඳහාම මහා නගර සභාව විසින් තීරණය කර ඇති බඳුන්වල හෝ බහාලුම්වල හෝ දැමිය යුතුය.

(vi) මහා නගර සභාවේ සභා රැස්වීමේ දී පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නොමිලයේ සැපයීම කළ යුතුය.

(vii) සෑම මුඩුක්කු නිවසෙකම හිමිකරු හෝ පදිංචිකරු තමන්ගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කර තම වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දැමිය යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(viii) මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ජේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

20. ව්‍යාපාරික ස්ථාන හා කාර්යාල -

(i) ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ සෑම හිමිකරුවෙක්ම හෝ සේවකෙයකුම හෝ එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

ඉටු කළයුතු කාර්යයන්.

(20 – 29)

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරන තෙක්, වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුතුය.

(iii) ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ හිමිකරු හෝ නිලධාරියා හෝ මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ජේදවලින් විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iv) උඩු මහලේ හෝ බිම් මහලේ හෝ කිහිපයකින් යුක්ත ව්‍යාපාරික ස්ථාන හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ නිලධාරියා, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම ව්‍යාපාරික ස්ථානයෙන් හෝ කාර්යාලයෙන් හෝ තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් ව්‍යාපාරික ස්ථානය හෝ කාර්යාලය සඳහා අවශ්‍ය වන අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ සැපයිය යුතුය.

(v) මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති වෙළෙඳ සැලක හෝ කාර්යාලයක හෝ යම් හිමිකරුවෙකු හෝ සේවකයෙකු හෝ විසින් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා තැබිය යුතුය. මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුටම හා සේවකයෙකුටම අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග සහ මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ වෙත ගෙවීම මත, එකී අපද්‍රව්‍ය හිමිකරු හෝ සේවකයා හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට හැකි ය.

(vii) අසල්වාසීන්ට හෝ ව්‍යාපාරික ස්ථානයේ හෝ කාර්යාලයේ හෝ සේවයේ නියුක්ත තැනැත්තන්ට, යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් මතු නොවන පරිද්දෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීම හා මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නඩත්තු කිරීම ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ සෑම හිමිකරුවෙකුගේම හෝ සේවකයෙකුගේම වගකීම වන්නේ ය.

21. ආපනශාලා -

(i) යම් ආපනශාලාකරුවෙක් ම හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙකු, තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

*(ඉ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි.

(ii) යම් ආපනශාලාකරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙක්, තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරන තෙක්, වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුතු ය.

(iii) යම් ආපනශාලාකරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙකු, මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් සතෙකු ඇතුළුවීම වළකමින්, සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය, ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක හෝ ඇසිරිය යුතු ය.

(iv) මේ කොටසේ 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

(v) මේ කොටසේ 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ඒවායේ ස්වභාවය සැලකිල්ලට ගෙන මහා නගර සභාව

විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් එකී අපද්‍රව්‍ය හිමිකරු හෝ සේවකයා හෝ විසින් මහා නගර සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට හැකි ය.

22. **එළවළු සහ පලතුරු වෙළෙඳ සල් -**

(i) සෑම එළවළු වෙළෙඳ සැලක හා පලතුරු වෙළෙඳ සැලක හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා හෝ තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පලතුරු සහ වෙනත් යම් අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක දැමිය යුතු ය. එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි සුරක්ෂිතව වසා තැබිය යුතු ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුතු ය.

(iii) මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් මහා නගර සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

23. **පදික වෙළෙඳාම -**

(i) සෑම පදික වෙළෙන්දෙක් ම, එකී තැනැත්තාගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක හෝ බහාලුමක හෝ තුළට දැමිය යුතු ය. මේ කොටසේ 23 අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කා වූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ දමා තැබිය යුතු අතර, අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන වේලාවක් හැර, එය වසා තැබිය යුතු ය.

(iii) සෑම පදික වෙළෙන්දෙක් ම, අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ මහා නගර සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර, මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් මහා නගර සභාව වෙත ගෙවිය යුතු ය.

24. **කර්මාන්ත ශාලා -**

(i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක් ම හෝ නිෂ්පාදකයෙක් ම හෝ කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර, පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් මහා නගර සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු ය.

25. **කැණීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම් -**

(i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කැණීමක් හෝ යම් නිර්මාණයක් ඉදි කිරීමක් හෝ කඩා දැමීමක් හෝ මගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, ඒ පරිශ්‍රය ඇතුළත නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරනු ලබන ස්ථානයක ගබඩා කළ යුතු ය.

(ii) මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය, මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක්, මහා නගර සභාවට ගෙවීම මත, මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

26. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකතන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් හෝ පූර්වාංග අනුමැතිය ලබාගත යුතු ය.

(ii) ඉහත 26 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙරාතුව, අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩපිළිවෙළ, යෝජිත කාර්යය නිමවීමෙන් අනතුරුව, පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදු වූ අපද්‍රව්‍ය, ඉල්ලුම්කරු ඉවත් කිරීමට අතපසු කරන්නේ නම්, එය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුතු ය. අනුමැතිය ලබාදීමට පෙර, ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක්, තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේ ය.

(iii) කවර හෝ තැනැත්තෙකු, අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරන්නේ නම්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් තීරණය කරනු ලබන ආකාරයට, එකී අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන අතර, ඒ සඳහා දැරීමට සිදුවන වියදම මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කළ මුදල්වලට හිලව් කරනු ලැබේ.

27. **රෝහල් -**

(i) රෝහලක හිමිකරු විසින් පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* මෙම උපවගන්තියේ (ඈ) වැනි ඡේදයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග හැර වෙනත් අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ (අ) සහ (ආ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර, ඒවා ඉවත් කරනු ලබන තෙක්, යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු ය. (i) වැනි උපවගන්තියේ (ඇ) සහ (ඇ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක හෝ තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුතු ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම රෝහල්වලට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුතු ය.

(iii) මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

28\. (i) මේ කොටසේ 8 සිට 27 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙකු හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජයීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධාන කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක්, එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය, පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඇ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය;

(ii) මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන තැනැත්තෙකු, එම ක්‍රියාකරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස, ඒ පිළිබඳව කල්තියා මහා නගර සභාවට දැනුම්දිය යුතු ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය, ඉවත් කරගනු ලබන තෙක්, වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුතු ය.

(iv) මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ඉහත (i) වැනි වගන්තියේ (ඇ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ මහා නගර සභාව විසින් කළින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

29\. වීථි සහ පොදු ස්ථාන -

නාගරික කොමසාරිස්වරයා විසින් නගරාධිපතිවරයා සමඟ සාකච්ඡා කර, මහා සභාවේ අනුමැතියට යටත් ව පහත දැක්වෙන කාර්යයන් සැලැසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතු ය.

(i) මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළෙඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;

(ii) වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;

(iii) උත්සව කාලවල දී, විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී මහා නගර සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම;

(iv) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම් සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර, එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම;

(v) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ පිළිබඳව ක්‍රියා කිරීම.

ඉටු නොකළ යුතු කාර්යයන්. (30-40)

30. හිමිකරුගේ හෝ පදිංචිකරුගේ, නිවැසියන්ගේ හෝ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ හෝ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුතු ය.

31. කවර හෝ තැනැත්තෙකු වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශ්‍රයකට හෝ අපද්‍රව්‍ය මුදා හැරීම නොකළ යුතු ය.

32. කවර හෝ තැනැත්තෙකු මහා නගර සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුතු ය.

33. කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදා හැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුතු ය.

34. තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර, එහි සඳහන් ස්ථානයේ දී කවර හෝ තැනැත්තෙකු විසින් ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හෝ හැරුණු විට, වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු හෝ ඝාතනය නොකළ යුතු ය.

35. අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක හෝ තබාගත යුතු ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ හෝ පොදු ස්ථානයක හෝ නොදැමිය යුතු ය.

36. පදික වෙළෙන්දෙක් වාහනවලට හෝ පදිකයින්ගේ ගමනාගමනයට හෝ බාධා ඇතිවන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් හෝ නොතැබිය යුතු ය.

37. සෑම පදික වෙළෙන්දෙක් ම මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඇ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකවම භාරදිය යුතු ය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ හෝ නොතැබිය යුතු ය.

38. මහා නගර සභාව විසින් විශේෂයෙන් ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙතමනය වාණිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙකු නොකළ යුතු ය.

39. මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශය ඇතුළත, අවසර නොලත් කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් නොකළ යුතු ය.

අනවසරයෙන් ඇතුළුවීම හෝ ගැවසීම හෝ නොකළ යුතු ය.

එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයන් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම හෝ නොකළ යුතු ය.

කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මහා නගර සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස, මහා නගර සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුතු ය.

40. නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, කිසිම තැනැත්තෙක් මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් හෝ එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා ලබාදීම හෝ භාවිතා කිරීම හෝ නොකළ යුතුය.

41. නාගරික කොමසාරිස්වරයා විසින් නගරාධිපතිවරයා සමග සාකච්ඡා කර, මහා සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලැසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ යුතු ය. මහා නගර සභාවේ කාර්යභාරය.

(i) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ii) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදා හැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම.

(iii) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත තැනැත්තන්ට හා කුඩා ව්‍යවසායකයන්ට පහසුකම් සැපයීම, ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධව වී සිටින තැනැත්තන්ට දිරි ගැන්වීම් පිරිනැමීම.

(iv) අපද්‍රව්‍ය මුදා හැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(v) මහා නගර සභාවේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින්, අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්ය සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ, යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම

(vii) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ, අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(viii) නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරන ලද අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර, වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ නාගරික කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම.

(ix) නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු මගින් එක්කාසු කළ ආහාර සහ වෙනත් ජෛව ජීර්ණීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය, ප්‍රායෝගික අන්දමින් හැකිතාක් දුරට මුළුමනින් හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩපිළිවෙළක් යොදා ගැනීමත් සමග මෙම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ විසින් අනුමත කරන ආකාරයට බැහැරලීමට සුදුසු පියවර ගැනීම.

(x) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් අනුමත කරනු ලබන ආකාරයට සියළුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(xi) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව, අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂණ බිම් පිරවුමක් හෝ පවත්වාගෙන යාම.

(xii) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන්හි නිරතවන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(xiii) නිවසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මහා නගර සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත කාර්යය ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(xiv) මහා නගර සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙළ කිරීම.

(xv) 2000 වසරේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වසර 03ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම. එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත මහා නගර සභාව විසින් වාර්ෂිකව අනුමත කිරීම.

(xvi) මේ කොටසේ 41 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) සිට (xv) දක්වා වන උපවගන්තිවලින් සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නගරාධිපතිවරයාට ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත ද, වෙනත් පැමිණිල්ලක් නම් දින දහහතරක් ඇතුළත ද විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

අයකිරීම් හා ගාස්තු.

42. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙකු, පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම්, එකී තැනැත්තාට මහා නගර සභාව විසින් බලපත්‍රයක් නිකුත් කළ හැකි ය.

*(අ)* මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ මහා නගර සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ආ)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඇ)* එක්රැස් කළ අපද්‍රව්‍ය පිණිස මහා නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදි කරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානවලට අනුමැතිය ලබාදීම.

*(ඈ)* නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් අනුමත කරන පරිදි එක්කාසු කළ අපද්‍රව්‍ය, ජනතාවට පීඩාවක් සිදු නොවන අන්දමින් සනීපාරක්ෂක ක්‍රමයට ප්‍රවාහන කිරීම සඳහා වාහන සැපයීම.

*(ඉ)* අදාළ ව්‍යවසායකත්වයක් මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ආයතනය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට උපයෝගී කර ගැනීමේ දී හෝ පිරියම් කිරීමේ දී හෝ අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ හෝ අපද්‍රව්‍ය මහා නගර සභාව වෙත භාරදීමට එකඟවීම.

මහා නගර සභාව විසින් කලින් කලට අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා තීරණය කරනු ලබන ගාස්තුවක් මහා නගර සභාව වෙත ගෙවීම් කළ යුතු ය.

(ii) මහා නගර සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභ කළ විටෙක, ඒ සඳහා වන හේතුව ඉල්ලුම්කරු ඉල්ලා සිටින්නේ නම්, ප්‍රතික්ෂේප කිරීමට හෝ නිෂ්ප්‍රභ කිරීමට හෝ හේතු ඉල්ලුම්පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

(iii) මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසරය ලබාදුන් මධ්‍යස්ථානවල බලපත්‍රයේ, එක්රැස් කරනු ලබන අපද්‍රව්‍යවල වර්ග, අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර ලබාදුන් ප්‍රදේශ සහ වෙනත් සුදුසු කොන්දේසි සටහන් කර දැක්වීම.

(iv) මේ කොටසේ 42 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු නොකරන අවස්ථාවක දී, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කරනු ලැබේ.

(v) මේ කොටසේ 42 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී, කවර හෝ තැනැත්තෙකු අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුතුය. එවැනි අවස්ථාවක දී, බලපත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් මාධ්‍ය හරහා ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුතුය.

43. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නගරාධිපතිවරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

44. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

45. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථානවල / පරිශ්‍රවල පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (45 – 49)

46. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථාන / පරිශ්‍ර පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථානවල හිමිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ කුලීකරුගේ හෝ බලපත්‍රලාභියාගේ හෝ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

47. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට, සඳහන් කර ඇති ස්ථානයන්හි හිමිකරු හෝ පදිංචිකරු හෝ බලපත්‍රලාභියා හෝ පටහැනි වන අවස්ථාවක, වහාම හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර හෝ එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට නියම කෙරෙන දැන්වීමක්, නගරාධිපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී තැනැත්තා වෙත භාරදිය යුතුය.

48. මේ කොටසේ 47 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් වේලාවට හා දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

49. මේ කොටසේ 47 වැනි හා 48 වැනි අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

50. බලපත්‍රලාභියා හෝ සම්බන්ධිත කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක්, නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14) ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

52. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි දඩ හා දණ්ඩන.

උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කාර්යාලය" යන්නෙන්, 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම අදහස් වේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන්, කිසියම් ඉඩමක / ව්‍යාපාරික ස්ථානයක, හිමිකරු හෝ පදිංචිකරු හෝ ඉඩමක/ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරු අදහස් වේ.

"ව්‍යාපාරික ස්ථානය" යන්නෙන්, තොග හෝ සිල්ලර වෙළෙඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් අදහස් වන අතර ආහාරපාන අළෙවියට තබා ඇති ස්ථානයක් සහ කොණ්ඩා සකසන ස්ථානයක් හෝ රූපලාවන්‍ය ස්ථානයක් හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

"ආපනශාලා" යන්නෙන්, දින පහසුකම් සහිතව හෝ රහිතව හෝ මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් වේ. එයට හෝටලයක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

"කර්මාන්ත ශාලාව" යන්නට, 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන අතර, කිසියම් අමු ද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් ද අදහස් වේ.

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, පස්, මඩ, දූවිලි, අළු සහ අපද්‍රව්‍ය ද, ගොඩනැගිලි කඩා දමන විට ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ද, ඒ සමග කුණු, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය ද අදහස් වේ.

"රෝහල" යන්නෙන්, යම් රෝගයකින් හෝ දුබලතාවකින් හෝ පෙළෙන තැනැත්තන් හෝ සතුන් හෝ භාර ගැනීම්, ඔවුනට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ත්ව සායනයක් ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන්, සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදැමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු ඊට ඇතුළත් වේ.

"උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය" යන්නෙන්, මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හෝ හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලි ස්වභාවයෙන් වන අපද්‍රව්‍ය අදහස් වේ.

"එක්රැස් කිරීම" යන්නෙන්, බලයලත් එක්රැස් කරන්නෙකු හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු හෝ විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් වේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම් අදහස් වේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

"ගබඩා කිරීම" යන්නෙන්, හිමිකරුවෙකුගේ හෝ පදිංචිකරුවෙකුගේ හෝ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම හෝ අදහස් වේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන්, ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් හෝ ඉවත් කරන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් වේ.

"ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය" යන්නෙන්, ක්ෂුද්‍ර ජීවී කාරකයන් මඟින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන්, අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි, එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයන් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන්, සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් හෝ පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රවාහනය" යන්නෙන්, මිනිස් හෝ සත්ත්ව හෝ යාන්ත්‍රික හෝ බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යක් යොදා ගනිමින්, අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් වේ.

"බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන්, අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රා හැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් වේ.

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන්, අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබා ගැනීමට හෝ නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් හෝ බලපත්‍රයක් ලබාගත් තැනැත්තෙකු අදහස් වේ.

"බැහැරලීම" යන්නෙන්, ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත්, පිරියම් නොකරන ලද්දාවූත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් වේ.

"මාරු කරන ස්ථානය" යන්නෙන්, මහා නගර සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කරන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණය, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම යනාදිය සඳහා අපද්‍රව්‍ය එක්කාසු කරන ස්ථානය වේ.

"වෙන් කිරීම" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති ප්‍රභේදයන්ට අනුකූලව, අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් වේ.

"සැකසීම" යන්නෙන්, අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ.

"නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන්, බක්කිවලින් හෝ බහාලුම්වලින් හෝ අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා මහා නගර සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට මහා නගර සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් වේ.

"පොදු ස්ථානය" යන්නෙන්, පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශ්‍රයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

54. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

## 9 වැනි පරිච්ඡේදය

**i වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

අරමුණ.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව, මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 272(5)(ඌ) වැනි වගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.

(4 - 5)

4. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා මහා නගර සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම වාසය කරන පදිංචිකරුවන් -

(i) සියළුම නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, කුරුම්බා හා තැඹිලි කෝම්බ සහ ඒ ස්ථානයේ තිබෙන වෙනයම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා පාවිච්චි කරනු ලබන භාජන වැනි දෑ ඉවත් කිරීමට හෝ විනාශ කිරීමට හෝ එසේ කිරීමට සැලැස්විය යුතු ය.

(ii) නේවාසික හෝ අනේවාසික හෝ ගොඩනැගිලිවලින් වැහි ජලය ගලායාම සඳහා වන පයිප්ප, පීහිලි සහ ගෙවතුවල ඇති කාණු නිසියාකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය. ඒවායේ අවහිරතා සිදු වන්නේ නම් වරින් වර පරීක්ෂා කර, ඒවා ඉවත් කළ යුතු ය.

(iii) නේවාසික හෝ අනේවාසික හෝ පරිශ්‍ර තුළ තිබෙන සියළුම ජල බඳුන්, ජල ටැංකි සහ ජලය එක්රැස් කර තබන වෙනත් භාජන මනා තත්ත්වයකින් සුදුසු ප්‍රතිසංස්කරණ සහිතව පවත්වාගෙන යාම, ඒවා මදුරුවන්ගෙන් හා රෝග කාරක කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීම, ඒවායේ මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයකින් තබා ගැනීම හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීමට අවශ්‍ය විය හැකි සියළුම කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන්නේ ය.

(iv) පරිශ්‍රය තුළ වූ සියලුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාම කළයුතු අතර මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයෙන් තබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සැලැස්විය යුතු ය.

(v) ජලය හිස් කිරීමට හැකිවන ආකාරයෙන් ඉදි කර ඇති යම් කෘත්‍රිම පොකුණු ඇත්නම්, යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් එහි ජලය හිස්කොට පවිත්‍ර කළ යුතු ය.

(vi) ගෙවතුවල හා ඉඩම්වල තිබෙන කාණුවලින් ගලායන ජලය එකතු වී, දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා දිනපතාම නඩත්තු කළ යුතු ය.

(vii) ආහාර පිණිස හෝ අලංකාරය පිණිස වවනු ලබන පැලෑටි හැර අනෙකුත් සියලුම ලඳු කැලෑ, වෘක්ෂ සහ වනාන්තර යනාදිය මනුෂ්‍ය වාසස්ථාන වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක හෝ සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කර, පිරිසිදුවෙන් තබාගත යුතු ය.

(viii) සියලුම ගල් වළවල්, පස් කැණීම් කරන ලද වළවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වළවල් යනාදියේ ජලය නොරැඳෙන ආකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතු ය.

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැලෑටි, දිය පරඬැල් ඇතුළත් විවිධ ජලජ පැලෑටි හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීමට හේතුවක් වන බව කළින්ම දැන ගන්නා පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එවැනි පැලෑටි යම් දිය මාර්ගයක් දිගේ පාවීයාම නතර කිරීමට හැකිවන පරිදි සුදුසු බාධක ඉදිකර, ඒවා පැතිරීයාම වළක්වාලිය යුතු ය.

(x) වැසිකිළි, දිය වළවල්, දිය උරන වළවල්, මුද්‍රා තැබූ වළවල් හා ඒ අවට පරිසරය ඇතුළුව එම ස්ථානයේ වූ සියලුම වැසිකිළි, මදුරුවන්ගෙන් බෝවීම වැළැක්විය හැකි ආකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතු ය.

(xi) සුසාන භූමියන්හි හෝ වෙනත් පරිශ්‍රයයන්හි හෝ මළවුන් සඳහා ඉදි කෙරෙන සිහිවටන, ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතු ය.

5. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළයුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කරනු ලබන අවස්ථාවෙහි දී, දැන්වීම භාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය ඇතුළත එකී නියමයන් ඉටු කළ යුතු ය.

6. මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු ඕනෑම පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ බෝවීමට හා වර්ධනය වීමට හැකිවන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ එලෙසින් ක්‍රියාත්මක කිරීමට හෝ ඉඩ සැලැස්වීම නොකළ යුතු ය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(6 – 7)

7. නගරාධිපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, ජල විදින ව්‍යුහයේ වූ ඉදි කිරීම්, වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තැබිය හැකි වෙනත් ඉදිකිරීම් හෝ නොකළ යුතු ය.

8. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වූ කාලය ඇතුළත කිසියම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුළු වී, පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස එකී පරිශ්‍රය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මහා නගර සභාවේ කාර්යභාරය.

(8 – 11)

(i) එම පරිශ්‍රය මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවන පරිශ්‍රයක් ද, යන වග;

(ii) එම පරිශ්‍රයේ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන පිළිපැද තිබේ ද, යන වග;

(iii) එම පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීමට සහ විනාශ කිරීමට කුමන හෝ පියවර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, එම පියවර කවරේ ද, යන වග; සහ

(iv) එම පරිශ්‍රයේ විෂබීජ විනාශ කිරීම සඳහා විෂබීජනාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද, යන වග.

9. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් යම් පරිශ්‍රයක අවශ්‍යා වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළයුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියෝග කළ හැකි ය.

10. මේ කොටසේ 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදි කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලසීමාව තුළ එකී ළිං, ටැංකි, පොකුණු, ජල විදින ව්‍යුහයේ වූ ඉදි කිරීම් හෝ නියමිත වතුර රැඳී තිබෙන ඉදි කිරීම්, නියම කරනු ලබන යම් ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කරන ලෙස *නැතහොත්* එම කාලසීමාව තුළ එම දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයෙන් වෙනස් කරන ලෙස නියම කළ හැකි ය.

11. මේ කොටසේ 9 වැනි හෝ 10 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වූ දැන්වීමක්, යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ පෞද්ගලිකව භාරදීමෙන් හෝ එම දැන්වීම එකී ස්ථානයේ මනාව පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකි ය.

බලය පැවරීම.

12. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය.

(13 – 16)

13. මෙම අතුරු ව්‍යවස්ථාවලින් පනවන ලද නියමයන්, මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ පරීක්ෂාවට ලක් කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේ ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන්නන්ගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතු ය.

15. මේ කොටසේ 9 වැනි හා 10 වැනි අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින 14කට නොවැඩි විය යුතු ය.

16. මේ කොටසේ 15 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ එකී දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වූ කාලය තුළ කුමන හෝ වේලාවක අවශ්‍යා විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුළු වී, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට හෝ ඉඩ සැලැස්විය හැකි ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

17. මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතු ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු උල්ලංඝණය කිරීම වරදක් වන්නේ ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවලින් 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ කාර්යයක් හෝ කාර්යයන් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවෙහි දී හෝ ඉටු කරනු ලබන අවස්ථාවෙහි දී, ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා දරන්නට සිදුවූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් මහා නගර සභාව වෙත ගෙවිය යුතු ය. නගරාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳව ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු, දින 14ක් ඇතුළත එම මුදල එකී අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් මහා නගර සභාව වෙත ගෙවිය යුතු අතර නිශ්චිත කාලය තුළ එම මුදල ගෙවනු නොලැබුවහොත්, එම මුදල මහා නගර සභාව වෙත ගෙවිය යුතු දඩ මුදල වශයෙන් එකී අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් හෝ අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය.

දඩ හා දණ්ඩන.

(19 – 20)

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ;

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ;

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ;

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ;

"අයිතිකරු" යන්නෙන්, යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් පාන යම් තැනැත්තෙකු අදහස් වේ;

"පදිංචිකරු" යන්නෙන්, යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් හෝ එහි භාරකාරත්වය, කළමනාකරණය හෝ පාලනය හෝ පාලනය දරන තැනැත්තෙකු අදහස් වේ;

"රෝගකාරක කෘමීන්" යන්නෙන්, මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ;

"පරිශ්‍රය" යන්නෙන්, යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අතහැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අතහැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය අදහස් වේ;

22. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය .

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**ii වැනි කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සුභසාධනය පිණිස මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම සහතික කරලීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 267(1) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 272 වැනි වගන්තියේ 5 වැනි උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.

(4 – 5)

4. සතෙකු මැරුණු විට, ඒ සතා මැරුණු වේලාවේ සිට පැය දොළහක් (12) ඉකුත් වීමට පෙර වළලා දැමීම, ඒ සතාගේ අයිතිකරුගේ හෝ අයිතිකරු නොමැති විටක ඒ සතා මැරුණු ස්ථානයේ පදිංචිකරුගේ හෝ යුතුකම විය යුතු ය.

5. මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් නිවසක අයිතිකරු හෝ පදිංචිකරු/පදිංචිකරුවෙකු හෝ එම නිවසට අදාළ ඉඩම පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයකින් ද, වල් පැළෑටි, ලඳු කැලෑ, කුණු රොඩු, ජලය රැඳී තිබිය හැකි වෙනත් භාජන, ටයර්, පොලිතීන් මලු, ටින්, තැඹිලි කෝම්බ වැනි ද්‍රව්‍යවලින් තොරව ද පවත්වාගෙන යා යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(6 – 16)

6. නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් ලකුණක් ඉවත් කිරීම හෝ මකා දැමීම නොකළ යුතුය.

7. මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙකු යම් පාරක, අඩි පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක වුවමනාවෙන් නිදහසේ ගමන් නොකළ යුතුය.

8. කවර හෝ තැනැත්තෙකු මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන යම් ළමයෙකු හෝ තැනැත්තෙකු හෝ වුවමනාවෙන්ම යම් පාරක, අඩි පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක නිරාවරණව තබා ගැනීමට හෝ එවැනි තැනකට යාමට හෝ ඉඩ හැරීම නොකළ යුතු ය.

9. මහා නගර සභාව විසින් පොදු නාන ස්ථානයක පිරිමි හෝ ගැහැණු හෝ එක් පාර්ශ්වයක තනි ප්‍රයෝජනය සඳහා වෙන් කර ඇති යම් පොදු නාන ස්ථානයකට ඊට විරුද්ධව ලිංගික පාර්ශ්වයේ කිසිම තැනැත්තෙකු ඇතුළු නොවිය යුතු ය.

10. (i) යම් ස්පර්ශක, චර්ම හෝ ආසාදක රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු ආසාදන හෝ බීජෞෂණ කාල සීමාව ඉක්මවන තුරු, යම් පොදු නාන ස්ථානයක නෑම හෝ රෙදි සේදීම හෝ නොකළ යුතු ය.

(ii) මේ කොටසේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් කවර හෝ තැනැත්තෙකුගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ජලය, නිරෝගී තැනැත්තෙකු විසින් ලබාගෙන, ළිඳ පිහිටි ස්ථානයේ සිට මීටර් දහයක(10) දුරක් ඇතුළත නෑම හෝ සේදීම හෝ නොකළ යුතු ය.

11. යම් පොදු ළිඳකින් හෝ පොදු නාන ස්ථානයකින් හෝ ජලය ගැනීමේ කාර්යය සඳහා කවර හෝ තැනැත්තෙකු විසින් යම් අපිරිසිදු භාජනයක් භාවිතා නොකළ යුතුය.

12. කවර හෝ තැනැත්තෙකු විසින් -

(i) පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති යම් ස්ථානයක දී, කවර අන්දමක හෝ භාණ්ඩයක් පොදු ළිඳක හෝ ඒ අසළ හෝ සේදීම හෝ සේදීමට සැළැස්වීම හෝ නොකළ යුතු ය.

(ii) කවර හෝ කාර්යයක් සඳහා යම් සතෙකු යම් නාන ස්ථානයකට දක්කා ගෙන යාම, එළවීම හෝ ඇද ගෙන යාම හෝ නොකළ යුතු ය.

(iii) යම් පොදු ළිඳක හෝ නාන ස්ථානයක හෝ ඒ අවට භූමිය කුමන හෝ අන්දමකින් අපිරිසිදු නොකළ යුතු ය.

13. මහා නගර සභාව විසින් මේ කොටසේ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වෙන් කර ඇති යම් ස්ථානයක්, එය එසේ වෙන් කර ඇති කාර්යය හැර වෙනත් යම් කාර්යයක් සඳහා කිසිම තැනැත්තෙකු විසින් ප්‍රයෝජනයට නොගත යුතු ය.

14. (i) පරිහරණය සඳහා ජලය ලබා ගන්නා යම් පොදු ළිඳක හෝ දිය උල්පතක හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථානයක හෝ සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත කසළ වළක්, වසුරු වලක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් තිබෙන්නට ඉඩ හැරීම නොකළ යුතු ය.

(ii) පරිහරණය සඳහා ජලය ලබා ගන්නා යම් පොදු ළිඳක හෝ දිය උල්පතක හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථානයක හෝ සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත ගොවිතැන් කාර්යය සඳහා යොදා ගන්නා ඉඩම්වල ජලය දූෂණය විය හැකි ආකාරයෙන් පොහොර හෝ විෂබීජනාශක හෝ යෙදීම නොකළ යුතු ය.

(iii) යම් කසළ වළක්, වසුරු වළක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් හෝ ගොවිතැන් කාර්යය සඳහා නොසැලකිල්ලෙන් පොහොර යෙදීම යනාදිය සිදුවන යම් ස්ථානයක සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත ගෘහ කාර්යය සඳහා කිසිම පුද්ගලික ළිඳක් කැපීම නොකළ යුතු ය.

15. කවර හෝ තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකුට අයිති ඉඩමක හෝ මාර්ගයක හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ කැලි කසළ හෝ දුගඳ හමන ද්‍රව්‍ය හෝ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ දැමීම හෝ ඉවත දැමීම නොකළ යුතු ය.

16. මළ හා මුත්‍රා පහ කිරීම සඳහා විශේෂයෙන් වෙන්කර නොමැති ස්ථානවල, කිසිම තැනැත්තෙකු විසින් මළ හෝ මුත්‍රා හෝ පහ නොකළ යුතුය.

17. (i) ස්පර්ශක රෝගයකින් හෝ චර්ම රෝගයකින් හෝ වසංගත වෙනත් රෝගයකින් හෝ පෙළෙන තැනැත්තෙකු සිටින යම් නිවසක හෝ ගොඩනැගිල්ලක පිටතින් ප්‍රකටව පෙනෙන කොටසක, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙකු හෝ විසින් ලකුණක් තැබීම හෝ තැබීමට සැලැස්වීම අවශ්‍ය යැයි සලකනු ලබන කාලය දක්වා ඔහු විසින් එම ලකුණ අලවා තැබීමට බලය ඇත්තේය. මහා නගර සභාවේ කාර්යභාරය.

(ii) යම් පොදු ළිඳක හෝ පානීය ජලය ලබා ගැනීමට හැකි ස්ථානයක, රෙදි සේදීම හෝ නෑම හෝ තහනම් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(iii) ප්‍රසිද්ධ පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක හෝ යම් සතෙකු මැරුණු විටෙක, එය අයිතිකරුට දැන ගැනීමට නොහැකි අවස්ථාවක, මහා නගර සභාව විසින් ඒ සතාගේ ශරීරය වහාම ඉවත් කර, වැළලීමට පියවර ගැනීම හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීම හෝ මහා නගර සභාවේ කාර්යය විය යුතුය.

(iv) රෙදි සේදීම, නෑම හෝ සතුන් නැවීමට හැකි වැව් හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථාන, මහා නගර සභාව විසින් එහි අභිමතය පරිදි වෙන් කළ හැකිය.

(v) මනුෂ්‍ය පරිභෝජනය සඳහා ජලය ලබා ගැනීමට හැකි වැව් හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථාන, මහා නගර සභාව විසින් එහි අභිමතය පරිදි වෙන් කළ හැකිය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

19. කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267(3) වැනි වගන්තියෙහි (අ),(ආ) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267(3) වැනි වගන්තියෙහි (ඇ) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ, නාගරික කොමසාරිස්වරයා ලෙස අදහස් වේ. මෙම නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, නාගරික කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනත යටතේ අදාළ මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

23. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

05 - 587/1

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාළන ආයතන( සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා ( අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන මාර්ග නීතිය සහ ප්‍රවාහන යන විෂයයන් භාර අමාත්‍ය ක.වි.විග්නේශ්වරන් වන මවිසින් සාදන ලද නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා 7 සිට 9 දක්වා වූ පරිච්ඡේදයෙන් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා, සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියට අදාළව උතුරු පළාතේ පළාත් සභාවේ *තීරණය* මගින් පිළිගෙන, එකී අනුමැතිය රජයේ *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කළ විට, ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (අ) වැනි වගන්තියට අනුව උතුරු පළාතේ වූ නගර සභාවන් එකී සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට මෙයින් බලය ලබාදෙනු ලබන අතර, ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (ආ) වැනි වගන්තියට අදාළව එකී අතුරු ව්‍යවස්ථාවන්හි කෙටුම්පත්වල අඩංගු විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථා සෑදීමට මහා නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 157 වැනි වගන්තිය සමග කියැවෙන 94 වැනි හා 153 වැනි වගන්තිය මගින් උතුරු පළාතේ වූ නගර සභාවන්ට බලය ලබා දෙනු ලැබේ.

**විනිසුරු ක. වි. විග්නේශ්වරන්,**
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා විනය,
ඉඩම්, විදුලි, නිවාස හා ඉදිකිරීම්, සංචාරක,
පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන,
මාර්ගය සංවර්ධන, මෝටර් රථ වාහන මාර්ග නීතිය සහ ප්‍රවාහන අමාත්‍යවරයා,
උතුරු පළාතේ පළාත් සභාව.

ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
A - 9 පාර, කයිතඩි,
යාපනය.

2018 මැයි මස 01 වැනි දින,

## නගර සභාවන් සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි අන්තර්ගතයන්

| අනු. අංකය | පරිච්ඡේදය | කොටස | සම්මත අතුරු ව්‍යවස්ථාවේ නාමය |
|---|---|---|---|
| 1 | 7 | i | නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය , පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 2 | | ii | නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළ් මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 3 | | iii | නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 4 | | iv | නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 5 | | v | නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 6 | 8 | i | නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණ කිරීම, ආපදාවට පත් වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 7 | | ii | නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 8 | | iii | නගර සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 9 | 9 | i | නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 10 | | ii | නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |

7 වැනි පරිච්ඡේදය

**i වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය, පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

01. නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර වර්ග, පාන වර්ග, එළවළු සහ පළතුරු වෙළෙඳාම් කිරීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. **අතුරු ව්‍යවස්ථාවේ නාමය.**

02. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම, පිරිසිදු ආහාර ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම, ගමනාගමනයට අවහිරතා ඇති කිරීම වැළැක්වීම යනාදි අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. **අරමුණ.**

03. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 157 වැනි වගන්තියේ 9 (ක) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. **අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.**

04. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, සෑම පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට නගර සභාවේ සභාපති හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. **ඉටු කළ යුතු කාර්යයන්.** **(4-12)**

(i) පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් බලපත්‍රයකට අයදුම් කරන අයදුම්පත්‍රයක්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා අවසානයේ දී දක්වා ඇති පළමු වැනි උපලේඛනයට සාරානුකූලව තිබිය යුතුය.

(ii) පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ උඩුකය දක්වා පෙනෙන 2½" x 2" ක ප්‍රමාණයේ ඡායාරූප දෙකක්, බලපත්‍රයකට අයදුම් කරන සෑම එක් එක් අයදුම්පත්‍රයකම අයදුම්කරු විසින් අමුණා තිබිය යුතුය. අයදුම්පත්‍රය භාර ගැනීමෙන් අනතුරුව නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා විසින් සුදුසු යැයි අදහස් කරන ආකාරයේ පරීක්ෂණයක් සිදු කිරීමෙන්, අයදුම්කරු සුදුසු නොවන්නේ නම්, අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ හැකිය. තව ද, අයදුම්කරු තමාගේ පදිංචි ස්ථානය, ඔහු වාසය කරන ග්‍රාම සේවක නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.

(iii) පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ බලපත්‍රයකට අයදුම් කරන අයදුම්පත්‍රය, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කළ අවස්ථාවේ දී, අයදුම්පත්‍රය සමග ලබාදුන් ඡායාරූපයෙන් එකක් අයදුම්කරුට නිකුත් කරනු ලබන බලපත්‍රයේ අලවා තිබිය යුතුය. අනික් ඡායාරූපය නගර සභා කාර්යාලයේ තබාගත යුතුය.

05. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට පිසින ලද ආහාර හා පාන වර්ග විකිණීම පිණිස නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(i) විකිණීමට තබා ඇති පිසින ලද ආහාර හා පාන වර්ග මැස්සන්ගෙන්, කෘමීන්ගෙන්, දූවිල්ලෙන් *නැතහොත්* ජලයෙන් දූෂණය නොවන ආකාරයට සංවෘත භාජනයක් හෝ පෙට්ටියක් හෝ පාවිච්චියට ගැනීමට සූදානම් කර තිබිය යුතුය.

(ii) පිසින ලද ආහාරයක් විකුණුම් කරනු ලබන විට, ගනුදෙනුකරුවන්ට පිළිගැන්වීම් සඳහා මල නොබැඳෙන ලෝහවලින් තැනූ අඩුවක් තබාගත යුතුය.

(iii) ඒ අවස්ථාවේ දී ගනුදෙනුකරුවන්ට ආහාර හෝ පානයන් හෝ පරිභෝජනය කිරීමට පිළිගන්වන්නේ නම්, ඒ සඳහා ම වෙන් වෙන් වූ භාජනයන් තබාගත යුතුය.

(iv) පරිභෝජනයෙන් පසුව ගනුදෙනුකරුවන් විසින් ඉතුරු කරනු ලබන ආහාර හා පානයන් බහාලීමට වෙන වෙනම භාජනයන් තබාගත යුතු අතර එකී භාජන හොඳින් වසා තැබිය හැකි පියන්වලින් යුක්ත විය යුතුය.

06. පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් ව්‍යාපාරික කටයුතුවල නියුක්තව සිටින අවස්ථාවේ දී, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නිකුත් කළ බලපත්‍රය හා හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන ආකාරයේ සුදුසු තැනක ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

07. නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රය හා හැඳුනුම්පත පෙන්වන මෙන් ඉල්ලා සිටි අවස්ථාවක, එම ලියකියවිලි වහාම ඉදිරිපත් කිරීම පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ කාර්යය විය යුතුය.

08. බලපත්‍රලාභී පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා වූ කාල සීමාව තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නියුක්ත වීමට හිමිකම් ලබයි. එසේ වුව ද, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී කාල සීමාවෙන් බැහැරව රාත්‍රී කාලයේ දී වෙළෙඳාමේ නියුක්තවීම සඳහා අවසර දෙනු ලදුව, ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේ නම්, එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළෙඳාම් කිරීමට බලපත්‍රලාභියෙකුට හිමිකම් ඇත්තේය.

09. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(i) ජෛවභායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) මේ කොටසේ 9 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

10. පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා බලපත්‍රලත් වෙළෙඳුන්, නගර සභාව විසින් වරින්වර පනවනු ලබන කොන්දේසිවලට යටත් විය යුතුය.

11. පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් සෑම වසරක් පාසාම බලපත්‍රය සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන විට, වෛද්‍ය පරීක්ෂණ සහතිකය අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

12. පිසින ලද ආහාර ද්‍රව්‍ය හා පාන වර්ග විකිණීම කරනු ලබන තැනැත්තන්ට මෝටර් වාහනවලින් තැනින් තැන ගෙන යමින් විකිණීම සඳහා වන අනුමැතිය ලබාදිය හැකිය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(13-23)

13. නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ විසින් පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට නිකුත් කරනු ලැබූ බලපත්‍රය හා හැඳුනුම්පත නොමැතිව කවර හෝ තැනැත්තෙකු නගර සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, වීථියක, පටුමඟක, පොදු වේදිකාවක, පොදු උද්‍යානයක හෝ තල්ලු අත් කරත්තයක හෝ මෝටර් රථ වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති හෝ උපයෝගී කරනු ලබන කිනම් හෝ වාහන නවත්වාලීමේ හෝ පොදු බස්රථ නැවතුම් පළේ හෝ මහජනයා රැස්වන පොදු ස්ථානයක කවර හෝ භාණ්ඩයක්, ආහාරයක්, පානයක්, එළවළු වර්ගයක් හා පළතුරු වර්ගයක් විකිණීම හෝ විකිණීම පිණිස තැනින් තැන ගෙනයාම හෝ නොකළ යුතුය.

14. පදික වෙළෙඳාමේ සහ සංචාරක වෙළෙඳාමේ යෙදෙන බලපත්‍රලාභී ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා වූ අතරතුර කාලය හැර, වෙනත් යම් වේලාවක කවර හෝ භාණ්ඩයක් විකිණීමට හෝ විකිණීමට තබා ගැනීම හෝ නොකළ යුතුය.

15. බලපත්‍රලාභියා තමාගේ භාණ්ඩ ප්‍රචාරය කරලීමේ අරමුණින් යම් හඬ විකාශනයක් හෝ ශබ්ද විකාශනයක් හෝ ඊට අනුරූපිත වෙනත් උපකරණයක් හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය.

16. බලපත්‍රලාභියා සිය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් පරිශ්‍රය හා භාණ්ඩ හැර, වෙනත් යම් පරිශ්‍රයක බලපත්‍රයේ නිශ්චිතව සඳහන් භාණ්ඩ හෝ වෙනත් යම් භාණ්ඩයක් විකිණීම හෝ විකිණීමට තබා ගැනීම හෝ විකිණීම පිණිස තැනින් තැන ගෙනයාම හෝ නොකළ යුතුය.

17. බලපත්‍රලාභියා, කිසියම් මාර්ගයක ධාවනය කෙරෙන වාහනවලට හෝ ගමන් කරන පදිකයන්ට හෝ කිසිදු බාධාවක් ඇති නොකළ යුතුය. කවර හෝ පොලිස් නිලධාරියෙකු හෝ ග්‍රාම සේවක නිලධාරියෙකු හෝ නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කිසියම් මාර්ගයකින් හෝ පදික වේදිකාවකින් හෝ පිටවන ලෙස නියෝග කරනු ලබන විට, එලෙසින් එම තැනැත්තා පිටවීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

18. නගර සභාව විසින් පදික වෙළෙඳාමට සහ සංචාරක වෙළෙඳාමට තහනම් කරනු ලැබූ ප්‍රදේශයේ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් රැඳී සිට හෝ තැනින් තැන ගෙනයමින් හෝ විකිණීම නොකළ යුතුය.

19. බලපත්‍රලාභියා, මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කර ඇති බලපත්‍රය කවර හෝ තැනැත්තෙකුට අන්සතු නොකළ යුතුය.

20. පදික මාළු වෙළෙඳුන්ගේ හා සංචාරක මාළු වෙළෙඳුන්ගේ බලපත්‍ර සම්බන්ධයෙන් උතුරු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ, උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කරන ලද, උතුරු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අංක 2011/25 හා 2017.03.24 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද, මාළු වෙළෙඳාම සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 6 වැනි පරිච්ඡේදයේ vi වැනි කොටසේ 20 වැනි හා 21 වැනි අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රයක් ලබා නොගෙන, මාළු විකිණීම හෝ මාළු විකිණීම පිණිස තබා ගැනීම හෝ නොකළ යුතුය.

21. පිසින ලද ආහාර ද්‍රව්‍ය හා පාන වර්ග හැර නිෂ්පාදිත භාණ්ඩ විකිණීම කරනු ලබන තැනැත්තන්ට මෝටර් වාහනවලින් තැනින් තැන ගෙනයමින් විකිණීම සඳහා වන අනුමැතිය ලබා නොදිය යුතුය. එනමුත්, ඉහත ද්‍රව්‍යයන් සංචාරක වෙළෙඳුන් විසින් යතුරු පැදිවලින් හා පාපැදිවලින් හෝ හිසේ තබා ඔසවමින් හෝ තැනින් තැනට යමින් විකිණීම සඳහා වන අනුමැතිය ඉල්ලා සිටි විටෙක, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම නිසා බලපත්‍රලාභියාට සිදුවන යම් පාඩුවක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ වගකීමට යටත් නොවනු ඇත.

23. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රයක් ලබා ඇත්තේ වුවද, කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි රෝගියෙකුව තම නිවසෙහි තබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, පදික වෙළෙඳාමේ සහ සංචාරක වෙළෙඳාමේ නියුක්තවීම නොකළ යුතුය.

නගර සභාවේ කාර්යභාරය.

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කොටසක පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම තහනම් කිරීමට හේතු වූ අවදානම අවසන් වී ඇති බව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නගරසභාවේ සභාපතිවරයා වෙත කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම්, එකී කොටසේ පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා නැවත අවසර දෙනු ලබන බව, බලපත්‍රලාභීන්ට දැන්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ කාර්යය විය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

25. පදික වෙළෙඳාමක් හෝ සංචාරක වෙළෙඳාමක් හෝ සඳහා 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 164 වැනි හා 165 උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

26. මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, කිසියම් උත්සවයක දී හෝ යම් ජාතික උත්සවයක දී හෝ මහජන ඒකරාශීවීමක දී හෝ නගර සභා බල ප්‍රදේශය තුළ නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියමිත ප්‍රදේශයේ ස්ථිර වෙළෙඳ ස්ථානවලට බාධා ඇති නොවන අයුරින්, වෙළෙඳාම් සඳහා වන ස්ථාන වෙන්කර, ඒ සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කරනු ලැබ, විශේෂිත ගාස්තුවක් අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

බලය පැවරීම.

27. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය.
(28-29)

28. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

29. මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද තාවකාලික බලපත්‍රය, කිනම් දිනයක් සඳහා නිකුත් කරනු ලැබුවේ ද, ඒ දිනෙන් පසුව එම බලපත්‍රය අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරිය.
(30-32)

30. කවර හෝ පදික වෙළෙන්දෙකු සහ සංචාරක වෙළෙන්දෙකු විසින් විකුණනු ලබන යම් භාණ්ඩයක/පිසින ලද ආහාර හෝ ආහාර ද්‍රව්‍යයක/පාන වර්ගයක හෝ සාම්පලයක්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ නගර සභාවේ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එහි මිළ ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වුවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, බලපත්‍රලාභියා වෙත ලිඛිතව කරනු ලබන දැන්වීමක් භාරදීමෙන් අනතුරුව බලපත්‍රලාභියාට පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රය නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු අතර අවලංගු කළ බලපත්‍රය ආපසු නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙත භාරදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

32. කිසියම් බෝවෙන රෝගයක් හෝ උදරාශ්‍රිත රෝග තත්ත්වයක් හෝ නගර සභා බල ප්‍රදේශය තුළ පැතිරෙන බවට හෝ එවැනි රෝග තත්ත්වයක් පැතිරීමේ අවදානමක් පවතින බවට හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙත කරුණු වාර්තා කර ඇති යම් අවස්ථාවක, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් පහත සඳහන් පියවරයන් ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(i) මේ සම්බන්ධයෙන් ලිඛිතව කරුණු සඳහන් කරමින් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ නිකුත් කළ බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම;

(ii) නගර සභා බල ප්‍රදේශයේ කිසියම් කොටසක, පදික වෙළෙඳාම හා සංචාරක වෙළෙඳාම තහනම් කිරීම;

(iii) ඉහත 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ තාවකාලිකව අත්හිටුවනු ලැබූ බලපත්‍රය, එසේ අත්හිටුවනු ලැබූ කාලය ඇතුළත භාරයට ගනු ලැබීම; සහ

(iv) බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට නියමිත දිනට පෙර, එකී රෝග පැතිරීමේ අවදානම අවසන් වී ඇති බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් වාර්තා කරනු ලැබ ඇත්නම්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අත්හිටුවනු ලැබූ බලපත්‍රය ප්‍රතිසාධනය කිරීම.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි 2 වැනි උප වගන්තියෙහි සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන. (35– 36)

36. පදික වෙළෙඳාමක් සහ සංචාරක වෙළෙඳාමක් සඳහා බලපත්‍රයක් ලබා නොගෙන, යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ හෝ විකිණීම කරනු ලබන හෝ විකිණීම පිණිස තබාගෙන ඇති හෝ තැනැත්තා, එකී භාණ්ඩය හෝ භාණ්ඩ හෝ විකිණීමට, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ විසින් කරනු ලබන තහනම් කිරීමකට යටත් විය යුතුය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල- අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගර සභාවේ සභාපතිවරයා " යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගරසභාවේ ලේකම්වරයා " යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගරසභාවේ, නගර සභවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගර සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"නගර සභාව" යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"සංචාරක වෙළෙඳාම" යන්නෙන්, හිසේ තබා ඔසවා ගෙන යාමෙන් හෝ යම් අනුමත කළ වාහනයක ගෙන යාමෙන් හෝ මහජනතාවගේ පරිභෝජනය සඳහා තැනින් තැනට යමින් හෝ කිසියම් තැනක නතර වී හෝ කරනු ලබන වෙළෙඳාම අදහස් වේ.

"පදික වෙළෙඳාම" යන්නෙන්, පාරක හෝ මාර්ගයක හෝ අසබඩ නිශ්චිතව වෙන් කරන ලද ස්ථානවල රැඳී සිට කරනු ලබන වෙළෙඳාම අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

38. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**ඇමුණුම - 01**

**නගර සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය, පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. වෙළෙඳ ස්ථානයේ නම: . ...............................................................................

2. (i) වෙළෙඳාම කිරීමට නියමිත කොට්ඨාසයේ අංකය: ............................................

 (ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය: ............................................................. හා

 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම: .......................................

3. අයදුම්කරුගේ -

 (i) සම්පූර්ණ නම: ....................................................................................

 (ii) ස්ථිර ලිපිනය: ....................................................................................

 (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය: .......................................................
 (ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කළ පදිංචි සහතිකය ඇමිණිය යුතුය.)

 (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ....................................................
 (ජාතික හැඳුනුම්පතේ ඡායාස්ථික පිටපතක් සමගින් 2½" x2" ප්‍රමාණයේ ඡායාරූප දෙකක් ඇමිණිය යුතුය.)

 (v) දුරකතන අංකය: ........................................................

 (vi) විද්‍යුත් තැපැල් අංකය: ..................................................

4. (i) වෙළෙඳාම ආරම්භ කළ දිනය: ....................................................

(ii) වෙළෙඳාමේ ස්වභාවය: ..............................................................

(iii) පදික වෙළෙඳාමේ / සංචාරක වෙළෙඳාමේ නියුක්ත සේවකයන් පිළිබඳ විස්තර:

(අ) නම / නම් : ..........................................................................

(ආ) දුරකතන අංකය / අංක: .......................................................

(iv) කළින් රැකියාව: .........................................................

5. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............ නැත: ............

ඔව් නම්: බලපත්‍රය අංකය: ..................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. පදික වෙළෙඳාම / සංචාරක වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

..............................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: ...................................

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

..............................................................................,
සභාපති/ ලේකම් /බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස ( නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය : ...................................... වරිපනම් අංකය : ..........................

වීථියේ / පාරේ නම : ..................................................................................................

අයිතිකරුගේ නම : ..................................................................................................

දේපළෙහි ස්වභාවය : ..................................................................................................

වාර්ෂික වටිනාකම : රු. .........................

හිඟ වරිපනම් මුදල : රු. .......................... ඇත: ............. නැත.: .................

...................................,
පරිපාලන නිලධාරි.

දිනය: ............................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: .....................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. .................................................................

ඒකකය A B C සටහන්:...................................................................

...................................,
ආදායම් පරීක්ෂක.

දිනය: ...........................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

....................................................................................................................................
....................................................................................................................................
.........................................................................................................

....................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය: ........................... .

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

....................................................................................................................................
....................................................................................................................................
....................................................................................................................................
....................................................................................................................................

දිනය: ............................... .

..........................................,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතුන් මත නිර්දේශ නොකරමි.

....................................................................................................................................
....................................................................................................................................
....................................................................................................................................
....................................................................................................................................

..................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක

දිනය: ...............................

**ලේකම්වරයාගේ / ගණකාධිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

......................................,
ලේකම් /ගණකාධිකාරී.

දිනය: ............................. .

**අනුමත කරමි. / නොකරමි.**

.

..............................................................................................,
නගර සභාවේ ලේකම්/ බලයලත් නිලධාරියා.

දිනය: ............................. .

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: .................................... ලදුපත් දිනය: ....................................

බලපත්‍ර අංකය: .................................. බලපත්‍ර දිනය: ...................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: ..............................

......................................,
ආදායම් පරිපාලන නිලධාරී.

නගර සභාවේ සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

............................................................,
ලේකම් /ගණකාධිකාරී.

දිනය: .............................

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

....................................................................,
නගර සභාවේ සභාපති/ බලයලත් නිලධාරියා.

දිනය: ..............................

**ii වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *අතුරු ව්‍යවස්ථාවේ නාමය.*

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම, පිරිසිදු ආහාර ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම, ගමනාගමනයට අවහිරතා ඇති කිරීම වැළැක්වීම යනා දී අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *අරමුණ.*

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 157 වැනි වගන්තියේ 9(ක) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.*

4. ඇමුණුම 01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම් කරනු ලබන වෙළෙඳ සැල, මෙහි පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ තැනැත්තෙකුට කුකුළු මස් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. *ඉටු කළයුතු කාර්යයන්.* (4-13)

   (i) විකිණීම පිණිස කුකුළු මස් ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය, පිඟන් ගඩොල් අල්ලා හෝ සිමෙන්තියෙන් කපරාරු කර හෝ මල නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතුය.

   (ii) කුකුළු මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම, සිමෙන්තියෙන් කපරාරු කර හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ තිබිය යුතුය.

(iii) කුකුළු මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ එක් එක් කාමරයකටම පිටතට හෝ පාර්ශ්වීකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතුය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය, කාමරයේ බිමෙහි වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතුය. කෙසේ වුවද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී, මේ නියමය අදාළ නොවිය යුතුය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයකම බිත්ති මීටර් තුන(3.0)කට නොඅඩු උසකින් යුක්ත විය යුතුය.

(v) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයකම ඇතුල් වහළක් (සීලිමක්) සවිකර තිබිය යුතු අතර, එකී ඇතුල් වහළ පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් තුන(3.0)කට නොඅඩු උසකින් තිබිය යුතුය.

(vi) වහළය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, අගු පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක්වත් තිබිය යුතුය.

(vii) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිහන් ගඩොල් ඇල්ලූ හෝ කාණු තිබිය යුතුය.

(viii) 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (vii) වැනි උපවගන්තියේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය, කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වළකට ගලායෑමට ඉඩ සලස්වා තිබිය යුතුය.

(ix) අපජලය ගලායාමට සලස්වන ලද උරාගන්නා වළ, වාතය ඇතුල් නොවන සේ ආවරණය කර තිබිය යුතුය.

(x) කුකුළු මස් අළෙවි ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායනික අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරු ඇති වළක වැළලීමට හෝ මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව මහා නගර සභාවේ කුණු කසළ රැස්කරන වාහනයට භාරදීමට හෝ කටයුතු කළ යුතුය.

(xi) වෙළෙඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

(xii) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, අඩුම වශයෙන් එක් පඩික්කමක්වත් පරිශ්‍රයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි බලපත්‍රලත් පරිශ්‍රයේ තැබීමට සැලැස්විය යුතුය.

(xiii) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, ඔහුගේ වෙළෙඳ ස්ථානයේ පිටත ප්‍රකටව පෙනෙන තැනක තරාදියක ස්වරූපයෙන් "තමන්ගේ නම" හා "බලපත්‍රලත් කුකුළු මස් අළෙවි සැල" යන වාක්‍ය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් සවිකර තිබිය යුතුය.

(xiv) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, ඕනෑම වේලාවක ලබාගත හැකි පරිද්දෙන් කුකුළු මස් වෙළෙඳුන් ඇතුළුව සියළුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් එකී ස්ථානයෙහි තබාගත යුතුය.

(xv) යටත් පිරිසෙයින් අවුරුද්දකට සිව් වරක්වත්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ලිඛිතව නියම කරනු ලැබිය හැකි පරිදි එකී වෙනයම් වේලාවන්හි දී ද, එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, වෙළෙඳ සැලෙන් කොටසක් වන එක් එක් කාමරයකම බිත්ති, පිහන් ගඩොල් අල්ලා හෝ සිමෙන්ති කපරාරු කර ඇති එකී කොටස් හැර, හුණු පිරියම් කිරීමට ද, ලීයෙන් කළ සියලු කොටස් පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආලේප කර ඇත්නම්, සබන් ගා උණු දියෙන් සේදීමට ද සැලැස්විය යුතුය.

5. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම්, බිත්ති, පිහන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස්, මස් කැපීමට යොදා ගන්නා කොටය, උපකරණ, කුකුළු මස් විකිණීම පිණිස කුකුළු මස් ප්‍රදර්ශනයට තබන ස්ථාන යනාදිය විෂබීජනාශක දියර යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක බලපත්‍රලාභියා කුකුළු මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම ආශ්‍රිතව පාවිච්චි කරනු ලබන සියළුම භාජන හා උපකරණ සහ කුකුළු මස් වෙළෙඳ සැලේ අවට ඇති කාණු හොඳින් සෝදා පිරිසිදු කර, මනා අළුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි ආකාරයෙන් තබාගත යුතුය.

8. කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම් සහ වෙනත් අවශ්‍ය ආරක්ෂිත පැළඳුම් සපයා තිබිය යුතුය. ඒ සමඟ එකී සේවකයන් කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත සියළුම අවස්ථාවන්හි දී, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සියළුම සේවකයින් සඳහාම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර හෝ සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතුය.

11. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

12. බලපත්‍රලත් සියළුම කුකුළු මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් වෙළෙඳ සැල පිහිටි ස්ථානයේ බීමට සුදුසු ප්‍රමාණවත් ජලය ලබාදිය යුතුය.

13. සියළුම කුකුළු මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන්, බලපත්‍රලත් ස්ථානය සඳහා වන වෙළෙඳ සැල හෝ අළෙවි ස්ථාන හෝ ශ්‍රීලංකා රජය විසින් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් වසා තැබිය යුතු යැයි නිශ්චය කරනු ලබන දවස් හැර, සෙසු සෑම දවසකම නගර සභාව විසින් තීරණය නොකළ විටක, පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා පමණක් විවෘත කර තැබිය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.
(14 – 23)

14. කවර හෝ තැනැත්තෙකු, වෙළෙඳ පොළ නොවන වෙනත් කිසියම් ස්ථානයක නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කුකුළු මස් විකිණීම පිණිස යම් ස්ථානයක් පාවිච්චි කිරීම නොකළ යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකි ශේෂ වන මස් අධිශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළෙඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස, ශේෂ වන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ අධිශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ හෝ තබා ගැනීම නොකළ යුතුය.

16. කිසිම තැනැත්තෙකු බලපත්‍රලත් ස්ථානයේ කුමන කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතුය.

17. කිසිම තැනැත්තෙකු අදාළ කාර්යය සඳහා නියම කර ඇති පඩික්කම ඇතුළේ හැර, කුකුළු මස් වෙළෙඳ සැල තුළ කෙළ නොගැසිය යුතුය.

18. බලපත්‍රලත් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියා විසින් කුකුළු මස් විකිණීමෙහි දී, තමන් විසින් පිරිසිදු කරනු ලබන කුකුළු මස්වල අපද්‍රව්‍ය, මාර්ගයේ දෙපස හෝ පොදු ස්ථානවල හෝ ඉවත දැමීම නොකළ යුතුය.

19. කිසිම තැනැත්තෙකු නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් තැනින් තැනට ගෙන යමින් විකිණීම නොකළ යුතුය.

20. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානය, දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදා ගැනීම හෝ ආහාර ගැනීම හෝ කරන ස්ථානයක් ලෙසින් පාවිච්චි කිරීම නොකළ යුතු අතර, වෙනත් කවර හෝ තැනැත්තෙකුට එලෙස කිරීමට ඉඩදීම නොකළ යුතුය.

21. කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීමට හෝ නියුක්ත කරවීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

22. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකුව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

23. බලපත්‍රලත් ස්ථානයෙහි කුකුළු මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට හෝ පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර, කිසිම භාජනයක් හෝ ඇඳුමක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතුය.

නගර සභාවේ කාර්යභාරය.
(24 – 25)

24. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ බලපත්‍රලත් ස්ථානයක ශීතකරණයේ තබා ඇති කිසියම් කුකුළු මසක් පරීක්ෂා කිරීමේ අරමුණින් එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කුකුළු මස් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට, බලපත්‍රලාභියා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

26. කිසියම් කුකුළු මස් අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 164 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නගර සභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවලින් පනවන ලද නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (29 – 32)

30. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

31. මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

32. මේ කොටසේ 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගර සභාවේ සභාපතිවරයා " යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගර සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගර සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගර සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ

බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

“නගර සභාව” යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

“බලයලත් නිලධාරියා” යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

“බලපත්‍රලාභියා” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

“බලපත්‍රලත් ස්ථානය” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

“පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය” යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

“කුකුළු මස් සැල හෝ කුකුළු මස් අළෙවි ස්ථානය” යන්නෙන්, කුකුළු මස් ඇතුළත්ව සජීවි කුකුළන් විකිණීමට තබා ඇති ස්ථානය අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

37. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**ඇමුණුම - 01**

**නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහාවන අයදුම්පත්‍රය - 20...... ... වර්ෂය.**

1. කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ නම: ..........................................................................

2. කුකුළු මස් වෙළෙඳ ස්ථානය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාසය: .......................... වරිපනම් අංකය: ........................

   (ii) වීථියේ / පාරේ නම: .........................................................................................

   (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය: ........................................................... හා

   ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: .................................................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: .......................................................................................

   (ii) ස්ථිර ලිපිනය: .........................................................................................

   (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය: ...........................................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: .........................................................................

   (v) දුරකථන අංකය: .......................................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: ..................................................................

4. (i) කුකුළු මස් වෙළෙඳාම ආරම්භ කළ දිනය: .....................................

5. (ii) කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ

*(අ)* නම : ......................................................................................................

*(ආ)* දුරකථන අංකය: ...................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

(i) අයිතිකරුගේ නම: ...............................................................................

(ii) ලිපිනය: ...............................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............. නැත: ............

ඔව් නම්: බලපත්‍ර අංකය: ............................ දිනය: ............................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

.....................................,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: .............................

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

......................................................................,

සභාපති/ ලේකම් /බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස ( නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය : ............................ වරිපනම් අංකය : .......................

වීථියේ / පාරේ නම : ..........................................................................................

අයිතිකරුගේ නම : ..........................................................................................

දේපලෙහි ස්වභාවය : ..........................................................................................

වාර්ෂික වටිනාකම : රු. ................................

හිඟ වරිපනම් මුදල : රු. ............................ ඇත : ............ නැත. : ...........

...............................,
පරිපාලන නිලධාරී.

දිනය : ............................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය : ...............................................................................................

ගෙවිය යුතු ගාස්තුව : රු. ..............................................................

ඒකකය A B C සටහන් :...................................................................

..................................,

ආදායම් පරීක්ෂක.

දිනය: ........................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..................................................................................................................

......................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය: ........................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

................................................,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය: ..........................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ...................... ව්‍යාපාරයේ ස්වභාවය: .................. පාරිසරික බලපත්‍ර: ...............

MOH වාර්තාව:............. අනුකූලතා සහතිකය: ......... ......... මත්පැන් බදු බලපත්‍ර:............

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

.......................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය: .........................

**ලේකම්වරයාගේ / ගණකාධිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.......................................................,
ලේකම් / ගණකාධිකාරි.

දිනය: ............................

අනුමත කරමි. / නොකරමි.

.....................................................................,
නගර සභාවේ ලේකම්/ බලයලත් නිලධාරියා.

දිනය: ........................

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ......................................  ලදුපත් දිනය: ..................................

බලපත්‍ර අංකය: ...........................................  බලපත්‍ර දිනය: .................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

......................................,
ආදායම් පරිපාලන නිලධාරි.

දිනය: ............................

නගර සභාවේ සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

...........................................,
ලේකම් / ගණකාධිකාරි.

දිනය: ..............................

බලපත්‍රය අත්සන් කරන ලදී.

.........................................................................................,
නගර සභාවේ/ බලයලත් නිලධාරියා.

දිනය: ..............................

**iii වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අලෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *අතුරු ව්‍යවස්ථාවේ නාමය*

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *අරමුණ*

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තිය සමග කියවිය යුතු හා 157 වැනි වගන්තියට අනුකූලව 9 වැනි වගන්තියේ ( ඒ), (ඔ) සහ (ඕ) යන උපවගන්තීන් යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වු නෛතික විධිවිධාන*

ඉටු කළයුතු කාර්යයන්
(4-24)

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ කිරි පට්ටියකට නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(i) එක් සත්ත්වයෙකු රඳවා තැබීමට අවම වශයෙන් වර්ග මීටර් 3.0ක් බැගින් වන සේ කිරි පට්ටියේ සිටින සත්ත්වයන් රඳවා තැබීමට ප්‍රමාණවත් ගොඩනැගිලි ඉදිකර තිබිය යුතුය.

(ii) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි බිත්තිවල උස මීටර් 1.0 ට වඩා උසින් යුක්ත නොවිය යුතු අතර, ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ ඇළුමිනියමෙන් හෝ ලීයෙන් හෝ තනා දෙපැත්ත ම කපරාරු කර, තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iii) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවවලින් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් හෝ තනා තිබිය යුතු අතර, එකී කණුවල ඉහළ කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3ක් උසින් යුක්ත විය යුතුවාක් හැර, කණුවල තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iv) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, වහළය කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3ක් උසින් යුක්ත විය යුතුය.

(v) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිම සිමෙන්ති දමා තිබිය යුතුය.

(vi) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි මනා අළුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතුය.

(vii) කිරි පට්ටියේ සත්ත්වයන්ට පානය කිරීමට, සතුන් නැවීමට සහ ගොඩනැගිලි සේදීමට දූෂණය නොවූ ප්‍රමාණවත් ජල පහසුකම් සපයා තිබිය යුතුය.

(viii) සත්ත්වයන් නැවීමෙන් පසු බැහැර කරන ජලය හා සත්ත්වයන් රඳා තබන ගොඩනැගිලි සේදීමෙන් පසු බැහැර කරන ජලය, මුත්‍රා සහ වසුරු කොටස් උරා ගන්නා වළකට පහසුවෙන් ගලායන පරිදි සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට්වලින් තැනූ කාණු සකසා තිබිය යුතුය.

(ix) සත්ත්වයන්ගේ වසුරු, ඉතිරි වන තණකොළ සහ වෙනත් කෑම වර්ග ඉවත් කිරීම සඳහා වෙනම ම ස්ථානයක් ඉදිකර තිබිය යුතු අතර, එකී ස්ථානය සතුන් රඳවා තබන ගොඩනැගිලිවලින් සහ කිරි කාමරයෙන් යටත් පිරිසෙයින් මීටර් 10.0ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය. එසේම එකී ස්ථානය පොදු ජල මාර්ගයක හෝ ජලය ලබා ගන්නා කිසියම් ළිඳක සිට අවම වශයෙන් මීටර් 10.0ක් දුරින් පිහිටුවා තිබිය යුතුය.

(x) කිරි දොවන ස්ථානය සහ තාවකාලිකව කිරි ගබඩා කරන ස්ථානය සතුන් රඳවා තබන ස්ථානයෙන් අවම වශයෙන් මීටර් 6.0කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(xi) කිරි දොවන ගොඩනැගිල්ල ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ බැඳ දෙපැත්තම සිමෙන්තියෙන් මැද තිබිය යුතුය. එහි බිත්තිවල උස අවම වශයෙන් මීටර් 1.2ක් විය යුතු අතර, බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවවලින් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් හෝ තනා, තීන්ත ආලේප කර තිබිය යුතුය.

(xii) කිරි දොවන ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර, බිම සහ බිත්ති සම්බන්ධ වන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතුය. එසේම එකී ගොඩනැගිල්ලේ පියසි කෙළවර පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.8කට ඉහළින් විය යුතුය.

(xiii) කිරි දොවන ගොඩනැගිල්ලේ මේසයක් තිබිය යුතු අතර, එහි මතුපිට පිහන් ගඩොල් හෝ පිරිද්දුම් නොමැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ වෙනත් යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ අතුරා තිබිය යුතුය.

(xiv) කිරි දොවන ස්ථානය තුළ සනීපාරක්ෂක කසළ භාජනයක් තිබිය යුතුය.

(xv) කිරි දොවන ගොඩනැගිල්ල, කිසියම් වැසිකිළියකින්, කසළ වළකින්, පොහොර ගොඩකින් හෝ පොහොර වළකින්, විවෘත කසළ කාණුවකින් යනාදියේ සිට යටත් පිරිසෙයින් මීටර් 10.0ක දුර ප්‍රමාණයක දුරකින් පිහිටා තිබිය යුතුය.

(xvi) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට යටත් පිරිසෙයින් මීටර් 20.0 ට නොඅඩු දුරකින් රෝගීවන සතුන් රඳවා තැබීම සඳහා වෙනම ගොඩනැගිල්ලක් තබා තිබිය යුතු අතර, සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ නියමයන්ට අනුකූලව මේ ගොඩනැගිල්ල ද ගොඩනගා තිබිය යුතුය.

(xvii) රෝගී සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට ගලායන අප ජලය අනෙක් සතුන් රඳවා තබන ගොඩනැගිල්ල දෙසට ගලා නොයන සේ කාණු නිර්මාණය වී තිබිය යුතුය.

(xviii) කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම්, එකී යන්ත්‍ර සහ දොවා ගන්නා කිරි රැස් කරන භාජන දිනපතා ජීවානුහරණය කිරීමට අවශ්‍ය උපකරණ සපයා තිබිය යුතුය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසකම අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

6. නිරෝගී සතුන් සහ රෝගී සතුන් රඳවා තබා ගන්නා ගොඩනැගිල්ලේ ගෙබිම සහ බිත්ති යටත් පිරිසෙයින් දිනපතාම එක් වරක් බැගින් සේදීමට සැලැස්විය යුතුය.

7. කිරි පට්ටිය සහ එහි වටපිටාව, කාණු, ලී බඩු හා උපකරණ පිරිසිදුව හා මනා අළුත්වැඩියා තත්ත්වයකින් තබාගත යුතුය.

8. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. කිරි පට්ටියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීම හා එකී සේවකයන් සියළුම අවස්ථාවන්හි දී, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. කිරි පට්ටියේ කිරි දෙවීමේ කාර්යයන්හි නියුක්තවීමට පෙර, ඔවුන් තමන්ගේ ඇඟපත සේදීම කළ යුතුය.

11. සතුන් රඳවා තබන ගොඩනැගිලි සහ කිරි දොවන කාමරයේ බිම සහ මේසය මතුපිට යටත් පිරිසෙයින් දිනපතාම එක් වරක් බැගින් සෝදා හැරීමට සැලැස්විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා සියලුම භාජන සහ කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම්, එකී උපකරණ ද යටත් පිරිසෙයින් දිනකට එක් වරක් බැගින් ජීවානුහරණය කළ යුතු අතර, වෙනත් භාණ්ඩ සහ උපකරණ දිනපතා ම පිරිසිදු කරවීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. කිරි පට්ටියේ ඇති කරන සෑම සතෙකුම යටත් පිරිසෙයින් වර්ෂයකට තුන් වතාවක් පශු වෛද්‍යවරයාගේ හෝ ඔහු විසින් නම් කරනු ලබන කවර හෝ නියෝජිතයෙකුගේ හෝ අධීක්ෂණයට ලක්කර, අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සහ එකී උපදෙස් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. කිරි පට්ටියේ කවර හෝ සතෙකුට කිසියම් රෝගයක් වැළදී ඇති බව දැන ගන්නට ලැබුණු වහාම එකී සතාව, සතුන් රඳවන ගොඩනැගිල්ලෙන් ඉවත් කර, රෝගී සතුන් රඳවන ගොඩනැගිල්ලේ රැඳවීමට ක්‍රියා කිරීම සහ ඒ පිළිබඳව පශු වෛද්‍ය නිලධාරියා දැනුවත් කිරීමට ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ ප්‍රයෝජනය සඳහා ඇති තණකොළ හා පිදුරු හැර, සියලුම සත්ත්ව ආහාර මීයන්ට ඇතුල්විය නොහැකිවන සේ සුදුසු භාජනවල තබා තිබිය යුතුය.

16. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

*(ආ)* ඉහත (අ) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

*(ඇ)* ඉහත (ආ) වැනි වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, (අ) වගන්තියේ (i) උප වගන්තියේ සඳහන් වන ජෛවභායන අපද්‍රව්‍ය අතරට ගැනෙන සත්ත්ව වසුරු සහ ඉතිරි වන තණකොළ කොටස්, පොහොර වශයෙන් යොදා ගැනීමට එකී නියමය බාධාවක් නොවිය යුතුය. කෙසේ වුවද, එකී අපද්‍රව්‍ය කිරි පට්ටියෙන් බැහැරට ප්‍රවාහනය කරනු ලබන්නේ නම්, ආවරණයක් සහිතව ප්‍රවාහනය කරන්නේ නම් මිස, කිරි පට්ටිය පිහිටා තිබෙන පරිශ්‍රයෙන් බැහැරව ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

17. දොවා ගන්නා කිරි තැන්පත් කර තැබීමට ඒ සඳහාම වෙන් වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර, එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිතවූ ද, මැස්සන්ට හෝ වෙනත් කෘමී සතුන්ට සහ මීයන්ට ඇතුළුවිය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතුය.

18. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර, කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිළි තිබිය යුතුය. එසේම එකී වැසිකිළි, කිරි පට්ටියේ සතුන් රඳවා තිබෙන ගොඩනැගිලි, කිරි දොවන ස්ථානවල සහ කිරි තැන්පත් කරන කාමරවල සිට අවම වශයෙන් මීටර් 15.0ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය.

19. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතුය.

20. සෑම කිරි පට්ටි බලපත්‍රලාභියෙකුම, "තමන්ගේ නම" හා "බලපත්‍රලත් කිරි පට්ටිය" යන වාක්‍ය ත්‍රිවිධ භාෂාවෙන් ලියූ පුවරුවක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

21. සෑම කිරි පට්ටි බලපත්‍රලාභියෙකු ම, නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ පිටපතක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතුය. ඒ සමග නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් කවර හෝ නිලධාරියෙකු හෝ විසින් ඕනෑම සාධාරණ වේලාවන්හි දී පරීක්ෂා කර බැලිය හැකි ආකාරයෙන් කිරි පට්ටියේ සියලුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් ඔහු විසින් තබාගත යුතුය.

22. ඉහත කී අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන් ව තිබුණ ද, කිරි නිෂ්පාදන සමුපකාර සමිති විසින් කිරි මිල දී ගනිමින් විකුණන විටෙක, කිරි සපයන්නන් සඳහා නියමිත ආදර්ශ ආකෘතියේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතකට අයදුම් කිරීම හා අනු අංක යෙදූ කාඩ්පත වාර්ෂිකව ම නගර සභාවේ සභාපතිවරයාගෙන් ලබා ගැනීම කිරි පට්ටි පවත්වාගෙන යනු ලබන සමුපකාර සමිතිවල කාර්යය විය යුතුය. ඉහත කාඩ්පතේ කිරි සමුපකාර සමිතිවලට කිරි සපයන්නාගේ නම, ලිපිනය, භාරදෙන ස්ථාන යනාදිය සඳහන් කිරීම සමග කිරි සපයන්නාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතුය.

23. කිරි පට්ටියක සේවයේ නියුක්ත සියලුම සංචාරක කිරි වෙළෙඳුන් සඳහා නියමිත ආදර්ශ ආකෘතියේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතකට අයදුම් කිරීම හා අනු අංක යෙදූ කාඩ්පත වාර්ෂිකව ම ලබාගැනීම කිරි පට්ටිකරුගේ වගකීම හා කාර්යය විය යුතුය. ඉහත කාඩ්පතේ කිරි වෙළෙන්දාගේ නම, ලිපිනය හා විකිණීම් කරනු ලබන ස්ථාන යනාදිය සඳහන් කර, කිරි වෙළෙන්දාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතුය.

24. මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, බලපත්‍රලත් කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය එහි සාමාජිකයන්ගෙන් කිරි මිල දී ගනිමින් විකුණන විටෙක, සමුපකාර සමිතියට කිරි සැපයුම්කරු, කිරි පට්ටිකරු ලෙසින් අදහස් කළ යුතුය. එසේ ම කිරි ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීම සඳහා කිරි තොගය ම මිල දී ගන්නා පෞද්ගලික ආයතන හා එම ආයතනවලට තොග කිරි විකුණුම්කරු, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිරි පට්ටිකරු ලෙසින් අදහස් කළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(25–38)

25. නගර සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත්කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටියක් හෝ කිරි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

26. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීමට හෝ නියුක්ත කරවීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකුව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

27. කිරි දොවා ගැනීමට, කිරි තැන්පත් කිරීමට සහ කිරි ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා භාජන ඔප දැමූ මැටි, ගැල්වනයිස් කළ යකඩ හෝ ටින්, එනැමල් ආලේපිත යකඩ, මතුපිට සුමට කළ ඇළුමිනියම්, වීදුරු හෝ පෝසිලෙන් යන කවර හෝ වර්ගයක භාජන යොදාගත යුතු අතර, එකී භාජන සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ ගබඩා නොකළ යුතුය.

28. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා භාජන, ඒවාට නියමිත කාර්යයට හැර, වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතුය.

29. කිරි දොවා ගැනීම ආරම්භ කිරීමට පෙර -

(i) කවර හෝ කිරි දෙනකගේ බුරුල්ල පිරිසිදු ජලයෙන් සේදීම කර;

(ii) කිරි දොවන්නා සබන් හෝ සබන් දියර හෝ යොදා තම දෑත සෝදා ගෙන;

(iii) යන්ත්‍රානුසාරයෙන් කිරි දෙවීම කරනු ලබන අවස්ථාවක, එකී උපකරණ ජීවාණුහරණය කර;

ඇත්තේ නම් මිස, කිරි දෙවීමට ඉඩදීම නොකළ යුතුය.

30. කිරි බුරුල්ලේ හෝ අන් තැනක හෝ ඇතිවන ක්ෂය රෝගයෙන්, තීව්‍ර ස්තන ප්‍රදාහයෙන්, කුර හා මුඛ රෝගයෙන්, අන්ත්‍රැක්ස් රෝගයෙන් හෝ කිරි බුරුල්ලේ ඇක්ටිනොමයිකෝසිස් රෝගයෙන් පෙළෙන හෝ බෘසෙල්ලෝසිස් රෝගයෙන්

පෙළෙන බවට පශු වෛද්‍ය නිලධාරියා තීරණය කරන ලද යම් සතෙකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩදීම හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරිවලට එකතු කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

31. කිරි ගබඩා කර තැබීමේ සහ සකස් කිරීමේ කාර්යය හැර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා කිරි කාමරය යොදා ගැනීම හෝ යොදා ගැනීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

32. කවර හෝ තැනැත්තෙකු විසින් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ එකතු කිරීමෙන් කිරි බාල කිරීම නොකළ යුතුය.

33. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර, කිරි පට්ටියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතුය. එසේ වුවද, කිරි පට්ටියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් හෝ මෙයට ඇතුළත් නොවිය යුතුය.

34. කිරි පට්ටියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම්, එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18.0 කට අඩු දුරකින් කසළ වළක් හෝ පොහොර වළක් හෝ අළු වළක් හෝ ස්ථානගත කර නොතිබිය යුතුය.

35. කිසියම් කිරි පට්ටියකින් ලබාගන්නා කිරි, දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ භාජන යොදා ගන්නේ නම් මිස, ඒ කිරි බලපත්‍රලත් ස්ථානයෙන් බැහැරව ගෙනයාම නොකළ යුතුය.

36. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් කිරි සමග ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයන් හෝ ද්‍රව්‍යයක් එකතු කිරීමෙන් කිරි බාල කිරීම හෝ බාල කළ කිරි විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ සංචාරයේ යෙදී විකිණීම හෝ භාරදීම හෝ නොකළ යුතුය.

37. (i) 1980 අංක 26 දරන ආහාර පනත යටතේ 1991.08.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී *ජනරජයේ ගැසට් පත්‍ර(අති විශෙෂ)* යෙන් පළ කරන ලද පහත 01 වැනි උපලේඛනයෙන් දක්වා ඇති කිරිවලට අවශ්‍ය කරන අවම වශයෙන් යම් ද්‍රව්‍යයක් එකතු නොකළ බාල කළ කිරි, කිරි ද්‍රව්‍යයන් කිසිවක් කවර හෝ බලපත්‍රලාභියෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

(ii) මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු, නරක් වූ නැතහොත් යම් ද්‍රව්‍යයක් එකතු කළ සම්පූර්ණ යොද සහිත කිරි කිසිවක් කිසිම තැනැත්තෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

38. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් පවත්නා වර්ෂය සඳහා නිකුත් කරන ලද කාඩ්පත ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු කිරි විකිණීම, තැනින් තැනට ගෙනයාම, විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

මහා නගර සභාවේ කාර්යභාරය.

(39 – 41)

39. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ කිරි පට්ටියක කිරි හෝ විකිණීම සඳහා තබා ඇති යම් සාම්පලයක්, එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

40. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කිරි පට්ටියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වුවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතුය.

41. මේ කොටසේ 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇති අවස්ථාවක, නියමිත හැඳුනුම්පත නිකුත් කිරීම නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියාගේ හෝ කාර්යය වන්නේය.

අයකිරීම් හා ගාස්තු.

42. කිරි පට්ටියක් පවත්වාගෙන යාම සඳහා 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 164 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නගර සභාවේ ලේකම්වරයා බලය ඇත්තේය.

43. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලය පැවරීම.

44. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

45. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ නගර සභාවේ බලයලත් කවර හෝ නිලධාරියෙකු හෝ විසින් කිරි පට්ටි බලපත්‍රලාභියෙකුගෙන් විකුණන, විකිණීම සඳහා තැනින් තැනට ගෙනයන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ යම් තැනැත්තෙකුගෙන් කවර හෝ වේලාවක පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා කිරි සාම්පලයක් ලබාගත හැකි අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා ඇති කරන යම් ලියාපදිංචි කිරි පට්ටිකරුවෙකු හෝ වෙනත් තැනැත්තෙකු වරදක් කරන්නේය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය.

(45 – 49)

46. සංචාරක කිරි වෙළෙඳුන්ට වාර්ෂිකවම නිකුත් කරනු ලබන හැඳුනුම්පත පරීක්ෂා කිරීම සඳහා බලයලත් නගර සභා නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ විසින් ඉල්ලා සිටින විට, ඔහු විසින් පරීක්ෂා කිරීමට ඉදිරිපත් කිරීම පැහැර හරින අවස්ථාවක, ඔහු වරදකරු වන්නේය. ඒ නිලධාරියා විසින් ඔහුව අත්අඩංගුවට ගෙන අප්‍රමාදව ළඟම ඇති පොලීසියට ගෙන යා යුතුය. ඔහුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ වරෙන්තුවක් නොමැතිව පොලිස් නිලධාරියෙකු විසින් අත් අඩංගුවට ගනු ලැබුවාක් සේ, ඒ පොලිස් ස්ථානයේ, ස්ථානභාර නිලධාරියා විසින් ක්‍රියා කළ යුතුය. ඉහත කී හැඳුනුම්පත අවලංගු කිරීම මහජන සෞඛ්‍ය පිණිස අවශ්‍ය යැයි නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට පෙනී ගියහොත්, ඒවා කවර අවස්ථාවක වුවද, එසේ අවලංගු කරනු ලැබිය හැකිය.

47. කිරි සාම්පල ගන්නා විට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ බලයලත් නගර සභා නිලධාරියා හෝ විසින් සාම්පල 3ක් ලබාගත යුතු අතර, ඒවා ලබාගනු ලැබූ ලියාපදිංචි කිරි පට්ටිකරු හෝ බලපත්‍රලාභියා හෝ ඉදිරිපිට දී ඒවාට මුද්‍රා තබා, ඉන් එකක් එකී ලියාපදිංචි කිරි පට්ටිකරුට තැනහොත් බලපත්‍රලාභියාට භාර දී, දෙවැන්න ප්‍රදේශයේ හෝ රජයේ රස පරීක්ෂකවරයාට ද, තුන්වැන්න නගර සභා කාර්යාලයට ද යැවිය යුතුය. ඒ සාම්පලය ලබාගනු ලැබූ කිරි බාල කර තිබුණු බවට නගර සභාව හෝ රජයේ රස පරීක්ෂකවරයා විසින් අත්සන් තබන ලද සහතිකය සාක්ෂියක් වන්නේය.

48. මේ කොටසේ 40 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

49. මේ කොටසේ 48 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනයට හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර හෝ ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

50. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

52. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255

දඩ හා දණ්ඩන.

වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි (2) වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි (2) වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

“නගර සභාවේ සභාපතිවරයා” යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

“නගර සභාවේ ලේකම්වරයා” යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගර සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගරසභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

“ නගර සභාව” යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

“බලයලත් නිලධාරියා” යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

“බලපත්‍රලාභියා” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

“බලපත්‍රලත් ස්ථානය” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

“පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය” යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

“කිරි පට්ටිය” යන්නෙන්, කිරි ලබා ගැනීමේ හා කිරි විකිණීමේ කාර්යය ප්‍රමුඛ වශයෙන් ක්‍රියාත්මක කිරීමට එක් වර්ගයක හෝ වර්ග එකකට වැඩි වර්ග ගණනක හෝ සත්ත්වයන් රඳවා තබා ගන්නා ගොඩනැගිලි ද, ඒ පරිශ්‍රය ද, අදහස් වන අතර එකී සත්ත්වයන් ද ඊට ඇතුළත් විය යුතුය.

“කිරි අළෙවි ස්ථානය” යන්නෙන්, කිරි මිළ දී ගැනීමේ හා මිළ දී ගෙන විකුණුම් කිරීමේ කටයුතු සිදු කෙරෙන ස්ථානය අදහස් වේ.

“පශු වෛද්‍ය නිලධාරියා” යන්නෙන්, නගර සභා බල ප්‍රදේශය ආවරණ වනසේ පත් කරනු ලබන නගර සභාවේ රජයේ පශු වෛද්‍ය නිලධාරියා අදහස් වේ.

“සත්ත්වයා” යන්නෙන්, එළ ගවයන්, මී ගවයන්, බැටළුවන් සහ එළුවන් යන වර්ගවලට අයත් සත්ත්වයන් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

54. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

උපලේඛන 01 - කිරිවල සංයුතිය

| I වැනි තීරය කිරි වර්ගය | | II වැනි තීරය කිරිවල නාමය | III වැනි තීරය ක්ෂීර මේදය අවම ප්‍රතිශතය | IV වැනි තීරය ක්ෂීර මේදය හැර ක්ෂීර ඝණද්‍රව්‍ය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1. | මී කිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 7.0 | 9.0 |
| 2. | එළකිරි | එම | 3.5 | 8.5 |
| 3. | ප්‍රමිත කළ | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 3.25 | 8.25 |
| 4. | සකස් කළ | එම | 2.0 | 8.5 |
| 5. | රස කළ | එම | 2.0 | 7.2 |
| 6. | යොදය රහිත හෝ මේදය රහිත | එම | - | 8.5 |

ඇමුණුම - 01

**නගර සභා බලප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. කිරි පට්ටියේ / කිරි අළෙවි ස්ථානයේ නම: ................................................................

2. කිරි පට්ටිය / කිරි අළෙවි ස්ථානය පිහිටා ඇති ස්ථානයේ

   (i) වරිපනම් කොට්ඨාසය: ............................ වරිපනම් අංකය:……………...

   (ii) වීථියේ / පාරේ නම: ...............................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: ........................................................... හා

   ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: .................................................................

3. අයදුම්කරුගේ නම: ..................................................................................................

   (i) සම්පූර්ණ නම: ...................................................................................................

   (ii) ස්ථිර ලිපිනය: ......................................................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය:.............................................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ...........................................................................

   (v) දුරකථන අංකය: .....................................................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: ..................................................................................

4. කිරි පට්ටිය / කිරි අළෙවි ස්ථානය ආරම්භ කළ දිනය: ...........................................

   (i) කිරි පට්ටියේ / කිරි අළෙවි ස්ථානයේ කළමනාකරුගේ / නියෝජිතයාගේ -

   (අ) නම : ....................................................................................................

   (ආ) දුරකථන අංකය: .......................................................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

   (i) අයිතිකරුගේ නම: ..........................................................................................

   (ii) ලිපිනය: .......................................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............... නැත: .........................

   ඔව් නම්: බලපත්‍රය අංකය: ..................................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: .........................

.................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

..........................................................,
නාගරික කොමසාරිස්වරයා /බලයලත් නිලධාරියා.

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස ( නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාශය: ........................................ වරිපනම් අංකය: .........................

වීථියේ / පාරේ නම: ...................................................................................................

අයිතිකරුගේ නම: ......................................................................................................

දේපලෙහි ස්වභාවය: ..................................................................................................

වාර්ෂික වටිනාකම: රු. ..............................................................................................

හිඟ වරිපනම් මුදල: රු. ................................ ඇත: .............. නැත.: .......................

දිනය: .....................

.................................,
පරිපාලන නිලධාරී.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ....................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ..................................................................

ඒකකය A B C සටහන්:...................................................................

දිනය: ........................

....................................,
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

දිනය: ............................

........................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

දිනය: ............................ .

.......................................................,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: .............. ව්‍යාපාරයේ ස්වභාවය: ............ පාරිසරික බලපත්‍ර: ................

MOH වාර්තාව:............. අනුකූලතා සහතිකය: ............... මත්පැන් බදු බලපත්‍ර:.............

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.

.......................................................................................................................................

.......................................................................................................................................

......................................................................................................

දිනය: ...........................

........................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**ලේකම්වරයාගේ / ගණකාධිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: ...........................

.......................................................,
ලේකම් / ගණකාධිකාරී.

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: ............................

..................................................................,
නගර සභාවේ ලේකම්/බලයලත් නිලධාරියා

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ............................... ලදුපත් දිනය: ............................

බලපත්‍ර අංකය: .............................. බලපත්‍ර දිනය: ............................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: .......................

......................................,
ආදායම් පරිපාලන නිලධාරී.

නගරාධිපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය: .......................

............................................................,
ලේකම් / ගණකාධිකාරී.

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

දිනය: ......................

..........................................................................,
නගරසභාවේ සභාපති /බලයලත් නිලධාරියා.

**iv වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන

3. 1939 අංක 61 දරන මහා නගර සභා ආඥා පනතේ 153(1) වැනි වගන්තිය සමග කියවිය යුතු හා 157 වැනි වගන්තියේ 9(ග) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙමඅතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු නොකළ යුතු කාර්යයන්

(4 –19)

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(i) අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන් වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයෙකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග අඩි 80කට නොඅඩු ඉඩකඩක් තිබිය යුතුය. එකී කාර්යය පිණිස පාවිච්චි කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර, එය පිහන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතුය.

(ii) අවමංගල්‍යාය සේවා සැපයුම් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයට, බාහිර පුද්ගලයන් අවසරයකින් තොරව ඇතුළුවීම තහනම් කර තිබිය යුතුය.

(iii) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිතා කරනු ලබන කාමරයේ වර්ගඵලයෙන්, හතෙන් එක(1/7)කට නොඅඩු ප්‍රමාණයකට වූ කවුළු සකසා තිබිය යුතු වන අතර, එකී කාර්යයන්හි නියුක්තවීම

කිසිදු බාහිර පුද්ගලයෙකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතුය. එකී කවුළු අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති නිවාස දෙසට එක එල්ලේ විවෘත නොවී තිබිය යුතුය.

(iv) මෘත දේහයක් සකස් කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස්, තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු වන අතර, එකී කාර්යය කරන අවස්ථාවේ දී, මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම්, එකී අපජලය වැනි දෑ රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයෙන් භාජන තබා තිබිය යුතුය.

(v) බලපත්‍රලත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇති විට, කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන තැනැත්තන්ගේ වාහන නවත්වා තැබීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතුය.

(vi) ගෞරවය දැක්වීම පිණිස මෘත දේහයන් තැන්පත් කර තිබෙන ස්ථානය, ඒ අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙනම වෙන්කර තිබිය යුතුය.

(vii) මේ කොටසේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් තිබිය යුතුය.

5. අවමංගල්‍යය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකුම විසින් මේ කොටසේ පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පතක් නගර සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. මෘත දේහයන් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හය(06) ක් ගත වූ පසු, පොළොවේ මතුපිට සිට අඩි හතර(04)ක ගැඹුරු වළක, වළදමා මැනවින් වසා දැමිය යුතුය.

7. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් නියෝගයක් කර ඇති විටෙක, ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

8. මේ කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටෙක, සභාව විසින් කළින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය මහා නගර සභාවේ පොදු සුසාන භූමිය ඇතුළේ, එම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරක් සහිත වළක, වළදමා වසා දැමිය යුතුය.

9. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තරයෙන් විෂබීජනාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම කළ යුතුය. එසේම අවශ්‍ය වන විටෙක දී, කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනයට ලබාගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් උපකරණ තිබිය යුතුය.

10. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල සේවයේ යෙදෙන සියළුම සේවකයින්ට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුව වැසුම් හා අත් වැසුම් ලබාදීම හා මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේ දී, එකී සේවකයින් ඒ ඇඳුම්වලින් හා පැළඳුම්වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වගබලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථ ඇතුළත, අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක (vacuum cleaner) මගින් පිරිසිදු කර, විෂබීජ නාශක යොදා තිබිය යුතුය.

14. මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව, නිකුත් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම්, බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතුය.

15. මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, එකී ස්ථානයේ තැන්පත් කර තබන කිසියම් මෘත දේහයකට සහ එකී මෘත දේහයේ භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් එකී මෘත දේහය ප්‍රදර්ශනය කිරීම කළ යුතුය.

16. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

17. (*අ*) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(*ආ*) ඉහත (අ) වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ සිට (vii) වැනි උපවගන්තිය දක්වා වන අපද්‍රව්‍ය යන්නට, කිසියම් මෘත ශරීර කොටස් ඇතුළත් නොවිය යුතු වන අතර, මෘත දේහයෙන් ඉවත් කරනු ලබන කිසියම් මෘත ශරීර කොටසක් හෝ කොටස් අවස්ථාවෝචිත පරිදි 6 වැනි හෝ 7 වැනි හෝ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයට බැහැර කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(*ඇ*) ඉහත (අ) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය මහනගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නෙන්, බලපත්‍රලත් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන හෝ කිසියම් මෘත ශරීරයක් මහජන ගෞරවරය පිණිස තබා ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

19. බලපත්‍රලත් ස්ථානයේ දී හෝ වෙනත් කිසියම් බාහිර ස්ථානයක දී හෝ සිදු කරනු ලබන සෑම මෘත දේහ සැකසීමක් ම සහ අවමංගල්‍යය සේවා සැපයීමක් ම පිළිබඳව මේ කොටසේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් පවත්වාගෙන යාම සහ එකී ලේඛනය නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(20 –26)

20. නගර සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

21. අධික වශයෙන් හානි සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර, වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහ සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිතා නොකළ යුතුය.

22. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තෙකු හැර, වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතුය.

23. ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස, කොළරාව, ඩෙංගු, මහාමාරිය, වසූරිය, කහඋණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහයක් බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

24. කිසියම් මෘත දේහයක් සැකසීමට සහ අවමංගල්‍යය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර, එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතුය.

25. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වන විටෙක හෝ එකී මරණය සැක සහිත වන විටෙක, මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම් මිස, එකී මෘත ශරීරය සැකසීම හෝ සැකසීම සඳහා භාර ගැනීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

26. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර හෝ කාර්යයක් අවමංගල්‍යය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදු කිරීමට හෝ එසේ කිරීමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

27. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වූවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් හෝ එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතුය. නගර සභාවේ කාර්යභාරය.

28. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 164 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. අයකිරීම් හා ගාස්තු.

29. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය.

(31 – 32)

31. මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

32. මේ කොටසේ 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

“නගරසභාවේ සභාපතිවරයා ” යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

“නගරසභාවේ ලේකම්වරයා ” යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගරසභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගර සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

“නගර සභාව” යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

“බලයලත් නිලධාරියා” යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

“බලපත්‍රලාභියා” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය" යන්නෙන්, කිසියම් මෘත ශරීරයක් කල්තබා ගත හැකි වන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් අදහස් වේ.

"මෘත දේහ සැකසීම" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල්තබා ගත හැකි වන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම අදහස් වේ.

"මෘත ශරීර කොටස්" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැර වන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක්, මියගිය පුද්ගලයාගේ ශරීරයේ තිබූ කිසියම් අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලුම්පටි, පුළුන් හෝ වන යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

37. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

### පළමුවන උපලේඛනය

**අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම. - 20...... වර්ෂය.**

1. අයදුම්කරුගේ නම: ......................................................................................................
2. ලිපිනය: ...........................................................................................................................
3. ජාතික හැඳුනුම්පතේ අංකය: .....................................................
4. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය: ..........................................................................
5. එක වරක දී සැකසීම පිණිස තබාගත හැකි මෘත දේහ සංඛ්‍යාව: .................
6. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව:.................................
7. මෘත දේහ සැකසීමට පෙර, ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව:
8. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය:
9. ගෞරව දැක්වීම පිණිස මෘත දේහය තැන්පත් කර තැබීම භාරගනු ලබන්නේ නම් :-
   (i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව:..................
   (ii) ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද?....................
10. ස්වභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද? ඔව්./නැත.
11. ඉවතලන ස්වභාවික මල් හෝ ශාක කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය:
12. ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව:..........................

13. කළමණාකරුවෙකු පත්කර ඇත්නම්, ඔහුගේ -

(i) නම:............................................................................

(ii) ජාතික හැඳුනුම්පතේ අංකය:..........................................

අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමට හා කළින් කළ නගර සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළි පැදීමටත් එකඟ වන බව මෙහි අත්සන් කිරීමෙන්ම පිළිගනිමි.

දිනය: .....................

.................................
අයදුම්කරුගේ අත්සන

## දෙවන උපලේඛනය

### අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක හෝ වෙනත් බාහිර ස්ථානයක සැකසුම් කරනු ලබන මෘතදේහ පිළිබඳ තොරතුරු ලේඛනය.

| අනු අංකය | මියගිය අයගේ නම | ජා. හැ.පතේ අංකය | ස්ත්‍රී/ පුරුෂභාවය | මියගිය දිනය | මරණ සහතිකය ලියාපදිංචි කළ | | මෘත දේහය භාරගත් | | මරණකරුගේ ඥාති අයගේ විස්තර | | | | හදිසි මරණ පරීක්ෂකගේ නියෝගයේ | | මෘත දේහය බැහැර කළ | | කළමනාකරුගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අංකය | දිනය | දිනය | වේලාව | නම | මරණකරු වෙතඇති සබඳතාව | ලිපිනය | ජා. හැ.පතේ අංකය | යොමු අංකය | දිනය | දිනය | වේලාව | |
| 1. | | | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | | | |

**V වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. අතුරු ව්‍යවස්ථාවේ නාමය.

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම, පීඩාවන් දමනය කිරීම හා කර්මාන්ත අපද්‍රව්‍යයන් නියාමනය කිරීම හා පාලනය කිරීම යනාදි අරමුණු සඳහා මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. අරමුණ.

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 253(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා එකී පනතේ 157 වැනි වගන්තියේ (9) (පප) වැනි උපවගන්ති යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ කර්මාන්ත ශාලාවක් හා කර්මාන්තයක් පවත්වාගෙන යාමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. ඉටු කළ යුතු කාර්යයන්. (4 –12)

(i) නියමිත ස්ථානය මනා අළුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ii) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැගිල්ලකට ම මනා වාතාශ්‍රය හා ආලෝකය ලැබෙන ආකාරයෙන් පැවතිය යුතුය. සෑම කාමරයකට ම විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට, ඒ කවුළුවල වර්ග ප්‍රමාණය ඒ කාමරයේ මතුපිට බිම් ප්‍රදේශයෙන් වර්ග ඵලයෙන් පහළොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතුය. කෙසේ වුවද, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යයන් සංවෘත ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම කළයුතු කර්මාන්ත ශාලා හෝ කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල වායු සමනය කර ඇති අවස්ථාවක, මෙම විධිවිධානය අදාළ නොවන බව අදහස් කළ යුතුය.

(iii) සෑම කාමරයක ම බිත්තිවල අවම උස මීටර් 2.14ට අඩු නොවිය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇති අවස්ථාවක, ඒවා බදාම යොදා කපරාරු කර ඇතුළු පැත්තේ තීන්ත ආලේප කර තිබිය යුතුය. නැතහොත් ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමඟ ලෑලි යෙදූ බිත්ති නිමකර ඇති අවස්ථාවක, ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iv) ස්ථානයේ වූ සෑම කාමරයක ම ඇතුළු වහළ (සීලිම) සවිකර තිබිය යුතු අතර, එකී ඇතුලු වහළ පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් දෙක(2.0)කට නොඅඩු උසකින් තිබිය යුතුය.

(v) වහළයට යොදන ලද යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත හෝ ආලේප කර තිබිය යුතුය.

(vi) ගෙබිම සිමෙන්ති දමා සිමෙන්තියෙන් මැද තිබීම හෝ පිහන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

(vii) කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දස දෙනෙකුට ම, එකක් බැගින් වන සේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන ප්‍රමාණවත් වැසිකිළි හා කැසිකිළි තිබිය යුතුය.

(viii) නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව අපජලය පවිත්‍රකරණය කටයුතු සිදුකිරීම කළ යුතුය.

(ix) නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමෙන් පසුව බැහැර කරන අපජලය පවිත්‍රකරණයට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අපජලය ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා හෝ විසින් නිර්දේශ කරනු ලබන ආකාරයෙන් උරා ගන්නා වළකට ගලායාමට සැලැස්විය යුතුය. එසේම එකී උරා ගන්නා වළ වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර ආසන්නයේ ඇති පොදු ජල මාර්ගයක සිට හෝ ඉදිකර ඇති ළිඳක සිට හෝ මීටර් පනහ(50)කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(x) කර්මාන්ත ශාලාව සඳහා භාවිතා කරන ගොඩනැගිල්ලට, ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇති කර තිබිය යුතුය.

(xi) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය සඳහා පාවිච්චි කරන කාමරවලින් සහ සේවකයන්ගේ නාන කාමරවලින් බැහැර කෙරෙන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් ඇති කර තිබිය යුතුය.

(xii) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය, වෙනත් රසායනික ද්‍රව්‍ය, කිසියම් නිෂ්පාදනයක් ඇසිරීම සඳහා යොදා ගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා අවම වශයෙන් එක් කාමරයක්වත් වෙනම සපයා තිබිය යුතු අතර, එකී කාමරය මීයන්ගෙන්, කෘමීන්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතුය.

(xiii) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරන නිෂ්පාදනයන් මනුෂ්‍ය පරිභෝජනයට හෝ සත්ත්වයින්ගේ පරිභෝජනයට හෝ සඳහාවන ආහාර හෝ පාන වර්ගයක් වන විට, ඒ සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර, අවම වශයෙන් සෑම මාස හය(06)කට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ස්ථානයේ පාවිච්චිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය එකී නිෂ්පාදන සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතුය.

(xiv) කර්මාන්ත ශාලාවේ පාවිච්චියට ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් සහ මදුරුවන් සහ වෙනත් කීටයන් බෝවීමෙන් වළක්වාලීම පිණිස ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී ජලය භූගත ජල ටැංකියක ගබඩා කර තබන අවස්ථාවක, එකී ස්ථානයේ සිට කර්මාන්ත ශාලාවේ ඉදි කරනු ලබන කසළ වළක් හෝ පොහොර වළක් හෝ අළු වළක් හෝ මීටර් දහඅට(18)කට ඔබ්බෙන් වූ දුරක ස්ථානගත කර තිබිය යුතුය.

(xv) කලින් පාවිච්චි කළ ඇසුරුම් සේදීම සඳහා යොදා ගන්නා ස්ථානය, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය කරන කාමරවලින් වෙන්ව ස්ථානගත කර තිබිය යුතු අතර ඉහත (xiii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතුය.

(xvi) කර්මාන්ත ශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය මේ කොටසේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට වර්ග කර, බැහැර කළ හැකි ආකාරයෙන් වෙන් කළ භාජන හෝ ටැංකි හෝ තිබිය යුතුය.

5. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම කොටසක් ම කටු පඳුරු හෝ වල් පඳුරුවලින් තොරව පවත්වා ගැනීම සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් හෝ බෝවන ආකාරයෙන් ජලය රැඳී තිබීම වැළැක්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

6. මේ කොටසේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

7. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අළුත්වැඩියා තත්ත්වයකින් තබාගත යුතුය.

8. නිෂ්පාදන වර්ග ඇසුරුම් කිරීමට පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කර, නැවත පාවිච්චි කරමින් නිපැයුම් ඇසිරීම සඳහා එකී ඇසුරුම් යොදා ගන්නා කිසියම් කර්මාන්ත ශාලාවක හා කර්මාන්තයක එකී පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කිරීමේ දී -

(අ) එකී ඇසුරුම්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද, සහ

(ආ) එකී ඇසුරුම් අවසාන වටයේ පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද,

යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිතා කළයුතු අතර, එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මඟින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

9. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ නියුක්ත සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයින් නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේනම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවහායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය:

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

11. කර්මාන්ත ශාලාවේ පිහිටීම, මධ්‍යම පරිසර අධිකාරියේ, නාගරික සංවර්ධන අධිකාරියේ සහ කර්මාන්ත ශාලා ආඥා පනතේ රෙගුලාසිවලට යටත්ව තිබිය යුතුය.

12. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(13 – 19)

13. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්තයක් හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

14. දුර්ගන්ධය හෝ විෂ සහිත කිසියම් වායු වර්ගයක් බැහැරට විසිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වෝපායයන් සලසා ඇත්තේ නම් මිස, යම් විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් හෝ මතුවන කිසියම් ද්‍රව්‍යයක් කර්මාන්ත ශාලා හා කර්මාන්ත පරිශ්‍රයක් තුළ ගබඩා කිරීම හෝ පාවිච්චියට ගැනීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

15. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව ශබ්ද දූෂණයක් විය හැකි සීමාවට වඩා අඩු සීමාවක ශබ්ද පාලනයක් පවත්වාගෙන ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක ශබ්ද නිපදවීමක් ඇති වන කිසියම් යන්ත්‍රසූත්‍ර හෝ වාෂ්ප බොයිලේරු හෝ ක්‍රියාත්මක කිරීමේ දී, ශබ්ද උපදවන වෙනත් යම් ආකාරයක යන්ත්‍රයක් පාවිච්චි නොකළ යුතුය.

16. යම් උඳුනකින් උත්පාදනය වන දුම් පිට කිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව, දුම් කවුළුවක් තනා ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක දුම් උත්පාදනය කෙරෙන යම් උඳුනක් පාවිච්චියට ගැනීම නොකළ යුතුය.

17. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ කර්මාන්තයක හෝ නියුක්ත කම්කරුවන් හෝ සේවා නියුක්තිකයන් හෝ කැඳවීමේ කාර්යයන් ආරම්භ කිරීමේ හෝ කාර්යයන් අවසන් කිරීමේ සංඥා කිරීමක් හෝ වෙනත් කිසියම් කරුණක් සඳහා යම් වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් හෝ භාවිතා කිරීම හෝ පාවිච්චි කිරීම හෝ නොකළ යුතුය. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දින වන විටත්, ඒ ආකාරයේ වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් පාවිච්චි කරනු ලබන කිසියම් කර්මාන්ත ශාලාවක් වන විට, එකී කර්මාන්ත ශාලාවේ පාවිච්චි කරනු ලබන එකී කැඳවීම් සංඥා මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව නිවැරදි කිරීමට එකී දින සිට මාස තුනක කාලයක් හිමිවන අතර, එදිනෙන් පසුව එකී කැඳවීම් සංඥා පාවිච්චි කිරීම නොකළ යුතුය.

18. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ කර්මාන්තයක හෝ පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය කවර හෝ අවස්ථාවක පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතුය.

19. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රලත් මුත්, කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, සේවයෙහි නියුක්ත නොවිය යුතුය.

නගර සභාවේ කාර්යභාරය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කර්මාන්ත ශාලාවක් හා කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර, එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

21. කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්තයක් හෝ පවත්වාගෙන යාම සඳහා 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 164 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නගරසභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය.

බලය පැවරීම.

22. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

23. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටි හා අධිකාරිය.

(24-27)

24. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

26. මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

27. මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

*පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.*

28. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

*අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.*

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

*දඩ හා දණ්ඩන.*

30. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

*අර්ථ නිරූපණය හා නිර්වචන.*

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරසභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගරසභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගරසභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගරසභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකමවරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"නගර සභාව" යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කර්මාන්ත ශාලාව" යන්නට, 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන අතර, කිසියම් අමුද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් අදහස් වේ.

*අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

32. මෙම සම්මතඅතුරු ව්‍යවස්ථාවේ දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

ඇමුණුම - 01

**නගර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. කර්මාන්ත ශාලාවේ/කර්මාන්තයේ නම: ..................................................................

2. කර්මාන්ත ශාලාව/කර්මාන්තය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාසය: ................. වරිපනම් අංකය: .........................

   (ii) වීථියේ / පාරේ නම: ..........................................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: ............................................................ හා ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: ..................................................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: ........................................................................

   (ii) ස්ථිර ලිපිනය: ..........................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය: ........................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: .....................................................

   (v) දුරකතන අංකය: .......................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: ...............................................................

4. (i) කර්මාන්ත ශාලාව/කර්මාන්තය ආරම්භ කළ දිනය: ..................

   (ii) කර්මාන්ත ශාලාවේ / කර්මාන්තයේ, කළමනාකරුගේ / නියෝජිතයාගේ -

      (අ) නම : ..........................................................................

      (ආ) දුරකථන අංකය: ...............................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

   (i) අයිතිකරුගේ නම: ......................................................................

   (ii) ලිපිනය: .....................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............ නැත: ...........

   ඔව් නම්: බලපත්‍රය අංකය: .................... දිනය: ........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: ....................... ...............................,
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

.............................................................,
සභාපති/ ලේකම්/ බලයලත් නිලධාරියා.

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස ( නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය: .......................... වරිපනම් අංකය: ...................................

වීථියේ / පාරේ නම: ..............................................................................................

අයිතිකරුගේ නම: ..................................................................................................

දේපළෙහි ස්වභාවය: ...............................................................................................

වාර්ෂික වටිනාකම: රු. ......................................................

හිඟ වරිපනම් මුදල: රු. ....................... ඇත: .................... නැත.: .................

දිනය: .............................

................................,
පරිපාලන නිලධාරී.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: .....................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ....................................................................

ඒකකය A B C සටහන්:......................................................................

දිනය: ...........................

........................................
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

දිනය: ..........................

......................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

දිනය: ..........................

.....................................................,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුළී ගිවිසුම: ............... ව්‍යාපාරයේ ස්වභාවය: .............. පාරිසරික බලපත්‍ර: ...................

MOH වාර්තාව:.......... අනුකූලතා සහතිකය: ................ මත්පැන් බදු බලපත්‍ර:................

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නොකරමි.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

දිනය: .......................

........................................,
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**ලේකම්වරයාගේ / ගණකාධිකාරිවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: .........................

........................................................,
ලේකම් / ගණකාධිකාරී.

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: .........................

.........................................................................,
නගරසභාවේ ලේකම් / බලයලත් නිලධාරියා.

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ................................... ලදුපත් දිනය: ............................................

බලපත්‍ර අංකය: ................................. බලපත්‍ර දිනය: ...........................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: ..........................

..........................................,
ආදායම් පරිපාලන නිලධාරී.

නගරසභාවේ සභාපතිවරයාගේ/ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය: ..........................

.....................................................,
ලේකම් / ගණකාධිකාරී.

**බලපත්‍රය අත්සන් කරන ලදී**

දිනය: ...........................

.....................................................,
නගරසභාවේ සභාපති/ බලයලත් නිලධාරියා.

8 වැනි පරිච්ඡේදය

**i වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. නගර සභා බල ප්‍රදේශය තුළ වර්තමාන කාලයේ ආපදා කළමනාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. — අතුරු ව්‍යවස්ථාවේ නාමය.

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවීමට ඉඩ ඇති ආපදා අවස්ථා අවම කිරීම, එවැනි යම් ආපදාවක දී අපහසුතාවට පත්වන්නන්ට හෝ පත්වීමට ඉඩ ඇති තැනැත්තන්ට සහන සැලසීම සහ නගර සභා බල ප්‍රදේශයේ ආපදා අවස්ථාවක දී ඊට මුහුණ දීමට හැකිවන අයුරින් පූර්ව සූදානම් කිරීම සඳහා ද, ආපදා අවදානම අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු පූර්ව ආපදා ක්‍රියාදාමයන් සඳහා ද, ඊට සම්බන්ධ හෝ අනුෂාංගික සියලු කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අරමුණ.

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 157 වැනි වගන්තියට අනුකූලව, 36 වැනි වගන්තියේ (ආ) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

4. නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණය කිරීම සහ එවැනි යම් ආපදා තත්ත්වයක් ඇති වූ විට, එම ආපදාවන්ට ලක් වූ හෝ ලක්විය හැකි තැනැත්තන්ට සහන සැලසීම හා ආපදා අවදානම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු පූර්වෝපායන් නිර්ණය කිරීම යනාදී කටයුතු සඳහා නගර සභාවේ ආපදා කළමනාකරණ කමිටුව පිහිටුවිය යුතුය. — ඉටු නොකළ යුතු කාර්යයන්. (4 –25)

5. **කමිටුවේ සංයුතිය -**

(අ) 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව 22 කට නොවැඩි විය යුතු අතර කාන්තාවන් ද නියෝජනය වන පරිදි එම සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) කමිටුවේ සභාපතිවරයා වශයෙන් නගර සභාවේ සභාපතිවරයා;

(ii) කමිටුවේ ලේකම්වරයා වශයෙන් නගර සභාවේ ලේකම්වරයා;

(iii) නගර සභාවේ උප සභාපතිවරයා සමගින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස නගර සභාවේ සභා රැස්වීමෙහි දී ඉදිරි වර්ෂය සඳහා ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන නගර සභාවේ සභිකයන් තුන් දෙනෙකු;

(iv) නගර සභාවේ තාක්ෂණ නිලධාරි;

(v) නගර සභාවේ ගිනි නිවීමේ අංශයේ ස්ථානභාර නිලධාරියා / ප්‍රධාන ගිනි භට;

(vi) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ පත්කරනු ලැබ ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(vii) නගර සභා බල ප්‍රදේශයට ඇතුළත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ/ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයා/ප්‍රාදේශීය ලේකම්වරුන් හෝ විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(viii) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නියෝජිතයෙකු;

(ix) නගර සභා බල ප්‍රදේශයට ඇතුළත්වන පොලිස් ස්ථානාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(x) අවම වශයෙන් නගර සභාබල ප්‍රදේශයේ ක්‍රියාන්විත නාගරික සංවර්ධන උපදේශක කමිටුවේ නියෝජිතයන් තුන් දෙනෙකු;

(xi) නගර සභා බල ප්‍රදේශයේ රජයේ පාසල් ඇතුළත්වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(xii) නගර සභා බල ප්‍රදේශයට අයත් වාණිජ මණ්ඩලයේ හෝ වෙළෙඳ සංගමයේ හෝ නියෝජිතයෙකු;

(xiii) ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි අධිකාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xiv) ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ස්ථානභාර නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xv) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උතුරු පළාතේ ඩිපෝ කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xvi) උතුරු පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජිතයෙකු;

(xvii) උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු

(ආ) නගර සභාවේ සභිකයින් ධුරය හිස්කිරීම මත කමිටුවේ සාමාජික ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන යම් අවස්ථාවක, එසේ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පවත්වනු ලබන සභාවේ ඊළඟ රැස්වීමේ දී, එකී පුරප්පාඩුව සඳහා සභාවේ වෙනත් යම් සභිකයෙකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර, එසේ තෝරා පත්කර ගනු ලබන සභිකයාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින වන තෙක්, ඒ සාමාජික ධුරයේ කටයුතු කරනු ලැබිය යුතුය.

(ඇ) ඉහත 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv). (v) සහ (ix) වැනි උපවගන්තිවල සඳහන් කවර හෝ නිලධාරියෙකු විසින් යම් කමිටු රැස්වීමකට පෞද්ගලිකව සහභාගිවීමට නොහැකි වන අවස්ථාවක, ඔහු විසින් නම් කරනු ලබන හා ඔහුගේ රාජකාරි ආවරණය කරනු ලබන වෙනත් නිලධාරියෙකු ආයතන ප්‍රධානියාගේ අනුදැනුම ඇතිව කමිටු රැස්වීමට සහභාගි කරවිය හැකිය.

6. (i) අවම වශයෙන් සෑම මාස දෙකකට එක් වරක් හෝ කමිටුවේ සාමාන්‍ය රැස්වීමක් පැවැත්විය යුතුය. කමිටුවේ සභාපතිවරයා විසින් උචිත යැයි අදහස් කරනු ලබන යම් අවස්ථාවක කමිටුවේ විශේෂ රැස්වීම් කැඳවීමට කමිටුවේ සභාපතිවරයාට බලය තිබිය යුතුය.

(ii) කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය, නගර සභාවේ සභාපතිවරයා හෝ ඔහු නොමැති යම් අවස්ථාවක නගර සභාවේ උපසභාපතිවරයා හෝ විසින් දරනු ලැබිය යුතුය. නගර සභාවේ සභාපතිවරයා හෝ උප සභාපතිවරයා යන දෙදෙනාටම යම් කමිටු රැස්වීමකට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ)(iii) වැනි උපවගන්තියේ සඳහන් නගර සභාවේ සභිකයින් අතුරින් කෙනෙකු එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතුය.

(iii) කමිටුවේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය, මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(iv) කමිටුව විසින් ගනු ලබන සෑම තීරණයක්ම, එදින රැස්වීමට පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(v) කමිටුව විසින් ගනු ලබන තීරණය සඳහා ඡන්ද ගණන සමාන වුවහොත්, තීරක ඡන්දයක් කමිටුවේ සභාපතිවරයාට හිමි විය යුතුය.

(vi) කමිටුවේ දී ගනු ලබන තීරණ කමිටුවේ ලේකම්වරයා විසින් වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර, කමිටුවේ ඊළඟ රැස්වීමේ දී අවශ්‍ය විය හැකි සංශෝධන ද සමග ඒවා ස්ථිර කරනු ලැබූ විට, කමිටුවේ මූලාසනය දරනු ලබන තැනැත්තා විසින් එයට අත්සන් තැබිය යුතුය.

7. කමිටුවේ කිසිදු ක්‍රියාවක් හෝ කාර්යයක් හෝ ඒ කමිටුවේ සාමාජිකයින් අතර පුරප්පාඩු පැවතීමේ හෝ එහි යම් සාමාජිකයෙකු තෝරා පත්කර ගැනීමේදී, යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුව නිසා පමණක් අවලංගු හෝ බල රහිත වන ලෙස නොසැලකිය යුතුය.

8. කමිටුවේ සෑම රැස්වීමකම වාර්තා, එළඹෙන නගර සභාවේ සභා රැස්වීමේ දී දැන ගැනීම පිණිස සභාගත කළ යුතුය

9. කමිටුව විසින් නගර සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන යම් නිර්දේශ වන්නේ නම්, ඒවා සම්බන්ධයෙන් නගර සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, නගර සභාව විසින් සලකා බලනු ලැබිය හැකිය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ සඳහන් කාර්යයන් කමිටුවේ කාර්යය විය යුතුය.

11. (i) නගරාසභාවේ සභාපතිවරයා විසින් නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළෙඳ ස්ථානයක හෝ දෛනික කාර්යයන් අවසානයේ එකී කාර්යාලය හෝ වෙළෙඳ ස්ථානය හෝ වසා දැමීමට පෙර, ඒ පරිශ්‍රය ඇතුළත දල්වා තබන ලද -

*(අ)* භූමිතෙල් භාවිතා කරන ලාම්පුවක්;

*(ආ)* පොල්තෙල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් දල්වා තබනු ලබන යම්කිසි පහනක්;

*(ඇ)* හඳුන්කූරක් හෝ එවැනි වෙනත් යම් දෙයක්;

*(ඈ)* එවැනි විවෘත දැල්ලක් සහිත වෙනත් යම් දෙයක්;

නිවා දැමීම කළයුතු බවට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(ii) නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළෙඳ හිමිකරු හෝ සඳහන් කරන ලද එකී යම් ස්ථානයක තත් කාලයේ භාරකරු හෝ විසින් ඉහත 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් නියමය පිළිපැදීමට යටත් තැනැත්තා වන අතර ඔහු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු ලවා හෝ එසේ කිරීමට සැලැස්වීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතුය.

12. (i) නගර සභා බල ප්‍රදේශය ඇතුළත පෙර ආපදාවලට ලක් වූ හා ලක්විය හැකි ප්‍රදේශයන් දැක්වෙන සිතියම් සකස් කර, දත්ත ගබඩාවක් පවත්වාගෙන යායුතු අතර මහජනයාගේ දැන ගැනීම පිණිස ප්‍රදර්ශනය කළ යුතුය.

(ii) නගර සභා බල ප්‍රදේශයේ ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි ස්ථාන සිතියම්ගත කිරීම හා ඒ පිළිබඳව මහජනයා පුළුල් ලෙස දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

(iii) ආපදා අවදානම් ස්ථාන පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස භාෂා ත්‍රිත්වයෙන් පුවරු සවිකර යාවත්කාලීන කළ යුතුය.

(iv) ආපදාවට ලක්විය හැකි බවට හඳුනා ගත් ප්‍රදේශවල සිදුවිය හැකි ආපදා අවම කිරීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදාළ අනෙකුත් ආයතන දැනුවත් කර, ඔවුන්ගේ ද සහය ඇතිව ආපදා අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.

13. (i) සියලුම සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් අදාළ අනුමැතිය ලබාදීමේ දී, අදාළ ප්‍රදේශයේ පවතින ආපදා තත්ත්වයන් පිළිබඳ ඇගයීම හා ආපදා අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මගින් ලබාගත යුතු අතර, අධි අවදානම් තත්ත්වයන්ට ලක්විය හැකි වන්නේ නම්, ආපදා අවම කිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත කොට වරලත් වාස්තු විද්‍යාඥයෙකුගේ / හූ විද්‍යාඥයෙකුගේ සහතිකයක් සහිතව සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

(ii) නගර සභා බල ප්‍රදේශය ඇතුළත ග්‍රාම නිලධාරී වසම් මට්ටමින්, දැනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පිහිටුවා ඇති ආපදා කළමනාකරණ කමිටු සමග සම්බන්ධව කටයුතු කළ යුතුය.

14. ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධ කර ගෙන, ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීම සඳහා දැනට රජයේ ක්‍රියාත්මකවන ක්‍රමවේදය තුළට සම්බන්ධ වී කටයුතු කළ යුතුය.

15. ආපදා තත්ත්වයන් සිදුවීමට ඉඩ තිබෙන බවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව කමිටුව විසින් හඳුනාගනු ලැබූ,

(i) ආපදා අවදානම් කලාපය, ඒ එක් එක් කලාපයට ආපදා ඇති වීමට බලපාන හේතු සහ ප්‍රදේශ ආපදාවක දී, එයින් පීඩාවට පත්වන්නන් ඉවත් කර ගැනීමට වඩාත් සුදුසු මාර්ග හා අවතැන් වූවන් තාවකාලිකව රඳවා තැබිය හැකි ස්ථාන කවරේ ද, යන්න පහසුවෙන් සොයාගත හැකි ආකාරයට සිතියම්ගත කිරීම සහ එම සිතියම් යාවත්කාලීනව පවත්වා ගැනීම කළ යුතුය.

(ii) ආපදා අවදානම් කලාප ඇතුළත පදිංචි ජනතාවගේ ජන ජීවිතයට කිසියම් බලපෑමක් ඇති කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් වෙන් වෙන්ව නිශ්චිතව හඳුනාගෙන තිබිය යුතුය.

(iii) ආපදා අවදානම් කලාප ඇතුළත මහා පරිමාණයේ ආපදාවක් හේතුවෙන් අවතැන්වීමට ඉඩ තිබෙන පවුල් තාවකාලිකව පදිංචි කරවීම සුදුසු බවට කමිටුව විසින් හඳුනාගනු ලැබ තිබෙන ස්ථානවලට අවශ්‍ය උපකරණ සපයා ගැනීම සඳහා අදාළ ආයතන හඳුනාගෙන තිබිය යුතුය.

(iv) ආපදා අවදානම් තත්ත්වයන් අවම කිරීම සහ ආපදාවලට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා කාර්යයන් කමිටුවේ සාමාජිකයන්, ප්‍රජාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ වෙනත් පාර්ශ්වකරුවන් සමග එක්ව හඳුනාගෙන ක්‍රියා කළ යුතුය.

(v) ආපදා අවදානම් තත්ත්වයන් අවම කිරීම හා ආපදාවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමේ ප්‍රමුඛතා සැලැසුම් කිරීම සහ එකී සැලැසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

(vi) ආපදා තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එහි පදිංචි ජනතාවට සහන සැලසීම සඳහා කමිටුව විසින් හඳුනා ගෙන ඇති කණ්ඩායමේ සාමාජිකයින්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහය ඇතිව සහන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම නගර සභාවේ කාර්යය විය යුතුය.

16. (i) ව්‍යසන සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන තාක්ෂණික ආයතනවල උපදෙස් මත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිකුත් කරනු ලබන පූර්ව අනතුරු ඇඟවීම් වාර්තා තබා ගැනීම සඳහා නගර සභාවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ නිශ්චිතව යෙදවීම නගර සභාවේ කාර්යය භාරය වන්නේය.

(ii) නගර සභා බල ප්‍රදේශයට බලපෑ හැකි උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදන, ආපදා කළමනාකරණ කමිටුවට හෝ කමිටුවේ සභාපතිවරයාට හෝ කමිටු සාමාජිකයන්ට හෝ දැනුම්දීම, කාර්යය පවරන ලද නිලධාරියාගේ හෝ සේවකයාගේ හෝ වගකීම වන්නේය.

(iii) නගර සභා ප්‍රදේශයේ කිසියම් ආපදා අවදානම් කලාපයක ආපදා අවදානමක් ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවක හෝ එවැනි අවදානමක් ඇති වී තිබෙන අවස්ථාවක, අවදානමට ලක්වීමට ඉඩ ඇති හෝ අවදානමට ලක් වූ තැනැත්තන් වෙත සහන සැලසීම සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේ ද, යන්න තීරණය

කිරීම එම කමිටුව විසින් කරනු ලැබිය හැකිය. ආපදාවන්ට ලක්වූවන්ගේ ජීවිත ආරක්ෂාව, ආහාර, පානීය ජලය, ඇඳුම්, සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ යන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තීරණයක් හෝ තීරණ ගැනීම සඳහා කමිටුව රැස්කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව කමිටු සභාපතිවරයාගේ මතය වන විට, ඒ අවස්ථාවේ දී කළයුතු සහන සැලසීම පිළිබඳ තීරණ ගැනීමට කමිටු සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද, තමා විසින් ගනු ලැබූ තීරණය හෝ තීරණ කවරේ ද, යන්න දින තුනක් ඇතුළත කැඳවනු ලබන කමිටු රැස්වීමේ දී ඉදිරිපත් කිරීම කමිටු සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(iv) මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට කමිටුව හෝ කමිටුවේ සභාපතිවරයා හෝ විසින් ගනු ලැබූ තීරණයක් හෝ තීරණ යටතේ ආපදාවට ලක් වූ තැනැත්තන්ට සහන සැලසීම කළ හැකි අතර, ඒ සඳහාවන වියදම් මහා නගර සභා අරමුදලෙන් වියදම් කරනු ලැබිය හැකි ය.

(v) මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට කමිටුව හෝ කමිටුවේ සභාපතිවරයා හෝ විසින් ගනු ලැබූ තීරණ, එකී තීරණවලට අනුව මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ඒ වෙනුවෙන් සභා අරමුදලෙන් දරනු ලැබූ වියදම් කොපමණ ද, යන්න පිළිබඳව කමිටුව විසින් පිළියෙල කළ සවිස්තර වාර්තාවක් එකී කාර්යයෙන් පසුව එළඹෙන නගර සභාවේ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම කමිටුවේ කාර්යය විය යුතුය.

17. නගර සභා බල ප්‍රදේශයේ ස්වභාවික ආපදාවලට ගොදුරු විය හැකි ඉඩම් මෙන්ම, $30^0$ ට වැඩි වූ බෑවුම් සහිත ඉඩම් හඳුනා ගැනීම සඳහා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ලබාදිය යුතු ය.

18. නගර සභා ප්‍රදේශයේ ජල ගැලීම්වලට පාත්‍රවන ප්‍රදේශ හඳුනාගෙන සිතියම්වල සළකුණු කිරීම හා එම එක් එක් ප්‍රදේශවල උපරිම ජල මට්ටම, වර්ෂාපතනය හා අනෙකුත් සාධක පාදක කර ගත් විද්‍යාත්මක ක්‍රමවේදයකින් හෝ පසුගිය අත්දැකීම් හෝ මත තීරණය කර, නිවාසවල අත්තිවාරම් මට්ටම සඳහා අනුමැතිය ලබාදිය යුතු ය.

19. නගර සභා බල ප්‍රදේශය තුළ පතිත වන වර්ෂා ජලය බාධාවකින් තොරව ගලා යෑමට හැකිවන ආකාරයෙන් මතුපිට ජලාපවහන පද්ධතිය ඉදිකිරීම, නඩත්තුව සහ වැසි ජලය ගලා යෑමට පවතින අවහිරතා මහ හැරවීමට ක්‍රියා කිරීම නගර සභාවේ කාර්යය විය යුතුය.

(i) නගර සභා බල ප්‍රදේශයේ රජයේ හා පුද්ගලික ඉඩම්වල, ඉඩම් අනු බෙදුම් ඉල්ලුම් අනුමත කිරීමේ දී, වැසි ජලය ආපදා තත්ත්වයක් ඇති නොවන සේ ක්‍රමානුකූලව බැහැරලීමට අවශ්‍ය කාණු පද්ධතිය සැලැසුමට ඇතුළත් කර ඇති බව සහතික කළ යුතුය.

(ii) නගර සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබාදීමේ දී, අදාළ ඉඩමේ කට්ටි සැලැස්ම සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති බවට සනාථ කර ගත යුතුය.

20. නගර සභා බල ප්‍රදේශය ඇතුළත වූ නිවාසවල, වෙළෙඳ ස්ථානවල සහ වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ප්‍රයෝජනයට ගනු ලබන වායු සිලින්ඩරවලට සම්බන්ධ කරනු ලබන උපාංග වලින් හෝ ඒ උපාංග එකිනෙකට සම්බන්ධ කරන ස්ථානවලින් වායු කාන්දුවීමකින් තොරව පවත්වාගෙන යාම සහ ඒ පිළිබඳ පූර්වාරක්ෂිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් නගර සභා ප්‍රදේශයේ පදිංචි සහ ප්‍රදේශය තුළ ව්‍යවසායකත්වයේ නියුක්ත තැනැත්තන් දැනුවත් කිරීමට කටයුතු කිරීම නගර සභාවේ කාර්යය විය යුතුය.

21. මෝසම් වැසි සමය ද ඇතුළුව සෑම අවස්ථාවකම අකුණු සැර වලින් ආරක්ෂා වීමේ හා ගිගුරුම් සහිත කාලගුණ තත්ත්වයක් පවතින අවස්ථාවල විදුලි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව නගර සභා ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම නගර සභාවේ කාර්යය විය යුතුය.

22. ආපදා අවදානම් අවස්ථාවක දිවි ගලවා ගැනීමේ සහ ප්‍රථමාධාර ලබාදීම සඳහා ස්වේච්ඡා කමිටු පිහිටුවිය යුතු අතර, අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව ඔවුනට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම නගර සභාවේ කාර්යය විය යුතු ය.

23. මේ අතුරු ව්‍යවස්ථා යටතේ -

(අ) ආපදා අවදානම් අවස්ථා අවම කිරීම සඳහා; සහ

(ආ) ආපදා අවදානම් අවස්ථාවල දී සහන සැලසීම සඳහා;

ආපදා කළමනාකරණ අරමුදලේ, මුදල් ප්‍රමාණයන් ද ඇතුළත් වන සේ, ප්‍රමාණවත් වැය ප්‍රතිපාදන නගර සභාවේ අයවැය ලේඛනයට ඇතුළත් කරනු ලබන බවට වගබලා ගැනීම නගර සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

මේ අතුරු ව්‍යවස්ථා යටතේ නගර සභාවේ සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණය කුමක් ද, යන්න අප්‍රමාදව විගණකාධිපතිවරයා වෙත වාර්තාගත කිරීම නගරසභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

24. (i) මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී, නගර සභාවට දැරීමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා කිසියම් සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු හෝ විසින් මූල්‍යාධාර ලබාදීමට හැකි වන්නේය. එනමුත් එකී මූල්‍යාධාර දේශීය මූල්‍ය ප්‍රභවයක් ලෙසින් ලබා ගන්නේ නම්, උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර පළාත් අමාත්‍යවරයාගෙන් ද, විදේශීය මූල්‍ය ප්‍රභවයක් ලෙසින් ලබා ගන්නේ නම්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ද අනුමැතිය ලබාගත යුතු අතර, එකී කාර්යයන්ට අවශ්‍ය උපකරණ, ආම්පන්න හෝ ද්‍රව්‍යමය ආධාර සැපයීමට හැකි වන්නේය.

(ii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට සපයනු ලබන මූල්‍ය ආධාර, සභා අරමුදලට ගෙවිය යුතු අතර, එසේ සපයනු ලබන මුදල් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා පමණක් යොදවනු ලැබිය යුතුය.

(iii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට ගෙවනු ලබන මුදල් පිළිබඳව වෙනම ගිණුමකින් තොරතුරු පවත්වාගෙන යාම නගර සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු අතර, එකී අරමුදල සභාවේ ආපදා කළමනාකරණ ගිණුම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය. මෙම අරමුදලේ මුදල් යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තියක් හා උපදෙස් මාලාවක් සකස් කර, ඒ සඳහා නගර සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

(iv) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නගර සභා අරමුදලට ලැබෙන හා ඒ අරමුදලෙන් වියදම් කරනු ලබන මුදල් පිළිබඳ වාර්තාවක්, කමිටුවේ සෑම රැස්වීමකදීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී කමිටු රැස්වීමෙන් පසුව පවත්වනු ලබන නගර සභාවේ සභා රැස්වීමේ දී සභාගත කිරීමට සලස්වනු ලැබිය යුතුය.

25. (i) නගර සභා බල ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව, නගර සභා බල ප්‍රදේශය ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්, නගර සභා බල ප්‍රදේශයට අයත් වන වෙනත් පළාත් පාලන ආයතන, නගර සභා ප්‍රදේශය ඇතුළත හා ඒ ආසන්නයේ පිහිටා ඇති වෙනත් රාජ්‍ය ආයතන සහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන යනාදිය සතුව පවත්නා ආපදා කළමනාකරණයට අදාළ වන්නා වූ දත්ත හා තොරතුරු නගර සභාවේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී, නගර සභාවේ ලේකම්වරයා වෙත ලබාදීම ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තෙකු වන විට, ඔහුගේ කාර්යය විය යුතුය.

(ii) ඒ ආකාරයෙන් ම නගර සභාව සතුව පවතින ආපදා කළමනාකරණයට අදාළ දත්ත හා තොරතුරු එකී යම් ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ ආයතනයට එකී දත්ත හා තොරතුරු ලබාදීම නගර සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි හා (ii) වැනි උපවගන්තිවල කුමක් සඳහන්ව තිබුණ ද, කවර හෝ තැනැත්තෙකු විසින් එසේ ඉල්ලා සිටිනු යම් දත්ත හෝ තොරතුරු හෝ පිටතට ලබාදීමෙන් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් හෝ වන්නේ යැයි එකී දත්ත හා තොරතුරු සතුව පවත්නා ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියාකරනු ලබන වෙනත් යම් තැනැත්තෙකුගේ මතය වන අවස්ථාවක, එසේ රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් හෝ විය හැකි දත්ත හා තොරතුරු පිටතට ලබාදීමෙන් වැළකී සිටීමට, ඒ තැනැත්තාට එකී වගන්තිවල නියමයන් බාධාවක් නොවිය යුතුය.

26. මෙහි බලය පැවරීම, මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ විසින් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

27. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ඕනෑම අවස්ථාවක් අදහස් වේ. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය.

28. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව හෝ නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතු ය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේ ය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. දඩ හා දණ්ඩන.

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගර සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගර සභවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගර සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගර සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

" නගර සභාව" යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

"මහා සභාව" යන්නෙන්, නගර සභාවේ මාසිකව පවත්වනු ලබන සභා රැස්වීම අදහස් වේ.

"ආපදා සහ අවදානම්" යන්නෙන්, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන පනතෙහි "ව්‍යසනය" යන්නට දී ඇති අර්ථය අදහස් වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදායක වන්නා වූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නා වූ හෝ නැතහොත්, යම් දේපලක් විනාශ කරන්නා වූ හෝ හානියට පමුණුු වන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වභාවිකව හෝ මිනිසා හෝ විසින් සිදු කරනු ලබන්නා වූ සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්න වීම හෝ අදහස් වේ. ඊට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

(අ) නායයෑමක්,

(ආ) සුළි සුළඟක්,

(ඇ) ගංවතුරක්,
(ඈ) නියඟයක්,
(ඉ) කාර්මික උපද්‍රවයක්,
(ඊ) සුනාමියක් (භූකම්පනාසන්න චලනයක්),
(උ) භූමිකම්පාවක්,
(ඌ) ගුවන් උපද්‍රවයක්,
(එ) සමුද්‍රීය උපද්‍රවයක්,
(ඒ) ගින්නක්,
(ඔ) වසංගතයක්,
(ඕ) පිපිරීමක්,
(ක) ගුවන් ප්‍රහාරයක්,
(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්,
(ච) රසායනික අනතුරක්,
(ජ) විකිරණශීලිත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්,
(ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පිටාර ගැලීමක්,
(ඩ) න්‍යෂ්ටික ආපදාවක්,
(ණ) නාගරික සහ වනාන්තර ගිනි ගැනීමක්,
(ත) වෙරළ ඛාදනවීමක්, සහ
(ද) ටොනාඩෝ, චන්ඩ මාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගිරුම් සහිත කුණාටුවක්.

''සහන සැලසීම'' යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා ආපදා යන්නට දී ඇති අර්ථ නිරූපණයට අනුව කවර හෝ අවස්ථාවක දී හෝ කිසියම් ආපදාවක් නිශ්චිතව ඇති වීමට ඉඩ ඇති යම් අවස්ථාවක දී, එකී ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වීමට ඉඩ තිබෙන හෝ පීඩාවට පත් වූ තැනැත්තන් තාවකාලිකව ආරක්ෂිත ස්ථානයක හෝ ස්ථානවල ස්ථානගත කිරීම, ජීවිත ගලවා ගැනීම, ප්‍රථමාධාර ලබාදීම, ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත් වී ඇති හා අවතැන්වූවන් තාවකාලික නවාතැන්වලින් ඉවත්ව යන කාලය දක්වා, ඒ තැනැත්තන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලැස්වීම අදහස් වන අතර, එසේ අවතැන් වී ඇති තැනැත්තන්ට පිසූ හෝ වියළි ආහාර සැපයීම ද ඊට ඇතුළු විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

32. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**පළමුවන උපලේඛනය**

1. නගර සභා බල ප්‍රදේශයට බලපාන ආපදා හා එම ආපදා බලපාන ප්‍රදේශ කවරේ ද, යන්න හඳුනා ගැනීම.

2. ආපදා තත්ත්වයන්ට හේතු වන හෝ හේතු විය හැකි කාරණා කවරේ ද, යන්න නිගමනය කිරීම.

3. ආපදා තත්ත්වයන් ඇති වීමට හේතු වන කාරණා වළක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට සහ ආපදාවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කරන ක්‍රමෝපායන් හඳුනා ගැනීම.

4. කිසියම් ආපදා තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවකට පත්වීමට ඉඩ තිබෙන ප්‍රදේශ සහ පවුල් කවරේ ද, යන්න නිශ්චිතව හඳුනා ගැනීම සහ එසේ හඳුනා ගැනීමේ දී සිසුන්, ළමයින්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් පිළිබඳ විස්තර වෙන් වෙන්ව සටහන් කර තබා ගැනීම.

5. කවර හෝ ආපදා තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවට පත්වන පවුල්වලට සහන සැලසීමේ ක්‍රමෝපායන් නිගමනය කිරීම.

6. කිසියම් ආපදා තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාව තාවකාලිකව පදිංචි කරවිය හැකි ස්ථාන, ආපදා සිදුවීමට පෙර හඳුනා ගැනීම.

7. කිසියම් ආපදා තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාවට, නැවත පදිංචි වන අවස්ථාව දක්වා ආහාරපාන ලබාදීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීම.

8. කිසියම් ආපදා අවස්ථාවක දී, සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ඇති කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීම.

9. කිසියම් ආපදා තත්ත්වයක් ඇතිවීමට වඩාත් ඉඩ තිබෙන කාල වකවානු කවරේ ද, යන්න නිශ්චය කර හඳුනා ගැනීම.

10. වාහන ගමනාගමනයට අවහිර වන ආකාරයෙන් සිදුවන හෝ සිදුවිය හැකි ඕනෑම ආපදා අවස්ථාවක දී, ඒ මාර්ග වෙනුවට යොදා ගත හැකි විකල්ප මාර්ග කවරේ ද, යන්න හඳුනා ගැනීම.

11. ගංවතුර ගැලීමක දී, මාර්ග ජලයෙන් යටවීම සිදු වන්නේ කුමන ප්‍රමාණයක වර්ෂාපතනයක් ඇති වූ විටක ද, යන්න සහ එම වර්ෂාපතනය පතිත වී කොපමණ වේලාවකින් මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ ද, යන්න හඳුනා ගැනීම.

12. ඕනෑම ගංවතුර ගැලීමක දී, ප්‍රදේශ ජලයෙන් යටවීම සිදුවීමට තරමේ වර්ෂාපතනයක් ඇති වී කොපමණ වේලාවකින් එම ප්‍රදේශ ජලයෙන් යටවීම සිදුවන්නේ ද, යන්න සහ සුළි සුළඟක් හෝ ඊට සමාන කුණාටු තත්ත්වයක දී ඇතිවන අනපේක්ෂිත වර්ෂා තත්ත්වයක දී, ප්‍රදේශයේ ජලයෙන් යටවන ස්ථාන හඳුනා ගැනීම.

13. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව මහා නගර සභා බල ප්‍රදේශයේ තෝරාගත් ස්ථාන කිහිපයක අඩු වියදම් වර්ෂා මාපක සවි කිරීමට කටයුතු කිරීම සහ එම වර්ෂා මාපක දත්ත එකතු කිරීමට කටයුතු කිරීම.

14. නගර සභා ප්‍රදේශයේ ජනතාවට දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රමවලින් පානීය ජලය ලබා ගැනීමට නොහැකිවන කාල වකවානු සහ හේතු හඳුනා ගැනීම.

15. දේපලවලට හෝ ජනතාවට හානිවිය හැකි ආකාරයෙන් මහා නගර සභා ප්‍රදේශ ඇතුළත ගිනි ගැනීම් ඇතිවිය හැකි අවදානම් ස්ථාන හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම.

16. නගර සභා ප්‍රදේශයේ ඇති බෑවුම් සහිත ස්ථානවල නායයාමේ අවදානමක පැවතිය හැකි ස්ථාන අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව හඳුනා ගැනීම.

17. නගර සභා ප්‍රදේශය ඇතුළත වසංගත රෝග ඇතිවීම සහ පැතිරීම පාලනය කිරීමේ ක්‍රමවේදයන් අදාළ සෞඛ්‍ය ආයතනයේ සහය ඇතිව හඳුනා ගැනීම.

18. වහා ගිනි ඇවිලෙන සුළු හෝ පිපිරුම් ඇති කරන සුළු හෝ අන්තරායකාර රසායන ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින්, නගර සභා ප්‍රදේශයේ නිශ්චිත ස්ථානයක ස්ථානගත කර හෝ තැනින් තැන ගෙන යමින් ක්‍රියාත්මකවන කර්මාන්ත හා කර්මාන්තකරුවන් හඳුනා ගැනීම හා ලියාපදිංචි කිරීම.

19. කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් ආපදා කළමනාකරණයට අදාළව රැස්කර ගනු ලබන දත්ත හා තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බවට සහතික වීම.

20. නගර සභා ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව සමඟ සමීප සම්බන්ධතාවක් ගොඩනගා ගනිමින් ආපදා කළමනාකරණයට අදාළව එකී කමිටුව සතු දත්ත හා තොරතුරු ලබාගැනීම සහ සභාව සතු දත්ත හා තොරතුරු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව වෙත ලබාදීම සහතික වීම.

21. කිසියම් ආපදා හෝ අවදානම් අවස්ථාවක දී, සහන කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීමට හැකියාව තිබෙන හා පහසුවෙන් සහය ලබාගත හැකි තැනැත්තන්, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කවරේ ද, යන්න හා ඔවුන් සතුව පවතින උපකරණ හඳුනා ගැනීම.

22. ආපදා හෝ අවදානම් අවස්ථාවක දී, ජීවිත ගලවා ගැනීමේ කාර්යන්හි ස්වේච්ඡාවෙන් නියුක්ත වීමට කැමැති තැනැත්තන් හඳුනාගෙන, ඔවුන් ලියාපදිංචි කිරීම හා ඔවුනට ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීම සඳහා නගර සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

23. කිසියම් ආපදා තත්ත්වයක් ඇතිවීම පිළිබඳ පූර්ව දැනුම්දීම සඳහා හෝ ආපදා සහන සැලසීම සඳහා නගර සභාව විසින් මිළ දී ගනු ලැබිය යුතු උපකරණ හෝ වෙනත් යම් දේ හෝ පිළිබඳව සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

24. කමිටුව විසින් රැස් කරගනු ලැබූ දත්ත, තොරතුරු සහ හඳුනාගනු ලැබූ ක්‍රමවේදයන් පිළිබඳව කමිටුවේ නිර්දේශයන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

**ii වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ නගර සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරුව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. නගර සභා බල ප්‍රදේශය තුළ නගර සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වූ පදික මාරු ස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම තුළින් ගමන්කරුවන් ආරක්ෂා කිරීමේ හා වාහන අනතුරුවලින් වැළැක්වීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 153 වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා එකී පනතේ 157(7)(ඇ) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්

(4 – 5)

4. කිසියම් පදිකයෙකු යම් පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීමට ඒ මතට පිවිසී ඇති අවස්ථාවක, එකී පදික මාරු ස්ථානය පසුකර යාමට පැමිණෙන සෑම වාහනයකම රියදුරා විසින් එකී පදිකයා පාර මාරු වී අනෙක් පසට පිවිසෙන තෙක් තමා පදවාගෙන යන වාහනය, නතර කර තබා ගැනීම කළ යුතුය.

5. පොලිස් නිලධාරියෙකු හෝ රිය නියාමකවරයෙකු හෝ ආලෝක සංඥා මඟින් හෝ වරින් වර පාලනය කරනු ලබන යම් පදික මාරු ස්ථානයක් හරහා ගමන් කිරීමට පැමිණෙන කවර හෝ වාහනයක් පාලනය කළ හැකිය. එකී පොලිස් නිලධාරියා හෝ රිය නියාමකවරයා හෝ විසින් ආලෝක සංඥාවක් හෝ වෙනත් සංඥාවක් හෝ මඟින් දෙනු ලබන නියෝගයට අනුව එකී වාහනය පදවන රියදුරා ක්‍රියා කළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්

(6 – 10)

6. කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් පදික මාරු සළකුණක් විකෘති කිරීම හෝ මකා දැමීම හෝ නොකළ යුතුය.

7. කිසියම් වාහනයක් පදික මාරු ස්ථානයේ වාහන නතර කර තැබීමට සළකුණු කර ඇති සීමාව පසු කිරීමට ආසන්න අවස්ථාවක, කවර හෝ පදිකයෙකු පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීම පිණිස පදික මාරු ස්ථානය මතට පිවිසීම නොකළ යුතුය.

8. කවර හෝ පදිකයෙකු කිසියම් පදික මාරු ස්ථානයක් මතින් පයින් ගමන් කිරීමේ දී සාධාරණ වේගයකින් වීදියෙන් එක පැත්තක සිට අනික් පැත්තට ගමන් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය කාලයට වැඩි කාලයක් කවර හෝ පදික මාරුවක් මත රැඳී සිටීම හෝ ඒ හරහා ගමන් ගන්නා වාහනයක ගමනාගමනයට බාධාවන පරිදි රැඳී සිටීම හෝ නොකළ යුතු අතර, එකී පදික මාරු ස්ථානය මතින් ගමන් ගන්නා වෙනත් යම් පදිකයෙකුගේ ගමනට අනිසි ආකාරයෙන් බාධා කිරීම ද නොකළ යුතුය.

9. කවර හෝ වාහනයක රියදුරකු විසින් තමා විසින් පදවාගෙන එනු ලබන වාහනය, තමන්ගේ පාලනයෙන් පරිබාහිර වූ හේතු නිසා ඉදිරියට යාමෙන් තමා වළක්වනු ලැබ ඇත්නම්, එකී වාහනය යම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කුමන හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතුය.

10. කවර හෝ වාහනයක රියදුරකු විසින් අනතුරක් වැළැක්වීම පිණිස එකී වාහනය පදික මාරු ස්ථානයක් මත නතර කිරීමට අවශ්‍ය වන්නේ නම් මිස, එකී වාහනය කිසියම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කුමන හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතුය.

නගර සභාවේ කාර්යභාරය

(11–14)

11. මේ කොටසේ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයට පත් කරන ලද පදික මාරු ස්ථානවල කළයුතු සළකුණු කිරීම් මෝටර් රථ වාහන පනතේ 164 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ මධ්‍යම රජයේ ප්‍රවාහන

අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වැනි දිනැති 444/18 අංක දරණ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කළ 1 වැනි කොටසේ (1) වැනි වගන්තියේ නියෝගවල 16 වැනි නියෝගය සමඟ කියවිය යුතු 4.18 වැනි රූපයේ ආදර්ශයට අනුව විය යුතුවාක් හැර, එකී නියෝගවලට කලින් කලට කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතුය. එසේම එකී සළකුණු මැකී යාමට ඉඩ නොදී නැවත පින්තාරු කිරීමට සැලැස්වීම නගර සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

12. නගර සභා බල ප්‍රදේශය තුළ මහා මාර්ගවල සහ මංමාවත්වල ගමන් කරන පදිකයන්ට පාර මාරුවීම සඳහා පදික මාරු ස්ථාන නගර සභාවේ ප්‍රවාහන උපදෙස් කමිටුව මඟින් හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම හා සළකුණු කිරීම නගර සභාව විසින් කළ යුතුවාක් මෙන්ම, මෝටර් රථ වාහන ආඥා පනතේ වූ රෙගුලාසිවලට අනුව සංඥා පුවරු සවි කළ යුතුය.

13. නගර සභාව විසින් කළින් කළට කරනු ලබන තීරණයක් අනුව කිසියම් පදික මාරු ස්ථානයක් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ නගර සභාවට බලය තිබිය යුතුය.

14. නගර සභා බල ප්‍රදේශයේ වූ කිසියම් පාසලක් ඉදිරිපිට ඇති මාර්ගයේ සළකුණු කර ඇති පදික මාරු ස්ථානවල කාර්යයේ නියුතු රිය නියාමකවරුන් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට නගර සභාවට හැකිය.

*බලය පැවරීම*

15. මෙම අතුරු ව්‍යවස්ථාවලට නියමිත කාර්යභාරය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් නගර සභාවට පවරන ලද බලතල නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් එකී නගර සභාවේ යම් නිලධාරියෙකුට ලිඛිතව පැවරීම නීත්‍යානුකූල වන්නේය.

*පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය*

16. කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

*අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම*

17. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

*දඩ හා දණ්ඩන*

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

*අර්ථ නිරූපණය හා නිර්වචන.*

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරසභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගර සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගරසභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

" නගර සභාව" යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"රිය නියාමක" යන්නෙන්, පදික මාරු ස්ථානවල පදිකයන් සහ වාහන හැසිරවීමේ කාර්යය සඳහා කිසියම් පාසලක ප්‍රධානියා හෝ ඔහුගෙන් බලයලත් යම් තැනැත්තෙකු හෝ විසින් නම් කරනු ලැබූ හා එම කාර්යයේ නියුක්ත පාසල් සිසුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ අදහස් වේ.

"වාහනය" යන්නෙන්, මෝටර් රථ වාහන පනතේ සඳහන් කවර හෝ මෝටර් වාහනයක් අදහස් වන අතර, කිසියම් කරත්තයක්, අත් කරත්තයක්, තල්ලු කරගෙන යන කරත්තයක්, පාපැදියක්, රික්ෂෝවක් සහ මෝටරයක් මඟින් ක්‍රියා කරවන බයිසිකලයක් ද ඊට ඇතුළත් විය යුතුය.

"මාරු ස්ථාන" යන්නෙන්, වර්ණ කළ රේඛා හෝ වෙනත් ආකාරයකට පයින් ගමන් කරන්නන් සඳහා වෙන් කොට දක්වා ඒ බව "මෙතැනින් මාරු වනු" යන වචන සහිත මාර්ග සංඥාවකින් සඳහන් කරනු ලැබ ඇති මාර්ගය හරහා මාරුවීම සඳහා වූ ස්ථානයක් අදහස් වේ.

"රියදුරු" යන්නෙන්, පාපැදියක් හෝ ත්‍රීරෝද රථයක් සම්බන්ධයෙන් වන විට, එය යන්ත්‍රානුසාරයෙන් හෝ අන් ආකාරයකින් පදවනු ලැබුව ද, එය පදවා ගෙන යන තැනැත්තා ද, අත් කරත්තයක් හෝ තල්ලු කරගෙන යන කරත්තයක් හෝ සම්බන්ධයෙන් වූ විට, කරත්තය ඇදගෙන යන නැතහොත් තල්ලු කරගෙන යන තැනැත්තා ද, ජින් රික්ෂෝවක් සම්බන්ධයෙන් වූ විට, එම ජින්න රික්ෂෝව ඇදගෙන යන තැනැත්තා ද, මෝටර් රථ වාහන පනත යටතේ සඳහන් කවර හෝ වාහනයක් මෙහෙයවන්නා ද අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

20. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**iii වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් වන කාර්යයන් අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය සම්බන්ධිත කළමනාකරණ කාර්යයන් සහතික කරලීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 118, 119 හා 120 වැනි වගන්තිවලට අනුව 157(9) (ආ) වැනි උපවගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.
(4 – 17)

4. නගර සභා බල ප්‍රදේශය තුළ යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබාගත යුතුය.

5. නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුතු ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුතුය.

6. පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තමන්ගේ පරිශ්‍රයේ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව එක්රැස් කළ යුතුය.

7. සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිවලට අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය, 8 සිට 28 දක්වා සඳහන් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වෙන් කළ යුතුය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුතුය.

8. හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීමට හෝ මුදා හැරීමට භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව එක්රැස් කරලීම පිණිස මනා තත්ත්වයෙන් නඩත්තු කළ යුතු ය.ඒවා ඉරී, සිදුරු වී, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණයවීම නිසා බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම්, ඒවා මෙම කාර්යයන් සඳහා පාවිච්චි නොකර, අතහැර දැමිය යුතුය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ විසින් ඉල්ලීමක් කරන්නේ නම්, නගර සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ සහනාධාරයක් වශයෙන්, එවැනි බහාලුම් නගර සභාවෙන්ම සැපයිය හැකිය.

9. යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් හෝ මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදා හැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී, එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම්, එම තැනැත්තාට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

10. මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ යම් අපද්‍රව්‍ය 18(iii) වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සමඟින් මෙම අතුරු ව්‍යවස්ථාවලින් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුතුය.

11. යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට හෝ පහත (අ) වැනි හා (ආ) වැනි උපවගන්තිවලින් දැක්වෙන කරුණු හැර, වෙනත් ක්‍රමයකින් අපද්‍රව්‍ය තම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය. –

(අ) නගර සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි;

(ආ) නගර සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

12. යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද සැලැසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදි කරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හා වැළලීම කළ හැකිය.

13. යම් පරිශ්‍රයක හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු “කොම්පෝස්ට්” බඳුනක් තබා ගැනීම නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙතින් ඉල්ලීමක් කළහොත්, ඒ හිමිකරුට හෝ පදිංචිකරුට හෝ එම කොම්පෝස්ට් බඳුන නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබේ නම්, එය එම පරිශ්‍රය තුළ තබා ගැනීමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ.

14. හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන “ගෙවතු අපද්‍රව්‍ය” හැකිතාක් දුරට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ හැකිය. එම හිමිකරු හෝ පදිංචිකරු හෝ ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන නගර සභාව විසින් කලින් කළට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවා නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට හෝ බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට හෝ භාරදිය යුතුය.

15. වීථියක හෝ මංමාවතක හෝ යාබද නිවෙස් හිමිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ මායිම් වැටේ වැවෙන යම් ගසක් හෝ එහි අත්තක් හෝ කපන හිමිකරු හෝ පදිංචිකරු වහාම එය ඉවත් කළ යුතුය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුතුය. එසේත් නැතිනම් නගර සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් ගෙවා, නගර සභාවේ භාරකරුට ඒවා භාරදිය යුතුය.

16. සෑම තැනැත්තෙකුම, තම පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුතුය. එසේ මළපහ කරනු ලැබුවහොත් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම අදාළ තැනැත්තාගේ වගකීම වන්නේය.

17. නිවසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට හෝ අයදුම් කරන යම් තැනැත්තෙකු, තම පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර තම අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුතුය.

18. **නිවාස පරිශ්‍රයන්**

(i) සෑම හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි (වර්ගීකරණය කර) තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම හෝ එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට දමා, ඒවා ඉවත් කරනු ලබන තෙක්, ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුතුය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක දමා තැබිය යුතුය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන, ඒවා ප්‍රදේශයට සරිලන පරිදි කළින් කළට නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් නගර සභාව වෙත ගෙවීම් කිරීම මත නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම මේ කොටසේ 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, එම තැනැත්තා ඉහත (ඇ) වැනි ඡේදයෙන් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. නැතිනම් නගර සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදි කරනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුතුය.

19. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම තම අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි වෙන් කර, වර්ගීකරණය කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 19 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු හෝ, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් හෝ සකසා ගත යුතුය. ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය.

(iii) මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට

පෙර, අදාළ බඳුන් හෝ බහාලුම් හෝ තබා ගන්නා ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිම් මහලක හෝ උඩු මහලක හිමිකරු හෝ පදිංචිකරු හෝ තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුන්වල දැමිය යුතුය.

(v) සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. හිමිකරු හෝ පදිංචිකරු හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, එම තැනැත්තා (ඇ) සහ (ඈ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය සමගින් එකී අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු වෙත භාරදිය යුතුය. නැතිනම්, සෑම අපද්‍රව්‍යයක් සඳහාම නගර සභාව විසින් තීරණය කර ඇති බඳුන්වල හෝ බහාලුම්වල හෝ දැමිය යුතුය.

(vi) නගර සභාවේ සභා රැස්වීමේ දී පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නොමිලයේ සැපයීම කළ යුතුය.

(vii) සෑම මුඩුක්කු නිවසෙකම හිමිකරු හෝ පදිංචිකරු තමන්ගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කර තම වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දැමිය යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(viii) මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

20. ව්‍යාපාරික ස්ථාන හා කාර්යාල -

ඉටු කළයුතු කාර්යයන්.

(20 – 29)

(i) ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ සෑම හිමිකරුවෙක්ම හෝ සේවකෙයකුම හෝ එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරන තෙක්, වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුතුය.

(iii) ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ හිමිකරු හෝ නිලධාරියා හෝ මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iv) උඩු මහලේ හෝ බිම් මහලේ හෝ කිහිපයකින් යුක්ත ව්‍යාපාරික ස්ථාන හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ නිලධාරියා, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත

කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම ව්‍යාපාරික ස්ථානයෙන් හෝ කාර්යාලයෙන් හෝ තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් ව්‍යාපාරික ස්ථානය හෝ කාර්යාලය සඳහා අවශ්‍ය වන අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ සැපයිය යුතුය.

(v) මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති වෙළෙඳ සැලක හෝ කාර්යාලයක හෝ යම් හිමිකරුවෙකු හෝ සේවකයෙකු හෝ විසින් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා තැබිය යුතුය. මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුටම හා සේවකයෙකුටම අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග සහ මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග මහා නගර සභාව විසින් කළින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ වෙත ගෙවීම මත, එකී අපද්‍රව්‍ය හිමිකරු හෝ සේවකයා හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට හැකි ය.

(vii) අසල්වාසීන්ට හෝ ව්‍යාපාරික ස්ථානයේ හෝ කාර්යාලයේ හෝ සේවයේ නියුක්ත තැනැත්තන්ට, යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් මතු නොවන පරිද්දෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීම හා මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නඩත්තු කිරීම ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ සෑම හිමිකරුවෙකුගේම හෝ සේවකයෙකුගේම වගකීම වන්නේ ය.

21. ආපනශාලා -

(i) යම් ආපනශාලාකරුවෙක් ම හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙකු, තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුතු ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

(ආ) ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ඉ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි.

(ii) යම් ආපනශාලාකරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙක්, තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරන තෙක්, වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුතු ය.

(iii) යම් ආපනශාලාකරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙකු, මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් සතෙකු ඇතුළුවීම වළකමින්, සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය, ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක හෝ ඇසිරිය යුතු ය.

(iv) මේ කොටසේ 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

(v) මේ කොටසේ 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ඒවායේ ස්වභාවය සැලකිල්ලට ගෙන නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් එකී අපද්‍රව්‍ය හිමිකරු හෝ සේවකයා හෝ විසින් නගර සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට හැකි ය.

22. **එළවළු සහ පලතුරු වෙළෙඳ සැල් -**

(i) සෑම එළවළු වෙළෙඳ සැලක හා පලතුරු වෙළෙඳ සැලක හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා හෝ තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පලතුරු සහ වෙනත් යම් අපද්‍රව්‍ය;

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක දැමිය යුතු ය. එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි සුරක්ෂිතව වසා තැබිය යුතු ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුතු ය.

(iii) මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් නගර සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

23. **පදික වෙළෙඳාම -**

(i) සෑම පදික වෙළෙන්දෙක් ම, එකී තැනැත්තාගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක හෝ බහාලුමක හෝ තුළට දැමිය යුතු ය. මේ කොටසේ 23 අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කා වූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ දමා තැබිය යුතු අතර, අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන වේලාවක් හැර, එය වසා තැබිය යුතු ය.

(iii) සෑම පදික වෙළෙන්දෙක් ම, අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නගර සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර, නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් නගර සභාව වෙත ගෙවිය යුතු ය.

24. **කර්මාන්ත ශාලා -**

(i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක් ම හෝ නිෂ්පාදකයෙක් ම හෝ කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර, පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් නගර සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු ය.

25. **කැණීම්, ඉදි කිරීම් සහ කඩා දැමීම් -**

(i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කැණීමක් හෝ යම් නිර්මාණයක් ඉදි කිරීමක් හෝ කඩා දැමීමක් හෝ මගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, ඒ පරිශ්‍රය ඇතුළත නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරනු ලබන ස්ථානයක ගබඩා කළ යුතු ය.

(ii) මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය, නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක්, නගර සභාවට ගෙවීම මත, නගර සභාවේ බල ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

26. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකතන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් නගර සභාවේ සභාපතිවරයාගෙන් හෝ නගර සභාවේ ලේකම්වරයාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් හෝ පූර්වාංග අනුමැතිය ලබාගත යුතු ය.

(ii) ඉහත 26 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙරාතුව, අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩපිළිවෙළ, යෝජිත කාර්යය නිමවීමෙන් අනතුරුව, පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදු වූ අපද්‍රව්‍ය, ඉල්ලුම්කරු ඉවත් කිරීමට අතපසු කරන්නේ නම්, එය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුතු ය. අනුමැතිය ලබාදීමට පෙර, ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක්, තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේ ය.

(iii) කවර හෝ තැනැත්තෙකු, අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරන්නේ නම්, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් තීරණය කරනු ලබන ආකාරයට, එකී අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන අතර, ඒ සඳහා දැරීමට සිදුවන වියදම මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කළ මුදල්වලට හිලව් කරනු ලැබේ.

27. **රෝහල් -**

(i) රෝහලක හිමිකරු විසින් පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* මෙම උපවගන්තියේ (ඈ) වැනි ඡේදයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග හැර වෙනත් අපද්‍රව්‍ය;

*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ (අ) සහ (ආ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර, ඒවා ඉවත් කරනු ලබන තෙක්, යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු ය. (i) වැනි උපවගන්තියේ (ඇ) සහ (ඈ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක හෝ තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුතු ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම රෝහල්වලට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුතු ය.

(iii) මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

28. (i) මේ කොටසේ 8 සිට 27 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙකු හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජයීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධාන කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක්, එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය, පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය;

(ii) මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන තැනැත්තෙකු, එම ක්‍රියාකරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස, ඒ පිළිබඳව කල්තියා නගර සභාවට දැනුම්දිය යුතු ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය, ඉවත් කරගනු ලබන තෙක්, වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුතු ය.

(iv) මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ඉහත (i) වැනි වගන්තියේ (ඈ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ නගර සභාව විසින් කලින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

29. වීථි සහ පොදු ස්ථාන -

නගර සභාවේ ලේකම්වරයා විසින් නගර සභාවේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කර, මහා සභාවේ අනුමැතියට යටත් ව පහත දැක්වෙන කාර්යයන් සැලැසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතු ය.

(i) නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළෙඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;

(ii) වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;

(iii) උත්සව කාලවල දී, විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ නගර සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී නගර සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම;

(iv) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම් සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර, එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම;

(v) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ පිළිබඳව ක්‍රියා කිරීම.

ඉටු නොකළයුතු කාර්යයන්.

(30 – 40)

30. හිමිකරුගේ හෝ පදිංචිකරුගේ, නිවැසියන්ගේ හෝ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ හෝ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුතු ය.

31. කවර හෝ තැනැත්තෙකු වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශ්‍රයකට හෝ අපද්‍රව්‍ය මුදා හැරීම නොකළ යුතු ය.

32. කවර හෝ තැනැත්තෙකු නගර සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුතු ය.

33. කවර හෝ තැනැත්තෙකු විසින් නගර සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදා හැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුතු ය.

34. තත් කාර්යය සඳහා නගර සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර, එහි සඳහන් ස්ථානයේ දී කවර හෝ තැනැත්තෙකු විසින් ගෝ ඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හෝ හැරුණු විට, වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු හෝ ඝාතනය නොකළ යුතු ය.

35. අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක හෝ තබාගත යුතු ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ හෝ පොදු ස්ථානයක හෝ නොදැමිය යුතු ය.

36. පදික වෙළෙන්දෙක් වාහනවලට හෝ පදිකයින්ගේ ගමනාගමනයට හෝ බාධා ඇතිවන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් හෝ නොතැබිය යුතු ය.

37. සෑම පදික වෙළෙන්දෙක් ම මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඇ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකවම භාරදිය යුතු ය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ හෝ නොතැබිය යුතු ය.

38. නගර සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක නෙතමනය වාණිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙකු නොකළ යුතු ය.

39. නගර සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශය ඇතුළත, අවසර නොලත් කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් නොකළ යුතු ය.

අනවසරයෙන් ඇතුළුවීම හෝ ගැවසීම හෝ නොකළ යුතු ය.

එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයන් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම හෝ නොකළ යුතු ය.

කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව නගර සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස, නගර සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුතු ය.

40. නගර සභාවේ සභාපතිවරයාගේ හෝ නගර සභාවේ ලේකම්වරයා සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, කිසිම තැනැත්තෙක් නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් හෝ එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා ලබාදීම හෝ භාවිතා කිරීම හෝ නොකළ යුතුය.

41. නගරසභාවේ ලේකම්වරයා විසින් නගර සභාවේ සභාපතිවරයා සමග සාකච්ඡා කර, මහා සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ යුතු ය.

නගර සභාවේ කාර්යභාරය.

(i) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ii) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදා හැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම.

(iii) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත තැනැත්තන්ට හා කුඩා ව්‍යවසායකයන්ට පහසුකම් සැපයීම, ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින තැනැත්තන්ට දිරි ගැන්වීම් පිරිනැමීම.

(iv) අපද්‍රව්‍ය මුදා හැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(v) නගර සභාවේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින්, අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්ය සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ, යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම

(vii) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ, අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(viii) නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරන ලද අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර, වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ නාගරික කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම.

(ix) නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු මගින් එක්කාසු කළ ආහාර සහ වෙනත් ජෛව ජීර්ණීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය, ප්‍රායෝගික අන්දමින් හැකිතාක් දුරට මුළුමනින් හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩපිළිවෙළක් යොදා ගැනීමත් සමග මෙම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ විසින් අනුමත කරන ආකාරයට බැහැරලීමට සුදුසු පියවර ගැනීම.

(x) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ජා කර, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් අනුමත කරනු ලබන ආකාරයට සියළුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(xi) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව, අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂණ බිම් පිරවුමක් හෝ පවත්වාගෙන යාම.

(xii) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන්හි නිරතවන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(xiii) නිවසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නගර සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත කාර්යය ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(xiv) නගර සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙළ කිරීම.

(xv) 2000 වසරේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වසර 03ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම. එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත නගර සභාව විසින් වාර්ෂිකව අනුමත කිරීම.

(xvi) මේ කොටසේ 41 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) සිට (xv) දක්වා වන උපවගන්තිවලින් සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නගර සභාවේ සභාපතිවරයා ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත ද, වෙනත් පැමිණිල්ලක් නම් දින දහහතරක් ඇතුළත ද විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

අයකිරීම් හා ගාස්තු.

42. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙකු, පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම්, එකී තැනැත්තාට නගර සභාව විසින් බලපත්‍රයක් නිකුත් කළ හැකි ය.

*(අ)* නගර සභාවේ බල ප්‍රදේශය තුළ නගර සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ආ)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඇ)* එක්රැස් කළ අපද්‍රව්‍ය පිණිස නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදි කරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානවලට අනුමැතිය ලබාදීම.

*(ඈ)* නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් අනුමත කරන පරිදි එක්කාසු කළ අපද්‍රව්‍ය, ජනතාවට පීඩාවක් සිදු නොවන අන්දමින් සනීපාරක්ෂක ක්‍රමයට ප්‍රවාහන කිරීම සඳහා වාහන සැපයීම.

*(ඉ)* අදාළ ව්‍යවසායකත්වයක් නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ආයතනය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට උපයෝගී කර ගැනීමේ දී හෝ පිරියම් කිරීමේ දී හෝ අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ හෝ අපද්‍රව්‍ය නගර සභාව වෙත භාරදීමට එකඟවීම.

නගර සභාව විසින් කලින් කලට අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා තීරණය කරනු ලබන ගාස්තුවක් නගර සභාව වෙත ගෙවීම් කළ යුතු ය.

(ii) නගර සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභ කළ විටෙක, ඒ සඳහා වන හේතුව ඉල්ලුම්කරු ඉල්ලා සිටින්නේ නම්, ප්‍රතික්ෂේප කිරීමට හෝ නිෂ්ප්‍රභ කිරීමට හෝ හේතු ඉල්ලුම්පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

(iii) නගර සභාව විසින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසරය ලබාදුන් මධ්‍යස්ථානවල බලපත්‍රයේ, එක්රැස් කරනු ලබන අපද්‍රව්‍යවල වර්ග, අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර ලබාදුන් ප්‍රදේශ සහ වෙනත් සුදුසු කොන්දේසි සටහන් කර දැක්වීම.

(iv) මේ කොටසේ 42 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු නොකරන අවස්ථාවක දී, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කරනු ලැබේ.

(v) මේ කොටසේ 42 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී, කවර හෝ තැනැත්තෙකු අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුතුය. එවැනි අවස්ථාවක දී, බලපත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් මාධ්‍ය හරහා ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුතුය.

43. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නගර සභාවේ සභාපතිවරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

44. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

45. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථානවල/පරිශ්‍රවල පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (45 – 49)

46. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථාන / පරිශ්‍ර පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථානවල හිමිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ කුලීකරුගේ හෝ බලපත්‍රලාභියාගේ හෝ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

47. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට, සඳහන් කර ඇති ස්ථානයන්හි හිමිකරු හෝ පදිංචිකරු හෝ බලපත්‍රලාභියා හෝ පටහැනි වන අවස්ථාවක, වහාම හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර හෝ එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට නියම කෙරෙන දැන්වීමක්, නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී තැනැත්තා වෙත භාරදිය යුතුය.

48. මේ කොටසේ 47 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් වේලාවට හා දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර (14)කට නොවැඩි විය යුතුය.

49. මේ කොටසේ 47 වැනි හා 48 වැනි අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

50. බලපත්‍රලාභියා හෝ සම්බන්ධිත කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක්, නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

52. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥා පනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් දඩ හා දණ්ඩන.

සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරසභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගරසභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගරසභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගරසභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"නගර සභාව" යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කාර්යාලය" යන්නෙන්, 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම අදහස් වේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන්, කිසියම් ඉඩමක / ව්‍යාපාරික ස්ථානයක, හිමිකරු හෝ පදිංචිකරු හෝ ඉඩමක/ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරු අදහස් වේ.

"ව්‍යාපාරික ස්ථානය" යන්නෙන්, තොග හෝ සිල්ලර වෙළෙඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් අදහස් වන අතර ආහාරපාන අළෙවියට තබා ඇති ස්ථානයක් සහ කොණ්ඩා සකසන ස්ථානයක් හෝ රූපලාවන්‍ය ස්ථානයක් හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

"ආපනශාලා" යන්නෙන්, දින පහසුකම් සහිතව හෝ රහිතව හෝ මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් වේ. එයට හෝටලයක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

"කර්මාන්ත ශාලාව" යන්නට, 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන අතර, කිසියම් අමු ද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් ද අදහස් වේ.

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, පස්, මඩ, දූවිලි, අළු සහ අපද්‍රව්‍ය ද, ගොඩනැගිලි කඩා දමන විට ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ද, ඒ සමඟ කුණු, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය ද අදහස් වේ.

"රෝහල" යන්නෙන්, යම් රෝගයකින් හෝ දුබලතාවකින් හෝ පෙළෙන තැනැත්තන් හෝ සතුන් හෝ භාර ගැනීම්, ඔවුනට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ත්ව සායනයක් ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන්, සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු ඊට ඇතුළත් වේ.

"උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය" යන්නෙන්, මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හෝ හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයෙන් වන අපද්‍රව්‍ය අදහස් වේ.

"එක්රැස් කිරීම" යන්නෙන්, බලයලත් එක්රැස් කරන්නෙකු හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු හෝ විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් වේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම් අදහස් වේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

"ගබඩා කිරීම" යන්නෙන්, හිමිකරුවෙකුගේ හෝ පදිංචිකරුවෙකුගේ හෝ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම හෝ අදහස් වේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන්, ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් හෝ ඉවත් කරන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් වේ.

"ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය" යන්නෙන්, ක්ෂුද්‍ර ජීවී කාරකයන් මඟින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන්, අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි, එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයන් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන්, සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් හෝ පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රවාහනය" යන්නෙන්, මිනිස් හෝ සත්ත්ව හෝ යාන්ත්‍රික හෝ බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යක් යොදා ගනිමින්, අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් වේ.

"බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන්, අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රා හැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් වේ.

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන්, අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබා ගැනීමට හෝ නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් හෝ බලපත්‍රයක් ලබාගත් තැනැත්තෙකු අදහස් වේ.

"බැහැරලීම" යන්නෙන්, ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත්, පිරියම් නොකරන ලද්දාවූත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් වේ.

"මාරු කරන ස්ථානය" යන්නෙන්, නගර සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කරන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණය, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම යනාදිය සඳහා අපද්‍රව්‍ය එක්කාසු කරන ස්ථානය වේ.

"වෙන් කිරීම" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති ප්‍රභේදයන්ට අනුකූලව, අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් වේ.

"සැකසීම" යන්නෙන්, අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ.

"නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන්, බක්කිවලින් හෝ බහාලුම්වලින් හෝ අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා නගර සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට නගර සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් වේ.

"පොදු ස්ථානය" යන්නෙන්, පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශ්‍රයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

54. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

## 9 වැනි පරිච්ඡේදය

**i වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 157(9)(ඣ) වැනි වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.

(4 - 5 )

4. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා නගර සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම වාසය කරන පදිංචිකරුවන් -

(i) සියළුම නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, කුරුම්බා හා තැඹිලි කෝම්බ සහ ඒ ස්ථානයේ තිබෙන වෙනයම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා පාවිච්චි කරනු ලබන භාජන වැනි දෑ ඉවත් කිරීමට හෝ විනාශ කිරීමට හෝ එසේ කිරීමට සැලැස්විය යුතුය.

(ii) නේවාසික හෝ අනේවාසික හෝ ගොඩනැගිලි වලින් වැහි ජලය ගලායාම සඳහා වන පයිප්ප, පිහිලි සහ ගෙවතුවල ඇති කාණු නිසියාකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය. ඒවායේ අවහිරතා සිදු වන්නේ නම් වරින් වර පරීක්ෂා කර, ඒවා ඉවත් කළ යුතුය.

(iii) නේවාසික හෝ අනේවාසික හෝ පරිශ්‍ර තුළ තිබෙන සියළුම ජල බඳුන්, ජල ටැංකි සහ ජලය එක්රැස් කර තබන වෙනත් භාජන මනා තත්ත්වයකින් සුදුසු ප්‍රතිසංස්කරණ සහිතව පවත්වාගෙන යාම, ඒවා මදුරුවන්ගෙන් හා රෝග කාරක කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීම, ඒවායේ මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයකින් තබා ගැනීම හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීමට අවශ්‍ය විය හැකි සියළුම කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන්නේය.

(iv) පරිශ්‍රය තුළ වූ සියලුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාම කළයුතු අතර මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයෙන් තබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය.

(v) ජලය හිස් කිරීමට හැකිවන ආකාරයෙන් ඉදි කර ඇති යම් කෘත්‍රිම පොකුණු ඇත්නම්, යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් එහි ජලය හිස්කොට පවිත්‍ර කළ යුතුය.

(vi) ගෙවතුවල හා ඉඩම්වල තිබෙන කාණු වලින් ගලායන ජලය එකතු වී, දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා දිනපතාම නඩත්තු කළ යුතුය.

(vii) ආහාර පිණිස හෝ අලංකාරය පිණිස වවනු ලබන පැලෑටි හැර අනෙකුත් සියලුම ලඳු කැලෑ, වෘක්ෂ සහ වනාන්තර යනාදිය මනුෂ්‍ය වාසස්ථාන වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක හෝ සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කර, පිරිසිදුවෙන් තබාගත යුතුය.

(viii) සියලුම ගල් වළවල්, පස් කැණීම් කරන ලද වළවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වළවල් යනාදියේ ජලය නොරැඳෙන ආකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය.

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැලෑටි, දිය පරඬල් ඇතුළත් විවිධ ජලජ පැලෑටි හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීමට හේතුවක් වන බව කළින්ම දැන ගන්නා පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එවැනි පැලෑටි යම් දිය මාර්ගයක් දිගේ පාවීයාම නතර කිරීමට හැකිවන පරිදි සුදුසු බාධක ඉදිකර, ඒවා පැතිරීයාම වළක්වාලිය යුතුය.

(x) වැසිකිළි, දිය වළවල්, දිය උරන වළවල්, මුද්‍රා තැබූ වළවල් හා ඒ අවට පරිසරය ඇතුළුව එම ස්ථානයේ වූ සියලුම වැසිකිළි, මදුරුවන්ගෙන් බෝවීම වැළැක්විය හැකි ආකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය.

(xi) සුසාන භූමියන්හි හෝ වෙනත් පරිශ්‍රයයන්හි හෝ මළවුන් සඳහා ඉදි කෙරෙන සිහිවටන, ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතුය.

5. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළයුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කරනු ලබන අවස්ථාවෙහි දී, දැන්වීම භාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය ඇතුළත එකී නියමයන් ඉටු කළ යුතුය.

6. නගර සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු ඕනෑම පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ බෝවීමට හා වර්ධනය වීමට හැකිවන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ එලෙසින් ක්‍රියාත්මක කිරීමට හෝ ඉඩ සැලැස්වීම නොකළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(6 – 7)

7. නගර සභාවේ සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, ජල විදින ව්‍යුහයේ වූ ඉදි කිරීම්, වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තැබිය හැකි වෙනත් ඉදිකිරීම් හෝ නොකළ යුතුය.

8. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වූ කාලය ඇතුළත කිසියම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුළු වී, පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස එකී පරිශ්‍රය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

නගර සභාවේ කාර්යභාරය.

(8 – 11)

(i) එම පරිශ්‍රය මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවන පරිශ්‍රයක් ද, යන වග;

(ii) එම පරිශ්‍රයේ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන පිළිපැද තිබේ ද, යන වග;

(iii) එම පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීමට සහ විනාශ කිරීමට කුමන හෝ පියවර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, එම පියවර කවරේ ද, යන වග; සහ

(iv) එම පරිශ්‍රයේ විෂබීජ විනාශ කිරීම සඳහා විෂබීජනාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද, යන වග.

9. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් යම් පරිශ්‍රයක අවශ්‍යා වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළයුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියෝග කළ හැකිය.

10. මේ කොටසේ 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදි කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලසීමාව තුළ එකී ළිං, ටැංකි, පොකුණු, ජල විදින ව්‍යුහයේ වූ ඉදි කිරීම් හෝ නියමිත වතුර රැඳී තිබෙන ඉදි කිරීම්, නියම කරනු ලබන යම් ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කරන ලෙස නැතහොත් එම කාලසීමාව තුළ එම දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයෙන් වෙනස් කරන ලෙස නියම කළ හැකිය.

11. මේ කොටසේ 9 වැනි හෝ 10 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වූ දැන්වීමක්, යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ පෞද්ගලිකව භාරදීමෙන් හෝ එම දැන්වීම එකී ස්ථානයේ මනාව පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකිය.

බලය පැවරීම.

12. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය.

(13 – 16)

13. මෙම අතුරු ව්‍යවස්ථාවලින් පනවන ලද නියමයන්, නගර සභාවේ බල ප්‍රදේශය තුළ පරීක්ෂාවට ලක් කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් නගර සභාවේ බල ප්‍රදේශය තුළ පරීක්ෂා කිරීමට නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම නගර සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන්නන්ගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

15. මේ කොටසේ 9 වැනි හා 10 වැනි අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින 14කට නොවැඩි විය යුතුය.

16. මේ කොටසේ 15 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ එකී දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වූ කාලය තුළ කුමන හෝ වේලාවක අවශ්‍යා විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුළු වී, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට හෝ ඉඩ සැලැස්විය හැකිය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

17. නගර සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයාට හෝ නගර සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ නගර සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවලින් 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ කාර්යයක් හෝ කාර්යයන් නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවෙහි දී හෝ ඉටු කරනු ලබන අවස්ථාවෙහි දී, ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා දරන්නට සිදුවූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් හෝ නගර සභාව වෙත ගෙවිය යුතු ය. නගර සභාවේ සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳව ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු, දින 14ක් ඇතුළත එම මුදල එකී අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් නගර සභාව වෙත ගෙවිය යුතු අතර නිශ්චිත කාලය තුළ එම මුදල ගෙවනු නොලැබුවහොත්, එම මුදල නගර සභාව වෙත ගෙවිය යුතු දඩ මුදල වශයෙන් එකී අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් හෝ අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය.

දඩ හා දණ්ඩන.

(19 – 20)

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය .

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

අර්ථ නිරූපණය හා නිර්වචන.

"නගර සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගර සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගරසභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගරසභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ නගර සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"නගර සභාව" යන්නෙන්, නගර සභා පනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"අයිතිකරු" යන්නෙන්, යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් පාන යම් තැනැත්තෙකු අදහස් වේ.

"පදිංචිකරු" යන්නෙන්, යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් හෝ එහි භාරකාරත්වය, කළමනාකරණය හෝ පාලනය හෝ පාලනය දරන තැනැත්තෙකු අදහස් වේ.

"රෝග කාරක කෘමීන්" යන්නෙන්, මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"පරිශ්‍රය" යන්නෙන්, යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අතහැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අතහැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිමනය අදහස් වේ.

22. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය .

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**ii වැනි කොටස - නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සුභසාධනය පිණිස මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම සහතික කරලීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

3. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ වගන්තියේ යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්.

(4 – 5)

4. සතෙකු මැරුණු විට, ඒ සතා මැරුණු වේලාවේ සිට පැය දොළහක් (12) ඉකුත් වීමට පෙර වළලා දැමීම, ඒ සතාගේ අයිතිකරුගේ හෝ අයිතිකරු නොමැති විටක ඒ සතා මැරුණු ස්ථානයේ පදිංචිකරුගේ හෝ යුතුකම විය යුතුය.

5. නගර සභා බල ප්‍රදේශය තුළ යම් නිවසක අයිතිකරු හෝ පදිංචිකරු/පදිංචිකරුවෙකු හෝ එම නිවසට අදාළ ඉඩම පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයකින් ද, වල් පැළෑටි, ලඳු කැලෑ, කුණු රොඩු, ජලය රැඳී තිබිය හැකි වෙනත් භාජන, ටයර්, පොලිතීන් මලු, ටින්, තැඹිලි කෝම්බ වැනි ද්‍රව්‍යවලින් තොරව ද පවත්වාගෙන යා යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(6 – 16)

6. නගර සභාවේ සභාපතිවරයා හෝ නගරසභාවේ ලේකම්වරයා හෝ අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් ලකුණක් ඉවත් කිරීම හෝ මකා දැමීම නොකළ යුතුය.

7. මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙකු යම් පාරක, අඩි පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක වුවමනාවෙන් නිදහසේ ගමන් නොකළ යුතුය.

8. කවර හෝ තැනැත්තෙකු මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන යම් ළමයෙකු හෝ තැනැත්තෙකු හෝ වුවමනාවෙන්ම යම් පාරක, අඩි පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක නිරාවරණව තබා ගැනීමට හෝ එවැනි තැනකට යාමට හෝ ඉඩ හැරීම නොකළ යුතුය.

9. නගර සභාව විසින් පොදු නාන ස්ථානයක පිරිමි හෝ ගැහැණු හෝ එක් පාර්ශ්වයක තනි ප්‍රයෝජනය සඳහා වෙන් කර ඇති යම් පොදු නාන ස්ථානයකට ඊට විරුද්ධව ලිංගික පාර්ශ්වයේ කිසිම තැනැත්තෙකු ඇතුළු නොවිය යුතුය.

10. (i) යම් ස්පර්ශක, චර්ම හෝ ආසාදක රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු ආසාදන හෝ බීජෞෂණ කාල සීමාව ඉක්මවන තුරු, යම් පොදු නාන ස්ථානයක නෑම හෝ රෙදි සේදීම හෝ නොකළ යුතුය.

(ii) මේ කොටසේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් කවර හෝ තැනැත්තෙකුගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ජලය, නිරෝගී තැනැත්තෙකු විසින් ලබාගෙන, ළිඳ පිහිටි ස්ථානයේ සිට මීටර් දහය(10)ක දුරක් ඇතුළත නෑම හෝ සේදීම හෝ නොකළ යුතුය.

11. යම් පොදු ළිඳකින් හෝ පොදු නාන ස්ථානයකින් හෝ ජලය ගැනීමේ කාර්යය සඳහා කවර හෝ තැනැත්තෙකු විසින් යම් අපිරිසිදු භාජනයක් භාවිතා නොකළ යුතුය.

12. කවර හෝ තැනැත්තෙකු විසින් -

(i) පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති යම් ස්ථානයක දී, කවර අන්දමක හෝ භාණ්ඩයක් පොදු ළිඳක හෝ ඒ අසළ හෝ සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

(ii) කවර හෝ කාර්යයක් සඳහා යම් සතෙකු යම් නාන ස්ථානයකට දක්කා ගෙන යාම, එළවීම හෝ ඇද ගෙන යාම හෝ නොකළ යුතු ය.

(iii) යම් පොදු ළිඳක හෝ නාන ස්ථානයක හෝ ඒ අවට භූමිය කුමන හෝ අන්දමකින් අපිරිසිදු නොකළ යුතු ය.

13. නගර සභාව විසින් මේ කොටසේ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වෙන් කර ඇති යම් ස්ථානයක්, එය එසේ වෙන් කර ඇති කාර්යය හැර වෙනත් යම් කාර්යයක් සඳහා කිසිම තැනැත්තෙකු විසින් ප්‍රයෝජනයට නොගත යුතු ය.

14. (i) පරිහරණය සඳහා ජලය ලබා ගන්නා යම් පොදු ළිඳක හෝ දිය උල්පතක හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථානයක හෝ සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත කසළ වළක්, වසුරු වලක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් තිබෙන්නට ඉඩ හැරීම නොකළ යුතු ය.

(ii) පරිහරණය සඳහා ජලය ලබා ගන්නා යම් පොදු ළිඳක හෝ දිය උල්පතක හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථානයක හෝ සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත ගොවිතැන් කාර්යය සඳහා යොදා ගන්නා ඉඩම්වල ජලය දූෂණය විය හැකි ආකාරයෙන් පොහොර හෝ විෂබීජනාශක හෝ යෙදීම නොකළ යුතු ය.

(iii) යම් කසළ වළක්, වසුරු වළක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් හෝ ගොවිතැන් කාර්යය සඳහා නොසැලකිල්ලෙන් පොහොර යෙදීම යනාදිය සිදුවන යම් ස්ථානයක සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත ගෘහ කාර්යය සඳහා කිසිම පුද්ගලික ළිඳක් කැපීම නොකළ යුතු ය.

15. කවර හෝ තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකුට අයිති ඉඩමක හෝ මාර්ගයක හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ කැලි කසළ හෝ දුගඳ හමන ද්‍රව්‍ය හෝ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ දැමීම හෝ ඉවත දැමීම නොකළ යුතු ය.

16. මළ හා මුත්‍රා පහ කිරීම සඳහා විශේෂයෙන් වෙන්කර නොමැති ස්ථානවල, කිසිම තැනැත්තෙකු විසින් මළ හෝ මුත්‍රා හෝ පහ නොකළ යුතුය.

17. (i) ස්පර්ශක රෝගයකින් හෝ චර්ම රෝගයකින් හෝ වසංගත වෙනත් රෝගයකින් හෝ පෙළෙන තැනැත්තෙකු සිටින යම් නිවසක හෝ ගොඩනැගිල්ලක පිටතින් ප්‍රකටව පෙනෙන කොටසක, නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙකු හෝ විසින් ලකුණක් තැබීම හෝ තැබීමට සැලැස්වීම අවශ්‍ය යැයි සලකනු ලබන කාලය දක්වා ඔහු විසින් එම ලකුණ අලවා තැබීමට බලය ඇත්තේය. නගර සභාවේ කාර්යභාරය.

(ii) යම් පොදු ළිඳක හෝ පානීය ජලය ලබා ගැනීමට හැකි ස්ථානයක, රෙදි සේදීම හෝ නැම හෝ තහනම් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(iii) ප්‍රසිද්ධ පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක හෝ යම් සතෙකු මැරුණු විටෙක, එය අයිතිකරුට දැන ගැනීමට නොහැකි අවස්ථාවක, නගර සභාව විසින් ඒ සතාගේ ශරීරය වහාම ඉවත් කර, වැළලීමට පියවර ගැනීම හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීම හෝ නගර සභාවේ කාර්යය විය යුතුය.

(iv) රෙදි සේදීම, නැම හෝ සතුන් නැවීමට හැකි වැව් හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථාන, නගර සභාව විසින් එහි අභිමතය පරිදි වෙන් කළ හැකිය.

(v) මනුෂ්‍ය පරිභෝජනය සඳහා ජලය ලබා ගැනීමට හැකි වැව් හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථාන, නගර සභාව විසින් එහි අභිමතය පරිදි වෙන් කළ හැකිය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවලින් නගර සභාවේ සභාපතිවරයාට හෝ නගරසභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

19. කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දින දහහතර(14)ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 255 වැනි අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වැනි වගන්තියෙහි 2 වැනි උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගර සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නගර සභාවේ නගර සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"නගරසභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය සඳහා නගර සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ, නගරසභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම නගරසභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා නගර සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"නගර සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන නගර සභා පනත යටතේ අදාළ නගරය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගර සභාවේ සභාපතිවරයා හෝ නගර සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

23. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

15 – 587/2

# පළාත් සභා නිවේදන

## උතුරු පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**ප්‍රාදේශීය සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන මාර්ග නීතිය සහ ප්‍රවාහන යන විෂයයන් භාර අමාත්‍ය ක. වි. විග්නේශ්වරන් වන ම විසින් සාදන ලද ප්‍රාදේශීය සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා 7 සිට 9 දක්වා වූ පරිච්ඡේදයෙන් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා, පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ (3) වැනි උපවගන්තියට අදාළව උතුරු පළාතේ පළාත් සභාවේ තීරණය මගින් පිළිගෙන, එකී අනුමැතිය රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කළවිට, ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (අ) වැනි වගන්තියට අනුව උතුරු පළාතේ වූ ප්‍රාදේශීය සභාවන් එකී සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට මෙයින් බලය ලබා දෙනු ලබන අතර, ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (ආ) වැනි වගන්තියට අදාළව එකී අතුරු ව්‍යවස්ථාවන්හි කෙටුම්පත්වල අඩංගු විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියැවෙන 122 වැනි වගන්තිය මගින් උතුරු පළාතේ වූ ප්‍රාදේශීය සභාවන්ට බලය ලබාදෙනු ලැබේ.

**විනිසුරු ක. වි. විග්නේශ්වරන්,**
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන මාර්ග නීතිය සහ ප්‍රවාහන අමාත්‍යවරයා.
උතුරු පළාතේ පළාත් සභාව.

2018, මැයි මස 01 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
A-9 පාර, කයිතඩි,
යාපනය.

**ප්‍රාදේශීය සභාවන් සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි අන්තර්ගතයන්**

| අනු. අංකය | පරිච්ඡේදය | කොටස | සම්මත අතුරු ව්‍යවස්ථාවේ නාමය |
|---|---|---|---|
| 1 | 7 | i | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදික වෙළඳුන් සහ සංචාරක වෙළඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය, පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 2 | | ii | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුකුල් මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 3 | | iii | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 4 | | iv | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 5 | | v | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 6 | 8 | i | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමණාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 7 | | ii | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 8 | | iii | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 9 | 9 | i | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා. |
| 10 | | ii | ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා. |

## 7 වැනි පරිච්ඡේදය

**I වැනි කොටස :- ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය, පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් විසින් භාණ්ඩ, ආහාර වර්ග, පාන වර්ග, එළවළු සහ පළතුරු වෙළෙඳාම් කිරීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *(අතුරු ව්‍යවස්ථාවේ නාමය.)*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම, පිරිසිදු ආහාර ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම, ගමනාගමනයට අවහිරතා ඇති කිරීම වැළැක්වීම යනාදී අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *(අරමුණ.)*

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 121 (1) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (x) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *(අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන)*

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, සෑම පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. *(ඉටුකළ යුතු කාර්යයන් (4-12))*

   (i) පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් බලපත්‍රයකට අයදුම්කරන අයදුම්පත්‍රයක්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා අවසානයේ දී දක්වා ඇති පළමුවැනි උපලේඛනයට සාරානුකූලව තිබිය යුතුය.

   (ii) පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ උඩුකය දක්වා පෙනෙන 2½″x2″ක ප්‍රමාණයේ ඡායාරූප දෙකක්, බලපත්‍රයකට අයදුම්කරන සෑම එක් එක් අයදුම්පත්‍රයකම අයදුම්කරු විසින් අමුණා තිබිය යුතුය. අයදුම්පත්‍රය භාර ගැනීමෙන් අනතුරුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් සුදුසු යැයි අදහස් කරන ආකාරයේ පරීක්ෂණයක් සිදු කිරීමෙන්, අයදුම්කරු සුදුසු නොවන්නේ නම්, අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ හැකිය. තවද, අයදුම්කරු තමාගේ පදිංචි ස්ථානය, ඔහු වාසය කරන ග්‍රාම සේවක නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් මඟින් තහවුරු කළ යුතුය.

   (iii) පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ බලපත්‍රයකට අයදුම් කරන අයදුම්පත්‍රය, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කළ අවස්ථාවේ දී, අයදුම්පත්‍රය සමඟ ලබාදුන් ඡායාරූපයෙන් එකක් අයදුම්කරුට නිකුත් කරනු ලබන බලපත්‍රයේ අලවා තිබිය යුතුය. අනික් ඡායාරූපය ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබාගත යුතුය.

5. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට පිසින ලද ආහාර හා පාන වර්ග විකිණීම පිණිස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

   (i) විකිණීමට තබා ඇති පිසින ලද ආහාර හා පාන වර්ග මැස්සන්ගෙන්, කෘමීන්ගෙන්, දූවිල්ලෙන් *නැතහොත්* ජලයෙන් දූෂණය නොවන ආකාරයට සංවෘත භාජනයක් හෝ පෙට්ටියක් හෝ පාවිච්චියට ගැනීමට සූදානම් කර තිබිය යුතුය.

   (ii) පිසින ලද ආහාරයක් විකුණුම් කරනු ලබන විට, ගනුදෙනුකරුවන්ට පිළිගැන්වීම් සඳහා මළ නොබැඳෙන ලෝහවලින් තැනූ අඩුවක් තබාගත යුතුය.

   (iii) ඒ අවස්ථාවේ දී ගනුදෙනුකරුවන්ට ආහාර හෝ පානයන් හෝ පරිභෝජනය කිරීමට පිළිගන්වන්නේ නම්, ඒ සඳහා ම වෙන් වෙන් වූ භාජනයන් තබාගත යුතුය.

   (iv) පරිභෝජනයෙන් පසුව ගනුදෙනුකරුවන් විසින් ඉතුරු කරනු ලබන ආහාර හා පානයන් බහාලීමට වෙන වෙනම භාජනයන් තබාගත යුතු අතර එකී භාජන හොඳින් වසා තැබිය හැකි පියන්වලින් යුක්ත විය යුතුය.

6. පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් ව්‍යාපාරික කටයුතුවල නියුක්තව සිටින අවස්ථාවේ දී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නිකුත් කළ බලපත්‍රය හා හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන ආකාරයේ සුදුසු තැනක ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

7. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රය හා හැඳුනුම්පත පෙන්වන මෙන් ඉල්ලා සිටී අවස්ථාවක, එම ලියකියවිලි වහාම ඉදිරිපත් කිරීම පදික වෙළෙඳුන්ගේ සහ සංචාරක වෙළෙඳුන්ගේ කාර්යය විය යුතුය.

8. බලපත්‍රලාභී පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන් පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා වූ කාල සීමාව තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නියුක්තවීමට හිමිකම් ලබයි. එසේ වුවද, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී කාල සීමාවෙන් බැහැරව රාත්‍රී කාලයේ දී වෙළෙඳාමේ නියුක්තවීම සඳහා අවසර දෙනු ලදුව, ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේ නම්, එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළෙඳාම් කිරීමට බලපත්‍රලාභියෙකුට හිමිකම් ඇත්තේය.

9. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(i) ජෛවහායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය:

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) මේ කොටසේ 9 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

10. පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා බලපත්‍රලත් වෙළෙඳුන්, ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පනවනු ලබන කොන්දේසිවලට යටත් වියයුතුය.

11. පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳුන් සෑම වසරක් පාසාම බලපත්‍රය සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන විට, වෛද්‍ය පරීක්ෂණ සහතිකය අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

12. පිසින ලද ආහාර ද්‍රව්‍ය හා පාන වර්ග විකිණීම කරනු ලබන තැනැත්තන්ට මෝටර් වාහනවලින් තැනින් තැන ගෙනයමින් විකිණීම සඳහා වන අනුමැතිය ලබාදිය හැකිය.

ඉටු නොකළ යුතු කාර්යයන්.

(13-23)

13. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ විසින් පදික වෙළෙඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට නිකුත් කරනු ලැබූ බලපත්‍රය හා හැඳුනුම්පත නොමැතිව කවර හෝ තැනැත්තෙකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, වීථියක, පටුමඟක, පොදු වේදිකාවක, පොදු උද්‍යානයක හෝ තල්ලු අත් කරත්තයක හෝ මෝටර් රථ වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති හෝ උපයෝගී කරනු ලබන කිනම් හෝ වාහන නවත්වාලීමේ හෝ පොදු බස්රථ නැවතුම් පළේ හෝ මහජනයා රැස්වන පොදු ස්ථානයක කවර හෝ භාණ්ඩයක්, ආහාරයක්, පානයක්, එළවළු වර්ගයක් හා පළතුරු වර්ගයක් විකිණීම හෝ විකිණීම පිණිස තැනින් තැන ගෙනයාම හෝ නොකළ යුතුය.

14. පදික වෙළෙඳාමේ සහ සංචාරක වෙළෙඳාමේ යෙදෙන බලපත්‍රලාභී ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා වූ අතරතුර කාලය හැර, වෙනත් යම් වේලාවක කවර හෝ භාණ්ඩයක් විකිණීමට හෝ විකිණීමට තබා ගැනීම හෝ නොකළ යුතුය.

15. බලපත්‍රලාභියා තමාගේ භාණ්ඩ ප්‍රචාරය කරලීමේ අරමුණින් යම් හඬ විකාශනයක් හෝ ශබ්ද විකාශනයක් හෝ ඊට අනුරූපිත වෙනත් උපකරණයක් හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය.

16. බලපත්‍රලාභියා සිය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් පරිශ්‍රය හා භාණ්ඩ හැර, වෙනත් යම් පරිශ්‍රයක බලපත්‍රයේ නිශ්චිතව සඳහන් භාණ්ඩ හෝ වෙනත් යම් භාණ්ඩයක් විකිණීම හෝ විකිණීමට තබා ගැනීම හෝ විකිණීම පිණිස තැනින් තැන ගෙනයාම හෝ නොකළ යුතුය.

17. බලපත්‍රලාභියා, කිසියම් මාර්ගයක ධාවනය කෙරෙන වාහනවලට හෝ ගමන් කරන පදිකයන්ට හෝ කිසිදු බාධාවක් ඇති නොකළ යුතුය. කවර හෝ පොලිස් නිලධාරියෙකු හෝ ග්‍රාම සේවක නිලධාරියෙකු හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කිසියම් මාර්ගයකින් හෝ පදික වේදිකාවකින් හෝ පිටවන ලෙස නියෝග කරනු ලබන විට, එලෙසින් එම තැනැත්තා පිටවීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

18. ප්‍රාදේශීය සභාව විසින් පදික වෙළෙඳාමට සහ සංචාරක වෙළෙඳාමට තහනම් කරනු ලැබූ ප්‍රදේශයේ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් රැඳී සිට හෝ තැනින් තැන ගෙනයමින් හෝ විකිණීම නොකළ යුතුය.

19. බලපත්‍රලාභියා, මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කර ඇති බලපත්‍රය කවර හෝ තැනැත්තෙකුට අන්සතු නොකළ යුතුය.

20. පදික මාළු වෙළෙඳුන්ගේ හා සංචාරක මාළු වෙළෙඳුන්ගේ බලපත්‍ර සම්බන්ධයෙන් උතුරු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ, උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කරන ලද, උතුරු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අංක 2011/25 හා 2017.03.24 දිනැති *අතිවිශෙෂ ගැසට්පත්‍රය* මඟින් පළ කරන ලද, මාළු වෙළෙඳාම සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 6 වැනි පරිච්ඡේදයේ vi වැනි කොටසේ 20 වැනි හා 21 වැනි අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රයක් ලබා නොගෙන, මාළු විකිණීම හෝ මාළු විකිණීම පිණිස තබා ගැනීම හෝ නොකළ යුතුය.

21. පිසින ලද ආහාර ද්‍රව්‍ය හා පාන වර්ග හැර නිෂ්පාදිත භාණ්ඩ විකිණීම කරනු ලබන තැනැත්තන්ට මෝටර් වාහනවලින් තැනින් තැන ගෙනයමින් විකිණීම සඳහා වන අනුමැතිය ලබා නොදිය යුතුය. එනමුත්, ඉහත ද්‍රව්‍යයන් සංචාරක වෙළෙඳුන් විසින් යතුරු පැදිවලින් හා පාපැදිවලින් හෝ හිසේ තබා ඔසවමින් හෝ තැනින් තැනට යමින් විකිණීම සඳහා වන අනුමැතිය ඉල්ලා සිටි විටෙක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම නිසා බලපත්‍රලාභියාට සිදුවන යම් පාඩුවක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ වගකීමට යටත් නොවනු ඇත.

23. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රයක් ලබා ඇත්තේ වුවද, කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි රෝගියෙකුව තම නිවසෙහි තබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, පදික වෙළෙඳාමේ සහ සංචාරක වෙළෙඳාමේ නියුක්තවීම නොකළ යුතුය.

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කිසියම් කොටසක පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම තහනම් කිරීමට හේතු වූ අවදානම අවසන් වී ඇති බව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම්, එකී කොටසේ පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා නැවත අවසර දෙනු ලබන බව, බලපත්‍රලාභීන්ට දැන්වීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ කාර්යය විය යුතුය. ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය

25. පදික වෙළෙඳාමක් හෝ සංචාරක වෙළෙඳාමක් හෝ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය. අයකිරීම හා ගාස්තු

26. මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, කිසියම් උත්සවයක දී හෝ යම් ජාතික උත්සවයක දී හෝ මහජන ඒකරාශීවීමක දී හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියමිත ප්‍රදේශයේ ස්ථිර වෙළෙඳ ස්ථානවලට බාධා ඇති නොවන අයුරින්, වෙළෙඳාම් සඳහා වන ස්ථාන වෙන්කර, ඒ සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කරනු ලැබ, විශේෂිත ගාස්තුවක් අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

බලය පැවරීම.

27. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍ර යේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය (28-29)

28. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

29. මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද තාවකාලික බලපත්‍රය, කිනම් දිනයක් සඳහා නිකුත් කරනු ලැබුවේ ද, ඒ දිනෙන් පසුව එම බලපත්‍රය අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය. (30-32)

30. කවර හෝ පදික වෙළෙන්දෙකු සහ සංචාරක වෙළෙන්දෙකු විසින් විකුණනු ලබන යම් භාණ්ඩයක/ පිසින ලද ආහාර හෝ ආහාර ද්‍රව්‍යයක/පාන වර්ගයක හෝ සාම්පලයක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එහි මිළ ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළෙඳුන්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වූවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, බලපත්‍රලාභියා වෙත ලිඛිතව කරනු ලබන දැන්වීමක් භාරදීමෙන් අනතුරුව බලපත්‍රලාභියාට පදික වෙළෙඳාම සහ සංචාරක වෙළෙඳාම සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු අතර අවලංගු කළ බලපත්‍රය ආපසු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙත භාරදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

32. කිසියම් බෝවෙන රෝගයක් හෝ උදරාශ්‍රිත රෝග තත්ත්වයක් හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැතිරෙන බවට හෝ එවැනි රෝග තත්ත්වයක් පැතිරීමේ අවදානමක් පවතින බවට හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙත කරුණු වාර්තා කර ඇති යම් අවස්ථාවක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් පහත සඳහන් පියවරයන් ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(i) මේ සම්බන්ධයෙන් ලිඛිතව කරුණු සඳහන් කරමින් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ නිකුත් කළ බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම;

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිසියම් කොටසක, පදික වෙළෙඳාම හා සංචාරක වෙළෙඳාම තහනම් කිරීම;

(iii) ඉහත 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ තාවකාලිකව අත්හිටුවනු ලැබූ බලපත්‍රය, එසේ අත්හිටුවනු ලැබූ කාලය ඇතුළත භාරයට ගනු ලැබීම; සහ

(iv) බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට නියමිත දිනට පෙර, එකී රෝග පැතිරීමේ අවදානම අවසන් වී ඇති බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් වාර්තා කරනු ලැබ ඇත්නම්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අත්හිටුවනු ලැබූ බලපත්‍රය ප්‍රතිසාධනය කිරීම.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේ ය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. දඩ හා දණ්ඩන. (35-36)

36. පදික වෙළෙඳාමක් සහ සංචාරක වෙළෙඳාමක් සඳහා බලපත්‍රයක් ලබා නොගෙන, යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ හෝ විකිණීම කරනු ලබන හෝ විකිණීම පිණිස තබාගෙන ඇති හෝ තැනැත්තා, එකී භාණ්ඩය හෝ භාණ්ඩ හෝ විකිණීමට, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ විසින් කරනු ලබන තහනම් කිරීමකට යටත් විය යුතු ය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර, එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"සංචාරක වෙළෙඳාම" යන්නෙන්, හිසේ තබා ඔසවා ගෙන යාමෙන් හෝ යම් අනුමත කළ වාහනයක ගෙන යාමෙන් හෝ මහජනතාවගේ පරිභෝජනය සඳහා තැනින් තැනට යමින් හෝ කිසියම් තැනක නතර වී හෝ කරනු ලබන වෙළෙඳාම අදහස් වේ.

"පදික වෙළෙඳාම" යන්නෙන්, පාරක හෝ මාර්ගයක හෝ අසබඩ නිශ්චිතව වෙන් කරන ලද ස්ථානවල රැඳී සිට කරනු ලබන වෙළෙඳාම අදහස් වේ.

38. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලත්වයක් ඇති වූ විටෙක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

ඇමුණුම 01

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදික වෙළෙඳුන් සහ සංචාරක වෙළඳුන් විසින් භාණ්ඩ , ආහාර ද්‍රව්‍ය , පාන වර්ග, එළවළු සහ පළතුරු විකිණීම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20.......... වර්ෂය**

1. වෙළෙඳ ස්ථානයේ නම:..........................................................................

2. (i) වෙළෙඳාම කිරීමට නියමිත කොට්ඨාසයේ අංකය:..................................
   (ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය:........................................................ හා
   ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම:.......................................................

3. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම:....................................................

   (ii) ස්ථිර ලිපිනය:....................................................

   (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය:.......................................................
   (ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කළ පදිංචි සහතිකය ඇමිණිය යුතු ය.)

   (iv) ජාතික හැඳුනුම්පත් අංකය: ......................................
   (ජාතික හැඳුනුම්පතේ ඡායාස්ථිත පිටපතක් සමගින් 2½"x2" ප්‍රමාණයේ ඡායාරූප දෙකක් ඇමිණිය යුතු ය.)

   (v) දුරකථන අංකය:.................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය:................................

4. (i) වෙළෙඳාම ආරම්භ කළ දිනය:................................................

   (ii) වෙළෙඳාමේ ස්වභාවය:.......................................

   (iii) පදික වෙළෙඳාමේ / සංචාරක වෙළෙඳාමේ නියුක්ත සේවකයන් පිළිබඳ විස්තර:

   *(අ)* නම / නම්:..............................
   *(ආ)* දුරකථන අංකය / අංක:..........................

   (iv) කලින් රැකියාව:..................................

5. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්:................. නැත:................

ඔව් නම්: බලපත්‍ර අංකය:............. දිනය:.................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. පදික වෙළෙඳාම / සංචාරක වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20......... වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය:.................................  ..................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

........................................
සභාපති / ලේකම් / බලයලත් නිලධාරියා

වරිපනම් අංශයේ වාර්තාව පිණිස (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)

වරිපනම් කොට්ඨාසය: ................................ වරිපනම් අංකය: ..........................

වීථියේ / පාරේ නම: .............................

අයිතිකරුගේ නම: .......................................

දේපලෙහි ස්වභාවය: ....................................

වාර්ෂික වටිනාකම: රු. ...............................

හිඟ වරිපනම් මුදල: රු. ................................. ඇත: .................... නැත: ...................

දිනය: .............................. .............................................
පරිපාලන නිලධාරි.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: .....................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ....................................................................

ඒකකය A B C සටහන්: ....................................

දිනය: ........................ ..................................
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

දිනය: ..................... ..........................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

දිනය: ..................... ..................................................;
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

දිනය: .................... ......................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**ලේකම්වරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: .................... .........................................
ලේකම්.

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: .................... .................................................................
ප්‍රාදේශීය සභාවේ ලේකම් / බලයලත් නිලධාරියා.

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ............................... ලදුපත් දිනය: ............................

බලපත්‍ර අංකය: .............................. බලපත්‍ර දිනය: ............................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: .................... ......................................
ආදායම් පරිපාලන නිලධාරි.

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය: .................... .......................................
ලේකම්.

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

දිනය: .................. ...............................................................
ප්‍රාදේශීය සභාවේ සභාපති/ බලයලත් නිලධාරියා.

**II වැනි කොටස :- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (ix)(ඒ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.

4. ඇමුණුම 01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම් කරනු ලබන වෙළෙඳ සැල, මෙහි පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ තැනැත්තෙකුට කුකුළු මස් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

ඉටුකළ යුතු කාර්යයන්. (4-13)

(i) විකිණීම පිණිස කුකුළු මස් ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය, පිඟන් ගඩොල් අල්ලා හෝ සිමෙන්තියෙන් කපරාරු කර හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතුය.

(ii) කුකුළු මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම, සිමෙන්තියෙන් කපරාරු කර හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ තිබිය යුතුය.

(iii) කුකුළු මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ එක් එක් කාමරයකටම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතුය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය, කාමරයේ බිමෙහි වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතුය. කෙසේ වුවද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී, මේ නියමය අදාළ නොවිය යුතුය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයකම බිත්ති මීටර් තුන (3.0)කට නොඅඩු උසකින් යුක්ත විය යුතුය.

(v) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයකම ඇතුල් වහළක් (සීලිමක්) සවිකර තිබිය යුතු අතර, එකී ඇතුල් වහළ පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් තුන (3.0)කට නොඅඩු උසකින් තිබිය යුතුය.

(vi) වහළය කිසියම් ස්ථිර ඝන ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, අගුපියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගුපියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක්වත් තිබිය යුතුය.

(vii) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ හෝ කාණු තිබිය යුතුය.

(viii) මේ කොටසේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (vii) වැනි උපවගන්තියේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය, කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වළකට ගලායෑමට ඉඩ සලස්වා තිබිය යුතුය.

(ix) අපජලය ගලායාමට සලස්වන ලද උරාගන්නා වළ, වාතය ඇතුළු නොවන සේ ආවරණය කර තිබිය යුතුය.

(x) කුකුළු මස් අළෙවි ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායනික අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරු ඇති වළක වැළලීමට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව ප්‍රාදේශීය සභාවේ කුණු කසළ රැස්කරන වාහනයට භාරදීමට හෝ කටයුතු කළ යුතුය.

(xi) වෙළෙඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

(xii) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, අඩුම වශයෙන් එක් පඩික්කමක්වත් පරිශ්‍රයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි බලපත්‍රලත් පරිශ්‍රයේ තැබීමට සැලැස්විය යුතුය.

(xiii) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, ඔහුගේ වෙළෙඳ ස්ථානයේ පිටත ප්‍රකටව පෙනෙන තැනක තරාදියක ස්වරූපයෙන් "තමන්ගේ නම" හා "බලපත්‍රලත් කුකුළු මස් අළෙවි සැල" යන වාක්‍ය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් සවිකර තිබිය යුතුය.

(xiv) එක් එක් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, ඕනෑම වේලාවක ලබාගත හැකි පරිද්දෙන් කුකුළු මස් වෙළෙඳුන් ඇතුළුව සියලුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් එකී ස්ථානයෙහි තබාගත යුතුය.

(xv) යටත් පිරිසෙයින් අවුරුද්දකට සිව් වරක්වත්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ලිඛිතව නියම කරනු ලැබිය හැකි පරිදි එකී වෙනයම් වේලාවන්හි දී ද, එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකුම, වෙළෙඳ සැලෙන් කොටසක් වන එක් එක් කාමරයකම බිත්ති, පිහන් ගඩොල් අල්ලා හෝ සිමෙන්ති කපරාරු කර ඇති එකී කොටස් හැර, හුණු පිරියම් කිරීමට ද, ලීයෙන් කළ සියලු කොටස් පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආලේප කර ඇත්නම්, සබන් ගා උණු දියෙන් සේදීමට ද සැලැස්විය යුතුය.

5. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම්, බිත්ති, පිහන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස්, මස් කැපීමට යොදා ගන්නා කොටය, උපකරණ, කුකුළු මස් විකිණීම පිණිස කුකුළු මස් ප්‍රදර්ශනයට තබන ස්ථාන යනාදිය විෂබීජනාශක දියර යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

6. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක බලපත්‍රලාභියා කුකුළු මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම ආශ්‍රිතව පාවිච්චි කරනු ලබන සියලුම භාජන හා උපකරණ සහ කුකුළු මස් වෙළෙඳ සැලේ අවට ඇති කාණු හොඳින් සෝදා පිරිසිදු කර, මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

7. බලපත්‍රලත් කවර හෝ කුකුළු මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි ආකාරයෙන් තබාගත යුතුය.

8. කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම් සහ වෙනත් අවශ්‍ය ආරක්ෂිත පැළඳුම් සපයා තිබිය යුතුය. ඒ සමග එකී සේවකයන් කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත සියලුම අවස්ථාවන්හි දී, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සියලුම සේවකයින් සඳහාම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර හෝ සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතුය.

11. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

12. බලපත්‍රලත් සියලුම කුකුළු මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් වෙළෙඳ සැල පිහිටි ස්ථානයේ බීමට සුදුසු ප්‍රමාණවත් ජලය ලබාදිය යුතුය.

13. සියලුම කුකුළු මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන්, බලපත්‍රලත් ස්ථානය සඳහා වන වෙළෙඳ සැල හෝ අළෙවි ස්ථාන හෝ ශ්‍රී ලංකා රජය විසින් හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් වසා තැබිය යුතු යැයි නිශ්චය කරනු ලබන දවස් හැර, සෙසු සෑම දවසකම ප්‍රාදේශීය සභාව විසින් තීරණය නොකළ විටක, පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා පමණක් විවෘත කර තැබිය යුතුය.

ඉටුනොකළ යුතු කාර්යයන්.

(14-23)

14. කවර හෝ තැනැත්තෙකු, වෙළෙඳ පොළ නොවන වෙනත් කිසියම් ස්ථානයක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කුකුළු මස් විකිණීම පිණිස යම් ස්ථානයක් පාවිච්චි කිරීම නොකළ යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකි ශේෂ වන මස් අධිශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළෙඳ සැල විවෘත කරනු අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස, ශේෂ වන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ අධිශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ හෝ තබා ගැනීම නොකළ යුතුය.

16. කිසිම තැනැත්තෙකු බලපත්‍රලත් ස්ථානයේ කුමන කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතුය.

17. කිසිම තැනැත්තෙකු අදාළ කාර්යය සඳහා නියම කර ඇති පඩික්කම ඇතුලේ හැර, කුකුළු මස් වෙළෙඳ සැල තුළ කෙළ නොගැසිය යුතුය.

18. බලපත්‍රලත් කුකුළු මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියා විසින් කුකුළු මස් විකිණීමෙහි දී, තමන් විසින් පිරිසිදු කරනු ලබන කුකුළු මස්වල අපද්‍රව්‍ය, මාර්ගයේ දෙපස හෝ පොදු ස්ථානවල හෝ විසි කිරීම නොකළ යුතුය.

19. කිසිම තැනැත්තෙකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් තැනින් තැනට ගෙන යමින් විකිණීම නොකළ යුතුය.

20. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානය, දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදා ගැනීම හෝ ආහාර ගැනීම හෝ කරන ස්ථානයක් ලෙසින් පාවිච්චි කිරීම නොකළ යුතු අතර, වෙනත් කවර හෝ තැනැත්තෙකුට එලෙස කිරීමට ඉඩදීම නොකළ යුතුය.

21. කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීමට හෝ නියුක්ත කරවීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

22. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකු, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

23. බලපත්‍රලත් ස්ථානයෙහි කුකුළු මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට හෝ පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර, කිසිම භාජනයක් හෝ ඇඳුමක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතුය.

ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය (24-25)

24. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ බලපත්‍රලත් ස්ථානයක ශීතකරණයේ තබා ඇති කිසියම් කුකුළු මසක් පරීක්ෂා කිරීමේ අරමුණින් එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කුකුළු මස් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට, බලපත්‍රලාභියා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

අයකිරීම් හා ගාස්තු

26. කිසියම් කුකුළු මස් අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය.

බලය පැවරීම.

27. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍ර යේ හෝ අවසරපත්‍ර යේ වලංගු කාලය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (29-32)

29. මෙම අතුරු ව්‍යවස්ථා වලින් පනවන ලද නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය වියයුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

31. මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

32. මේ කොටසේ 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැරහැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේය.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචනය.

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කුකුළු මස් සැල හෝ කුකුළු මස් අළෙවි ස්ථානය" යන්නෙන්, කුකුළු මස් ඇතුළත්ව සජීවී කුකුළන් විකිණීමට තබා ඇති ස්ථානය අදහස් වේ.

37. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**ඇමුණුම - 01**

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුකුළු මස් විකිණීම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ නම: ...................................................

2. කුකුළු මස් වෙළෙඳ ස්ථානය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාසය: .................... වරිපනම් අංකය: ......................

(ii) වීථියේ / පාරේ නම: ..................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: .................... හා

ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: .......................................

3. අයදුම්කරුගේ -

(i) සම්පූර්ණ නම: .........................................................................

(ii) ස්ථිර ලිපිනය: ...........................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය: .......................................................

(iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ......................................................

(v) දුරකථන අංකය: .......................................................................

(vi) විද්‍යුත් තැපැල් අංකය: ...............................................................

4. (i) කුකුළු මස් වෙළෙඳාම ආරම්භ කළ දිනය: ......................................

(ii) කුකුළු මස් වෙළෙඳ ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ

(අ) නම : ..............................................................................

(ආ) දුරකථන අංකය: ...............................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

(i) අයිතිකරුගේ නම: ......................................................................

(ii) ලිපිනය: .....................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............. නැත: ............

ඔව් නම්: බලපත්‍රය අංකය: ..................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: .....................

.................................
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

......................................................................
සභාපති / ලේකම් /බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස (ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය: ........................ වරිපනම් අංකය: ...................

වීථියේ / පාරේ නම: ..........................................................................

අයිතිකරුගේ නම: .............................................................................

දේපලෙහි ස්වභාවය: ..........................................................................

වාර්ෂික වටිනාකම: රු. ......................

හිඟ වරිපනම් මුදල: රු. ................... ඇත: ................. නැත.: ..................

දිනය: .....................

.................................
පරිපාලන නිලධාරි.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ...................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ..................................................................

ඒකකය A B C සටහන්:....................................................................

දිනය: .....................

.......................................
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව
.....................................................................................................................................................
.....................................................................................................................................................
..................................................................................................................................

දිනය: .....................

......................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**
.....................................................................................................................................................
.....................................................................................................................................................
........................

දිනය: .....................

.......................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි.

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ........... ව්‍යාපාරයේ ස්වභාවය: ........... පාරිසරික බලපත්‍ර: ...........

MOH වාර්තාව:.......... අනුකූලතා සහතිකය: ......... මත්පැන් බදු බලපත්‍ර:..........

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.

..................................................................................................................................................................
..................................................................................................................................................................
.....................................................................................................................................................

දිනය: .....................
.......................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**ලේකම්වරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: .....................
...............................................
ලේකම්.

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: .....................
..................................................................
ප්‍රාදේශීය සභාවේ ලේකම් / බලයලත් නිලධාරියා.

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ................................ ලදුපත් දිනය: .............................

බලපත්‍ර අංකය: ............................... බලපත්‍ර දිනය: .............................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: .....................
.......................................
ආදායම් පරිපාලන නිලධාරි.

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය: .....................
..........................
ලේකම්.

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

දිනය: ..................
.................................................................
ප්‍රාදේශීය සභාවේ / බලයලත් නිලධාරියා.

***III වැනි කොටස :-*** **ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *(අතුරු ව්‍යවස්ථාවේ නාමය.)*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂාවන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *(අරමුණ.)*

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා 126(ix)(එ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *(අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.)*

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ කිරි පට්ටියකට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. *(ඉටුකළයුතු කාර්යයන්. (4-24))*

(i) එක් සත්ත්වයෙකු රඳවා තැබීමට අවම වශයෙන් වර්ග මීටර් 3.0ක් බැගින් වන සේ කිරි පට්ටියේ සිටින සත්ත්වයන් රඳවා තැබීමට ප්‍රමාණවත් ගොඩනැගිලි ඉදිකර තිබිය යුතුය.

(ii) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි බිත්තිවල උස මීටර් 1.0කට වඩා උසින් යුක්ත නොවිය යුතු අතර, ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ ඇලුමිනියමෙන් හෝ ලීයෙන් හෝ තනා දෙපැත්තම කපරාරු කර, තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iii) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවවලින් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් හෝ තනා තිබිය යුතු අතර, එකී කණුවල ඉහළ කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3ක් උසින් යුක්ත විය යුතුවාක් හැර, කණුවල තීන්ත ආලේප කර තිබිය යුතුය.

(iv) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, වහළය කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3ක් උසින් යුක්ත විය යුතුය.

(v) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිම සිමෙන්ති දමා තිබිය යුතුය.

(vi) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි මනා අළුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතුය.

(vii) කිරි පට්ටියේ සත්ත්වයන්ට පානය කිරීමට, සතුන් නැවීමට සහ ගොඩනැගිලි සේදීමට දූෂණය නොවූ ප්‍රමාණවත් ජල පහසුකම් සපයා තිබිය යුතුය.

(viii) සත්ත්වයන් නැවීමෙන් පසු බැහැර කරන ජලය හා සත්ත්වයන් රඳා තබන ගොඩනැගිලි සේදීමෙන් පසු බැහැර කරන ජලය, මූත්‍රා සහ වසුරු කොටස් උරා ගන්නා වළකට පහසුවෙන් ගලායන පරිදි සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට්වලින් තැනූ කාණු සකසා තිබිය යුතුය.

(ix) සත්ත්වයන්ගේ වසුරු, ඉතිරිවන තණකොළ සහ වෙනත් කැම වර්ග ඉවත් කිරීම සඳහා වෙනම ම ස්ථානයක් ඉදිකර තිබිය යුතු අතර, එකී ස්ථානය සතුන් රඳවා තබන ගොඩනැගිලිවලින් සහ කිරි කාමරයෙන් යටත් පිරිසෙයින් මීටර් 10.0ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය. එසේම එකී ස්ථානය පොදු ජල මාර්ගයක හෝ ජලය ලබා ගන්නා කිසියම් ළිඳක සිට අවම වශයෙන් මීටර් 10.0ක් දුරින් පිහිටුවා තිබිය යුතුය.

(x) කිරි දොවන ස්ථානය සහ තාවකාලිකව කිරි ගබඩා කරන ස්ථානය සතුන් රඳවා තබන ස්ථානයෙන් අවම වශයෙන් මීටර් 6.0කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(xi) කිරි දොවන ගොඩනැගිල්ල ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ බැඳ දෙපැත්තම සිමෙන්තියෙන් මැද තිබිය යුතුය. එහි බිත්තිවල උස අවම වශයෙන් මීටර් 1.2ක් විය යුතු අතර, බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදි කෙරෙන කණු ශක්තිමත් දැවවලින් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් හෝ තනා, තීන්ත ආලේප කර තිබිය යුතුය.

(xii) කිරි දොවන ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර, බිම සහ බිත්ති සම්බන්ධ වන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතුය. එසේම එකී ගොඩනැගිල්ලේ පියසි කෙළවර පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.8කට ඉහළින් විය යුතුය.

(xiii) කිරි දොවන ගොඩනැගිල්ලේ මේසයක් තිබිය යුතු අතර, එහි මතුපිට පිඟන් ගඩොල් හෝ පිරිද්දුම් නොමැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ වෙනත් යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ අතුරා තිබිය යුතුය.

(xiv) කිරි දොවන ස්ථානය තුළ සනීපාරක්ෂක කසළ භාජනයක් තිබිය යුතුය.

(xv) කිරි දොවන ගොඩනැගිල්ල, කිසියම් වැසිකිළියකින්, කසළ වළකින්, පොහොර ගොඩකින් හෝ පොහොර වළකින්, විවෘත කසළ කාණුවකින් යනාදියේ සිට යටත් පිරිසෙයින් මීටර් 10.0ක දුර ප්‍රමාණයක දුරකින් පිහිටා තිබිය යුතුය.

(xvi) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට යටත් පිරිසෙයින් මීටර් 20.0කට නොඅඩු දුරකින් රෝගීවන සතුන් රඳවා තැබීම සඳහා වෙනම ගොඩනැගිල්ලක් තබා තිබිය යුතු අතර, සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ නියමයන්ට අනුකූලව මේ ගොඩනැගිල්ල ද ගොඩනගා තිබිය යුතුය.

(xvii) රෝගී සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට ගලායන අපජලය අනෙක් සතුන් රඳවා තබන ගොඩනැගිල්ල දෙසට ගලා නොයන සේ කාණු නිර්මාණය වී තිබිය යුතුය.

(xviii) කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම්, එකී යන්ත්‍ර සහ දොවා ගන්නා කිරි රැස් කරන භාජන දිනපතා ජීවානුහරණය කිරීමට අවශ්‍ය උපකරණ සපයා තිබිය යුතුය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසකම අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතුය.

6. නිරෝගී සතුන් සහ රෝගී සතුන් රඳවා තබා ගන්නා ගොඩනැගිල්ලේ ගෙබිම සහ බිත්ති යටත් පිරිසෙයින් දිනපතාම එක් වරක් බැගින් සේදීමට සැලැස්විය යුතුය.

7. කිරි පට්ටිය සහ එහි වටපිටාව, කාණු, ලී බඩු හා උපකරණ පිරිසිදුව හා මනා අළුත්වැඩියා තත්ත්වයකින් තබාගත යුතුය.

8. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. කිරි පට්ටියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීම හා එකී සේවකයන් සියළුම අවස්ථාවන්හි දී, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. කිරි පට්ටියේ කිරි දෙවීමේ කාර්යයන්හි නියුක්තවීමට පෙර, ඔවුන් තමන්ගේ ඇඟපත සේදීම කළ යුතුය.

11. සතුන් රඳවා තබන ගොඩනැගිලි සහ කිරි දොවන කාමරයේ බිම සහ මේසය මතුපිට යටත් පිරිසෙයින් දිනපතාම එක් වරක් බැගින් සෝදා හැරීමට සැලැස්විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා සියළුම භාජන සහ කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම්, එකී උපකරණ ද යටත් පිරිසෙයින් දිනකට එක් වරක් බැගින් ජීවානුහරණය කළයුතු අතර, වෙනත් භාණ්ඩ සහ උපකරණ දිනපතාම පිරිසිදු කරවීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. කිරි පට්ටියේ ඇති කරන සෑම සතෙකුම යටත් පිරිසෙයින් වර්ෂයකට තුන් වතාවක් පශු වෛද්‍යවරයාගේ හෝ ඔහු විසින් නම් කරනු ලබන කවර හෝ නියෝජිතයෙකුගේ හෝ අධීක්ෂණයට ලක්කර, අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සහ එකී උපදෙස් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. කිරි පට්ටියේ කවර හෝ සතෙකුට කිසියම් රෝගයක් වැළඳී ඇති බව දැන ගන්නට ලැබුණු වහාම එකී සතාව, සතුන් රඳවන ගොඩනැගිල්ලෙන් ඉවත් කර, රෝගී සතුන් රඳවන ගොඩනැගිල්ලේ රැඳවීමට ක්‍රියා කිරීම සහ ඒ පිළිබඳව පශු වෛද්‍ය නිලධාරියා දැනුවත් කිරීමට ක්‍රියාකිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

15. බලපත්‍රලත් ස්ථානයේ ප්‍රයෝජනය සඳහා ඇති තණකොළ හා පිදුරු හැර, සියළුම සත්ත්ව ආහාර මීයන්ට ඇතුල්විය නොහැකි වනසේ සුදුසු භාජනවල තබා තිබිය යුතුය.

16. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

(ඇ) ඉහත (ආ) වැනි වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, (අ) වගන්තියේ (i) උප වගන්තියේ සඳහන් වන ජෛවභායන අපද්‍රව්‍ය අතරට ගැනෙන සත්ත්ව වසුරු සහ ඉතිරි වන තණකොළ කොටස්, පොහොර වශයෙන් යොදා ගැනීමට එකී නියමය බාධාවක් නොවිය යුතුය. කෙසේ වුවද, එකී අපද්‍රව්‍ය කිරි පට්ටියෙන් බැහැරට ප්‍රවාහනය කරනු ලබන්නේ නම්, ආවරණයක් සහිතව ප්‍රවාහනය කරන්නේ නම් මිස, කිරි පට්ටිය පිහිටා තිබෙන පරිශ්‍රයෙන් බැහැරව ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

17. දොවා ගන්නා කිරි තැන්පත් කර තැබීමට ඒ සඳහාම වෙන් වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර, එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිතවූ ද, මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන්ට සහ මීයන්ට ඇතුල්විය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතුය.

18. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර, කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිළි තිබිය යුතුය. එසේම එකී වැසිකිළි කිරි පට්ටියේ සතුන් රඳවා තිබෙන ගොඩනැගිලි, කිරි දොවන ස්ථානවල සහ කිරි තැන්පත් කරන කාමරවල සිට අවම වශයෙන් මීටර් 15.0ක් දුරින් ස්ථානගත කර තිබිය යුතුය.

19. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතුය.

20. සෑම කිරි පට්ටිබලපත්‍රලාභියෙකුම, "තමන්ගේ නම" හා "බලපත්‍රලත් කිරි පට්ටිය" යන වාක්‍ය ත්‍රිවිධ භාෂාවෙන් ලියූ පුවරුවක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

21. සෑම කිරි පට්ටි බලපත්‍රලාභියෙකුම, නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ පිටපතක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතුය. ඒ සමඟ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් කවර හෝ නිලධාරියෙකු හෝ විසින් ඕනෑම සාධාරණ වේලාවන්හි දී පරීක්ෂා කර බැලිය හැකි ආකාරයෙන් කිරි පට්ටියේ සියළුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් ඔහු විසින් තබාගත යුතුය.

22. ඉහත කී අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, කිරි නිෂ්පාදන සමුපකාර සමිති විසින් කිරි මිළ දී ගනිමින් විකුණන විටෙක, කිරි සපයන්නන් සඳහා නියමිත ආදර්ශ ආකෘතියේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතකට අයදුම් කිරීම හා අනු අංක යෙදූ කාඩ්පත වාර්ෂිකවම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබා ගැනීම කිරි පට්ටි පවත්වාගෙන යනු ලබන සමුපකාර සමිතිවල කාර්යය විය යුතුය. ඉහත කාඩ්පතේ කිරි සමුපකාර සමිතිවලට කිරි සපයන්නාගේ නම, ලිපිනය, භාරදෙන ස්ථාන යනාදිය සඳහන් කිරීම සමඟ කිරි සපයන්නාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතුය.

23. කිරි පට්ටියක සේවයේ නියුක්ත සියළුම සංචාරක කිරි වෙළෙඳුන් සඳහා නියමිත ආදර්ශ ආකෘතියේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතකට අයදුම් කිරීම හා අනු අංක යෙදූ කාඩ්පත වාර්ෂිකවම ලබා ගැනීම කිරි පට්ටිකරුගේ වගකීම හා කාර්යය විය යුතුය. ඉහත කාඩ්පතේ කිරි වෙළෙන්දාගේ නම, ලිපිනය හා විකිණීම් කරනු ලබන ස්ථාන යනාදිය සඳහන් කර, කිරි වෙළෙන්දාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතුය.

24. මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, බලපත්‍රලත් කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය එහි සාමාජිකයන්ගෙන් කිරි මිළ දී ගනිමින් විකුණන විටෙක, සමුපකාර සමිතියට කිරි සැපයුම්කරු, කිරි පට්ටිකරු ලෙසින් අදහස් කළ යුතුය. එසේම කිරි ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීම සඳහා කිරි තොගයම මිළ දී ගන්නා පෞද්ගලික ආයතන හා එම ආයතනවලට තොග කිරි විකුණම්කරු, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිරි පට්ටිකරු ලෙසින් අදහස් කළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන් (25-38)

25. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිරි පට්ටියක් හෝ කිරි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

26. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීමට හෝ නියුක්ත කරවීමට හෝ ඉඩදීම නොකළ යුතුය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකුව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

27. කිරි දොවා ගැනීමට, කිරි තැන්පත් කිරීමට සහ කිරි ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා භාජන ඔප දැමූ මැටි, ගැල්වනයිස් කළ යකඩ හෝ ටින්, එනැමල් ආලේපිත යකඩ, මතුපිට සුමට කළ ඇලුමිනියම්, වීදුරු හෝ පෝසිලෙන් යන කවර හෝ වර්ගයක භාජන යොදාගත යුතු අතර, එකී භාජන සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ ගබඩා නොකළ යුතුය.

28. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා භාජන, ඒවාට නියමිත කාර්යයට හැර, වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතුය.

29. කිරි දොවා ගැනීම ආරම්භ කිරීමට පෙර -

(i) කවර හෝ කිරි දෙනකගේ බුරුල්ල පිරිසිදු ජලයෙන් සේදීම කර;

(ii) කිරි දොවන්නා සබන් හෝ සබන් දියර හෝ යොදා තම දෑත සෝදා ගෙන;

(iii) යන්ත්‍රානුසාරයෙන් කිරි දෙවීම කරනු ලබන අවස්ථාවක, එකී උපකරණ ජීවානුහරණය කර;

ඇත්තේ නම් මිස, කිරි දෙවීමට ඉඩදීම නොකළ යුතුය.

30. කිරි බුරුල්ලේ හෝ අන් තැනක හෝ ඇතිවන ක්ෂය රෝගයෙන්, තීව්‍ර ස්තන ප්‍රදාහයෙන්, කුර හා මුඛ රෝගයෙන්, අන්ත්‍රැක්ස් රෝගයෙන් හෝ කිරි බුරුල්ලේ ඇන්ටිනොමයිකෝසිස් රෝගයෙන් පෙළෙන හෝ බෲසෙල්ලෝසීස් රෝගයෙන් පෙළෙන බවට පශු වෛද්‍ය නිලධාරියා තීරණය කරන ලද යම් සතෙකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩදීම හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරිවලට එකතු කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

31. කිරි ගබඩාකර තැබීමේ සහ සකස් කිරීමේ කාර්යය හැර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා කිරි කාමරය යොදා ගැනීම හෝ යොදා ගැනීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

32. කවර හෝ තැනැත්තෙකු විසින් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ එකතු කිරීමෙන් කිරි බාල කිරීම නොකළ යුතුය.

33. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර, කිරි පට්ටියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතුය. එසේ වුවද, කිරි පට්ටියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් හෝ මෙයට ඇතුළත් නොවිය යුතුය.

34. කිරි පට්ටියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම්, එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18.0කට අඩු දුරකින් කසළ වළක් හෝ පොහොර වළක් හෝ අළු වළක් හෝ ස්ථානගත කර නොතිබිය යුතුය.

35. කිසියම් කිරි පට්ටියකින් ලබා ගන්නා කිරි, දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ භාජන යොදා ගන්නේ නම් මිස, ඒ කිරි බලපත්‍රලත් ස්ථානයෙන් බැහැරව ගෙනයාම නොකළ යුතුය.

36. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් කිරි සමග ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයන් හෝ ද්‍රව්‍යයක් එකතු කිරීමෙන් කිරි බාල කිරීම හෝ බාල කළ කිරි විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ සංචාරයේ යෙදී විකිණීම හෝ භාරදීම හෝ නොකළ යුතුය.

37. (i) 1980 අංක 26 දරන ආහාර පනත යටතේ 1991.08.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* (අති විශෙෂ)යෙන් පළ කරන ලද පහත 01 වැනි උපලේඛනයෙන් දක්වා ඇති කිරිවලට අවශ්‍ය කරන අවම වශයෙන් යම් ද්‍රව්‍යයක් එකතු නොකළ බාල කළ කිරි, කිරි ද්‍රව්‍යයන් කිසිවක් කවර හෝ බලපත්‍රලාභියෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

(ii) මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු, නරක් වූ නැතහොත් යම් ද්‍රව්‍යයක් එකතු කළ සම්පූර්ණ යොද සහිත කිරි කිසිවක් කිසිම තැනැත්තෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

38. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් පවත්නා වර්ෂය සඳහා නිකුත් කරන ලද කාඩ්පත ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු කිරි විකිණීම, තැනින් තැනට ගෙනයාම, විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

39. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ කිරි පට්ටියක කිරි හෝ විකිණීම සඳහා තබා ඇති යම් සාම්පලයක්, එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය. ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය (39-41)

40. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කිරි පට්ටියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වුවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතුය.

41. මේ කොටසේ 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇති අවස්ථාවක, නියමිත හැඳුනුම්පත නිකුත් කිරීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ හෝ කාර්යය වන්නේය.

අයකිරීම් හා ගාස්තු.

42. කිරි පට්ටියක් පවත්වාගෙන යාම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය.

බලය පැවරීම.

43. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

44. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය. (45-49)

45. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ ප්‍රාදේශීය සභාවේ බලයලත් කවර හෝ නිලධාරියෙකු හෝ විසින් කිරි පට්ටි බලපත්‍රලාභියෙකුගෙන් විකුණන, විකිණීම සඳහා තැනින් තැනට ගෙනයන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ යම් තැනැත්තෙකුගෙන් කවර හෝ වේලාවක පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා කිරි සාම්පලයක් ලබාගත හැකි අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා ඇති කරන යම් ලියාපදිංචි කිරි පට්ටිකරුවෙකු හෝ වෙනත් තැනැත්තෙකු වරදක් කරන්නේය.

46. සංචාරක කිරි වෙළෙඳුන්ට වාර්ෂිකවම නිකුත් කරනු ලබන හැඳුනුම්පත පරීක්ෂා කිරීම සඳහා බලයලත් ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ විසින් ඉල්ලා සිටින විට, ඔහු විසින් පරීක්ෂා කිරීමට ඉදිරිපත් කිරීම පැහැර හරින අවස්ථාවක, ඔහු වරදකරුවන්නේය. ඒ නිලධාරියා විසින් ඔහුව අත් අඩංගුවට ගෙන අප්‍රමාදව ළඟම ඇති පොලීසියට ගෙන යා යුතුය. ඔහුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ වරෙන්තුවක් නොමැතිව පොලිස් නිලධාරියෙකු විසින් අත් අඩංගුවට ගනු ලැබුවාක් සේ, ඒ පොලිස් ස්ථානයේ, ස්ථානභාර නිලධාරියා විසින් ක්‍රියා කළ යුතුය. ඉහත කී හැඳුනුම්පත අවලංගු කිරීම මහජන සෞඛ්‍ය පිණිස අවශ්‍ය යැයි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පෙනී ගියහොත්, ඒවා කවර අවස්ථාවක වුවද, එසේ අවලංගු කරනු ලැබිය හැකිය.

47. කිරි සාම්පල ගන්නා විට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ බලයලත් ප්‍රාදේශීය සභාවේ නිලධාරියා හෝ විසින් සාම්පල 3ක් ලබාගත යුතු අතර, ඒවා ලබාගනු ලැබූ ලියාපදිංචි කිරි පට්ටිකරු හෝ බලපත්‍රලාභියා හෝ ඉදිරිපිට දී ඒවාට මුද්‍රා තබා, ඉන් එකක් එකී ලියාපදිංචි කිරි පට්ටිකරුට නැතහොත් බලපත්‍රලාභියාට භාර දී, දෙවැන්න ප්‍රදේශයේ හෝ රජයේ රස පරීක්ෂකවරයාට ද, තුන්වැන්න ප්‍රාදේශීය සභා කාර්යාලයට ද යැවිය යුතුය. ඒ සාම්පලය ලබාගනු ලැබූ කිරි බාල කර තිබුණු බවට ප්‍රාදේශීය සභාව හෝ රජයේ රස පරීක්ෂකවරයා හෝ විසින් අත්සන් තබන ලද සහතිකය සාක්ෂියක් වන්නේය.

48. මේ කොටසේ 40 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර (14)කට නොවැඩි විය යුතුය.

49. මේ කොටසේ 48 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනයට හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර හෝ ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

50. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත්

නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

52. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචන.

“ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා” යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

“ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා” යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

“ප්‍රාදේශීය සභාව” යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

“බලයලත් නිලධාරියා” යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

“බලපත්‍රලාභියා” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

“බලපත්‍රලත් ස්ථානය” යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

“පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය” යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

“කිරි පට්ටිය” යන්නෙන්, කිරි ලබා ගැනීමේ හා කිරි විකිණීමේ කාර්යය ප්‍රමුඛ වශයෙන් ක්‍රියාත්මක කිරීමට එක් වර්ගයක හෝ වර්ග එකකට වැඩි වර්ග ගණනක හෝ සත්ත්වයන් රඳවා තබා ගන්නා ගොඩනැගිලි ද, ඒ පරිශ්‍රය ද, අදහස් වන අතර එකී සත්ත්වයන් ද ඊට ඇතුළත් විය යුතුය.

“කිරි අළෙවි ස්ථානය” යන්නෙන්, කිරි මිළ දී ගැනීමේ හා මිළ දී ගෙන විකුණුම් කිරීමේ කටයුතු සිදු කෙරෙන ස්ථානය අදහස් වේ.

“පශු වෛද්‍ය නිලධාරියා” යන්නෙන්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණ වනසේ පත් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ රජයේ පශු වෛද්‍ය නිලධාරියා අදහස් වේ.

“සත්ත්වයා” යන්නෙන්, එළ ගවයන්, මී ගවයන්, බැටළුවන් සහ එළුවන් යන වර්ගවලට අයත් සත්ත්වයන් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇතිවූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

54. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**උපලේඛන 01 - කිරිවල සංයුතිය**

| *I වැනි තීරය කිරි වර්ගය* | | *II වැනි තීරය කිරිවල නාමය* | *IIIවැනි තීරය ක්ෂීර මේදය අවම ප්‍රතිශතය* | *IV වැනි තීරය ක්ෂීර මේදය හැර ක්ෂීර ඝණද්‍රව්‍ය ප්‍රතිශතය* |
|---|---|---|---|---|
| 1 | මී කිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 7.0 | 9.0 |
| 2 | එළකිරි | එම | 3.5 | 8.5 |
| 3 | ප්‍රමිත කළ | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 3.25 | 8.25 |
| 4 | සකස් කළ | එම | 2.0 | 8.5 |
| 5 | රස කළ | එම | 2.0 | 7.2 |
| 6 | යොදය රහිත හෝ මේදය රහිත | එම | -- | 8.5 |

ඇමුණුම - 01

**ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කිරි පට්ටි හා කිරි අළෙවි ස්ථාන පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. කිරි පට්ටියේ / කිරි අළෙවි ස්ථානයේ නම: .............................................

2. කිරි පට්ටිය / කිරි අළෙවි ස්ථානය පිහිටා ඇති ස්ථානයේ -

(i) වරිපනම් කොට්ඨාසය: .................... වරිපනම් අංකය: .................

(ii) වීථියේ / පාරේ නම: ......................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: ........................ හා

ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: .................................

3. අයදුම්කරුගේ -

(i) සම්පූර්ණ නම: .........................................................................

(ii) ස්ථිර ලිපිනය: ..........................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය: ......................................................

(iv) ජාතික හැඳුනුම්පතේ අංකය: ......................................................

(v) දුරකථන අංකය: .......................................................................

(vi) විද්‍යුත් තැපැල් අංකය: ...............................................................

4. (i) කිරි පට්ටිය / කිරි අළෙවි ස්ථානය ආරම්භ කළ දිනය: ..................

(ii) කිරි පට්ටියේ / කිරි අළෙවි ස්ථානයේ කළමනාකරුගේ / නියෝජිතයාගේ -

(අ) නම : ...............................................................................

(ආ) දුරකථන අංකය: ...............................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

(i) අයිතිකරුගේ නම: ......................................................................

(ii) ලිපිනය: .....................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............. නැත: ............

ඔව් නම්: බලපත්‍රය අංකය: ..................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: .....................

................................;
ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

....................................................................
සභාපති / ලේකම් /බලයලත් නිලධාරියා.

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස ( ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාසය: .......................... වරිපනම් අංකය: .............

වීථියේ / පාරේ නම: ......................................................................

අයිතිකරුගේ නම: ..........................................................................

දේපලෙහි ස්වභාවය: .....................................................................

වාර්ෂික වටිනාකම: රු. ......................

හිඟ වරිපනම් මුදල: රු. ................... ඇත: .................. නැත.: ..................

දිනය: .....................

................................;
පරිපාලන නිලධාරී.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ..................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ..................................................................

ඒකකය A B C සටහන්:....................................................................

දිනය: .....................
.......................................
ආදායම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

දිනය: .....................
.......................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

දිනය: .....................
.......................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ........... ව්‍යාපාරයේ ස්වභාවය: ........... පාරිසරික බලපත්‍ර: ...........

MOH වාර්තාව:.......... අනුකූලතා සහතිකය: ......... මත්පැන් බදු බලපත්‍ර:..........

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නිර්දේශ නොකරමි.
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

දිනය: .....................
.......................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

**ලේකම්වරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: .....................
...........................
ලේකම්.

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: .....................
.........................................................................
ප්‍රාදේශීය සභාවේ ලේකම් / බලයලත් නිලධාරියා.

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ................................ ලදුපත් දිනය: .............................

බලපත්‍ර අංකය: ............................... බලපත්‍ර දිනය: .............................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: .....................

......................................
ආදායම් පරිපාලන නිලධාරී

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අත්සන ඉදිරිපත් කරමි.

දිනය: .....................

..........................................
ලේකම්

බලපත්‍රය අත්සන් කරන ලදී.

දිනය: ..................

.................................................................
ප්‍රාදේශීය සභාවේ සභාපති / බලයලත් නිලධාරියා.

**IV වැනි කොටස :- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *අතුරු ව්‍යවස්ථාවේ නාමය.*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *අරමුණ*

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු හා 126(ix)(ඔ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.*

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. *ඉටුකළ යුතු කාර්යයන්. (4-19)*

   (i) අවමංගල්‍යා සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන් වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයෙකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග අඩි 80කට නොඅඩු ඉඩකඩක් තිබිය යුතුය. එකී කාර්යය පිණිස පාවිච්චි කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර, එය පිහන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතුය.

   (ii) අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයට, බාහිර පුද්ගලයන් අවසරයකින් තොරව ඇතුළ්වීම තහනම් කර තිබිය යුතුය.

   (iii) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිතා කරනු ලබන කාමරයේ වර්ගඵලයෙන්, හතෙන් එක(1/7)කට නොඅඩු ප්‍රමාණයකට වූ කවුළු සකසා තිබිය යුතු වන අතර, එකී කාර්යයන්හි නියුක්තවීම කිසිදු බාහිර පුද්ගලයෙකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතුය. එකී කවුළු අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති නිවාස දෙසට එක එල්ලේ විවෘත නොවී තිබිය යුතුය.

(iv) මෘත දේහයක් සකස් කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස්, තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු වන අතර, එකී කාර්යය කරන අවස්ථාවේ දී, මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම්, එකී අපජලය වැනි දෑ රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයෙන් භාජන තබා තිබිය යුතුය.

(v) බලපත්‍රලත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇති විට, කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන තැනැත්තන්ගේ වාහන නවත්වා තැබීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතුය.

(vi) ගෞරවය දැක්වීම පිණිස මෘත දේහයන් තැන්පත් කර තිබෙන ස්ථානය, ඒ අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙනම වෙන්කර තිබිය යුතුය.

(vii) මේ කොටසේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් තිබිය යුතුය.

5. අවමංගල්‍යය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකුම විසින් මේ කොටසේ පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පතක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. මෘත දේහයන් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හය(06)ක් ගත වූ පසු, පොළොවේ මතුපිට සිට අඩි හතර (04)ක ගැඹුරු වළක, වළදමා මැනවින් වසා දැමිය යුතුය.

7. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් නියෝගයක් කර ඇති විටෙක, ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

8. මේ කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටෙක, සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය ප්‍රාදේශීය සභාවේ පොදු සුසාන භූමිය ඇතුළේ, එම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරක් සහිත වළක, වළදමා වසා දැමිය යුතුය.

9. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තරයෙන් විෂබීජනාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම කළ යුතුය. එසේම අවශ්‍ය වන විටෙක දී, කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනයට ලබාගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් උපකරණ තිබිය යුතුය.

10. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල සේවයේ යෙදෙන සියළුම සේවකයින්ට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුව වැසුම් හා අත් වැසුම් ලබාදීම හා මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේ දී, එකී සේවකයින් ඒ ඇඳුම්වලින් හා පැළඳුම්වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වගබලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථ ඇතුළත, අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක (vacuum cleaner) මගින් පිරිසිදු කර, විෂබීජනාශක යොදා තිබිය යුතුය.

14. මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව, නිකුත් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම්, බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතුය.

15. මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, එකී ස්ථානයේ තැන්පත් කර තබන කිසියම් මෘත දේහයකට සහ එකී මෘත දේහයේ භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් එකී මෘත දේහය ප්‍රදර්ශනය කිරීම කළ යුතුය.

16. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

17. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය;

(ii) වීදුරු;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(iv) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ සිට (vii) වැනි උපවගන්තිය දක්වා වන අපද්‍රව්‍ය යන්නට, කිසියම් මෘත ශරීර කොටස් ඇතුළත් නොවිය යුතු වන අතර, මෘත දේහයෙන් ඉවත් කරනු ලබන කිසියම් මෘත ශරීර කොටසක් හෝ කොටස් අවස්ථාවෝචිත පරිදි 6 වැනි හෝ 7 වැනි හෝ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයට බැහැර කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ඇ) ඉහත (අ) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නෙන්, බලපත්‍රලත් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන හෝ කිසියම් මෘත ශරීරයක් මහජන ගෞරවය පිණිස තබා ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

19. බලපත්‍රලත් ස්ථානයේ දී හෝ වෙනත් කිසියම් බාහිර ස්ථානයක දී හෝ සිදු කරනු ලබන සෑම මෘත දේහ සැකසීමක් ම සහ අවමංගල්‍යය සේවා සැපයීමක් ම පිළිබඳව මේ කොටසේ දෙවන උපලේඛනයෙහි

දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් පවත්වාගෙන යාම සහ එකී ලේඛනය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන්. (20-26)

20. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

21. අධික වශයෙන් හානි සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර, වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහ සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිතා නොකළ යුතුය.

22. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තෙකු හැර, වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතුය.

23. ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස, කොළරාව, ඩෙංගු, මහාමාරිය, වසූරිය, කහඋණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහයක් බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

24. කිසියම් මෘත දේහයක් සැකසීමට සහ අවමංගල්‍යය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර, එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතුය.

25. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වන විටෙක හෝ එකී මරණය සැක සහිත වන විටෙක, මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම් මිස, එකී මෘත ශරීරය සැකසීම හෝ සැකසීම සඳහා භාර ගැනීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

26. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර හෝ කාර්යයක් අවමංගල්‍යය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදු කිරීමට හෝ එසේ කිරීමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය.

27. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසන් වූවත්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් හෝ එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතුය.

අයකිරීම් හා ගාස්තු.

28. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය.

බලය පැවරීම.

29. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

31. මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (31-32)

32. මේ කොටසේ 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

33. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

දඩ හා දණ්ඩන

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

අර්ථ නිරූපණය හා නිර්වචනය

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය" යන්නෙන්, කිසියම් මෘත ශරීරයක් කල්තබා ගත හැකි වන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් අදහස් වේ.

"මෘත දේහ සැකසීම" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල්තබා ගත හැකි වන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම අදහස් වේ.

"මෘත ශරීර කොටස්" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැර වන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක්, මියගිය පුද්ගලයාගේ ශරීරයේ තිබූ කිසියම් අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලුම්පටි, පුළුන් හෝ වන යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

37. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**පළමුවන උපලේඛනය**

**අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම 20...... වර්ෂය**

1. අයදුම්කරුගේ නම: .........................................

2. ලිපිනය: ..........................................................................

3. ජාතික හැඳුනුම්පතේ අංකය: ..................................................

4. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය: ..........................................

5. එක වරක දී සැකසීම පිණිස තබාගත හැකි මෘත දේහ සංඛ්‍යාව: .............

6. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව:

7. මෘත දේහ සැකසීමට පෙර, ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව:

8. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය:

9. ගෞරව දැක්වීම පිණිස මෘත දේහය තැන්පත් කර තැබීම භාරගනු ලබන්නේ නම් -

   (i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව:

   (ii) ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද?

10. ස්වභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද? ඔව්./නැත.

11. ඉවතලන ස්වභාවික මල් හෝ ශාක කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය:

12. ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව:

13. කළමණාකරුවෙකු පත්කර ඇත්නම්, ඔහුගේ -

(i) නම:

(ii) ජාතික හැඳුනුම්පතේ අංකය:

අවමංගල්‍යාය සේවා සැපයුම් ස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමට හා කළින් කළ ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළි පැදීමටත් එකඟ වන බව මෙහි අත්සන් කිරීමෙන්ම පිළිගනිමි.

දිනය: .....................

.................................
අයදුම්කරුගේ අත්සන.

## දෙවන උපලේඛනය

**අවමංගල්‍යාය සේවා සැපයුම් ස්ථානයක හෝ වෙනත් බාහිර ස්ථානයක සැකසුම් කරනු ලබන මෘතදේහ පිළිබඳ තොරතුරු ලේඛනය**

| | | | | | මරණ සහතිකය ලියාපදිංචි කළ | | මෘත දේහය භාරගත් | | මරණකරුගේ ඥාති අයගේ විස්තර | | | | හදිසි මරණ පරීක්ෂකගේ නියෝගයේ | | මෘත දේහය බැහැර කළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | මියගිය අයගේ නම | ජා. හැ.පතේ අංකය | ස්ත්‍රී/ පුරුෂභාවය | මියගිය දිනය | අංකය | දිනය | දිනය | වේලාව | නම | මරණකරු වෙත ඇති සබඳතාව | ලිපිනය | ජා. හැ.පතේ අංකය | යොමු අංකය | දිනය | දිනය | වේලාව | ඥාතියාගේ අත්සන |
| 1. | | | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | | | |

**V වැනි කොටස :- ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කර්මාන්තශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. අතුරු ව්‍යවස්ථාවේ නාමය.

අරමුණ.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම, පීඩාවන් දමනය කිරීම හා කර්මාන්ත අපද්‍රව්‍යයන් නියාමනය කිරීම හා පාලනය කිරීම යනාදි අරමුණු සඳහා මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු හා එකී පනතේ 126(ix)(ක) සහ (ද) වැනි උපවගන්ති යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටුකළ යුතු කාර්යයන් (4-12)

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, කවර හෝ කර්මාන්ත ශාලාවක් හා කර්මාන්තයක් පවත්වාගෙන යාමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(i) නියමිත ස්ථානය මනා අළුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ii) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැගිල්ලකට ම මනා වාතාශ්‍රය හා ආලෝකය ලැබෙන ආකාරයෙන් පැවතිය යුතුය. සෑම කාමරයකට ම විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට, ඒ කවුළුවල වර්ග ප්‍රමාණය ඒ කාමරයේ මතුපිට බිම් ප්‍රදේශයෙන් වර්ග ඵලයෙන් පහළොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතුය. කෙසේ වුව ද, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යයන් සංවෘත ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම කළයුතු කර්මාන්ත ශාලා හෝ කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල වායු සමනය කර ඇති අවස්ථාවක, මෙම විධිවිධානය අදාළ නොවන බව අදහස් කළ යුතු ය.

(iii) සෑම කාමරයක ම බිත්තිවල අවම උස මීටර් 2.14ට අඩු නොවිය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇති අවස්ථාවක, ඒවා බදාම යොදා කපරාරු කර ඇතුල් පැත්තේ තීන්ත ආලේප කර තිබිය යුතුය. නැතහොත් ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමඟ ලෑලි යෙදූ බිත්ති නිමකර ඇති අවස්ථාවක, ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(iv) ස්ථානයේ වූ සෑම කාමරයක ම ඇතුල් වහළ (සීලිම) සවිකර තිබිය යුතු අතර, එකී ඇතුල් වහළ පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් දෙක (2.0)කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) වහළයට යොදන ලද යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත හෝ ආලේප කර තිබිය යුතු ය.

(vi) ගෙබිම සිමෙන්ති දමා සිමෙන්තියෙන් මැද තිබීම හෝ පිහන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(vii) කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දස දෙනෙකුට ම, එකක් බැගින් වන සේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන ප්‍රමාණවත් වැසිකිළි හා කැසිකිළි තිබිය යුතුය.

(viii) ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව අපජලය පවිත්‍රකරණය කටයුතු සිදුකිරීම කළ යුතු ය.

(ix) නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමෙන් පසුව බැහැර කරන අපජලය පවිත්‍රකරණයට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අපජලය ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා හෝ විසින් නිර්දේශ කරනු ලබන ආකාරයෙන් උරා ගන්නා වළකට ගලායාමට සැලැස්විය යුතුය. එසේම එකී උරා ගන්නා වළ වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර ආසන්නයේ ඇති පොදු ජල මාර්ගයක සිට හෝ ඉදිකර ඇති ළිඳක සිට හෝ මීටර් පනහ (50)කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතුය.

(x) කර්මාන්ත ශාලාව සඳහා භාවිතා කරන ගොඩනැගිල්ලට, ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇති කර තිබිය යුතුය.

(xi) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය සඳහා පාවිච්චි කරන කාමරවලින් සහ සේවකයන්ගේ නාන කාමරවලින් බැහැර කෙරෙන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් ඇති කර තිබිය යුතුය.

(xii) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය, වෙනත් රසායනික ද්‍රව්‍ය, කිසියම් නිෂ්පාදනයක් ඇසිරීම සඳහා යොදා ගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා අවම වශයෙන් එක් කාමරයක්වත් වෙනම සපයා තිබිය යුතු අතර, එකී කාමරය මීයන්ගෙන්, කෘමීන්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතු ය.

(xiii) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරන නිෂ්පාදනයන් මනුෂ්‍ය පරිභෝජනයට හෝ සත්ත්වයින්ගේ පරිභෝජනයට හෝ සඳහාවන ආහාර හෝ පාන වර්ගයක් වන විට, ඒ සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර, අවම වශයෙන් සෑම මාස හය (06)කට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ස්ථානයේ පාවිච්චිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය එකී නිෂ්පාදන සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xiv) කර්මාන්ත ශාලාවේ පාවිච්චියට ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් සහ මදුරුවන් සහ වෙනත් කීටයන් බෝවීමෙන් වළක්වාලීම පිණිස ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී ජලය භූගත ජල ටැංකියක ගබඩා කර තබන අවස්ථාවක, එකී ස්ථානයේ සිට කර්මාන්ත ශාලාවේ ඉදි කරනු ලබන කසළ වළක් හෝ පොහොර වළක් හෝ අළු වළක් හෝ මීටර් දහඅට (18)කට ඔබ්බෙන් වූ දුරක ස්ථානගත කර තිබිය යුතු ය.

(xv) කලින් පාවිච්චි කළ ඇසුරුම් සේදීම සඳහා යොදා ගන්නා ස්ථානය, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය කරන කාමරවලින් වෙන්ව ස්ථානගත කර තිබිය යුතු අතර, ඉහත (xiii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතු ය.

(xvi) කර්මාන්ත ශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය මේ කොටසේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට වර්ග කර, බැහැර කළ හැකි ආකාරයෙන් වෙන් කළ භාජන හෝ ටැංකි හෝ තිබිය යුතු ය.

5. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම කොටසක් ම කටු පඳුරු හෝ වල් පඳුරුවලින් තොරව පවත්වා ගැනීම සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් හෝ බෝවන ආකාරයෙන් ජලය රැඳී තිබීම වැළැක්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

6. මේ කොටසේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතු ය.

7. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අළුත්වැඩියා තත්ත්වයකින් තබාගත යුතු ය.

8. නිෂ්පාදන වර්ග ඇසුරුම් කිරීමට පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කර, නැවත පාවිච්චි කරමින් නිපැයුම් ඇසිරීම සඳහා එකී ඇසුරුම් යොදා ගන්නා කිසියම් කර්මාන්ත ශාලාවක හා කර්මාන්තයක එකී පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කිරීමේ දී -

*(අ)* එකී ඇසුරුම්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද, සහ

*(ආ)* එකී ඇසුරුම් අවසාන වටයේ පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද,

යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිතා කළයුතු අතර, එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මඟින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

9. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ නියුක්ත සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයින් නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම, එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය:

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට හෝ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වැනි වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල හෝ දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

11. කර්මාන්ත ශාලාවේ පිහිටීම, මධ්‍යම පරිසර අධිකාරියේ, නාගරික සංවර්ධන අධිකාරියේ සහ කර්මාන්ත ශාලා ආඥා පනතේ රෙගුලාසිවලට යටත්ව තිබිය යුතු ය.

12. කර්මාන්ත ශාලාවේ හා කර්මාන්තයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

ඉටු නොකළ යුතු කාර්යයන් (13-19)

13. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්තයක් හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

14. දුර්ගන්ධය හෝ විෂ සහිත කිසියම් වායු වර්ගයක් බැහැරට විසිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වෝපායයන් සලසා ඇත්තේ නම් මිස, යම් විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් හෝ මතුවන කිසියම් ද්‍රව්‍යයක් කර්මාන්ත ශාලා හා කර්මාන්ත පරිශ්‍රයක් තුළ ගබඩා කිරීම හෝ පාවිච්චියට ගැනීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

15. 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව ශබ්ද දූෂණයක් විය හැකි සීමාවට වඩා අඩු සීමාවක ශබ්ද පාලනයක් පවත්වාගෙන ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක ශබ්ද නිපදවීමක් ඇති වන කිසියම් යන්ත්‍රසූත්‍ර හෝ වාෂ්ප බොයිලේරු හෝ ක්‍රියාත්මක කිරීමේ දී, ශබ්ද උපදවන වෙනත් යම් ආකාරයක යන්ත්‍රයක් පාවිච්චි නොකළ යුතු ය.

16. යම් උඳුනකින් උත්පාදනය වන දුම් පිට කිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව, දුම් කවුළුවක් තනා ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක දුම් උත්පාදනය කෙරෙන යම් උඳුනක් පාවිච්චියට ගැනීම නොකළ යුතු ය.

17. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ කර්මාන්තයක හෝ නියුක්ත කම්කරුවන් හෝ සේවා නියුක්තිකයන් හෝ කැඳවීමේ කාර්යයන් ආරම්භ කිරීමේ හෝ කාර්යයන් අවසන් කිරීමේ සංඥා කිරීමක් හෝ වෙනත් කිසියම් කරුණක් සඳහා යම් වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් හෝ භාවිතා කිරීම හෝ පාවිච්චි කිරීම හෝ නොකළ යුතු ය. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල

විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දින වන විටත්, ඒ ආකාරයේ වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් පාවිච්චි කරනු ලබන කිසියම් කර්මාන්ත ශාලාවක් වන විට, එකී කර්මාන්ත ශාලාවේ පාවිච්චි කරනු ලබන එකී කැඳවීම් සංඥා මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව නිවැරදි කිරීමට එකී දින සිට මාස තුනක කාලයක් හිමිවන අතර, එදිනෙන් පසුව එකී කැඳවීම් සංඥා පාවිච්චි කිරීම නොකළ යුතුය.

18. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ කර්මාන්තයක හෝ පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය කවර හෝ අවස්ථාවක පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතුය.

19. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුව බලපත්‍රලත් මුත්, කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, සේවයෙහි නියුක්ත නොවිය යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කර්මාන්ත ශාලාවක් හා කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර, එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය. ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය.

21. කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්තයක් හෝ පවත්වාගෙන යාම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට බලය ඇත්තේය. අයකිරීම් හා ගාස්තු

22. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභවේ සභපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම.

23. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය. බලපත්‍රයේ හෝ අවසරපත්‍ර යේ වලංගු කාලය.

24. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (24-27)

25. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

26. මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර (14)කට නොවැඩි විය යුතුය.

27. මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේ ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

28. බලපත්‍රලාභියා හෝ කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචන.

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල,කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කර්මාන්ත ශාලාව" යන්නට, 1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥාපනතේ තිබෙන අර්ථය ම අදාළ වන අතර, කිසියම් අමුද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

32. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ඇමුණුම - 01

**ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කර්මාන්ත ශාලා හා කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහාවන අයදුම්පත්‍රය - 20...... වර්ෂය.**

1. කර්මාන්ත ශාලාවේ/කර්මාන්තයේ නම: ............................................

2. කර්මාන්ත ශාලාව/කර්මාන්තය පිහිටා ඇති ස්ථානයේ -

   (i) වරිපනම් කොට්ඨාශය: .................. වරිපනම් අංකය: ................

   (ii) වීථියේ / පාරේ නම: ...................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය: ........................................... හා
   ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම: ...................................

4. අයදුම්කරුගේ -

   (i) සම්පූර්ණ නම: .........................................................................

   (ii) ස්ථිර ලිපිනය: .........................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය: .........................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය: .......................................................

   (v) දුරකථන අංකය: .........................................................................

   (vi) විද්‍යුත් තැපැල් අංකය: .................................................................

4. (i) කර්මාන්ත ශාලාව/කර්මාන්තය ආරම්භ කළ දිනය: ...................

   (ii) කර්මාන්ත ශාලාවේ / කර්මාන්තයේ, කළමනාකරුගේ / නියෝජිතයාගේ -

   (අ) නම : ...............................................................................

   (ආ) දුරකථන අංකය: ...............................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් -

   (i) අයිතිකරුගේ නම: ......................................................................

   (ii) ලිපිනය: .......................................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද? ඔව්: ............ නැත: ............

   ඔව් නම්: බලපත්‍රය අංකය: ..................... දිනය: .........................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවට සහතික කරමි. කර්මාන්තය / වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත / වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය: ..................... ................................

ඉල්ලුම්කරුගේ අත්සන.

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස,

.....................................................................
සභාපති / ලේකම් /බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස ( ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන්නේ නම්)**

වරිපනම් කොට්ඨාශය: .......................... වරිපනම් අංකය: ...................

වීථියේ / පාරේ නම: ...........................................................................

අයිතිකරුගේ නම: .............................................................................

දේපලෙහි ස්වභාවය: ..........................................................................

දේපලෙහි වටිනාකම: ..........................................................................

හිඟ වරිපනම් මුදල: රු. ................... ඇත: ................. නැත.: .................

දිනය: .....................

.................................
පරිපාලන නිලධාරී.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය: ....................................................................

ගෙවිය යුතු ගාස්තුව: රු. ..................................................................

ඒකකය A B C සටහන්:.....................................................................

දිනය: .....................

.....................................
ආදායම් පරීක්ෂක

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව

......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

දිනය: .....................

.......................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

දිනය: .....................

.......................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ........... ව්‍යාපාරයේ ස්වභාවය: ........... පාරිසරික බලපත්‍ර: ...........

MOH වාර්තාව:.......... අනුකූලතා සහතිකය: ......... මත්පැන් බදු බලපත්‍ර:..........

අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / පහත සඳහන් හේතූන් මත නොකරමි.

.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................

.......................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය: .....................

**ලේකම්වරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය: .....................

........................................
ලේකම්

**අනුමත කරමි. / නොකරමි.**

දිනය: .......................

..................................................................
ප්‍රාදේශීය සභාවේ ලේකම් / බලයලත් නිලධාරියා.

**නානාවිධ ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය: ................................ ලදුපත් දිනය: .............................

බලපත්‍ර අංකය: ............................... බලපත්‍ර දිනය: .............................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය: .....................

.............................................
ආදායම් පරිපාලන නිලධාරී.

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය: .................... ....................................
ලේකම්

**බලපත්‍රය අත්සන් කරන ලදී.**

..............................................................
ප්‍රාදේශීය සභාවේ සභාපති / බලයලත් නිලධාරියා.

දිනය: ..................

**8 වැනි පරිච්ඡේදය**

**I වැනි කොටස - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වර්තමාන කාලයේ ආපදා කළමනාකරණය කිරීම, ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සහ ආපදා අවදානම අවම කිරීමට පියවර ගැනීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුවීමට ඉඩ ඇති ආපදා අවස්ථා අවම කිරීම, එවැනි යම් ආපදාවක දී අපහසුතාවට පත්වන්නන්ට හෝ පත්වීමට ඉඩ ඇති තැනැත්තන්ට සහන සැලසීම සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආපදා අවස්ථාවක දී ඊට මුහුණ දීමට හැකිවන අයුරින් පූර්ව සූදානම් කිරීම සඳහා ද, ආපදා අවදානම අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු පූර්ව ආපදා ක්‍රියාදාමයන් සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 26 වැනි වගන්තියට අනුකූලව, 132 වැනි වගන්තියේ (ඊ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටුකළ යුතු කාර්යයන් (4-25)

4. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා කළමනාකරණය කිරීම සහ එවැනි යම් ආපදා තත්ත්වයක් ඇති වූ විට, එම ආපදාවන්ට ලක් වූ හෝ ලක්විය හැකි තැනැත්තන්ට සහන සැලසීම හා ආපදා අවදානම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු පූර්වෝපායන් නිර්ණය කිරීම යනාදි කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවේ ආපදා කළමනාකරණ කමිටුව පිහිටුවිය යුතුය.

5. කමිටුවේ සංයුතිය -

(අ) 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව 22කට නොවැඩි විය යුතු අතර කාන්තාවන් ද නියෝජනය වන පරිදි එම සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) කමිටුවේ සභාපතිවරයා වශයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා;

(ii) කමිටුවේ ලේකම්වරයා වශයෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා;

(iii) ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයා සමඟින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමෙහි දී ඉදිරි වර්ෂය සඳහා ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන ප්‍රාදේශීය සභාවේ සභිකයන් තුන් දෙනෙකු;

(iv) ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී;

(v) ප්‍රාදේශීය සභාවේ ගිනි නිවීමේ අංශයේ ස්ථානභාර නිලධාරියා / ප්‍රධාන ගිනි භට;

(vi) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ පත් කරනු ලැබ ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(vii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ/ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයා/ප්‍රාදේශීය ලේකම්වරුන් හෝ විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(viii) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් නියෝජිතයෙකු;

(ix) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට ඇතුළත් වන පොලිස් ස්ථානාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(x) අවම වශයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්විත නාගරික සංවර්ධන උපදේශක කමිටුවේ නියෝජිතයන් තුන් දෙනෙකු;

(xi) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ රජයේ පාසල් ඇතුළත් වන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නියෝජිතයෙකු;

(xii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් වාණිජ මණ්ඩලයේ හෝ වෙළෙඳ සංගමයේ හෝ නියෝජිතයෙකු;

(xiii) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි අධිකාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xiv) ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ස්ථානභාර නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xv) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උතුරු පළාතේ ඩිපෝ කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු;

(xvi) උතුරු පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජිතයෙකු;

(xvii) උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු.

(ආ) ප්‍රාදේශීය සභාවේ සභිකයින් ධුරය හිස් කිරීම මත කමිටුවේ සාමාජික ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන යම් අවස්ථාවක, එසේ පුරප්පාඩුව ඇතිවීමෙන් පසුව පවත්වනු ලබන ඊළඟ සභා රැස්වීමේ දී, එකී පුරප්පාඩුව සඳහා සභාවේ වෙනත් යම් සභිකයෙකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර, එසේ තෝරා පත්කර ගනු ලබන සභිකයාට ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින වන තෙක්, ඒ සාමාජික ධුරයේ කටයුතු කරනු ලැබිය යුතුය.

(ඇ) ඉහත 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv). (v) සහ (ix) වැනි උපවගන්තිවල සඳහන් කවර හෝ නිලධාරියෙකු විසින් යම් කමිටු රැස්වීමකට පෞද්ගලිකව සහභාගිවීමට නොහැකි වන අවස්ථාවක, ඔහු විසින් නම් කරනු ලබන හා ඔහුගේ රාජකාරි ආවරණය කරනු ලබන වෙනත් නිලධාරියෙකු ආයතන ප්‍රධානියාගේ අනුදැනුම ඇතිව කමිටු රැස්වීමට සහභාගි කරවිය හැකිය.

6. (i) අවම වශයෙන් සෑම මාස දෙකකට එක් වරක් හෝ කමිටුවේ සාමාන්‍ය රැස්වීමක් පැවැත්විය යුතුය. කමිටුවේ සභාපතිවරයා විසින් උචිත යැයි අදහස් කරනු ලබන යම් අවස්ථාවක කමිටුවේ විශේෂ රැස්වීම් කැඳවීමට කමිටුවේ සභාපතිවරයාට බලය තිබිය යුතුය.

(ii) කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහු නොමැති යම් අවස්ථාවක ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයා හෝ විසින් දරනු ලැබිය යුතුය. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා යන දෙදෙනාටම යම් කමිටු රැස්වීමකට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ)(iii) වැනි උපවගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභාවේ සභිකයින් අතුරින් කෙනෙකු එම රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතුය.

(iii) කමිටුවේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය, මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(iv) කමිටුව විසින් ගනු ලබන සෑම තීරණයක්ම, එදින රැස්වීමට පැමිණ සිටින කමිටුවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(v) කමිටුව විසින් ගනු ලබන තීරණ සඳහා ඡන්ද ගණන සමාන වුවහොත්, තීරක ඡන්දයක් කමිටුවේ සභාපතිවරයාට හිමි විය යුතුය.

(vi) කමිටුවේ දී ගනු ලබන තීරණ කමිටුවේ ලේකම්වරයා විසින් වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු අතර, කමිටුවේ ඊළඟ රැස්වීමේ දී අවශ්‍ය විය හැකි සංශෝධන ද සමඟ ඒවා ස්ථිර කරනු ලැබූ විට, කමිටුවේ මූලාසනය දරනු ලබන තැනැත්තා විසින් එයට අත්සන් තැබිය යුතුය.

7. කමිටුවේ කිසිදු ක්‍රියාවක් හෝ කාර්යයක් හෝ ඒ කමිටුවේ සාමාජිකයින් අතර පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයෙකු තෝරා පත්කර ගැනීමේ දී, යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුව නිසා පමණක් අවලංගු හෝ බල රහිත වන ලෙස නොසැලකිය යුතුය.

8. කමිටුවේ සෑම රැස්වීමකම වාර්තා, එළඹෙන ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමේ දී දැන ගැනීම පිණිස සභාගත කළ යුතුය.

9. කමිටුව විසින් ප්‍රාදේශීය සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන යම් නිර්දේශ වන්නේ නම්, ඒවා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කමිටුවේ වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, ප්‍රාදේශීය සභාව විසින් සලකා බලනු ලැබිය හැකිය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ සඳහන් කාර්යයන් කමිටුවේ කාර්යය විය යුතුය.

11. (i) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළෙඳ ස්ථානයක හෝ දෛනික කාර්යයන් අවසානයේ එකී කාර්යාලය හෝ වෙළෙඳ ස්ථානය හෝ වසා දැමීමට පෙර, ඒ පරිශ්‍රය ඇතුළත දල්වා තබන ලද -

*(අ)* භූමිතෙල් භාවිතා කරන ලාම්පුවක්;

*(ආ)* පොල්තෙල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් දල්වා තබනු ලබන යම්කිසි පහනක්;

*(ඇ)* හඳුන්කූරක් හෝ එවැනි වෙනත් යම් දෙයක්;

*(ඈ)* එවැනි විවෘත දැල්ලක් සහිත වෙනත් යම් දෙයක්;

නිවා දැමීම කළයුතු බවට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(ii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් කාර්යාලයක හෝ වෙළෙඳ හිමිකරු හෝ සඳහන් කරන ලද එකී යම් ස්ථානයක තත් කාලයේ භාරකරු හෝ විසින් ඉහත 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් නියමය පිළිපැදීමට යටත් තැනැත්තා වන අතර ඔහු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු ලවා හෝ එසේ කිරීමට සැලැස්වීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතුය.

12. (i) ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පෙර ආපදාවලට ලක් වූ හා ලක්විය හැකි ප්‍රදේශයන් දැක්වෙන සිතියම් සකස් කර, දත්ත ගබඩාවක් පවත්වාගෙන යායුතු අතර මහජනයාගේ දැන ගැනීම පිණිස ප්‍රදර්ශනය කළ යුතුය.

(ii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි ස්ථාන සිතියම්ගත කිරීම හා ඒ පිළිබඳව මහජනයා පුළුල් ලෙස දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.

(iii) ආපදා අවදානම් ස්ථාන පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස භාෂා ත්‍රිත්වයෙන් පුවරු සවිකර යාවත්කාලීන කළ යුතු ය.

(iv) ආපදාවට ලක්විය හැකි බවට හඳුනා ගත් ප්‍රදේශවල සිදුවිය හැකි ආපදා අවම කිරීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදාළ අනෙකුත් ආයතන දැනුවත් කර, ඔවුන්ගේ ද සහය ඇතිව ආපදා අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.

13. (i) සියලුම සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් අදාළ අනුමැතිය ලබාදීමේ දී, අදාළ ප්‍රදේශයේ පවතින ආපදා තත්ත්වයන් පිළිබඳ ඇගැයීම හා ආපදා අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ලබාගත යුතු අතර, අධි අවදානම් තත්ත්වයන්ට ලක්විය හැකි වන්නේ නම්, ආපදා අවම කිරීමේ ක්‍රමවේදයන් අන්තර්ගත කොට වරලත් වාස්තු විද්‍යාඥයෙකුගේ / භූවිද්‍යාඥයෙකුගේ සහතිකයක් සහිතව සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ග්‍රාම නිලධාරි වසම් මට්ටමින්, දැනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පිහිටුවා ඇති ආපදා කළමනාකරණ කමිටු සමග සම්බන්ධව කටයුතු කළ යුතුය.

14. ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධ කර ගෙන, ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීම සඳහා දැනට රජයේ ක්‍රියාත්මක වන ක්‍රමවේදය තුළට සම්බන්ධ වී කටයුතු කළ යුතුය.

15. ආපදා තත්ත්වයන් සිදුවීමට ඉඩ තිබෙන බවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ඇතිව කමිටුව විසින් හඳුනාගනු ලැබූ,

(i) ආපදා අවදානම් කලාපය, ඒ එක් එක් කලාපයට ආපදා ඇති වීමට බලපාන හේතු සහ ප්‍රදේශ ආපදාවක දී, එයින් පීඩාවට පත්වන්නන් ඉවත්කර ගැනීමට වඩාත් සුදුසු මාර්ග හා අවතැන් වූවන් තාවකාලිකව රඳවා තැබිය හැකි ස්ථාන කවරේ ද, යන්න පහසුවෙන් සොයාගත හැකි ආකාරයට සිතියම්ගත කිරීම සහ එම සිතියම් යාවත්කාලීනව පවත්වා ගැනීම කළ යුතුය.

(ii) ආපදා අවදානම් කලාප ඇතුළත පදිංචි ජනතාවගේ ජන ජීවිතයට කිසියම් බලපෑමක් ඇති කළ හැකි කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් වෙන් වෙන්ව නිශ්චිතව හඳුනාගෙන තිබිය යුතුය.

(iii) ආපදා අවදානම් කලාප ඇතුළත මහා පරිමාණයේ ආපදාවක් හේතුවෙන් අවතැන්වීමට ඉඩ තිබෙන පවුල් තාවකාලිකව පදිංචි කරවීම සුදුසු බවට කමිටුව විසින් හඳුනාගනු ලැබ තිබෙන ස්ථානවලට අවශ්‍ය උපකරණ සපයා ගැනීම සඳහා අදාළ ආයතන හඳුනාගෙන තිබිය යුතුය.

(iv) ආපදා අවදානම් තත්ත්වයන් අවම කිරීම සහ ආපදාවලට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා කාර්යයන් කමිටුවේ සාමාජිකයන්, ප්‍රජාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ වෙනත් පාර්ශ්වකරුවන් සමග එක්ව හඳුනාගෙන ක්‍රියා කළ යුතුය.

(v) ආපදා අවදානම් තත්ත්වයන් අවම කිරීම හා ආපදාවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමේ ප්‍රමුඛතා සැලැසුම් කිරීම සහ එකී සැලැසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

(vi) ආපදා තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එහි පදිංචි ජනතාවට සහන සැලසීම සඳහා කමිටුව විසින් හඳුනා ගෙන ඇති කණ්ඩායමේ සාමාජිකයින්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහය ඇතිව සහන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

16. (i) ව්‍යසන සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන තාක්ෂණික ආයතනවල උපදෙස් මත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් නිකුත් කරනු ලබන පූර්ව අනතුරු ඇඟවීම් වාර්තා තබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ නිශ්චිතව යෙදවීම ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය වන්නේය.

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපෑ හැකි උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදන, ආපදා කළමනාකරණ කමිටුවට හෝ කමිටුවේ සභාපතිවරයාට හෝ කමිටු සාමාජිකයන්ට හෝ දැනුම් දීම, කාර්යය පවරන ලද නිලධාරියාගේ හෝ සේවකයාගේ හෝ වගකීම වන්නේය.

(iii) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කිසියම් ආපදා අවදානම් කලාපයක ආපදා අවදානමක් ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවක හෝ එවැනි අවදානමක් ඇති වී තිබෙන අවස්ථාවක, අවදානමට ලක්වීමට ඉඩ ඇති හෝ අවදානමට ලක් වූ තැනැත්තන් වෙත සහන සැලසීම සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේ ද, යන්න තීරණය කිරීම එම කමිටුව විසින් කරනු ලැබිය හැකිය. ආපදාවන්ට ලක්වූවන්ගේ ජීවිත ආරක්ෂාව, ආහාර, පානීය ජලය, ඇඳුම්, සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ යන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තීරණයක් හෝ තීරණ ගැනීම සඳහා කමිටුව රැස්කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව කමිටු සභාපතිවරයාගේ මතය වන විට, ඒ අවස්ථාවේ දී

කළයුතු සහන සැලසීම පිළිබඳ තීරණ ගැනීමට කමිටු සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද, තමා විසින් ගනු ලැබූ තීරණය හෝ තීරණ කවරේ ද, යන්න දින තුනක් ඇතුළත කැඳවනු ලබන කමිටු රැස්වීමේ දී ඉදිරිපත් කිරීම කමිටු සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(iv) මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට කමිටුව හෝ කමිටුවේ සභාපතිවරයා හෝ විසින් ගනු ලැබූ තීරණයක් හෝ තීරණ යටතේ ආපදාවට ලක් වූ තැනැත්තන්ට සහන සැලසීම කළ හැකි අතර, ඒ සඳහාවන වියදම් ප්‍රාදේශීය සභා අරමුදලෙන් වියදම් කරනු ලැබිය හැකිය.

(v) මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට කමිටුව හෝ කමිටුවේ සභාපතිවරයා හෝ විසින් ගනු ලැබූ තීරණ, එකී තීරණවලට අනුව මේ කොටසේ 16 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ඒ වෙනුවෙන් සභා අරමුදලෙන් දරනු ලැබූ වියදම් කොපමණ ද, යන්න පිළිබඳව කමිටුව විසින් පිළියෙල කළ සවිස්තර වාර්තාවක් එකී කාර්යයෙන් පසුව එළඹෙන ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම කමිටුවේ කාර්යය විය යුතුය.

17. ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්වභාවික ආපදාවලට ගොදුරු විය හැකි ඉඩම් මෙන්ම, $30^0$ට වැඩි වූ බෑවුම් සහිත ඉඩම් හඳුනා ගැනීම සඳහා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහය ලබාදිය යුතුය.

18. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ජල ගැලීම්වලට පාත්‍රවන ප්‍රදේශ හඳුනාගෙන සිතියම්වල සළකුණු කිරීම හා එම එක් එක් ප්‍රදේශවල උපරිම ජල මට්ටම, වර්ෂාපතනය හා අනෙකුත් සාධක පාදක කර ගත් විද්‍යාත්මක ක්‍රමවේදයකින් හෝ පසුගිය අත්දැකීම් හෝ මත තීරණය කර, නිවාසවල අත්තිවාරම් මට්ටම සඳහා අනුමැතිය ලබාදිය යුතුය.

19. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පතිත වන වර්ෂා ජලය බාධාවකින් තොරව ගලා යෑමට හැකිවන ආකාරයෙන් මතුපිට ජලාපවහන පද්ධතිය ඉදිකිරීම, නඩත්තුව සහ වැසි ජලය ගලා යෑමට පවතින අවහිරතා මඟ හැරවීමට ක්‍රියා කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

(i) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ රජයේ හා පුද්ගලික ඉඩම්වල, ඉඩම් අනු බෙදුම් ඉල්ලුම් අනුමත කිරීමේ දී, වැසි ජලය ආපදා තත්ත්වයක් ඇති නොවන සේ ක්‍රමානුකූලව බැහැරලීමට අවශ්‍ය කාණු පද්ධතිය සැලැසුමට ඇතුළත්කර ඇති බව සහතික කළ යුතුය.

(ii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීම සඳහා අනුමැතිය ලබාදීමේ දී, අදාළ ඉඩමේ කට්ටි සැලැස්ම සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති බවට සනාථ කර ගත යුතුය.

20. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත වූ නිවාසවල, වෙළෙඳ ස්ථානවල සහ වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ප්‍රයෝජනයට ගනු ලබන වායු සිලින්ඩරවලට සම්බන්ධ කරනු ලබන උපාංගවලින් හෝ ඒ උපාංග එකිනෙකට සම්බන්ධ කරන ස්ථානවලින් වායු කාන්දුවීමකින් තොරව පවත්වාගෙන යාම සහ ඒ පිළිබඳ පූර්වාරක්ෂිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචි සහ ප්‍රදේශය තුළ ව්‍යවසායකත්වයේ නියුක්ත තැනැත්තන් දැනුවත් කිරීමට කටයුතු කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

21. මෝසම් වැසි සමය ද ඇතුළුව සෑම අවස්ථාවකම අකුණු සැරවලින් ආරක්ෂා වීමේ හා ගිගුරුම් සහිත කාලගුණ තත්ත්වයක් පවතින අවස්ථාවල විදුලි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

22. ආපදා අවදානම් අවස්ථාවක දිවි ගලවා ගැනීමේ සහ ප්‍රථමාධාර ලබාදීම සඳහා ස්වේච්ඡා කමිටු පිහිටුවිය යුතු අතර අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව ඔවුනට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය.

23. මේ අතුරු ව්‍යවස්ථා යටතේ -

*(අ)* ආපදා අවදානම් අවස්ථා අවම කිරීම සඳහා;

සහ

*(ආ)* ආපදා අවදානම් අවස්ථාවල දී සහන සැලසීම සඳහා;

ආපදා කළමනාකරණ අරමුදලේ, මුදල් ප්‍රමාණයන් ද ඇතුළත්වන සේ, ප්‍රමාණවත් වැය ප්‍රතිපාදන ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනයට ඇතුළත් කරනු ලබන බවට වගබලා ගැනීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

මේ අතුරු ව්‍යවස්ථා යටතේ ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණය කුමක් ද, යන්න අප්‍රමාදව විගණකාධිපතිවරයා වෙත වාර්තාගත කිරීම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

24. (i) මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී, ප්‍රාදේශීය සභාවට දැරීමට සිදුවන වියදම් පියවා ගැනීම සඳහා කිසියම් සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු හෝ විසින් මූල්‍යාධාර ලබාදීමට හැකි වන්නේය. එනමුත් එකී මූල්‍යාධාර දේශීය මූල්‍ය ප්‍රභවයක් ලෙසින් ලබාගන්නේ නම්, උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර පළාත් අමාත්‍යවරයාගෙන් ද, විදේශීය මූල්‍ය ප්‍රභවයක් ලෙසින් ලබා ගන්නේ නම්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ද අනුමැතිය ලබාගත යුතු අතර, එකී කාර්යයන්ට අවශ්‍ය උපකරණ, ආම්පන්න හෝ ද්‍රව්‍යමය ආධාර සැපයීමට හැකි වන්නේය.

(ii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට සපයනු ලබන මූල්‍ය ආධාර, සභා අරමුදලට ගෙවිය යුතු අතර, එසේ සපයනු ලබන මුදල් මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා පමණක් යොදවනු ලැබිය යුතුය.

(iii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලබන මුදල් පිළිබඳව වෙනම ගිණුමකින් තොරතුරු පවත්වාගෙන යාම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු අතර, එකී අරමුදල සභාවේ ආපදා කළමනාකරණ ගිණුම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය. මෙම අරමුදලේ මුදල් යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තියක් හා උපදෙස් මාලාවක් සකස් කර, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාගත යුතු ය.

(iv) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභා අරමුදලට ලැබෙන හා ඒ අරමුදලෙන් වියදම් කරනු ලබන මුදල් පිළිබඳ වාර්තාවක්, කමිටුවේ සෑම රැස්වීමකදීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී කමිටු රැස්වීමෙන් පසුව පවත්වනු ලබන ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමේ දී සභාගත කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

25. (i) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්වන වෙනත් පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත හා ඒ ආසන්නයේ පිහිටා ඇති වෙනත් රාජ්‍ය ආයතන සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මකවන රාජ්‍ය නොවන සංවිධාන යනාදිය සතුව පවත්නා ආපදා කළමනාකරණයට අදාළ වන්නා වූ දත්ත හා තොරතුරු ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙත ලබාදීම ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තෙකු වන විට, ඔහුගේ කාර්යය විය යුතු ය.

(ii) ඒ ආකාරයෙන් ම ප්‍රාදේශීය සභාව සතුව පවතින ආපදා කළමනාකරණයට අදාළ දත්ත හා තොරතුරු එකී යම් ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ ආයතනයට එකී දත්ත හා තොරතුරු ලබාදීම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි හා (ii) වැනි උපවගන්තිවල කුමක් සඳහන්ව තිබුණ ද, කවර හෝ තැනැත්තෙකු විසින් එසේ ඉල්ලා සිටිනු යම් දත්ත හෝ තොරතුරු හෝ පිටතට ලබාදීමෙන් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් හෝ වන්නේ යැයි එකී දත්ත හා තොරතුරු සතුව පවත්නා ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට ක්‍රියාකරනු ලබන වෙනත් යම් තැනැත්තෙකුගේ මතය වන අවස්ථාවක, එසේ රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් හෝ හානියක් හෝ විය හැකි දත්ත හා තොරතුරු පිටතට ලබාදීමෙන් වැළකී සිටීමට, ඒ තැනැත්තාට එකී වගන්තිවල නියමයන් බාධාවක් නොවිය යුතුය.

26. මෙහි බලය පැවරීම, මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ විසින් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

28. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචනය.

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"මහා සභාව" යන්නෙන්, ප්‍රාදේශීය සභාවේ මාසිකව පවත්වනු ලබන සභා රැස්වීම අදහස් වේ.

"ආපදා සහ අවදානම්" යන්නෙන්, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන පනතෙහි "ව්‍යසනය" යන්නට දී ඇති අර්ථය අදහස් වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදායක වන්නා වූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නා වූ හෝ නැතහොත්, යම් දේපළක් විනාශ කරන්නා වූ හෝ හානියට පමුණුවන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වභාවිකව හෝ මිනිසා හෝ විසින් සිදු කරනු ලබන්නා වූ සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්න වීම හෝ අදහස් වේ. ඊට පහත සඳහන් ද ඇතුළත් වේ.

*(අ)* නායයෑමක්,

*(ආ)* සුළි සුළඟක්,

*(ඇ)* ගංවතුරක්,

*(ඈ)* නියඟයක්,

*(ඉ)* කාර්මික උපද්‍රවයක්,

(ඊ) සුනාමියක් (භූකම්පනාසන්න චලනයක්),

(උ) භූමිකම්පාවක්,

(ඌ) ගුවන් උපද්‍රවයක්,

(එ) සමුද්‍රීය උපද්‍රවයක්,

(ඒ) ගින්නක්,

(ඔ) වසංගතයක්,

(ඕ) පිපිරීමක්,

(ක) ගුවන් ප්‍රහාරයක්,

(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්,

(ච) රසායනික අනතුරක්,

(ජ) විකිරණශීලීත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්,

(ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පිටාර ගැලීමක්,

(ඩ) න්‍යෂ්ටික ආපදාවක්,

(ණ) ප්‍රදේශයේ සහ වනාන්තරයේ ගිනි ගැනීමක්,

(ත) වෙරළ ඛාදනවීමක්, සහ

(ද) ටොනාඩෝ, චන්ඩ මාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගුරුම් සහිත කුණාටුවක්.

''සහන සැලසීම'' යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා ආපදා යන්නට දී ඇති අර්ථ නිරූපණයට අනුව කවර හෝ අවස්ථාවක දී හෝ කිසියම් ආපදාවක් නිශ්චිතව ඇති වීමට ඉඩ ඇති යම් අවස්ථාවක දී, එකී ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත්වීමට ඉඩ තිබෙන හෝ පීඩාවට පත් වූ තැනැත්තන් තාවකාලිකව ආරක්ෂිත ස්ථානයක හෝ ස්ථානවල ස්ථානගත කිරීම, ජීවිත ගලවා ගැනීම, ප්‍රථමාධාර ලබාදීම, ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත් වී ඇති හා අවතැන්වූවන් තාවකාලික නවාතැන්වලින් ඉවත්ව යන කාලය දක්වා, ඒ තැනැත්තන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලැස්වීම අදහස් වන අතර, එසේ අවතැන් වී ඇති තැනැත්තන්ට පිසූ හෝ වියළි ආහාර සැපයීම ද ඊට ඇතුළු විය යුතු ය.

32. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

## පළමුවන උපලේඛනය

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපාන ආපදා හා එම ආපදා බලපාන ප්‍රදේශ කවරේ ද, යන්න හඳුනා ගැනීම.

02. ආපදා තත්ත්වයන්ට හේතු වන හෝ හේතු විය හැකි කාරණා කවරේ ද, යන්න නිගමනය කිරීම.

03. ආපදා තත්ත්වයන් ඇති වීමට හේතු වන කාරණා වළක්වා ගැනීමට හෝ අවම කර ගැනීමට සහ ආපදාවට ලක්වූවන් යථා තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කරන ක්‍රමෝපායන් හඳුනා ගැනීම.

04. කිසියම් ආපදා තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවකට පත්වීමට ඉඩ තිබෙන ප්‍රදේශ සහ පවුල් කවරේ ද, යන්න නිශ්චිතව හඳුනා ගැනීම සහ එසේ හඳුනා ගැනීමේ දී සිසුන්, ළමයින්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් පිළිබඳ විස්තර වෙන් වෙන්ව සටහන් කර තබා ගැනීම.

05. කවර හෝ ආපදා තත්ත්වයක් මත හානියට හෝ දුෂ්කරතාවට පත්වන පවුල්වලට සහන සැලසීමේ ක්‍රමෝපායන් නිගමනය කිරීම.

06. කිසියම් ආපදා තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාව තාවකාලිකව පදිංචි කරවිය හැකි ස්ථාන, ආපදා සිදුවීමට පෙර හඳුනා ගැනීම.

07. කිසියම් ආපදා තත්ත්වයක් හේතුවෙන් අවතැන් වන ජනතාවට, නැවත පදිංචි වන අවස්ථාව දක්වා ආහාරපාන ලබාදීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීම.

08. කිසියම් ආපදා අවස්ථාවක දී, සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ඇති කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීම.

09. කිසියම් ආපදා තත්ත්වයක් ඇති වීමට වඩාත් ඉඩ තිබෙන කාල වකවානු කවරේ ද, යන්න නිශ්චය කර හඳුනා ගැනීම.

10. වාහන ගමනාගමනයට අවහිර වන ආකාරයෙන් සිදුවන හෝ සිදුවිය හැකි ඕනෑම ආපදා අවස්ථාවක දී, ඒ මාර්ග වෙනුවට යොදා ගත හැකි විකල්ප මාර්ග කවරේ ද, යන්න හඳුනා ගැනීම.

11. ගංවතුර ගැලීමක දී, මාර්ග ජලයෙන් යටවීම සිදු වන්නේ කුමන ප්‍රමාණයක වර්ෂාපතනයක් ඇති වූ විටක ද, යන්න සහ එම වර්ෂාපතනය පතිත වී කොපමණ වේලාවකින් මාර්ග ජලයෙන් යටවීම සිදුවන්නේ ද, යන්න හඳුනා ගැනීම.

12. ඕනෑම ගංවතුර ගැලීමක දී, ප්‍රදේශ ජලයෙන් යටවීම සිදුවීමට තරමේ වර්ෂාපතනයක් ඇති වී කොපමණ වේලාවකින් එම ප්‍රදේශ ජලයෙන් යටවීම සිදුවන්නේ ද, යන්න සහ සුළි සුළඟක් හෝ ඊට සමාන කුණාටු තත්ත්වයක දී ඇතිවන අනපේක්ෂිත වර්ෂා තත්ත්වයක දී, ප්‍රදේශයේ ජලයෙන් යටවන ස්ථාන හඳුනා ගැනීම.

13. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෝරාගත් ස්ථාන කිහිපයක අඩු වියදම් වර්ෂා මාපක සවි කිරීමට කටයුතු කිරීම සහ එම වර්ෂා මාපක දත්ත එකතු කිරීමට කටයුතු කිරීම.

14. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ජනතාවට දැනට ක්‍රියාත්මක කර ඇති ක්‍රමවලින් පානීය ජලය ලබා ගැනීමට නොහැකිවන කාල වකවානු සහ හේතු හඳුනා ගැනීම.

15. දේපළවලට හෝ ජනතාවට හානිවිය හැකි ආකාරයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශ ඇතුළත ගිනි ගැනීම් ඇතිවිය හැකි අවදානම් ස්ථාන හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම

16. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ඇති බෑවුම් සහිත ස්ථානවල නායයාමේ අවදානමක පැවතිය හැකි ස්ථාන අදාළ තාක්ෂණික ආයතනවල සහය ඇතිව හඳුනා ගැනීම.

17. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත වසංගත රෝග ඇතිවීම සහ පැතිරීම පාලනය කිරීමේ ක්‍රමවේදයන් අදාළ සෞඛ්‍ය ආයතනයේ සහය ඇතිව හඳුනා ගැනීම.

18. වහා ගිනි ඇවිලෙන සුළු හෝ පිපිරුම් ඇති කරන සුළු හෝ අන්තරායකාර රසායන ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ නිශ්චිත ස්ථානයක ස්ථානගත කර හෝ තැනින් තැන ගෙන යමින් ක්‍රියාත්මකවන කර්මාන්ත හා කර්මාන්තකරුවන් හඳුනා ගැනීම හා ලියාපදිංචි කිරීම.

19. කමිටුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් ආපදා කළමනාකරණයට අදාළව රැස්කර ගනු ලබන දත්ත හා තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන බවට සහතික වීම.

20. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත් දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව සමග සමීප සම්බන්ධතාවක් ගොඩනගා ගනිමින් ආපදා කළමනාකරණයට අදාළව එකී කමිටුව සතු දත්ත හා තොරතුරු ලබාගැනීම සහ සභාව සතු දත්ත හා තොරතුරු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව වෙත ලබාදීම සහතික වීම.

21. කිසියම් ආපදා හෝ අවදානම් අවස්ථාවක දී, සහන කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීමට හැකියාව තිබෙන හා පහසුවෙන් සහය ලබාගත හැකි තැනැත්තන්, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කවරේ ද, යන්න හා ඔවුන් සතුව පවතින උපකරණ හඳුනා ගැනීම.

22. ආපදා හෝ අවදානම් අවස්ථාවක දී, ජීවිත ගලවා ගැනීමේ කාර්යන්හි ස්වේච්ඡාවෙන් නියුක්ත වීමට කැමැති තැනැත්තන් හඳුනාගෙන, ඔවුන් ලියාපදිංචි කිරීම හා ඔවුනට ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

23. කිසියම් ආපදා තත්ත්වයක් ඇතිවීම පිළිබඳ පූර්ව දැනුම්දීම සඳහා හෝ ආපදා සහන සැලසීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් මිල දී ගනු ලැබිය යුතු උපකරණ හෝ වෙනත් යම් දේ හෝ පිළිබඳව සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

24. කමිටුව විසින් රැස් කරගනු ලැබූ දත්ත, තොරතුරු සහ හඳුනාගනු ලැබූ ක්‍රමවේදයන් පිළිබඳව කමිටුවේ නිර්දේශයන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

**II වැනි කොටස :- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. *අතුරු ව්‍යවස්ථාවේ නාමය.*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ පදික මාරු ස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම තුළින් ගමන්කරුවන් ආරක්ෂා කිරීමේ හා වාහන අනතුරුවලින් වැළැක්වීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *අරමුණ.*

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු හා එකී පනතේ 126(vii) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.*

4. කිසියම් පදිකයෙකු යම් පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීමට ඒ මතට පිවිසී ඇති අවස්ථාවක, එකී පදික මාරු ස්ථානය පසුකර යාමට පැමිණෙන සෑම වාහනයකම රියදුරා විසින් එකී පදිකයා පාර මාරු වී අනෙක් පසට පිවිසෙන තෙක් තමා පදවාගෙන යන වාහනය, නතර කර තබා ගැනීම කළ යුතුය. *ඉටු කළ යුතු කාර්යයන්. (4-5)*

5. පොලිස් නිලධාරියෙකු හෝ රිය නියාමකවරයෙකු හෝ ආලෝක සංඥා මගින් හෝ වරින් වර පාලනය කරනු ලබන යම් පදික මාරු ස්ථානයක් හරහා ගමන් කිරීමට පැමිණෙන කවර හෝ වාහනයක් පාලනය කළ හැකිය. එකී පොලිස් නිලධාරියා හෝ රිය නියාමකවරයා හෝ විසින් ආලෝක සංඥාවක් හෝ වෙනත් සංඥාවක් හෝ මගින් දෙනු ලබන නියෝගයට අනුව එකී වාහනය පදවන රියදුරා ක්‍රියා කළ යුතු ය.

6. කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් පදික මාරු සළකුණක් විකෘති කිරීම හෝ මකා දැමීම හෝ නොකළ යුතුය. *ඉටු නොකළ යුතු කාර්යයන්. (6-10)*

7. කිසියම් වාහනයක් පදික මාරු ස්ථානයේ වාහන නතර කර තැබීමට සළකුණු කර ඇති සීමාව පසු කිරීමට ආසන්න අවස්ථාවක, කවර හෝ පදිකයෙකු පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීම පිණිස පදික මාරු ස්ථානය මතට පිවිසීම නොකළ යුතුය.

8. කවර හෝ පදිකයෙකු කිසියම් පදික මාරු ස්ථානයක් මතින් පයින් ගමන් කිරීමේ දී සාධාරණ වේගයකින් වීදියෙන් එක පැත්තක සිට අනික් පැත්තට ගමන් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය කාලයට වැඩි කාලයක් කවර හෝ පදික මාරුවක් මත රැඳී සිටීම හෝ ඒ හරහා ගමන් ගන්නා වාහනයක ගමනාගමනයට බාධාවන පරිදි රැඳී සිටීම හෝ නොකළ යුතු අතර, එකී පදික මාරු ස්ථානය මතින් ගමන් ගන්නා වෙනත් යම් පදිකයෙකුගේ ගමනට අනිසි ආකාරයෙන් බාධා කිරීම ද නොකළ යුතුය.

9. කවර හෝ වාහනයක රියදුරකු විසින් තමා විසින් පදවාගෙන එනු ලබන වාහනය, තමන්ගේ පාලනයෙන් පරිබාහිර වූ හේතු නිසා ඉදිරියට යාමෙන් තමා වළක්වනු ලැබ ඇත්නම්, එකී වාහනය යම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කුමන හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතුය.

10. කවර හෝ වාහනයක රියදුරකු විසින් අනතුරක් වැළැක්වීම පිණිස එකී වාහනය පදික මාරු ස්ථානයක් මත නතර කිරීමට අවශ්‍ය වන්නේ නම් මිස, එකී වාහනය කිසියම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කුමන හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතුය.

11. මේ කොටසේ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයට පත් කරන ලද පදික මාරු ස්ථානවල කළයුතු සළකුණු කිරීම් මෝටර් රථ වාහන පනතේ 164 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ මධ්‍යම රජයේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 *ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය. (11-14)*

වැනි දිනැති 444/18 අංක දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කළ 1 වැනි කොටසේ (1) වැනි වගන්තියේ නියෝගවල 16 වැනි නියෝගය සමග කියවිය යුතු 4.18 වැනි රූපයේ ආදර්ශයට අනුව විය යුතුවාක් හැර, එකී නියෝගවලට කළින් කළට කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතුය. එසේම එකී සළකුණු මැකී යාමට ඉඩ නොදී නැවත පින්තාරු කිරීමට සැලැස්වීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

12. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහා මාර්ගවල සහ මංමාවත්වල ගමන් කරන පදිකයන්ට පාර මාරුවීම සඳහා පදික මාරු ස්ථාන ප්‍රාදේශීය සභාවේ ප්‍රවාහන උපදෙස් කමිටුව මගින් හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම හා සළකුණු කිරීම ප්‍රාදේශීය සභාව විසින් කළ යුතුවාත් මෙන්ම, මෝටර් රථ වාහන ආඥා පනතේ වූ රෙගුලාසිවලට අනුව සංඥා පුවරු සවි කළ යුතුය.

13. ප්‍රාදේශීය සභාව විසින් කළින් කලට කරනු ලබන තීරණයක් අනුව කිසියම් පදික මාරු ස්ථානයක් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතුය.

14. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වූ කිසියම් පාසලක් ඉදිරිපිට ඇති මාර්ගයේ සළකුණු කර ඇති පදික මාරු ස්ථානවල කාර්යයේ නියුතු රිය නියාමකවරුන් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට ප්‍රාදේශීය සභාවට හැකිය.

බලය පැවරීම.

15. මෙම අතුරු ව්‍යවස්ථාවලට නියමිත කාර්යභාරය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට පවරන ලද බලතල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකුට ලිඛිතව පැවරීම නීත්‍යානුකූල වන්නේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

16. කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

17. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේය.

දඬ හා දන්ඩන.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචනය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල-

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"රිය නියාමක" යන්නෙන්, පදික මාරු ස්ථානවල පදිකයන් සහ වාහන හැසිරවීමේ කාර්යය සඳහා කිසියම් පාසලක ප්‍රධානියා හෝ ඔහුගෙන් බලයලත් යම් තැනැත්තෙකු හෝ විසින් නම් කරනු ලැබූ හා එම කාර්යයේ නියුක්ත පාසල් සිසුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ අදහස් වේ.

"වාහනය" යන්නෙන්, මෝටර් රථ වාහන පනතේ සඳහන් කවර හෝ මෝටර් වාහනයක් අදහස් වන අතර, කිසියම් කරත්තයක්, අත් කරත්තයක්, තල්ලු කරගෙන යන කරත්තයක්, පාපැදියක්, රික්ෂෝවක් සහ මෝටරයක් මගින් ක්‍රියා කරවන බයිසිකලයක් ද ඊට ඇතුළත් විය යුතුය.

"මාරු ස්ථාන" යන්නෙන්, වර්ණ කළ රේඛා හෝ වෙනත් ආකාරයකට පයින් ගමන් කරන්නන් සඳහා වෙන් කොට දක්වා ඒ බව "මෙතැනින් මාරු වනු" යන වචන සහිත මාර්ග සංඥාවකින් සඳහන් කරනු ලැබ ඇති මාර්ගය හරහා මාරුවීම සඳහා වූ ස්ථානයක් අදහස් වේ.

"රියදුරු" යන්නෙන්, පාපැදියක් හෝ ත්‍රීරෝද රථයක් සම්බන්ධයෙන් වන විට, එය යන්ත්‍රානුසාරයෙන් හෝ අන් ආකාරයකින් පදවනු ලැබුව ද, එය පදවා ගෙන යන තැනැත්තා ද, අත් කරත්තයක් හෝ තල්ලු කරගෙන යන කරත්තයක් හෝ සම්බන්ධයෙන් වූ විට, කරත්තය ඇදගෙන යන නැතහොත් තල්ලු කරගෙන යන තැනැත්තා ද, ජින් රික්ෂෝවක් සම්බන්ධයෙන් වූ විට, එම ජින් රික්ෂෝව ඇදගෙන යන තැනැත්තා ද, මෝටර් රථ වාහන පනත යටතේ සඳහන් කවර හෝ වාහනයක් මෙහෙයවන්නා ද අදහස් වේ.

20. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය. *අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

**III වැනි කොටස :- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

*අතුරු ව්‍යවස්ථාවේ නාමය.*

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් වන කාර්යයන් අධීක්ෂණය කිරීම, පරික්ෂා කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

*අරමුණ.*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය සම්බන්ධිත කළමනාකරණ කාර්යයන් සහතික කරලීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

*අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා වූ නෛතික විධිවිධාන.*

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93, 94 හා 95 වැනි වගන්තිවලට අනුව හා 126(ix) (ආ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

*ඉටු කළ යුතු කාර්යයන්.*

*(4-17)*

4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබාගත යුතුය.

5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුතුය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුතුය.

6. පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තමන්ගේ පරිශ්‍රයේ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව එක්රැස් කළ යුතුය.

7. සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිවලට අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය, 8 සිට 28 දක්වා සඳහන් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වෙන් කළ යුතුය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුතුය.

8. හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීමට හෝ මුදා හැරීමට භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව එක්රැස් කරලීම පිණිස මනා තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය. ඒවා ඉරී, සිදුරු වී, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණයවීම නිසා බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම්, ඒවා මෙම කාර්යයන් සඳහා පාවිච්චි නොකර, අතහැර දැමිය යුතුය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ විසින් ඉල්ලීමක් කරන්නේ නම්, ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ සහනාධාරයක් වශයෙන්, එවැනි බහාලුම් ප්‍රාදේශීය සභාවෙන්ම සැපයිය හැකිය.

9. යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් හෝ මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදා හැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී, එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම්, එම තැනැත්තාට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

10 මේ කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ යම් අපද්‍රව්‍ය 18(iii) වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සමඟින් මෙම අතුරු ව්‍යවස්ථාවලින් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුතුය.

11. යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට හෝ පහත (අ) වැනි හා (ආ) වැනි උපවගන්තිවලින් දැක්වෙන කරුණු හැර, වෙනත් ක්‍රමයකින් අපද්‍රව්‍ය තම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය.

*(අ)* ප්‍රාදේශීය සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි;

*(ආ)* ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග;

12. යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද සැලැසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදි කරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හා වැළලීම කළ හැකිය.

13. යම් පරිශ්‍රයක හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට්" බඳුනක් තබා ගැනීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ වෙතින් ඉල්ලීමක් කළහොත්, ඒ හිමිකරුට හෝ පදිංචිකරුට හෝ එම කොම්පෝස්ට් බඳුන නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබේ නම්, එය එම පරිශ්‍රය තුළ තබා ගැනීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ.

14. හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන "ගෙවතු අපද්‍රව්‍ය" හැකිතාක් දුරට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ හැකිය. එම හිමිකරු හෝ පදිංචිකරු හෝ ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවා ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට හෝ බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට හෝ භාරදිය යුතුය.

15. වීථියක හෝ මංමාවතක හෝ යාබද නිවෙස් හිමිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ මායිම් වැටේ වැවෙන යම් ගසක් හෝ එහි අත්තක් හෝ කපන හිමිකරු හෝ පදිංචිකරු වහාම එය ඉවත් කළ යුතුය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුතුය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් ගෙවා, ප්‍රාදේශීය සභාවේ භාරකරුට ඒවා භාරදිය යුතුය.

16. සෑම තැනැත්තෙකුම, තම පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුතුය. එසේ මළපහ කරනු ලැබුවහොත් 8 සිට 28 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම අදාළ තැනැත්තාගේ වගකීම වන්නේය.

17. නිවසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට හෝ අයදුම් කරන යම් තැනැත්තෙකු, තම පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර තම අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුතුය.

18. නිවාස පරිශ්‍රයන්

(i) සෑම හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි (වර්ගීකරණය කර) තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම හෝ එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට දමා, ඒවා ඉවත් කරනු ලබන තෙක්, ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුතුය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක දමා තැබිය යුතුය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන, ඒවා ප්‍රදේශයට සරිලන පරිදි කළින් කළට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම් කිරීම මත ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම මේ කොටසේ 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, එම තැනැත්තා ඉහත (ඇ) වැනි ඡේදයෙන් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ අදාළ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදි කරනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුතුය.

19\. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම තම අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි වෙන් කර, වර්ගීකරණය කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 19 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු හෝ, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් හෝ සකසා ගත යුතුය. ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය.

(iii) මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර, අදාළ බඳුන් හෝ බහාලුම් හෝ තබා ගන්නා ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත්

නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිම් මහලක හෝ උඩු මහලක හිමිකරු හෝ පදිංචිකරු හෝ තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුන්වල දැමිය යුතුය.

(v) සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවෙකුම මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. හිමිකරු හෝ පදිංචිකරු හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේනම්, එම තැනැත්තා (ඇ) සහ (ඈ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇතිඅපද්‍රව්‍ය සමඟින් එකී අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු වෙත භාරදිය යුතුය. නැතිනම්, සෑම අපද්‍රව්‍යයක් සඳහාම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇති බඳුන්වල හෝ බහාලුම්වල හෝ දැමිය යුතුය.

(vi) ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීමේ දී පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නොමිලයේ සැපයීම කළ යුතුය.

(vii) සෑම මුඩුක්කු නිවෙසකම හිමිකරු හෝ පදිංචිකරු තමන්ගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කර තම වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දැමිය යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(viii) මේ කොටසේ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය.

ඉටු කළ යුතු කාර්යයන්. (20-29)

20. ව්‍යාපාරික ස්ථාන හා කාර්යාල -

(i) ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ සෑම හිමිකරුවෙක්ම හෝ සේවකයෙකුම හෝ එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරන තෙක්, වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුතුය.

(iii) ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ හිමිකරු හෝ නිලධාරියා හෝ මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iv) උඩු මහලේ හෝ බිම් මහලේ හෝ කිහිපයකින් යුක්ත ව්‍යාපාරික ස්ථාන හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ නිලධාරියා, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම ව්‍යාපාරික ස්ථානයෙන් හෝ කාර්යාලයෙන් හෝ තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් ව්‍යාපාරික ස්ථානය හෝ කාර්යාලය සඳහා අවශ්‍ය වන අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ සැපයිය යුතුය.

(v) මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති වෙළෙඳ සැලක හෝ කාර්යාලයක හෝ යම් හිමිකරුවෙකු හෝ සේවකයෙකු හෝ විසින් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා තැබිය යුතුය. මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුටම හා සේවකයෙකුටම අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග සහ මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ වෙත ගෙවීම මත, එකී අපද්‍රව්‍ය හිමිකරු හෝ සේවකයා හෝ ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට හැකිය.

(vii) අසල්වාසීන්ට හෝ ව්‍යාපාරික ස්ථානයේ හෝ කාර්යාලයේ හෝ සේවයේ නියුක්ත තැනැත්තන්ට, යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටලුවක් මතු නොවන පරිද්දෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීම හා මේ කොටසේ 20 වැනි අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ නඩත්තු කිරීම ව්‍යාපාරික ස්ථානයක හෝ කාර්යාලයක හෝ සෑම හිමිකරුවෙකුගේම හෝ සේවකයෙකුගේම වගකීම වන්නේය.

21. ආපනශාලා -

(i) යම් ආපනශාලාකරුවෙක් ම හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙකු, තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය. *නැතහොත්* එසේ කිරීමට සැලැස්විය යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය;

*(ඉ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි.

(ii) යම් ආපනශාලාකරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙක්, තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරන තෙක්, වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට හෝ දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුතුය.

(iii) යම් ආපනශාලාකරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව දෙනු ලැබූ යම් තැනැත්තෙකු, මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් සතෙකු ඇතුළුවීම වළකමින්, සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය, ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක හෝ ඇසිරිය යුතුය.

(iv) මේ කොටසේ 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(v) මේ කොටසේ 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ඒවායේ ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් එකී අපද්‍රව්‍ය හිමිකරු හෝ සේවකයා හෝ විසින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට හැකිය.

22. එළවළු සහ පළතුරු වෙළෙඳ සැල්:

(i) සෑම එළවළු වෙළෙඳ සැලක හා පළතුරු වෙළෙඳ සැලක හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා හෝ තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු සහ වෙනත් යම් අපද්‍රව්‍ය.

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක දැමිය යුතුය. එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි සුරක්ෂිතව වසා තැබිය යුතුය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුතුය.

(iii) මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මේ කොටසේ 22 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග ප්‍රාදේශීය සභාව විසින් කළින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

23. පදික වෙළෙඳාම:

(i) සෑම පදික වෙළෙන්දෙක්ම, එකී තැනැත්තාගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක හෝ බහාලුමක හෝ තුළට දැමිය යුතුය. මේ කොටසේ 23 අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කා වූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ දමා තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන වේලාවක් හැර, එය වසා තැබිය යුතුය.

(iii) සෑම පදික වෙළෙන්දෙක්ම, අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර, ප්‍රාදේශීය සභාව විසින් කළින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

24. කර්මාන්ත ශාලා -

(i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම හෝ කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර, පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම මත, අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතුය.

25. කැණීම්, ඉදි කිරීම් සහ කඩා දැමීම්:

(i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කැණීමක් හෝ යම් නිර්මාණයක් ඉදි කිරීමක් හෝ කඩා දැමීමක් හෝ මඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක්, ඒ පරිශ්‍රය ඇතුළත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් අනුමත කරනු ලබන ස්ථානයක ගබඩා කළ යුතුය.

(ii) මේ කොටසේ 25 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය, ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක්, ප්‍රාදේශීය සභාවට ගෙවීම මත, ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

26. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් හෝ පූර්වාංග අනුමැතිය ලබාගත යුතු ය.

(ii) ඉහත 26 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙරාතුව, අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩපිළිවෙල, යෝජිත කාර්යය නිමවීමෙන් අනතුරුව, පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදු වූ අපද්‍රව්‍ය, ඉල්ලුම්කරු ඉවත් කිරීමට අතපසු කරන්නේ නම්, එය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුතුය. අනුමැතිය ලබාදීමට පෙර, ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක්, තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේය.

(iii) කවර හෝ තැනැත්තෙකු, අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරන්නේ නම්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් තීරණය කරනු ලබන ආකාරයට, එකී අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන අතර, ඒ සඳහා දැරීමට සිදුවන වියදම මේ කොටසේ 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කළ මුදල්වලට හිලව් කරනු ලැබේ.

27. රෝහල්:

(i) රෝහලක හිමිකරු විසින් පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතුය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* මෙම උපවගන්තියේ (ඈ) වැනි ඡේදයේ සඳහන් අපද්‍රව්‍ය වර්ග හැර වෙනත් අපද්‍රව්‍ය;

*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ (අ) සහ (ආ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර, ඒවා ඉවත් කරනු ලබන තෙක්, යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතුය. (i) වැනි උපවගන්තියේ (ඇ) සහ (ඈ) වැනි ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක හෝ තැන්පත් කළයුතු අතර, ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුතුය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම රෝහල්වලට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුතු ය.

(iii) මේ කොටසේ 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

28. (i) මේ කොටසේ 8 සිට 27 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙකු හෝ මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පොදු, ආගමික, සමාජයීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධාන කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක්, එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය, පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුතු ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය;

*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය;

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය;

*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන තැනැත්තෙකු, එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස, ඒ පිළිබඳව කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුතු ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය, ඉවත් කරගනු ලබන තෙක්, වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුතු ය.

(iv) මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ඉහත (i) වැනි වගන්තියේ (ඇ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමඟ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

29. වීථි සහ පොදු ස්ථාන -

ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කර, මහා සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලැසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතුය.

(i) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළෙඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;

(ii) වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;

(iii) උත්සව කාලවල දී, විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී ප්‍රාදේශීය සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම.

(iv) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර, එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම;

(v) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ පිළිබඳව ක්‍රියා කිරීම.

ඉටු නොකළ යුතු කාර්යයන්. (30-40)

30. හිමිකරුගේ හෝ පදිංචිකරුගේ, නිවැසියන්ගේ හෝ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ හෝ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුතු ය.

31. කවර හෝ තැනැත්තෙකු වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශ්‍රයකට හෝ අපද්‍රව්‍ය මුදා හැරීම නොකළ යුතු ය.

32. කවර හෝ තැනැත්තෙකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුතු ය.

33. කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදා හැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුතු ය.

34. තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර, එහි සඳහන් ස්ථානයේ දී කවර හෝ තැනැත්තෙකු විසින් ගෝඝාතක ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හෝ හැරුණු විට, වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු හෝ ඝාතනය නොකළ යුතු ය.

35. අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක හෝ තබාගත යුතුය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ හෝ පොදු ස්ථානයක හෝ නොදැමිය යුතු ය.

36. පදික වෙළෙන්දෙක් වාහනවලට හෝ පදිකයින්ගේ ගමනාගමනයට හෝ බාධා ඇතිවන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් හෝ නොතැබිය යුතුය.

37. සෑම පදික වෙළෙන්දෙක්ම මේ කොටසේ 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) යන ඡේදවලින් විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඇ) වැනි ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමඟ ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකවම භාරදිය යුතුය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් හෝ පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ හෝ නොතැබිය යුතු ය.

38. ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙතමනය වාණිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙකු නොකළ යුතු ය.

39. ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශය ඇතුළත, අවසර නොලත් කවර හෝ තැනැත්තෙකු විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් නොකළ යුතු ය.

අනවසරයෙන් ඇතුළුවීම හෝ ගැවසීම හෝ නොකළ යුතු ය.

එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයන් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම හෝ නොකළ යුතු ය.

කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ප්‍රාදේශීය සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස, ප්‍රාදේශීය සභාව විසින් කලින් කළට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුතු ය.

40. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් හෝ එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා ලබාදීම හෝ භාවිතා කිරීම හෝ නොකළ යුතු ය.

ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය.

41. ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කර, මහා සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ යුතු ය.

(i) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ii) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදා හැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

(iii) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත තැනැත්තන්ට හා කුඩා ව්‍යවසායකයන්ට පහසුකම් සැපයීම, ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධව වී සිටින තැනැත්තන්ට දිරි ගැන්වීම් පිරිනැමීම.

(iv) අපද්‍රව්‍ය මුදා හැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(v) ප්‍රාදේශීය සභාවේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින්, අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්ය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ, යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(vii) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ, අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(viii) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් නියම කරන ලද අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර, වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ ප්‍රාදේශීය සභා කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම.

(ix) ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු මගින් එක්කාසු කළ ආහාර සහ වෙනත් ජෛව ජීර්ණීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය, ප්‍රායෝගික අන්දමින් හැකිතාක් දුරට මුළුමනින් හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙළක් යොදා ගැනීමත් සමග මෙම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ විසින් අනුමත කරන ආකාරයට බැහැරලීමට සුදුසු පියවර ගැනීම.

(x) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(xi) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව, අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂණ බිම් පිරවුමක් හෝ පවත්වාගෙන යාම.

(xii) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන්හි නිරතවන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

(xiii) නිවසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඉදි කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත කාර්යය ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

(xiv) ප්‍රාදේශීය සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම.

(xv) 2000 වසරේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වසර 03ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම. එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව අනුමත කිරීම.

(xvi) මේ කොටසේ 41 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) සිට (xv) දක්වා වන උපවගන්තිවලින් සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළත ද, වෙනත් පැමිණිල්ලක් නම් දින දහහතරක් ඇතුළත ද විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

42. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙකු, පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම්, එකී තැනැත්තාට ප්‍රාදේශීය සභාව විසින් බලපත්‍රයක් නිකුත් කළ හැකි ය. අයකිරීම් හා ගාස්තු

*(අ)* ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ආ)* 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඇ)* එක්රැස් කළ අපද්‍රව්‍ය පිණිස ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදි කරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානවලට අනුමැතිය ලබාදීම.

*(ඈ)* ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් අනුමත කරන පරිදි එක්කාසු කළ අපද්‍රව්‍ය, ජනතාවට පීඩාවක් සිදු නොවන අන්දමින් සනීපාරක්ෂක ක්‍රමයට ප්‍රවාහන කිරීම සඳහා වාහන සැපයීම.

*(ඉ)* අදාළ ව්‍යවසායකත්වයක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ආයතනය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට උපයෝගී කර ගැනීමේ දී හෝ පිරියම් කිරීමේ දී හෝ අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ හෝ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව වෙත භාරදීමට එකඟවීම.

ප්‍රාදේශීය සභාව විසින් කලින් කළට අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම් කළ යුතුය.

(ii) ප්‍රාදේශීය සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභ කළ විටෙක, ඒ සඳහා වන හේතුව ඉල්ලුම්කරු ඉල්ලා සිටින්නේ නම්, ප්‍රතික්ෂේප

කිරීමට හෝ නිෂ්ප්‍රභ කිරීමට හෝ හේතු ඉල්ලුම්පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතුය.

(iii) ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසරය ලබාදුන් මධ්‍යස්ථානවල බලපත්‍රයේ, එක්රැස් කරනු ලබන අපද්‍රව්‍යවල වර්ග, අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර ලබාදුන් ප්‍රදේශ සහ වෙනත් සුදුසු කොන්දේසි සටහන් කර දැක්වීම.

(iv) මේ කොටසේ 42 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු නොකරන අවස්ථාවක දී, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කරනු ලැබේ.

(v) මේ කොටසේ 42 වැනි අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී, කවර හෝ තැනැත්තෙකු අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුතුය. එවැනි අවස්ථාවක දී, බලපත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් මාධ්‍ය හරහා ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුතුය.

බලය පැවරීම.

43. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය.

44. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය. (45-49)

45. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථානවල / පරිශ්‍රවල පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේය.

46. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථාන / පරිශ්‍ර පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් ස්ථානවල හිමිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ කුලීකරුගේ හෝබලපත්‍රලාභියාගේ හෝ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

47. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයන්ට, සඳහන් කර ඇති ස්ථානයන්හි හිමිකරු හෝ පදිංචිකරු හෝ බලපත්‍රලාභියා හෝ පටහැනි වන අවස්ථාවක, වහාම හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර හෝ එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට නියම කෙරෙන දැන්වීමක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එකී තැනැත්තා වෙත භාරදිය යුතුය.

48. මේ කොටසේ 47 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් වේලාවට හා දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතර(14)කට නොවැඩි විය යුතුය.

49. මේ කොටසේ 47 වැනි හා 48 වැනි අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිළියම යාන්ත්‍රණය.

50. බලපත්‍රලාභියා හෝ සම්බන්ධිත කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

52. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

දඩ හා දණ්ඩන.

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

අර්ථ නිරූපණය හා නිර්වචන.

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු හෝ සිදු කෙරෙන ඕනෑම වේලාවක් අදහස් වේ.

"කාර්යාලය" යන්නෙන්, 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම අදහස් වේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන්, කිසියම් ඉඩමක / ව්‍යාපාරික ස්ථානයක, හිමිකරු හෝ පදිංචිකරු හෝ ඉඩමක/ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරු අදහස් වේ.

"ව්‍යාපාරික ස්ථානය" යන්නෙන්, තොග හෝ සිල්ලර වෙළෙඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් අදහස් වන අතර ආහාරපාන අළෙවියට තබා ඇති ස්ථානයක් සහ කොණ්ඩා සකසන ස්ථානයක් හෝ රූපලාවන්‍ය ස්ථානයක් හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

"ආපනශාලා" යන්නෙන්, දින පහසුකම් සහිතව හෝ රහිතව හෝ මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් වේ. එයට හෝටලයක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

"කර්මාන්ත ශාලාව" යන්නට, 1942 අංක 45 දරණ කර්මාන්ත ශාලා ආඥා පනතේ තිබෙන අර්ථයම අදාළ වන අතර, කිසියම් අමුද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය

කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් ද අදහස් වේ.

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, පස්, මඩ, දූවිලි, අළු සහ අපද්‍රව්‍ය ද, ගොඩනැගිලි කඩා දමන විට ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ද, ඒ සමඟ කුණු, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය ද අදහස් වේ.

"රෝහල" යන්නෙන්, යම් රෝගයකින් හෝ දුබලතාවයින් හෝ පෙළෙන තැනැත්තන් හෝ සතුන් හෝ භාර ගැනීම්, ඔවුනට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ත්ව සායනයක් ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන්, සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු ඊට ඇතුළත් වේ.

"උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය" යන්නෙන්, මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හෝ හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයෙන් වන අපද්‍රව්‍ය අදහස් වේ.

"එක්රැස් කිරීම" යන්නෙන්, බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු හෝ විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් වේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම් අදහස් වේ. එය පාංශු තත්ත්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

"ගබඩා කිරීම" යන්නෙන්, හිමිකරුවෙකුගේ හෝ පදිංචිකරුවෙකුගේ හෝ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම හෝ අදහස් වේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන්, ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් හෝ ඉවත් කරන ශාක කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් වේ.

"ජෛව ජීර්ණීය අපද්‍රව්‍ය" යන්නෙන්, ක්ෂුද්‍ර ජීවී කාරකයන් මඟින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන්, අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි, එහි ස්වරූපය වෙනස් කරමින් නව පරිභෝජන නිෂ්පාදනයන් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන්, සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් හෝ පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් වේ.

"ප්‍රවාහනය" යන්නෙන්, මිනිස් හෝ සත්ත්ව හෝ යාන්ත්‍රික හෝ බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යක් යොදා ගනිමින්, අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් වේ.

"බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන්, අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදා හැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් වේ.

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන්, අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබා ගැනීමට හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගෙන් හෝ බලපත්‍රයක් ලබාගත් තැනැත්තෙකු අදහස් වේ.

"බැහැරලීම" යන්නෙන්, ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත්, පිරියම් නොකරන ලද්දාවූත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් වේ.

"මාරු කරන ස්ථානය" යන්නෙන්, ප්‍රාදේශීය සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කරන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණය, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම යනාදිය සඳහා අපද්‍රව්‍ය එක්කාසු කරන ස්ථානය වේ.

"වෙන් කිරීම" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති ප්‍රභේදයන්ට අනුකූලව, අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් වේ.

"සැකසීම" යන්නෙන්, අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ.

"ප්‍රාදේශීය සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන්, බක්කිවලින් හෝ බහාලුම්වලින් හෝ අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට ප්‍රාදේශීය සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් වේ.

"පොදු ස්ථානය" යන්නෙන්, පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පලක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් වේ.

54. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය. *අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

## 9 වැනි පරිච්ඡේදය

**I වැනි කොටස :- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. *අතුරු ව්‍යවස්ථාවේ නාමය.*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. *අරමුණ.*

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 (ix)(ච) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන*

4. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම වාසය කරන පදිංචිකරුවන් - *ඉටු නොකළ යුතු කාර්යයන් (4-5)*

(i) සියළුම නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, කුරුම්බා හා තැඹිලි කෝම්බ සහ ඒ ස්ථානයේ තිබෙන වෙනයම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා පාවිච්චි කරනු ලබන භාජන වැනි දෑ ඉවත් කිරීමට හෝ විනාශ කිරීමට හෝ එසේ කිරීමට සැලැස්විය යුතුය.

(ii) නේවාසික හෝ අනේවාසික හෝ ගොඩනැගිලි වලින් වැහි ජලය ගලායාම සඳහා වන පයිප්ප, පීලි සහ ගෙවතුවල ඇති කාණු නිසියාකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය. ඒවායේ අවහිරතා සිදු වන්නේ නම් වරින් වර පරීක්ෂා කර, ඒවා ඉවත් කළ යුතුය.

(iii) නේවාසික හෝ අනේවාසික හෝ පරිශ්‍ර තුළ තිබෙන සියළුම ජල බඳුන්, ජල ටැංකි සහ ජලය එක්රැස් කර තබන වෙනත් භාජන මනා තත්ත්වයකින් සුදුසු ප්‍රතිසංස්කරණ සහිතව පවත්වාගෙන යාම, ඒවා මදුරුවන්ගෙන් හා රෝග කාරක කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීම, ඒවායේ මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයකින් තබා ගැනීම හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීමට අවශ්‍ය විය හැකි සියළුම කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන්නේය.

(iv) පරිශ්‍රය තුළ වූ සියළුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාම කළයුතු අතර මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයෙන් තබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය.

(v) ජලය හිස් කිරීමට හැකිවන ආකාරයෙන් ඉදි කර ඇති යම් කෘත්‍රිම පොකුණු ඇත්නම්, යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් එහි ජලය හිස්කොට පවිත්‍ර කළ යුතුය.

(vi) ගෙවතුවල හා ඉඩම්වල තිබෙන කාණුවලින් ගලායන ජලය එකතු වී, දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා දිනපතාම නඩත්තු කළ යුතුය.

(vii) ආහාර පිණිස හෝ අලංකාරය පිණිස වවනු ලබන පැලෑටි හැර අනෙකුත් සියළුම ලඳු කැලෑ, වෘක්ෂ සහ වනාන්තර යනාදිය මනුෂ්‍ය වාසස්ථාන වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක හෝ සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කර, පිරිසිදුවෙන් තබාගත යුතුය.

(viii) සියළුම ගල්වළවල්, පස් කැණීම් කරන ලද වළවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වළවල් යනාදියේ ජලය නොරැඳෙන ආකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය.

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැලෑටි, දිය පරඬල් ඇතුළත් විවිධ ජලජ පැලෑටි හා මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීමට හේතුවක් වන බව කළින්ම දැන ගන්නා පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එවැනි පැලෑටි යම් දිය මාර්ගයක් දිගේ පාවීයාම නතර කිරීමට හැකිවන පරිදි සුදුසු බාධක ඉදිකර, ඒවා පැතිරීයාම වළක්වාලිය යුතුය.

(x) වැසිකිළි, දිය වළවල්, දිය උරන වළවල්, මුද්‍රා තැබූ වළවල් හා ඒ අවට පරිසරය ඇතුළුව එම ස්ථානයේ වූ සියළුම වැසිකිළි, මදුරුවන්ගෙන් බෝවීම වැළැක්විය හැකි ආකාරයෙන් පවත්වාගෙන යාම කළ යුතුය.

(xi) සුසාන භූමියන්හි හෝ වෙනත් පරිශ්‍රයයන්හි හෝ මළවුන් සඳහා ඉදි කෙරෙන සිහිවටන, ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතුය.

5. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළයුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියම කරනු ලබන අවස්ථාවෙහි දී, දැන්වීම භාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය ඇතුළත එකී නියමයන් ඉටු කළ යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන් (6-7)

6. ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු ඕනෑම පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ බෝවීමට හා වර්ධනය වීමට හැකිවන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ එලෙසින් ක්‍රියාත්මක කිරීමට හෝ ඉඩ සැලැස්වීම නොකළ යුතුය.

7. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, ජල විදින ව්‍යුහයේ වූ ඉදි කිරීම්, වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තැබිය හැකි වෙනත් ඉදි කිරීම් හෝ නොකළ යුතුය.

ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය. (8-11)

8. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වූ කාලය ඇතුළත කිසියම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුළු වී, පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස එකී පරිශ්‍රය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(i) එම පරිශ්‍රය මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවන පරිශ්‍රයක් ද, යන වග;

(ii) එම පරිශ්‍රයේ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන පිළිපැද තිබේ ද, යන වග;

(iii) එම පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීමට සහ විනාශ කිරීමට කුමන හෝ පියවර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, එම පියවර කවරේ ද, යන වග; සහ

(iv) එම පරිශ්‍රයේ විෂබීජ විනාශ කිරීම සඳහා විෂබීජනාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද, යන වග.

9. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් හෝ විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළයුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නියෝග කළ හැකිය.

10. මේ කොටසේ 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදි කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මඟින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලසීමාව තුළ එකී ළිං, ටැංකි, පොකුණු, ජල විදින ව්‍යුහයේ වූ ඉදි කිරීම් හෝ නියමිත වතුර රැඳී තිබෙන ඉදි කිරීම්, නියම කරනු ලබන යම් ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කරන ලෙස නැතහොත් එම කාලසීමාව තුළ එම දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයෙන් වෙනස් කරන ලෙස නියම කළ හැකිය.

11. මේ කොටසේ 9 වැනි හෝ 10 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වූ දැන්වීමක්, යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ පෞද්ගලිකව භාරදීමෙන් හෝ එම දැන්වීම එකී ස්ථානයේ මනාව පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකිය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම.

13. මෙම අතුරු ව්‍යවස්ථාවලින් පනවන ලද නියමයන්, ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පරීක්ෂාවට ලක් කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ බලය ඇත්තේය. පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය. (13-16)

14. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ සහායවීම ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන්නන්ගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

15. මේ කොටසේ 9 වැනි හා 10 වැනි අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලය ඇත්තේය. කෙසේ වුවද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින 14කට නොවැඩි විය යුතුය.

16. මේ කොටසේ 15 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ එකී දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ විසින් ඕනෑම දවසක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වූ කාලය තුළ කුමන හෝ වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුල් වී, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට හෝ ඉඩ සැලැස්විය හැකිය.

17. ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු උල්ලංඝණය කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

19. මෙම අතුරු ව්‍යවස්ථාවලින් 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ කාර්යයක් හෝ කාර්යයන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවෙහි දී හෝ ඉටුකරනු ලබන අවස්ථාවෙහි දී, ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා දරන්නට සිදු වූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් හෝ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳව ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු, දින 14ක් ඇතුළත එම මුදල එකී අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් හෝ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු අතර නිශ්චිත කාලය තුළ එම මුදල ගෙවනු නොලැබුවහොත්, එම මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු දඩ මුදල වශයෙන් එකී අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් හෝ අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය. දඩ හා දණ්ඩන. (19-20)

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපණය හා නිර්වචනය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද රීට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

"අයිතිකරු" යන්නෙන්, යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු යම් පරිශ්‍රයක කුලියට හෝ එලදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් පාන යම් තැනැත්තෙකු අදහස් වේ

"පදිංචිකරු" යන්නෙන්, යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් හෝ එහි භාරකාරත්වය, කළමනාකරණය හෝ පාලනය හෝ පාලනය දරන තැනැත්තෙකු අදහස් වේ.

"රෝග කාරක කෘමීන්" යන්නෙන්, මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"පරිශ්‍රය" යන්නෙන්, යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අතහැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අතහැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

22. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**II වැනි කොටස :- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථායනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සුභ විහරණය පිණිස මහජන සෞඛ්‍යය පවත්වාගෙන යාම සහතික කරලීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ.

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීම සඳහා වූ නෛතික විධිවිධාන

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු හා 126(ix) (ග), (ජ), (ට) සහ (ද) යන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන් (4-5)

4. සතෙකු මැරුණු විට, ඒ සතා මැරුණු වේලාවේ සිට පැය දොළහ(12)ක් ඉකුත් වීමට පෙර වළලා දැමීම, ඒ සතාගේ අයිතිකරුගේ හෝ අයිතිකරු නොමැති විටක ඒ සතා මැරුණු ස්ථානයේ පදිංචිකරුගේ හෝ යුතුකම විය යුතුය.

5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් නිවසක අයිතිකරු හෝ පදිංචිකරු/පදිංචිකරුවෙකු හෝ එම නිවසට අදාළ ඉඩම පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයකින් ද, වල් පැළෑටි, ලඳු කැලෑ, කුණු රොඩු, ජලය රැඳී තිබිය හැකි වෙනත් භාජන, ටයර්, පොලිතීන් මලු, ටින්, තැඹිලි කෝම්බ වැනි ද්‍රව්‍යවලින් තොරව ද පවත්වාගෙන යා යුතුය.

ඉටු නොකළ යුතු කාර්යයන් (6-16)

6. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ හෝ අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් ලකුණක් ඉවත් කිරීම හෝ මකා දැමීම නොකළ යුතුය.

7. මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙකු යම් පාරක, අඩි පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක වුවමනාවෙන් නිදහසේ ගමන් නොකළ යුතුය.

8. කවර හෝ තැනැත්තෙකු මේ කොටසේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන යම් ළමයෙකු හෝ තැනැත්තෙකු හෝ වුවමනාවෙන්ම යම් පාරක, අඩි පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක නිරාවරණව තබා ගැනීමට හෝ එවැනි තැනකට යාමට හෝ ඉඩ හැරීම නොකළ යුතුය.

9. ප්‍රාදේශීය සභාව විසින් පොදු නාන ස්ථානයක පිරිමි හෝ ගැහැණු හෝ එක් පාර්ශ්වයක තනි ප්‍රයෝජනය සඳහා වෙන් කර ඇති යම් පොදු නාන ස්ථානයකට ඊට විරුද්ධව ලිංගික පාර්ශ්වයේ කිසිම තැනැත්තෙකු ඇතුළු නොවිය යුතුය.

10. (i) යම් ස්පර්ශක, චර්ම හෝ ආසාදක රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු ආසාදන හෝ බීජෞෂණ කාල සීමාව ඉක්මවන තුරු, යම් පොදු නාන ස්ථානයක නෑම හෝ රෙදි සේදීම හෝ නොකළ යුතුය.

(ii) මේ කොටසේ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් කවර හෝ තැනැත්තෙකුගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ජලය, නිරෝගී තැනැත්තෙකු විසින් ලබාගෙන, ළිඳ පිහිටි ස්ථානයේ සිට මීටර් දහය(10)ක දුරක් ඇතුළත නෑම හෝ සේදීම හෝ නොකළ යුතුය.

11. යම් පොදු ළිඳකින් හෝ පොදු නාන ස්ථානයකින් හෝ ජලය ගැනීමේ කාර්යය සඳහා කවර හෝ තැනැත්තෙකු විසින් යම් අපිරිසිදු භාජනයක් භාවිතා නොකළ යුතුය.

12. කවර හෝ තැනැත්තෙකු විසින් -

(i) පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන් කර ඇති යම් ස්ථානයක දී, කවර අන්දමක හෝ භාණ්ඩයක් පොදු ළිඳක හෝ ඒ අසළ හෝ සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

(ii) කවර හෝ කාර්යයක් සඳහා යම් සතෙකු යම් නාන ස්ථානයකට දක්කා ගෙන යාම, එළවීම හෝ ඇද ගෙන යාම හෝ නොකළ යුතුය.

(iii) යම් පොදු ළිඳක හෝ නාන ස්ථානයක හෝ ඒ අවට භූමිය කුමන හෝ අන්දමකින් අපිරිසිදු නොකළ යුතුය.

13. ප්‍රාදේශීය සභාව විසින් මේ කොටසේ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වෙන් කර ඇති යම් ස්ථානයක්, එය එසේ වෙන් කර ඇති කාර්යය හැර වෙනත් යම් කාර්යයක් සඳහා කිසිම තැනැත්තෙකු විසින් ප්‍රයෝජනයට නොගත යුතුය.

14. (i) පරිහරණය සඳහා ජලය ලබා ගන්නා යම් පොදු ළිඳක හෝ දිය උල්පතක හෝ ජලය ලබා ගන්නා

වෙනත් ස්ථානයක හෝ සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත කසළ වළක්, වසුරු වළක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් තිබෙන්නට ඉඩ හැරීම නොකළ යුතුය.

(ii) පරිහරණය සඳහා ජලය ලබා ගන්නා යම් පොදු ළිඳක හෝ දිය උල්පතක හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථානයක හෝ සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත ගොවිතැන් කාර්යය සඳහා යොදා ගන්නා ඉඩම්වල ජලය දූෂණය විය හැකි ආකාරයෙන් පොහොර හෝ විෂබීජනාශක හෝ යෙදීම නොකළ යුතුය.

(iii) යම් කසළ වළක්, වසුරු වළක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් හෝ ගොවිතැන් කාර්යය සඳහා නොසැලකිල්ලෙන් පොහොර යෙදීම යනාදිය සිදුවන යම් ස්ථානයක සිට මීටර් පහළොව(15)ක දුරක් ඇතුළත ගෘහ කාර්යය සඳහා කිසිම පුද්ගලික ළිඳක් කැපීම නොකළ යුතුය.

15. කවර හෝ තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකුට අයිති ඉඩමක හෝ මාර්ගයක හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ කැලි කසළ හෝ දුගඳ හමන ද්‍රව්‍ය හෝ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ දැමීම හෝ විසික් කිරීම නොකළ යුතුය.

16. මළ හා මුත්‍රා පහ කිරීම සඳහා විශේෂයෙන් වෙන් කර නොමැති ස්ථානවල, කිසිම තැනැත්තෙකු විසින් මළ හෝ මුත්‍රා හෝ පහ නොකළ යුතුය.

ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය.

17. (i) ස්පර්ශක රෝගයකින් හෝ චර්ම රෝගයකින් හෝ වසංගත වෙනත් රෝගයකින් හෝ පෙළෙන තැනැත්තෙකු සිටින යම් නිවසක හෝ ගොඩනැගිල්ලක පිටතින් ප්‍රකටව පෙනෙන කොටසක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙකු හෝ විසින් ලකුණක් තැබීම හෝ තැබීමට සැලැස්වීම අවශ්‍ය යැයි සලකනු ලබන කාලය දක්වා ඔහු විසින් එම ලකුණ අලවා තැබීමට බලය ඇත්තේය.

(ii) යම් පොදු ළිඳක හෝ පානීය ජලය ලබා ගැනීමට හැකි ස්ථානයක, රෙදි සේදීම හෝ නෑම හෝ තහනම් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(iii) ප්‍රසිද්ධ පාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක හෝ යම් සතෙකු මැරුණු විටෙක, එය අයිතිකරුට දැන ගැනීමට නොහැකි අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින් ඒ සතාගේ ශරීරය වහාම ඉවත් කර, වැළලීමට පියවර ගැනීම හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීම හෝ ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

(iv) රෙදි සේදීම, නෑම හෝ සතුන් නැවීමට හැකි වැව් හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථාන, ප්‍රාදේශීය සභාව විසින් එහි අභිමතය පරිදි වෙන් කළ හැකිය.

(v) මනුෂ්‍ය පරිභෝජනය සඳහා ජලය ලබා ගැනීමට හැකි වැව් හෝ ජලය ලබා ගන්නා වෙනත් ස්ථාන, ප්‍රාදේශීය සභාව විසින් එහි අභිමතය පරිදි වෙන් කළ හැකිය.

බලය පැවරීම.

18. මෙම අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එකී ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය.

19. කවර හෝ තැනැත්තෙකු විසින් ලිඛිතව හෝ වාචිකව හෝ කිසියම් පැමිණිල්ලක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට හෝ ඉදිරිපත් කළ හැකි අතර, අදාළ නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා දවස් 14ක් ඇතුළත විසඳුම් ලබාදිය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන්

අනතුරුව, ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 122 වන වගන්තියෙහි 2 වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපණය හා නිර්වචනය.

"ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අදහස් වේ.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන්, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස අදහස් වේ. මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙකුට, ලේකම්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ බලය පවරන ලද යම් නිලධාරියෙක් ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අදාළ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති එකී ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු අදහස් වේ.

23. මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

05 - 587/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.